| (ජ) | වර්ෂ 19 ක කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල පැවත එන නිලධාරීන් අතැති මුදල් ශේෂය රු.3,195,339 ක් වූ අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 | නිලධාරීන් අතැති මුදල් අයකර ගැනීම විධිමත් ක්‍රමවේදයක් යටතේ ගිණුම් වලින් ගැලපීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | එලෙසම පවතී. |
| (ට) | වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ණයගැති ශේෂ තුළ අක්‍රියව පවතින ගිණුම් 4862 කට අදාලව රු.466,586,610 ක ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. | 2022 | අක්‍රියව පවතින ව්‍යාපාරික ස්ථාන ටෙන්ඩර් කිරීම තුලින් ආදායමක් ලබා ගැනීමට කටයුතු කිරීම හා අක්‍රීයව පැවති කාලයට අදාලව ගිණුම්ගත කර ඇති ආදායම් විධිමත් ලෙස ගිණුම්වලින් ඉවත් කිරීමටත් කටයුතු කර ගිණුම් නිරවුල් කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | එලෙසම පවතී. |
| (ඩ) | කාක දූපත වෙරළ උද්‍යානයේ භෝජනාගාරය 2016 සැප්තැම්බර් 01 දින | 2022 | කඩිනමින් හිඟ මුදල් හා අයවිය යුතු අලාභ අයකර ගැනීමට කටයුතු | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | හිඟය එලෙසම පවතින අතර දේපළ නිශ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට 2026 අගෝස්තු 31 දින දක්වා ප්‍රසම්පාදන ක්‍රියාපටියකින් තොරව පැරඩිගම් ඉවෙන්ට් මැනේජ්මන්ට් පුද්ගලික සමාගමට බදු දී තිබූ නමුත් විධිමත් දැනුම්දීමකින් තොරව 2019 අප්‍රේල් 21 දින සිට බදුකරු පරිශ්‍රයෙන් ඉවත්ව ගොස් තිබුණි. බදුකරුගෙන් අයකර ගත යුතු සම්පූර්ණ හිඟ මුදල වන රු.4,702,733 ක මුදල සභාවට වර්ෂ 2020 දෙසැම්බර් 15 දින හෝ ඊට ප්‍රථම ගෙවන ලෙසත් එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් සමාගමට එරෙහිව නඩු පවරා එකී මුදල් අයකර ගැනීමට ක්‍රියාකරන බවත් දන්වමින් සමාගම වෙත 2020 දෙසැම්බර් 01 දින ලිපියක් සභාව විසින් යවා තිබුණද ඉදිරි කටයුතු සිදුකිරිම අතහැර දමා තිබීමෙන් කොළඹ මහා නගර සභාවට රු.4,702,733 ක පාඩුවක් සිදුවී තිබුණි. | | කළ යුතුය. | | |
| (ණ) | වෙරළ උද්‍යානයේ ආරම්භයේ සිට වෙළඳාමේ නිරත වූ පුද්ගලයින් සඳහා ව්‍යාපෘතිය මඟින් වැඩ අවසන් කරන ලද | 2022 | කඩිනමින් හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | එලෙසම පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙළඳකුටි 16 ක් දිනකට කුලිය රු.200 බැගින් හා ඊට අදාල බදු මුදල්ද සමඟ මාසිකව අයකිරීමට 2016 මාර්තු 28 දිනැති අංක 2757 දරන සභා තීරණය මගින් අනුමැතිය ලැබී තිබූ නමුත් 2016 වර්ෂයේදී පමණක් නියමිත පරිදි ගාස්තු අයකර තිබුණි. විධිමත් පරිදි කුලී මුදල් අයකර ගැනීම සිදු වූයේ නම් 2016 මැයි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අවම වශයෙන් රු.6,624,000 ක් අයවිය යුතු වුවත් කඩකුලී ලෙස රු.1,803,464 ක් පමණක් අය වී තිබුණි. | | | | |
| (ත) | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 2015 වර්ෂයේදි රු.12,286,464 (වැට් රහිත මිල) ක් වැය කරමින් මිලට ගන්නා ලද රසායනාගාර උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | 2022 | පරීක්ෂණ කටයුතු සඳහා අදාල උපකරණ භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | නැත. | උපකරණ තවදුරටත් නිශ්කාර්යව පවතී. |
| (ද) | නගරයේ ඇති අවුරුදු 100 කට වඩා පැරණි ගස්වල කඳ හා මුල්වල | 2022 | යන්ත්‍රය භාවිතය පිළිබඳව හැකි ඉක්මනින් | යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට පරීක්ෂා | තවදුරටත් නිශ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තත්ත්වය මැනීමට හා පරීක්ෂා කිරීමට 2015 වර්ෂයේදී රු.මිලියන 7.4 ක් වැය කර ඉඩම් හා පරිසර සංවර්ධන අංශය විසින් මිලදී ගෙන තිබූ ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවු.7 ක් ගත වී ඇතත් භාවිතයෙන් තොරව විහාරමහාදේවි උද්‍යාන කාර්යාලයෙහි තබා තිබුණි. | | නිලධාරීන් පුහුණු කරවා ගැනීම සහ මෙතෙක් කල් යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතුය . | කරමින් පවතී. | |
| (න) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2264/17 හා 2022 ජනවාරි 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 2(1) (අ) අනුව අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ මෝචනය කිරීම එකී අපද්‍රව්‍ය මඟින් පරිසරය දූෂණය නොවන ආකාරයෙන් හෝ පරිසර දූෂණය සිදු වීමට ඉඩ නොමැති ආකාරයෙන් පමණක් සිදු කළ යුතුය. ඒ අනුව පොදු පිරිපහදු පද්ධතියකට හෝ සමුද්‍රීය පිටවුම් නල මාර්ගයකට හෝ දෙකටම සම්බන්ධිත පොදු මලාපවහන ජාලයක් වෙත අපජලය හෝ අපසන්දන බැහැරලීම සිදු කිරීමේදී | 2022 | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාර විධිමත් ලෙස පරීක්ෂාවන් කර බැහැර කිරීම් සිදුකිරිමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නිර්දේශයට අනුව ක්‍රියා කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අපසන්දන වලට අදාලව පරාමිතින් 32 ක් හා වර්ණ නිර්ණායක 03 ක් පරීක්ෂා කළ යුතු බව ගැසට් නිවේදනය අනුව දක්වා තිබුණද මාදම්පිටිය පොම්ප මධ්‍යස්ථානයේ පිහිටි රසායනාගාරය මඟින් ප්‍රමාණවත් හා විධිමත් පරීක්ෂාවකින් තොරව අපසන්දන සාගරයට මුදාහැර තිබුණි. | | | | |
| (ප) | රසායනාගාරයට අනුයුක්තව සේවය කරනු ලබන පොම්පාගාර සේවකයින් දෙදෙනෙකු විසින් ලබා ගන්නා අපසන්දන සාම්පල් මත තීරණ ගැනීමේ අවදානමක් පවතින බැවින් රසායනඥවරියගේ සෘජු අධීක්ෂණය යටතේ සාම්පල් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු වුවද පොම්ප මධ්‍යස්ථානයට පැමිණෙන බවුසර් වලින් නියැදි ලබා ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබු අතර, ඒ හේතුවෙන් පරිසරයට අහිතකර අපජලය මුදාහැරීමේ මෙන්ම | 2022 | නියැදි ලබා ගැනීම විධිමත් කිරීමත් සේවකයන් අතර දුස්සන්ධානය සිදු නොවන පරිදි ක්‍රමවත් වැඩ බෙදීමක් සිදු කළ යුතුය. | නොමැත. | නිර්දේශ ක්‍රියාත්මක වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරීන්ට හා සේවකයන්ට අක්‍රමිකතා වලට අවස්ථාව ලබාදීමක්ද සිදුවී තිබුණි. | | | | |
| (ඛ) | කොළඹ නගරයේ සාමාන්‍ය වැසි තත්ත්වයකදී පවා ජලයෙන් යටවන ස්ථාන 20 ක් පමණ සභාව විසින් හඳුනාගෙන තිබුණද වැසි ජලය පිටාර ගැලීම හේතුවෙන් ඇතිවන ගංවතුර තත්ත්වයන් අවම කර ගැනීම සඳහා නිම කිරීමට යෝජිත ව්‍යාපෘතිවල සමාලෝචිත වර්ෂය තුල භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට හා කොන්ත්‍රාත් පිරිනැමීමට අපොහොසත්ව තිබුණි. | 2023 | හඳුනාගත් ස්ථාන සම්බන්ධව පිළියම් යෙදීම කඩිනම් කළ යුතුය. | මේ පිළිබඳ කටයුතු කර ඇත. | ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර ගැනීමට අසමත්ව තිබුණි. |
| (ම) | ලෝක බැංකුවේ ණය ආධාර මගින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කොළඹ නගරය ආශ්‍රිත නොරිස් ඇල සංවර්ධන මගින් ඊට එකතු වන වැසි ජලය සීග්‍රයෙන් බේරේ වැවට බැස යාම සඳහා මීටර් 632 කින් යුත් නව ඇළ මාර්ගයක් ඉදිකිරීමට ආරම්භ කළ නමුත් මහා නගර සභාවට අයත් නිවාස | 2023 | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. | අවසාන පදිංචිකරුවන් 7දෙනා සමඟ සාකච්ඡා කරමින් පවතී. | ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර ගැනීමට අසමත්ව තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 36 කින් යුත් අබලන් නිවාස සංකීර්ණයක් හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වී තිබූ අතර ඉතිරිව තිබූ මීටර් 105 ක් වූ ඇළ මාර්ගය නිම කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ රු.මිලියන 150 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි. එම පදිංචිකරුවන් ඉවත් කිරීමට ගෙන තිබූ ක්‍රියාමාර්ග කඩිනම් නොවීම හේතුවෙන් මහා නගර සභාවට එකී මුදල උපයෝජනය කිරීමට නොහැකි වීමෙන් මරදාන ඩීන්ස් පාර වැසි ජලයෙන් යට වීම වළක්වා ගත නොහැකි වී තිබුණි. | | | | |
| (ය) | ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් වසර කිහිපයකට පෙර සංඝරාජ මාවතේ වැසි ජලය ගලායාම සඳහා කොන්ක්‍රීට් (24’’) නලයක් මීටර් 180 ක් පමණ වන තෙක් එලා තිබු නමුත් අවසාන මීටර් 10 ක පමණ කොටස අවසන් කිරීමට හේතු වූ බාධාව ඉවත් කර තිබුණද ව්‍යාපෘතිය අවසන් කිරීමට | 2023 | වහාම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කළ යුතුය. | කටයුතු කරමින් පවති. | නිවාස ඉවත් කළද ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කොළඹ මහා නගර සභාවේ වගකිව යුතු නිලධාරින් අසමත්ව තිබුණු බැවින් සුළු වැසි වලදී පවා එම මාවතට එකතු වන වැසි ජලය ගලා යාමට නොහැකි වීම හේතුවෙන් එම මාර්ගය ජලයෙන් යටවීම වළක්වා ගැනීමට නොහැකි වී තිබුණි. | | | | |
| (ර) | කොළඹ මහා නගර සභාවේ නාගරික සූනාගාරය තුලදී එළුවන් පමණක් ඝාතනය කෙරෙන අතර ගවමස් වව්නියාව, හොරොව්පතාන, ගලෙන්බිඳුනුවැව, කහටගස්දිගිලිය, ගල්ගමුව, මධ්‍යම නුවරගම්පළාත, මිහින්තලේ, ශිරිබාව යන පළාත් පාලන බල ප්‍රදේශවල සිට කොළඹ සූනාගාරය දක්වා ප්‍රවාහනය කර කොළඹ නගරයේ ගවමස් කඩ වෙත බෙදාහරිනු ලැබේ. එසේ පළාත් පාලන බලප්‍රදේශවල සිට කොළඹ මහා නගර සභාවේ සූනාගාරය වෙත ගවමස් ප්‍රවාහනය කිරීම පවත්නා අතුරු ව්‍යවස්ථාවට සම්පූර්ණයෙන්ම පටහැනි වුවද දශක 4 ක කාලයක් තුල | 2023 | අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හා ජාතික මට්ටමින් හා පළාත් සභා මට්ටමින් සිදුවිය යුතු නීති සම්පාදනයන් සඳහා වූ තොරතුරු ඉදිරිපත් කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ප්‍රගතියක් අත්කරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එලෙස ගවමස් ප්‍රවාහනය සිදුකළ ද ඊට අදාල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කර අනුමත කර ගැනීම හා ජාතික මට්ටමින් සිදුවිය යුතු නීති සම්පාදනය සඳහා අදාල බලධරයන්ගෙන් ඉල්ලීම් කිරීම ද සිදුකර නොතිබුණි. | | | | |
| (ල) | ගවමස් පරීක්ෂා කිරීමේ ගාස්තුව මස් රාත්තලකට සත 05 ක් වූ අතර 1959 පෙබරවාරි 27 දිනෙන් පසුව ගාස්තු සංශෝධනය වී නොමැති බැවින් 2022 දෙසැම්බර් 27 දිනැති අංක 3516 දරන සභා තීරණය මඟින් සම්මත කළ මස් පරීක්ෂාව සඳහා සේවා ගාස්තුව ගවයකු සඳහා රු.1500 ක්ද ඌරෙකු සඳහා 1500 ක්ද එළුවකු සඳහා රු.600 ක්ද වශයෙන් ප්‍රසිද්ධ කර අය නොකිරීම හේතුවෙන් රු.43,126,800 ක ආදායමක් අහිමි වී තිබුණි. | 2023 | සභා තීරණයට අනුව කටයුතු නොකිරීමට එරෙහිව හා ආදායම අහිමි කිරීමට එරෙහිව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | එලෙසම පවතී. |
| (ව) | 1984 පෙබරවාරි 16 දින අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් කෞතුකාගාරයක් හා සංස්කෘතික කලා හා වාණිජ මධ්‍යස්ථානයක් | 2023 | විදේශීය හා දේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් ස්ථානයක් බැවින් පෞරාණික ස්මාරක ආරක්ෂා | ප්‍රතිසංස්කරණ කටයුතු නිළධාරීන්ට පවරා ඇත. | එලෙසම පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලෙසට යලි පිහිටුවා “පැරණි නගරශාලා මධ්‍යස්ථානය” ලෙස නම්කර තිබුණු හා 2013 අගෝස්තු 16 දිනැති අංක 1873/73 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රය මඟින් පැරණි ස්මාරකයක් ලෙස නම් කර ඇති කොළඹ 11 පිටකොටුව ප්‍රධාන වීදියේ පිහිටා ඇති පැරණි නගර ශාලා ගොඩනැගිල්ල හා පෞරාණික එඩිම්බරෝ ශාලාව එකී අරමුණු යටපත් වන පරිදි හා ගොඩනැගිල්ලේ පෞරාණිකත්වයට හා ප්‍රෞඩත්වයට හානිවන පරිදි ව්‍යාපාරිකයින්ට භාවිත කිරීමට ඉඩහැර තිබුණි. | | කිරීමට කටයුතු කළ යුතුය. | | |
| (ස) | පැරණි නගර ශාලාවේ බදුදී ඇති කඩ කාමර සංඛ්‍යාව 48 ක් වූ අතර මාසික කුලිය වසර පහෙන් පහට සංශෝධනය විය යුතු අතර ඒ අනුව නාගරික තක්සේරුකරු විසින් 2012 ජනවාරි 01 දින සිට අයකළ යුතු කුලිය 2012 ජුනි 29 දින තක්සේරු කර නියෝජ්‍ය භාණ්ඩාගාරික (ආදායම්) වෙත එවා තිබුණු නමුත් පරිගණක පද්ධතිය | 2023 | සිදුකර ඇති අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකළ යුතුය. | අභ්‍යන්තර විගණන අංශය ලවා නැවත පරීක්ෂා කරන බව දන්වා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යාවත්කාලීන කර සංශෝධිත කුලිය අය නොකිරීම නිසා 2012 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.27,958,260 ක් නගර සභා අරමුදලට අහිමිකර තිබුණි. | | | | |
| (හ) | 1987 අංක 38 දරන සමාජශාලා වලට බලපත්‍රදීමේ පනතේ 7 වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වගන්තිය අනුව සමාජශාලාව විසින් එකී කටයුතු පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලැබීමට අදහස් කරනු ලබන ස්ථානයක පැවතිය යුතු කරුණු 11 ක් ඉදිරිපත් කර තිබූ අතර එකී කරුණු සමඟ අනුකූල වන්නේ නම් මිස බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අවසර දිය යුතු අතර එම පනතේ(2) 2 වගන්තිය අනුව පනත ක්‍රියාත්මක වන දිනට පසු පිහිටුවනු ලැබූ යම් සමාජශාලාවක් සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කර තිබේ නම් මිස හෝ පාර්ලිමේන්තු පනත් මඟින් සංස්ථාගත කරනු ලැබ තිබේ නම් මිස සමාජශාලා බලපත්‍රය දීම හෝ අළුත් කිරීම නොකළ | 2023 | සමාජශාලා වලට බලපත්‍රදීමේ පනතේ සඳහන් විධිවිධාන අනුව බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යුතුය. එහෙත් එම කරුණු පිළිබඳව සලකා බැලීමකින් තොරව සමාජශාලා 25ක් සඳහා බලපත්‍ර ලබාදී තිබුණි. | | | | |
| (ළ) | පරණ යෝන්වීදියේ අංක 319 හා 323 දරන පර්චස් 38.32 ක් විශාල වූ ඉඩම පුද්ගලයෙකුට බදු ගිවිසුමක් මඟින් 1983 දෙසැම්බර් 09 දින සිට අවුරුදු 99 ක දීර්ඝ කාලීන බද්දකට ලබා දී තිබියදී අංක 964 දරන ගිවිසුම මඟින් බදු අයිතිය 1983 දෙසැම්බර් 09 දින සිට අවුරුදු 99 ක කාලපරිච්ඡේදයකට ව්‍යාපාරික ස්ථානයකට පවරාදී තිබුණි. බදුකරු ගෙවිය යුතු බිම්කුලිය ගෙවා නොතිබූ හෙයින් එකී කුලිය අයකර ගැනීමේ අරමුණින් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලියක්ද අධිකරණ ක්‍රියාවලියක්ද අනුගමනය කර තිබූ අතර 2007 නොවැම්බර් 21 දිනැති මහාධිකරණ තීරණය අනුව වූ රිට් ආඥාවද ක්‍රියාත්මක කර නොතිබුණි. ඉදිරි වසර 10 තුල සම්පූර්ණ හිඟ මුදල ගෙවා දැමීමේ එකඟතාවයෙන් | 2023 | ව්‍යාපාරික ස්ථානය පවරාගෙන හිඟ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මහාධිකරණයේ ගොනු කර තිබූ අංක HCARB1571/2003 නඩුව අවසන් කර තිබුණද 2019 අගෝස්තු 31 දින වන විට ගෙවා අවසන් කළ යුතු රු.20,823,102 ක සම්පූර්ණ හිඟ මුදල 2024 ජුනි 30 දින වන විටත් ගෙවා නොතිබුණු බදුකරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | | |
| (අඅ) | කොළඹ 05 රොබට් ගුණවර්ධන මාවතේ අංක 9/1 ස්ථානයේ මහ නගර සභාව සතු පර්චස් 14.76 ක් විශාල වූ ඉඩමක් පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබූ වසර 30 ක බදු කාලය 2017 දෙසැම්බර් 31 දින අවසන් වීමෙන් පසු 2018 පෙබරවාරි 27 දින කොමසාරිස් විසින් නැවත රු.2,000 ක මාසික කුලී මත වසර 10කට එම බදුකරුට මහා නගර සභා ආඥා පනතේ 40(1) (ඊ) වගන්තියේ විධිවිධානවලට පටහැනිව බදු පදනම මත ලබා දීමට තීරණය කර තිබුණි. පසුව නැවත මෙකී දේපල මාසික කුලිය රු.16,000ක් ලෙස තක්සේරු කර තිබූ නමුත් බදුකරු විසින් | 2023 | මහා නගර සභා ආඥා පනතට අනුව කටයුතු කළ යුතු අතර තක්සේරු කුලිය අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. කුලි අයකර ගැනීම පැහැරහැරීම සම්බන්ධව වගකිව යුතු නිළධාරින්ට එරෙහිව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එකී කුලිය ගෙවා නොතිබුණු අතර ගිවිසුම් ගතවීමක් සිදු කර ගැනීමක් නොවීමෙන් 2018 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.1,008,000 ක පාඩුවක් සභාවට සිදුව තිබුණි. | | | | |
| (අආ) | කොළඹ 12 ශ්‍රී සුමනතිස්ස මාවතේ වරිපනම් අංක 136 දරන පර්චස් 15.68 ක් විශාල වූ කොළඹ මහා නගර සභාව සතු ඉඩමක් දැව ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා අවිධිමත් ලෙස රු.30ක මාසික කුලියකට බදු දී තිබුණි. 1980 දෙසැම්බර් 11 දින ජාතික පුවත්පත්වල දැන්වීමක් පල කරමින් මෙම ඉඩම වසර 99 ට බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබූ අතර එවකට රු.3,250,000 ක ලංසුවක් පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කළද එම ගනුදෙනුව සිදුකර නොතිබූ අතර මේ දක්වා අනවසර පදිංචිකරු ඉවත් කර ඉඩම බදු දීමට හෝ සාධාරණ කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | 1980 වර්ෂයේ සිට අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයන්ගෙන් ඉඩමේ භුක්තිය ලබාගෙන ටෙන්ඩර් මඟින් බදුදීමට ක්‍රියා කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (අඇ) | 2013 වර්ෂයට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ ආයෝජනයක් ලෙස රු.මිලියන 900 ක වියදමක් දරා ඉදිකර කොළඹ මහා නගර සභාවට භාරදෙන ලද ලොන්ඩ්‍රි කාමර 40 කින් යුත් නවම් මාවත ලොන්ඩ්‍රිය කොළඹ මහා නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඊට පටහැනිව කිලිටු රෙදි කාමර හා රෙදි මදින කාමර 14 ක් පදිංචිය සඳහා භාවිතා කර තිබුණි. 2013 වර්ෂයේ අංක 1029 සභා තීරණය අනුව ලොන්ඩ්‍රිකරුවන්ගෙන් රු.50,000 ක තැම්පතුවක් ලබා ගැනීමටත්, රු.5,000 ක මාසික කුලියක් අයකර ගැනීමට ගිවිසුම්ගත වීමට නියමිත වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2017 වර්ෂයේ විශේෂ කොමසාරිස්ගේ තීරණයක් පරිදි රු.3,000 ක් දක්වා කුලී මුදල අඩුකර තිබුණි. ලොන්ඩ්‍රි 40 න් 14 ක් සම්පූර්ණයෙන්ම පදිංචිය සඳහා භාවිතා කරන අතර ලොන්ඩ්‍රි | 2023 | රජයේ ආයෝජන අවභාවිතාවීම වැළැක්වීම සඳහා අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රැකියාවේ නියුතු නොවන පුද්ගලයින්ද මෙම ලොන්ඩ්‍රිවල පදිංචිව සිටින අතර අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ලොන්ඩ්‍රි පවත්වාගෙන යාමට ජන සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව කටයුතු කර නොතිබුණි. | | | | |
| (අඈ) | කොළඹ 07 ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මාවතේ අංක 15 දරන ස්ථානයේ නව ගොඩනැගිල්ලක් සඳහා වැසිජල සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා සිදුකරන ලද ඉල්ලීමකට අනුව ජලසම්පාදන හා ජලාපවහන අංශයේ අධ්‍යක්ෂවරයා විසින් 2020 ඔක්තොම්බර් 05 දින රු.මිලියන 90 ක ඇස්තමේන්තුවක් අදාල පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කර තිබුණි. එකී සමාගම විසින් නගරාධිපතිනිය වෙත 2021 ජනවාරි 11 දින ඉදිරිපත් කරන ලද ලිපියක් නගරාධිපතිනිය විසින් සෘජුවම ජලසම්පාදන හා ජලාපවහන අංශයේ අධ්‍යක්ෂවරයාට යොමුකර තිබූ අතර ඒ අනුව රු.මි 90 ක ඇස්තමේන්තුව | 2023 | කොළඹ මහා නගර සභාවේ වැසිජල පද්ධතියට හා අපජල පද්ධතියට සම්බන්ධතා ලබාදීමේදී සම්බන්ධතාවේ ස්වභාවය අනුව කොන්ත්‍රාත් මුදල තීරණය කරන බැවින් විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනුවට රු.මිලියන 3.08 ක නව ඇස්තමේන්තුවක් අනුමත කර ඒ අනුව අදාල වැසිජල සම්බන්ධතාවය ලබාදී තිබුණි. මුලින් රු.මිලියන 90 ක් වූ ඇස්තමේන්තුව රු.මිලියන 3.08 ක් දක්වා අඩු කිරීමට හේතු වූ කරුණ ලෙස අදාල ස්ථානයේ සිට නොරිස් ඇල දක්වා වෙනම නල මාර්ගයක් දැමීමට මුලින් අදහස් කළ බවට වාර්තා කළ ද නගර සභාව සතුව එවැනි යෝජනාවක් හෝ සැලැස්මක් නොතිබූ හෙයින් ද ලිප්ටන් වටරවුම ප්‍රදේශය ගංවතුර තර්ජනයක් පවතින ප්‍රදේශයක් නොවන බැවින්ද රු.මිලියන 90 ක ඇස්තුමේන්තුවක් ලබා දීම මතභේදයට තුඩු දෙන කරුණක් විය. | | | | |
| (අඉ) | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන මඟින් හෝ දරිද්‍රතා ආඥා පනත මඟින් නීතිමය විධිවිධාන සලසා නොමැති කරුණක් වූ රටේ පවත්නා ආර්ථික උද්ධමනය හේතුවෙන් ආර්ථික අපහසුතාවයට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම යන | 2023 | මහා නගර සභා ආඥා පනත 188 වගන්තිය යටතේ ඉඩදී ඇති වියදම් සඳහා පමණක් සහා අරමුදල් භාවිතා කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කරුණ සඳහා රු.469,620,000 ක මුදලකට රු.3,500 බැගින් වූ තිළිණපත් 134,000ක් ලක් සතොස වෙතින් මිලදී ගෙන කිසිදු නිර්නායකයක් රහිතව එක් එක් නගර සභිකයින්ගේ අභිමතය පරිදි බෙදාහැර තිබුණු අතර එම වියදම මහා නගර සභා ආඥාපනතේ 188(1) වගන්තිය යටතේ ඉඩදී නොමැති වියදමක් විය. | | | | |
| (අී) | පෞද්ගලික රෝහලක් වෙත බදු දී තිබූ සර් ජේම්ස් පීරිස් මාවතේ පිහිටි වරිපනම් අංක 71 ½, 71 1/3,73 යන වරිපනම් අංක දරන කොළඹ මහා නගර සභාවට අයත් රූඩ් 01 පර්චස් 0.1ක ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බදු කාලය, මහ සභාවේ අනුමැතිය අනුව 1992 ඔක්තෝබර් 22 දින සිට වසර 50ක් දක්වා දීර්ඝ කිරීමෙන් පසු 2004 නොවැම්බර් 30 දින අංක 3411 දරන නව බදු ගිවිසුම අත්සන් කර තිබුනි. එකී ගිවිසුමේ 2 හා 3 කොන්දේසි අනුව නාගරික තක්සේරුකරු විසින් වර්ෂයකට බිම් කුලිය රු.මිලියන 5 ක් හා | 2023 | තක්සේරු බිම් කුලිය බදුකරුගෙන් අයකර නොගන්නේ නම් මහා නගර සභා අරමුදලට සිදුව ඇති පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මාසික නාමික කුලිය රු.18,000 ක් ලෙස 2022 දෙසැම්බර් 22 දින තක්සේරු කර තිබුනි. බදු කුලිය සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව මුදල් කමිටුව 2023 පෙබරවාරි 17 වැනි දින හා මහා සභාව 2023 මාර්තු 3 දින අනුමත කර තිබුණ ද තක්සේරු වාර්තාව අනුව ඉදිරි වසර 20 සඳහා එකවර අයකළ යුතුව තිබූ බිම් කුලිය වන රු.මිලියන 100 ක් වෙනුවට රු.මිලියන 5ක බිම් කුලියක් අයකර ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම තුලින් හා එකී මිලියන 5ක මුදලද අයකර නොගැනීම තුලින් මහ නගර සභා අරමුදලට රු.මිලියන 100ක මුදලක් අහිමිකර තිබුණි. | | | | |
| (අඋ) | ආර්නෝල්ඩ් රත්නායක මාවත මහල් නිවාස සංකීර්ණයේ පදිංචිකරුවන් සඳහා නිවාස සංවර්ධන අධිකාරියෙන් නිවාස 65 ක් ලබාගෙන තිබුණද එකී නිවාස වලින් නිවාස 14 ක් නගරාධිපති කාර්යාලයේ සහ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියතු | 2023 | නාගරික දේපළ අවභාවිතාවීම වලක්වමින් සේවකයන් වෙත ලබාදෙන ලද නිවාස නිල නිවාස සේ සලකා ගිවිසුම්ගත වීම හා කුලී අයකිරීම් කළ යුතුය. | ගිවිසුම් අත්සන් කිරීමට තීරණය කර ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවකයින් වෙත අවිධිමත් ආකාරයට ලබාදී තිබුණි. | | | | |
| (අඌ) | මහා නගර සභාවේ මැදහත්වීමකින් තොරව නාගලගම්වීදිය පොදු වෙළඳපොල ඉදිරිපිට පිහිටි මහා නගර සභාවට අයත් රූඩ් 03 පර්චස්2.12 ක් විශාල වූ ඉඩම බාහිර පාර්ශ්වයන් වෙනුවෙන් පුද්ගල කණ්ඩායමක් විසින් වාහන ගාල් කිරීම සඳහා ගාස්තු අය කිරීමට ටිකට්පතක් නිකුත් කර ආදායම් ඉපයීමක් සිදු කිරීම සම්බන්ධයෙන් මහා නගර සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 | නගර සභාවට ආදායමක් ලැබෙන පරිදි විධිමත් ලෙස නිත්‍යානුකූලව ඉඩම බදුදීමට කටයුතු කළ යුතුයි. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.2 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 42,289,813,162 | 343,421,841 | 41,946,391,321 | 161,769,825 | තත්වාගණනය කළ |
| **2022** | 42,621,703,067 | 313,256,688 | 42,308,446,379 | 305,213,089 | තත්වාගණනය කළ |
| **2023** | 42,515,835,961 | 332,660,854 | 42,183,175,107 | 210,290,184 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2016 පෙබරවාරි 16 දින රු.619,276,616 ක කොන්ත්‍රාත් වටිනාකමට පිටකෝට්ටේ ජයරජසිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා උපදේශක ගාස්තු ලෙස රු.2,638,191 ක් හා ඉදිකිරීම් සඳහා රු.255,707,477 ක් වැයකර තිබූ අතර 2018 සැප්තැම්බර් 10 දින කොන්ත්‍රාත්කරු වැඩබිම අත්හැර දමා තිබුණි. | 2021 | ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණ කර සැලසුම් නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතිය කරගෙන යාමට මුදල් නොමැති නිසා ව්‍යාපෘතිය නතර කරන ලදි. නාගරික ඉංජිනේරුවරයා විසින් සංශෝධිත ව්‍යුහාත්මක සැලැස්ම අනුව නැවත මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා යෝජනාවක් මුදල් කාරක සභාව වෙත ඉදිරිපත් කළ ද රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම තාවකාලිකව නතර වී ඇත. | කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර ඇත. මෙම ජයරජ සිටි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ) කාර්යාලය මගින් විමර්ශනයක් සිදු කරමින් පවතී. |
| (ආ) | නව නගර සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණ කටයුතු | 2021 | ඉඩමේ අයිතිය පවරාගෙන ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණ කර | මේ සම්බන්ධව පැවති බේරුම්කරණ තීරණය බලාත්මක කර ගැනීම සඳහා වූ | මේ සම්බන්ධව පැවති බේරුම්කරණ තීරණය බලාත්මක කර ගැනීම සඳහා වූ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනුවෙන් උපදේශන සේවා සැපයීම සඳහා 2015 ජනවාරි 26 දින රු.36,010,657 කට ගිවිසුම්ගත වී තිබුණු අතර උපදේශක ගාස්තු වෙනුවෙන් රු.26,220,340 ක් ගෙවා තිබුණි. පසුව ඉඩමේ අයිතිය සභාව සතු නොවන බැවින් නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සභාව විසින් අතහැර දමා තිබුණි. අයවිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීමට උපදේශක සමාගම විසින් සභාවට එරෙහිව නඩුවක් පවරා ඇති අතර ඒ සඳහා සභාව විසින් රු.877,887ක්ද වැයකර තිබුණි. තවද මෙම හිඟ මුදල් නොගෙවීම නිසා ඊට අදාල ප්‍රමාද ගාස්තු රු.11,468,913ක්ද ගෙවිය යුතුව පැවතුණි. | | සැලසුම් නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුවේ. | නඩුවේ තීන්දුව අනුව ගෙවීම සිදු කර ඇත. | නඩුවේ තීන්දුව අනුව ගෙවීම සිදු කර ඇත. නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | ජන ජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ 14ක් දීර්ඝ කාලයක සිට හිස්ව පවතින නිසා එමගින් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | 2022 | ජනජය සිටි වෙළඳ සංකීර්ණයේ බදු දී නොමැති කඩ කාමර බදු දීමට උපාය මාර්ග සකස් කළ යුතුය. | එක් කඩයක බදු කරු අදාල යතුරු බාරගෙන ඇතත් කඩය හිස්ව පවතින බැවින් බිල්කිරීමක් සිදු කර නොමැති අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිත වේ. කඩ දෙකක් බදුකරුවන්ට ලබා දි | කඩ බදු දී නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඇත. ඉතිරි කාමර 11 ටෙන්ඩර් කිරීම සඳහා තක්සේරුව ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අය නොවී පවතින වරිපනම් ශේෂය රු.141,865,710ක් විය. | 2023 | අයකර ගත යුතු බදු වට්නාකම් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ වන විට රු.31,383,217ක මුදලක් අයකර ගෙන ඇත. | මේ වන විට හිඟයෙන් සියයට 30ක් අයකරගෙන ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු කඩකුලී ආදායම රු. 35,090,412 ක් වූ අතර වර්ෂයක කාලය ඉක්මවා තිබූ හිඟ කුලී වට්නාකම රු.30,130,251 ක් විය. | 2023 | අයකර ගත යුතු කඩ කුලී ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ කඩකුලී අයකර ගැනීමට මේ දිනවල කටයුතු සිදු කරමින් පවතී. | හිඟ කඩකුලී සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවතී. |
| (ඊ) | සභා බල ප්‍රදේශයේ පිහිටි සිනමා ශාලා දෙකකින් 2019 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති විනෝද බදු ශේෂය රු.2,781,679 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිටද අයකරගෙන නොතිබුණි. | 2023 | අයවිය යුතු ආදායම හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විනෝද බදු සම්බන්ධ ලිපියක් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති අතර ඒ සඳහා විගණිත දිනය තෙක් අනුමැතිය ලැබී නොමැත. | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි හිඟ ආදායම් අත්හැරීම හා විනෝද බදු සම්බන්ධව සභාව විසින් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| (උ) | කොවිඩ් පළමු රැල්ල අවස්ථාවේ සභාව මගින් සිදු කර තිබුණ සහන පදනම මත භාණ්ඩ අලෙවි කිරීමේ හා බෙදා හැරීමේ වැඩසටහන යටතේ | 2023 | පරීක්ෂණ අවසන් වූ වහාම සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ පළාත් පාලන සහකාර කොමසාරිස් | ප්‍රතිඵල අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභාවෙන් විකිණීම සඳහා භාණ්ඩ රැගෙන ගොස් ඇතත් එයින් ලද මුදල් සභා අරමුදලට බැර නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කොරෝනා අත්තිකාරම් ශේෂය රු.1,291,160ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | කාර්යාලය මඟින් පරීක්ෂණ සිදු කරමින් පවතින අතර එහි ප්‍රතිඵල අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | |
| (ඌ) | වැලිකඩ ප්ලාසා වෙළඳ සංකීර්ණය සඳහා 2023 වර්ෂය වෙනුවෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද මාසික කඩ කුලී වාර්තාව අනුව එක් එක් කඩ වලට අදාල නව කඩකුලී අගය දන්වා යවන ලදී. කඩ හිමියන් දක්වා ඇත්තේ ඔවුන් කඩය නැවත බදු දී ලබන ආදායම අඩු වන නිසා නව කඩකුලී තක්සේරුවට එකඟ විය නොහැකි බවය. කෙසේ වෙතත් මෙම කඩ හිමිකරුවන් මාසිකව රු.21,000 ක් වැනි අනවසර ආදායමක් උපයාගනු ලබන බවත් බදු ගිවිසුමේ 18 වන කොන්දේසිය උල්ලංඝනය වී ඇති බවත් නිරීක්ෂණය වූ අතර එම ගිවිසුම | 2023 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කටයුතු කළ යුතුය. | සභාවේ ආදායම් පරීක්ෂක මහතුන් විසින් මේ වන විට වැලිකඩ ප්ලාසා කඩ හිමියන් අතුරු බදු දී ඇත් ද යන්න සමීක්ෂණයක් සිදු කරමින් පවතින අතර ඉන් අනතුරුව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව දන්වා ඇත. | සභාවේ ආදායම් පරීක්ෂක මහතුන් අතුරු බදු දී ඇත් ද යන්න සමීක්ෂණයක් සිදු කරමින් පවතින අතර ඉන් අනතුරුව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරනු ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උල්ලංඝනය කිරීමට එරෙහිව සභාව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | | |
| (ඵ) | වර්ෂ 5ක සිට වර්ෂ 10ක් අතර කාලයක සිට අය නොවී පවතින රු.8,842,794 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022<br>2023 | සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂයන් තවදුරටත් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | මෙම සේවක ණය අයකර ගැනීම සඳහා මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර කමිටු තීරණය මත ඉදිරියේදී කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. |

## 3.3 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 3,565,841,488 | 936,069,584 | 2,629,771,904 | 12,820,662 | තත්ත්වාගණනය කළ |
| **2022** | 4,866,307,593 | 616,211,607 | 4,250,095,986 | 976,156,225 | තත්ත්වාගණනය කළ |
| **2023** | 5,680,595,415 | 484,588,287 | 5,196,007,128 | 810,103,015 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් 1995 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී පැනවූ අධිභාර වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.1,214,417 ක් අය කර ගැනීමට තිබුණි. | 2021 2022 2023 | අධිභාර මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඒ සම්බන්ධව සොයා බලා ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | අය වී නොමැත. |
| (ආ) | 2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතු වෙළඳසැල් 1943 ක් පවතින බව දක්වා තිබුණද වෙළඳසැල් 730 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබූ අතර වෙළඳසැල් 1213 ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සිදු කර | 2021 2022 2023 | බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. | 2022 වර්ෂයේ බලපත්‍ර නොගත් වෙළඳසැල්වලට නඩු පවරා ඇත. | 2023 වර්ෂය සඳහා නඩු පවරා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණි. | | | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තුමේන්තුව අසල, මුහුදුබඩ මාර්ගය දෙපස හා රත්මලාන දිනපතා පොල ඉදිරිපිට යන ස්ථානවල වාහන නැවතුම්පල ගාස්තු අය කිරීමේ ටෙන්ඩර් ලබා ගත් තැනැත්තන් විසින් 2022 දෙසැම්බර් සිට 2023 මාර්තු දක්වා කාලයට අදාළ වාහන නැවතුම්පල ගාස්තු වශයෙන් රු.1,233,582 ක් සභාවට ගෙවා නොතිබුණි. කාර්යසාධන ඇපකර මුදල අඩු කළ විට තවදුරටත් රු.868,582 ක් අයවිය යුතුව පැවතුණි. | 2023 | හිඟ මුදල් අය කර ගත යුතුය. | කාර්යසාධන ඇපකරය අඩු කර ගෙන ඇත. ඉදිරි මුදල් අය කර ගැනීමට නීතිමය පියවර ගැනීමට නියමිතය. | අය වී නොමැත. |
| (ඈ) | පළාත් පාලන දෙපාර්තුමේන්තුව (බස්නාහිර පළාත) විසින් 2002 මැයි 17 දින නිකුත් කළ වීථි ලාම්පු නඩත්තුව, දැල්වීම හා නිවීම යන ලිපියෙහි 02 වන කරුණ ප්‍රකාරව සෑම විදුලි කණුවක්ම නම් කර (අංක කර) යොදනු ලබන විදුලි බල්බය පවා සවිකළ දිනය සොයා ගැනීමට හැකි ගණන් තැබීමේ | 2021<br>2023 | විදුලි කණු අංක කළ යුතුය. | 2024 අයවැය තුළින් විදුලි කණු අංක කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක මුදලක් වෙන් කර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගැනීම සභාවේ වගකීමක් බව දක්වා තිබුණද සහා බල ප්‍රදේශයේ සවි කර ඇති වීථි පහන් කණු හඳුනාගෙන අංක ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින්ගෙන් රු.4,412,457 ක් ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ මූලාශ්‍ර ලේඛන සොයා ගත නොහැකිව පවතී. එම නිසා නිරවුල් කිරීමට කල් ගත වී ඇති අතර මෙ වන විට අභාවිත කමිටුවක් පත් කර තිබේ. | අභාවිත කමිටුව මඟින් ලබා දෙන වාර්තාව ඉදිරි කළමනාකරණ කමිටුවට යොමු කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දින වන විට සභාව සතුව අක්‍රිය තත්ත්වයේ වාහන 22 ක් පැවති අතර ඒවා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | අළුත්වැඩියා කළ හැකි වාහන අළුත්වැඩියා කිරීමට හා අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන හඳුනාගෙන අපහරණය කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතය. | අළුත්වැඩියා කර හෝ අපහරණය කර නොමැත. |
| (උ) | 2023 වර්ෂය අවසානයේ මහා නගර සභාවට අයත් ඉඩම් කට්ටි 206 ක් හඳුනාගෙන තිබුණු අතර එම ඉඩම් වලින් ඔප්පු හෝ හිමිකම් සහතික ලබාගෙන තිබුණේ බිම් කට්ටි 48 ක් සඳහා පමණි. | 2023 | ඉඩම්වලට ඔප්පු/ හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුව මඟින් ගැසට් කරවා එම ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | මේ වන විට රත්මලාන ප්රදේශයේ සභාව නමින් ගැසට් නොකරන ලද ඉඩම් හඳුනාගෙන ඇති අතර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයේ සහය ලබා ගෙන ඇත. |

## 3.4 මොරටුව මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,054,479,592 | 275,401,075 | 779,078,517 | 136,192,585 | තත්වාගණනය කළ |
| **2022** | 1,125,066,850 | 229,309,416 | 895,757,434 | 90,675,820 | තත්වාගණනය කළ |
| **2023** | 1,199,513,690 | 209,357,887 | 990,155,803 | 67,100,827 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 252(1) (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.300,320,232ක් වූ අතර රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 406කින් අයවිය යුතු හිඟය රු.99,053,321ක් විය. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වටිනාකම රු.50,000 ඉක්ම වූ පසු හිඟ පවතින දේපල සංඛ්‍යාව 406 සිට 305 දක්වා අඩු කර ගැනීමට හැකියාව ලැබී ඇත. |
| (ආ) | රජයේ ආයතන 264කින් 2023 දෙසැම්බර් 31 දිනට වරිපනම් ලෙස රු.43,116,235ක් අයවිය යුතුව පැවතුණි. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වාරික වශයෙන් ගෙවීමට අවස්ථාව ලබා දී ඇත. | රජයේ දේපල සඳහා 2024/03 වන කාර්තුවට රු.42,278,760 ක හිඟ මුදලක් අයකර ගත යුතුව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 254 (අ) 1 සහ 2 වන වගන්ති අනුව මහා නගර සභාවට අයවිය යුතු කුලි අයකර ගත යුතු වුවත් දීර්ඝ කාලීන බදු දෙන දේපළ 179කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ශේෂය රු.5,303,156ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය | හිඟ දැනුම් දී ලිපි යැවීම සහ හිඟ මුදල් නොගෙවීම මත කඩ කාමර ආපසු පවරා ගැනීමට කටයුතු කර ඇත. | 2024.06.30 දිනට තව දුරටත් හිඟ ශේෂය රු. 3,800,444 කි. ගරු. ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත 2024.03.31 දිනට කපා හරින ලද මුදල රු. 195,426 ක් විය. |
| (ඈ) | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර 02ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.760,173ක් අයකර ගෙන නොතිබුණි. | 2023 | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පසු පමණක් දීමනා ගෙවීමට කටයුතු කිරීම කරනු ඇත. | 2024.07.31 දිනැතිව අධිභාරකරුවන් සියළුම දෙනා වෙත ලිපි යොමු කරමින් අධිභාරගත මුදල ගෙවීමට කටයුතු කරන ලෙසත් එසේ නැතහොත් අධිභාරගත මුදල අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල කටයුතු කිරීමට සිදුවන බවත් දන්වා යවා ඇත. |
| (ඉ) | වරිපනම් අංශයේ පරිගණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් විසින් මාණ්ඩලික නිලධාරියෙකු සතුව පැවතිය යුතු රහස් මුර පදය (Secret Password) ව්‍යාජ ලෙස භාවිතා කර පොදු මුරපදය (Common Password) | 2021<br>2022<br>2023 | පරීක්ෂණ කඩිනමින් නිම කළ යුතුය. | මේ වන විට සේවය සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් වෙත වෙන් වෙන් වශයෙන් මුරපද ලබා දීමට කටයුතු කර ඇත. | විමර්ශන වාර්තාව හා චෝදනා කෙටුම්පත සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත 2022 දෙසැම්බර් 09 දින යොමු කර ඇත. ඔවුන් පෙන්වා දුන් කරුණු මත වරිපනම් සේවා දායකයකුගේ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10කදී රු.105,893ක් වටිනා බිල්පත් අවලංගුකර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදුකර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලාභය අයකර නොතිබුණි. | | | | ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කරන ලදි. විමර්ශනයට අදාල බිල්පත් වාර්තාවක් නියෝජිත ආයතනය වන ලැන්ඩ් එමෙඩ්සොෆ්ට් වෙතින් ඉල්ලා සිටි අතර මේ තොරතුරු ලද විගස වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ලුනාව තානායම පිහිටා තිබූ සභාව සතු හෙක්ටයාර් 0.7063ක් විශාල ඉඩම රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරය 454) 06 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කිසිදු ගෙවීමකින් තොරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත 2021 දෙසැම්බර් 06 වැනි දින පවරා තිබුණි. ඒ අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් එහි මහල් නිවාස සංකීර්ණයක් ඉදිකර එම නිවාස මහජනතාව වෙත අලෙවිකර තිබුණි. නිවාස 175ක ජනතාව නගර බල ප්‍රදේශයේ පුරවැසියන් වුවද ,මෙම නිවාස සඳහා වරිපනම් තක්සේරු කර අංක ලබා දී වරිපනම් අයකිරීමට | 2023 | වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නාගරික ප්‍රජාව වෙත සැපයිය යුතු සේවාවන් සැපයිය යුතුය. | වන්දි ලබා ගැනීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) වෙත අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කර 2024 ඔක්තෝබර් 10 වන දින ඉදිරිපත් කර ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මේ දක්වා කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නාගරික ප්‍රජාව වෙත සැපයිය යුතු සේවාවන් නගර සභාවෙන් සපයා නොමැති අතර, සභාවට ලැබිය යුතු විශාල වරිපනම් ආදායමක් ද අහිමි වී තිබුණි. | | | | |
| (උ) | සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ රු.11,602,318ක් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | 2021<br>2022<br>2023 | මුදල් රෙගුලාසිය ප්‍රකාරව පරීක්ෂණ කඩිනමින් නිමකර නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | විමර්ෂන අවස්ථාවේ පවතින බව. එකී විමර්ශන කටයුතු සඳහා අදාල ලේඛන අඩංගු ගොනු පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය (බ.ප) වෙත භාරදීම මොරටුව මහා නගර සභාව විසින් 2024 අප්‍රේල් 29 දින සිදු කරනු ලැබ ඇත. | නිර්දේශ ක්‍රියාත්මක වී නොමැත. |
| (ඌ) | 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාද වීම මත රු.1,549,200ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර එම මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් | 2021<br>2022<br>2023 | මුදල් රෙගුලාසිය ප්‍රකාරව පරීක්ෂණ කඩිනමින් නිමකර නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | මේ වන විට ආයතනය සතුව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්වය දරණ සේවකයින් නොමැත. | මුදල් රෙගුලාසි 156 පරිදි සේවා නියුතිකයන්ගේ භාර අරමුදලට වාර්තා හා දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත ගෙවිය යුතු සියළුම මුදල 2006 පෙබරවාරි - 2022 ජූලි දක්වා වාරිකය රු.14,853.96 බැගින් වාරික 78 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | කින් සම්පූර්ණයෙන් ගෙවා ඇත.ඉහත ගෙවීම් සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (එ) | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188(1) උපවගන්තියට අනුව මහා නගර සභා අරමුදල ප්‍රයෝජනයට ගත නොහැකි ආකාරයේ ගනුදෙනුවක් වන සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී සභා අරමුදලින් පිළිවෙලින් රු.953,715 ක් හා රු.1,086,807ක් වශයෙන් එකතුව රු.2,040,522ක් ගෙවීම් කර තිබුණද සභාවට අයවිය යුතු රු.1,703,022 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021<br>2022<br>2023 | සභාවට අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2016 වර්ෂයේ දි සභාව විසුරුවා හරින තෙක් සභිකයින්ගේ මාසික දීමනාවෙන් රක්ෂණාවරණය අයකර ගැනීමට කටයුතු කර ඇත. | අය කරගෙන නොතිබුණි. |

## 3.5 කඩුවෙල මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 4,523,727,042 | 833,789,117 | 3,689,937,925 | 622,069,391 | තත්වාගණනය කළ |
| **2022** | 4,599,480,933 | 751,978,432 | 3,847,502,501 | 243,511,413 | තත්වාගණනය කළ |
| **2023** | 7,008,467,878 | 804,264,256 | 6,204,203,622 | 62,486,268 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය බැංකුවක ජංගම ගිණුම වර්ෂ 05ට වැඩි කාලයක සිට අක්‍රිය තත්වයේ පවතින අතර 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.600,353ක් විය. | 2022 | ශේෂ නිරවුල් කිරීම සම්බන්ධව අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. | මහජන බැංකුව වෙත සිහිකැඳවීම් ලිපි යවා ඇත. 2024.10.04 දිනැතිව මහජන බැංකුව වෙත ලිපියක් යවා බැංකු ගිණුමේ මුදල පිළිබඳ තොරතුරු ලබා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව දැනුම් දී ඇත. | හඳුනානොගත් රු. 14,250ක ගෙවීමක් මේ දක්වා නිරවුල් කර ගැනීම සඳහා පවතින බැවින් එය නිරවුල් කරන තුරු ගිණුම වසා දැමීමට නොහැක. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ කීපයක සිට පැවත එන අය විය යුතු වරිපනම් ශේෂය රු.89,425,049 ක් වී තිබුණි. | 2023 | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බල ප්‍රදේශයේ නිවාස වලට ගොස් මුදල් එකතු කිරීම. ජංගම සේවා පැවැත්වීම. දේපල තහනම් කිරීමේ නිවේදන ලබා දීම කරනු ලබයි. | 2023 වර්ෂයේ වරිපනම් හිඟයෙන් තවදුරටත් රු.720,114,425 ක් අයවීමට ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් වීදුරු නිෂ්පාදන ආයතනයකට සුදු වීදුරු කි.ග්‍රෑ.91300 ක් හා විවිධ වර්ණ සහිත වීදුරු කි.ග්‍රෑ.4260 ක් අලෙවි කර රු. 1,420,620 ක මුදලක් ලබා ගෙන තිබුණද සහා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. ලබා ගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වීදුරු කටු අලෙවි ආදායමෙන් සභා අරමුදලට බැර නොකරන ලද රු. 1,002,425 ක ආදායමක් පැවතිනි. | 2023 | ගනුදෙනුව විනිවිද භාවයෙන් සිදු කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ඒ සම්බන්ධ ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | සභා අරමුදලට ආදායම බැර කර නොමැත. |
| (ඇ) | අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලයේ පරිපාලන අංශය මෙගාසිටි ගොඩනැගිල්ල තුල ස්ථාපනය කිරීම සඳහා 2019 වර්ෂයේ වර්ග අඩි 1300 ක් වූ පරිශ්‍රයක යකඩ කණු මත තහඩු පෘෂ්ඨයක කොන්ක්‍රීට් ස්ලැබ් එකක් දමා ඒ සඳහා රු.3,253,840 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ අතර 2019 දෙසැම්බර් 26 දින එම කොන්ත්‍රාත්තුවේ රඳවුම් මුදල්ද නිදහස් කර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය වන විටත් එහි | 2023 | ඇස්තමේන්තු ප්‍රතිපාදනය අනුව ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කිරීමට වගබලා ගත යුතුය. | උඩු මහලේ බිම් ප්‍රමාණය වැඩිකිරීමට ටෙන්ඩර් කැඳවීමේදී ඇස්තමේන්තු මුදල ඉක්මවා ටෙන්ඩර්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීම හා අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය නතර කර ඇත. | සංවර්ධන කටයුතු සිදු වී නොමැති ගොඩනැගිල්ල නිශ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබූ බැවින් ඉහත ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා තිබූ මුදල නිෂ්කාර්ය වී තිබුණි. | | | | |
| (ඉ) | සභාව විසින් පෙර මිශ්‍රණ අංශයක් පිහිටුවා කාපට් යොදා මාර්ග සංවර්ධනය කිරීම අරමුණු කරගෙන 2017 වර්ෂයේදී රු. 66,612,047 ක් වැයකර මිලදී ගෙන තිබුණු යන්ත්‍ර 06 අතරින් යන්ත්‍ර 2 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2018 වර්ෂයේ ආරම්භ කර තිබූ පෙර මිශ්‍රණ අංශය වෙත යොදවා තිබූ අතර, රු 58,214,750 ක්වූ ඉතිරි යන්ත්‍ර 04 2017 වර්ෂයේ අගෝස්තු 13 දින සිට වසර 06 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව අතුරුගිරිය කාර්යාල පරිශ්‍රයේ රඳවා තබා තිබුණි. | 2023 | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකට අනුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. | ඉතිරි යන්ත්‍ර 04 විකිණීමට එවැනි යන්ත්‍ර ආනයනය කරනු ලබන ආයතන සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව දන්වා ඇත. | නිශ්ක්‍රීයව පවතී. |
| (ඊ) | කඩුවෙල බස් නැවතුම්පොළ පරිශ්‍රයේ උඩුමහලේ කඩ කාමර වලට ප්‍රවේශ වීම සඳහා රු. 3,900,000 ක් වැය කර 2013 නොවැම්බර් මස ස්ථාපනය කර තිබූ විදුලි සෝපානය 2016 වර්ෂයේදී අක්‍රීය වී අවුරුදු 07 ක | 2023 | අවශ්‍යතාව හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැසුම් සකස් කළ යුතුය. | මෙම විදුලි සෝපානයේ පවතින යකඩ හා අනෙකුත් කොටස් සම්බන්ධව පරීක්ෂාකර බලා වටිනාකම තක්සේරු කර යෝජිත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදහස් කරන බව දන්වා | අක්‍රීයව පවතී. |

| | |
|---|---|
| කාලයක් ගත වී තිබුණද, යථා තත්වයට පත් කර නොතිබුණි. 2021 දෙසැම්බර් 09 දිනැති සභා තීරණ අනුව මෙය බස් නැවතුම් පොළ සඳහා ඵලදායී නොවන බවත් ප්‍රධාන කාර්යාලයේ සුදුසු පරිදි ස්ථාන ගත කිරීමට නිර්දේශ කර තිබුණ ද විගණිත දිනය වන විටත් බස් නැවතුම් පොළෙහි අක්‍රීය වත්කමක් ලෙස පැවතුණි. | ඇත. |

## 3.6 ගම්පහ මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 6,843,419,510 | 310,334,300 | 6,533,085,210 | 181,048,126 | තත්වාගණනය කළ |
| **2022** | 7,537,434,850 | 379,505,538 | 7,157,929,312 | 53,423,602 | තත්වාගණනය කළ |
| **2023** | 7,620,129,998 | 219,583,517 | 7,400,546,481 | 111,022,252 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවේ, මහා නගර සභා ආඥා පනතේ 185 සහ 186 වගන්ති සහ බස්නාහිර පළාත් සභාවේ මහා නගර සභා මුල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 25 ට පටහැනිව මහා නගර සභාවට ලැබෙන පරිත්‍යාග බැර කිරීම සඳහා ගම්පහ රාජ්‍ය බැංකුවක වෙනම ගිණුමක් ආරම්භ කර “ නගරධිපති අරමුදල“ නමින් වෙනම අරමුදලක් ස්ථාපිත කර තිබුණි. | 2021 | මහ නගර සභා ආඥා පනතේ 185 වගන්තිය ප්‍රකාරව විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | බැංකු ගිණුමට අදාල තොරතුරු ගින්නෙන් විනාශ වූ බව නගරාධිපතිතුමා විසින් ලිඛිතව දැනුවත්කර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2003 වර්ෂයේදී මඩමවත්ත ගෘහස්ථ අත්පන්දු ක්‍රීඩාංගනය සඳහා සභා අරමුදලින් රු.5,230,606 ක් වැයකර තිබුණද, වැඩ අවසන් කර නොතිබුණු අතර, 2011 වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් මෙම ඉදිකිරීම ප්‍රයෝජනයට ගත නොහැකි බවත් ඇතැම් ඉදිකිරීම් දිරාපත්ව ඇති බවත් වාර්තා කර තිබුණි. එම නිර්දේශය නොසලකා දිරාගිය ඉදිකිරීම් ඉවත්කිරීමකින් තොරව, 2019 සැප්තැම්බර් 30 දින සිට 2020 දෙසැම්බර් 15 දක්වා කාලය තුල කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකර රු.8,840,741 ගෙවීම් කර තිබුණු අතර කසළ හුවමාරු මධ්‍යස්ථානය සංවර්ධනය කර මසක් ගතවූ 2021 ජනවාරි මස 14 දින එම පරිශ්‍රය වොලිබෝල් ක්‍රීඩා පිටියක්, ළමා උද්‍යානයක් හා නාගරික උද්‍යානයක් ආදීන්ගෙන් සමන්විත ව්‍යාපෘතියක් සඳහා ලබාදීමට සභා අනුමැතියකින් තොරව 2021 නොවැම්බර් 05 | 2021 | දිරාගිය ඉදිකිරීම් ඉවත් කිරීම සහ විශාල වියදමක් දරා සකස් කරන ලද කසළ හුවමාරු මධ්‍යස්ථානය, කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කළයුතුය. සංවර්ධන කටයුතු සිදු කිරීමේදී නගර සංවර්ධන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. | කසල අංගනය හා කසල හුවමාරු මධ්‍යස්ථානය මෙම ස්ථානයෙන් ඉවත් කර වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කොට නව ව්‍යාපෘතිය සඳහා භූමිය ලබා දීමට නගර සභාව විසින් එකඟ වී ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දිනැති ගමනස/නාඉ01/04/2021 ලිපිය මගින් නගරාධිපතිවරයා විසින් එකඟ වී තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේ රු.5,230,606 ක මුදලක් වැය කර සිදුකල ඉදිකිරීම් හා 2019 වර්ෂයේ රු. 8,840,741 ක් වැයකර සිදුකරන ලද ඉදිකිරීම් එකතුව වන රු.14,071,341 ක් වූ මුදල සභා අරමුදලින් කරන ලද නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය. | | | | |
| (ඇ) | 2005 සිට 2015 දක්වා සේවය කළ ව්‍යාපෘති සේවකයන් 37 දෙනෙකුට, අර්ථසාධක අරමුදල් පනතේ 10(1) හා 10(2) අනුව සේවකයන්ගෙන් හා සේවායෝජකන්ගෙන් අර්ථසාධක අරමුදලට ගෙවියයුතු පිළිවෙලින් රු.1,432,826 ක් සහ රු.2,149,239 ක් සමග ගෙවීම පැහැරහැරීම හේතුවෙන් අධිභාර මුදල රු.1,791,032 ක් ලෙස එකතු වටිනාකම රු.5,373,097 ක් සභාව විසින් ගෙවියයුතුව තිබුණි. මෙයින් රු.2,742,757 ක් 2022 ජුනි 30 වනවිට සභා | 2021 | වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් මු.රෙ. 156 ට අනුව කටයුතු කළ යුතුය. | ඒ සම්බන්ධයෙන් වගකිව යුතු අයගේ තොරතුරු සනාථ කරගෙන ඒ පිළිබඳව ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව විසින් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට 2022 අගෝස්තු 31 දින වනවිටත් කටයුතුකර නොතිබුණි. තවද මෙම සේවකයින් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල වන රු.1,904,229 කින් රු.648,463 ක් 2022 ජූලි 30 වනවිට ගෙවා තිබුණද, රු.1,255,765 ක් සභාව විසින් ගෙවිය යුතුව තිබුණි. | | | | |
| (ඈ) | සභාව සතු රු.මිලියන 1,597 ක් වටිනා සුසාන භූමි 20 ක් සඳහා හිමිකම් ඔප්පුද. වටිනාකම රු.මිලියන 3,862 ක් වන ඉඩම් 36 ක් සඳහා හිමිකම් ඔප්පු හා පිඹුරුපත් නොතිබුණු අතර, සුසාන භූමි 14 ක් සඳහා මායිම් ලකුණු කර නොතිබුණි. | 2022 | හිමිකම් ඔප්පු හා පිඹුරුපත් සකස්කර මායිම් ලකුණු කළ යුතුය. | මේ වන විට සුසාන භූමි මැනීම් කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ඇ) | ව්‍යාපෘති පදනම යටතේ සේවකයින් 75 ක් අනුමැතියක් නොමැතිව බඳවාගෙන 2020 වර්ෂයේ රු.14,144,245 ක්ද, 2021 වර්ෂයේ රු.15,536,821 ක්ද හා 2022 වර්ෂයේ රු.15,577,694 ක්ද | 2022 | ව්‍යාපෘතීන් සහ ව්‍යාපෘති සේවකයින් අනුමත කර ගත යුතුය. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යවා ඇතත් අඩුපාඩු නිසා එකඟතාවය ලබාදී නොමැත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලෙස ගෙවීම් කර තිබුණි. | | | | |
| (ඉ) | කාල විශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය රු.79,850,570 ක් තුල, වසර 10 ට වැඩි ශේෂය රු.13,667,261 ක්ද, වසර 5 ක සිට වසර 10 ක් අතර ශේෂය රු.23,225,705 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර ශේෂය රු.18,974,512 ක්ද, වසර 1 ක සිට වසර 3 ක් අතර ශේෂය රු.13,281,818 ක්ද, වසර 1 ට අඩු ශේෂය රු.10,701,273 ක්ද විය. | 2023 | හිඟ වරිපනම් ආදායම අයකළ යුතුය. | 2022 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේදී රතු නිවේදන නිකුත් කර ඇත. | මේ වන විට හිඟය රු.33,787,229 ක් විය. |
| (ඊ) | කාල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කඩ කුලී ශේෂය, වසර 5 ක සිට වසර 10 ක් අතර රු.16,758,012 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර රු.4,070,808 ක්ද, වසර 1 ක සිට වසර 3 ක් අතර රු.2,631,000 ක්ද, වසර 1 ට අඩු රු.3,272,696 ක්ද වී තිබුණි. | 2023 | හිඟ වෙළඳ ස්ථාන කුලී ආදායම අයකළ යුතුය. | කොවිඩ් කපා හැරීමද සැලකීමෙන් පසුව අවසන් දිනට හිඟ ශේෂය රු.26,732,516 ක් බව දන්වා ඇත. | බදුකරුවන් වෙත ලිඛිතව දැනුම් දී ඇත. |
| (උ) | සේවය අතහැර ගිය, මියගිය, විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවී ගිය සේවකයන් 46 | 2023 | සේවක ණය ශේෂ අයකළ යුතුය. | සේවය අතහැර ගිය අයගේ ඇපකරුවන් නොමැති බවත්, විශ්‍රාමිකයින් 31 | 2024 ඔක්තෝම්බර් 07 දිනට හිඟ ශේෂය 1,081,848 ක් විය. |

| | |
|---|---|
| දෙනෙකුගෙන් ණය හා අත්තිකාරම් ශේෂය රු.1,729780 ක් හිඟ හිටව පැවතිණි. | දෙනෙකුගේ මුදල් 2024 වර්ෂයේදී ලැබී ඇති බවත්, සේවකයින් 07 දෙනා සඳහා ලිපි යවා ඇති බවත්, විශ්‍රාමිකයන් 22 දෙනෙකුගේ තොරතුරු සොයාගත නොහැකි බව දන්වා ඇත. |

## 3.7 මීගමුව මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,006,379,360 | 377,808,763 | 628,570,597 | 58,059,856 | තත්වාගණනය කළ |
| **2022** | 1,331,413,651 | 487,473,117 | 843,940,534 | 12,401,464 | අහිතකර |
| **2023** | 2,236,242,697 | 807,063,895 | 1,429,178,802 | 204,958,275 | අහිතකර |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල මිලදී ගත් හා පරිත්‍යාග ලෙස ලද රු.16,611,626 ක් වූ වත්කම් 7 ක් විගණිත දින වන විටත් භාවිතයට නොගෙන ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතිණි. | 2022 | වත්කම් මිලදී ගැනීමේදී අවශ්‍යතාවයන් අනුව මිලදී ගත යුතුය. | මෙම යන්ත්‍රෝපකරණ ආයුධ භාරකරු වෙත නිකුත් කිරීමට තීරණය කර ඇත. | යන්ත්‍රෝපකරණ, ආයුධ භාරකරු වෙත ඉන්වෙන්ට්‍රි මඟින් නිකුත් කර ඇතත් භාවිතයට ගනු නොලබයි. |
| (ආ) | දෛනික වෙළඳපොලේ කඩ කාමර 116 ක් බදු දීමේදී මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳව නියෝග 411(iii) අනුව එම කඩ කාමර බදුදීමේදී මහා නගර සභාව හා බදු ගැණුම්කරු අතර විධිමත් පරිදි ගිවිසුම්ගත වීමක් සිදු වී නොතිබුණු බවත්, කඩ බදු ගැණුම්කරු හට | 2023 | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් ගත වීම සම්බන්ධයෙන් තීරණය ගැනීමට සහා තීරණයක් මඟින් නීති නිළධාරි වෙත යොමු කර ඇත. | 2024 සැප්තැම්බර් 30 දිනට හිඟය රු.2,569,403ක් විය. |

වෙළඳාම් කිරීම සඳහා වූ අවසර පත්‍රයක් පමණක් ලබාදී තිබුණු බවත් නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 111කින් හිඟ කඩ කුලී රු.4,020,758 ක් අයවිය යුතුව පැවතිණි.

## 3.8 නුවරඑළිය මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 915,982,511 | 163,982,742 | 751,999,769 | 56,399,455 | තත්ත්වාගණනය කළ |
| **2022** | 996,648,724 | 146,248,214 | 850,400,510 | 61,105,627 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,186,336,153 | 226,466,042 | 959,870,111 | 49,801,252 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2015 ජුලි 14 දිනැති අංක 2015/03 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371 (2) (ආ) සහ එම චක්‍රලේඛයේ 05 ඡේදය අනුව ලබාගන්නා ලද අග්‍රිමය ලබාගත් කාර්යය අවසන්වී දින 10 ක් ඇතුළත හෝ කාර්යය අවසන් වූ වහාම නැවත පියවිය යුතු වුවද, වසර 05 සිට වසර 08 ක කාල පරාසයක සිට මහා නගර සභාවේ විවිධ වැඩසටහන් පැවැත්වීම, මිළදී ගැනීම් හා සුළු මුදල් අත්තිකාරම් ලෙස ලබාගෙන නොපියවූ රු.1,214,500 ක | 2021 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් චෝදනා කෙටුම්පත් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වා ඇත. | පළාත් පාලන සහකර කොමසාරිස් කාර්යාලය මූලික විමර්ශනයක් ආරම්භ කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අත්තිකාරම් ශේෂ 09 ක් පැවතුණි. | | | | |
| (ආ) | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 247 ඉ (1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ පුද්ගලික සමාගම් 04 ක් විසින් වෙන්දේසියේ විකුණන ලද ඉඩම් කොටස් 46 ක විකිණීම මත බදු රු. 5,376,761 ක් අඩුවෙන් අයකර තිබුණි. | 2023 | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අය කර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | අය කර නොමැත. |
| (ඇ) | 2015 ජනවාරි 27 දිනැති අංක 2015/1 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය (අ)වගන්තිය අනුව කටයුතු කර වසර 01 ට වැඩි හිඟ කුලී පවතින නගර සභා බල ප්‍රදේශයේ පිහිටි කඩ 267 කින් රු.42,398,365 කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ ආදායම් අය කළ යුතුය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | අය කර නොමැත. |
| (ඇ) | සභාවට අයත් කඩ කාමරවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ අවසන්වරට කඩකුලී තක්සේරු කර තිබුණද, එම කුලිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් | 2023 | තක්සේරු කුලිය අයකළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුව එක්ව පවතින ගැටළු සාකච්ඡා කර සම්පූර්ණ කරගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | අය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 31 දක්වා අයකිරීමට කටයුතු කර නොකිරීම හේතුවෙන් පරීක්ෂාවට ලක් වූ කඩ 148 කින් වසර 15 ක් තුළ සභා අරමුදලට රු.55,609,875 ක මුදලක් අහිමි වී තිබුණි. | | | | |
| (ඉ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24 (ඇ) හා 24 (ඇ) වගන්ති අනුව 2007 මාර්තු 05 දිනැති අංක 1487/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ III උපලේඛනයේ 03 වන කොන්දේසියට අනුව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියකින් හා නිර්දේශ ලබා ගනිමින් තොරව ග්‍රෙගරි වැවේ IV අදියරේ දී මහා නගර සභාව විසින්ම කොන්ක්‍රීට් ස්ලැබ් යොදා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.3,733,373 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහ නගර සභාවට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණි. | 2023 | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන ඉටු කිරීමට අපේක්ෂිත බව. | අවශ්‍ය පියවර ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | ග්‍රෙගරි වැවෙහි හතරවන අදියරෙහි රු. 17,509,603 ක වියදමින් 2015 වසරේ ඉදිකර ඇති අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් (interlock) මාර්ගය සම්පූර්ණයෙන්ම වල් බිහිවී ඌණ උපයෝජිතව පැවති අතර තැනින් තැන සෝදා පාළුවී ගල් ගැලවී ගොස් තිබුණි. රු. 4,262,224 ක් වැය කර වැවේ 04 වන අදියරේ ඉදිකළ පොදු විදී පහන් කණු සියල්ල විනාශ කර දමා තිබූ අතර ඒවා පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණෙන් ග්‍රෙගරි වැව රාත්‍රී කාලයේ සම්පූර්ණයෙන්ම අඳුරේ පැවතුණි. ග්‍රෙගරි වැවේ අදියර II හා IV ප්‍රදේශවල වැට මායිම් සකස් කර වැව් පිටිය ආරක්ෂා කිරීමට හා අනවසර පිවිසුම් වැළැක්වීමට සහාව පියවර ගෙන නොතිබුණි. | 2023 | ග්‍රෙගරි වැව නිසි ලෙස නඩත්තු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අවශ්‍ය පියවර ගෙන නොමැත. |

## 3.9 මහනුවර මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 4,979,204,917 | 2,281,853,031 | 2,697,351,886 | 60,688,681 | තත්ත්වාගණනය කළ |
| 2022 | 4,804,565,892 | 2,142,685,518 | 2,661,880,374 | 351,459,924 | තත්ත්වාගණනය කළ |
| 2023 | 5,452,192,661 | 2,212,995,688 | 3,239,196,973 | 256,288,872 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව විසින් කුඩා රත්වත්ත මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීමේ දී තෝරාගත් කොන්ත්‍රාත්කරු අදාළ ඉදිකිරීම් සිදු කරන අතරතුර විධිමත් අනුමැතියකින් තොරව සභාවට අයත් එක්සැවේටර් යන්ත්‍රයක් ඉදිකිරීම් කටයුතුවලට යෙදවීමේ දී අනතුරට පත් වී තිබුණි. පසුව මෙම යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට හා මෙම යන්ත්‍රයෙන් ඉටු කළ ගොහාගොඩ කසළ අංගනයේ කසළ හැසිරවීමේ කටයුතු සඳහා කුලියට ගත් යන්ත්‍රය වෙනුවෙන් | 2021 | මෙවැනි කර්මාන්ත නිවැරදි අධීක්ෂණයක් හා නිසි සැලකිල්ලකින් යුතුව ක්‍රියාත්මක කළ යුතු අතර, අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනා ගත යුතුය. | රක්ෂණ භාර අරමුදලින් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් පවත්වා නැත. වර්තමානය වන විට ද රක්ෂණය මඟින් කිසිදු මුදලක් ලැබී නැත. අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.22,044,548 ක මහා නගර සභා අරමුදලින් ගෙවා තිබුණු ද, රක්ෂණය මඟින් හෝ පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ මුදල් අය කර නොතිබුණි. | | | | |
| (ආ) | 2007 වර්ෂයේ දී, ඩී.එස්. සේනානායක මහජන පුස්තකාල ශ්‍රවණාගාරය ගින්නකින් විනාශවීම සම්බන්ධව සිදු කළ මු.රෙ. 104 පරීක්ෂණය ප්‍රකාරව අය කළ යුතු රු.31,250,000 ක මුදල වගකිව යුතු පාර්ශවවලින් අය කර ගෙන නොතිබුණි. | 2022 | මුදල් රෙගුලාසි 104 පරීක්ෂණවලින් නිර්දේශ කළ අලාභ අය කළ යුතුය. | මහා නගර සභා ආඥා පනතේ 254අ(2) වගන්තිය අනුව, මුදල් අය කර ගැනීමේ බලය නාගරික කොමසාරිස් සතු වන බවත්, පළාත් පාලන කොමසාරිස් ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුව දන්වා ඇත. අධිභාර ගෙවන ලෙස දන්වා 2022 සැප්තැම්බර් 19 දිනැති ලිපියෙන් එම නිලධාරීන් වෙත නාගරික කොමසාරිස්ගේ අත්සනින් ලිපි යවන ලද බව. | නඩුවක් පවතින අතර, අලාභ අය කර නොමැත. |
| (ඇ) | මහා නගර සභා පනතේ 266(අ) වගන්තියට අනුකූල නොවී සමාලෝචිත වර්ෂයේ දී, ආදායම් විෂයයන් 06 ක රු.57,538,128 ක හිඟ ගාස්තු කපා හැර තිබුණු ද, ඒ සඳහා මහා සභා අනුමැතිය හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියක් ලබා | 2022 | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පසුගිය වසර කිහිපයකදීම කේවල ශේෂ හා ඉදිරියට ගෙන ආ ශේෂ අතර වෙනස්කම් පවතින බැවින්, ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමේ අරමුණින් ශේෂයන් කපා හැර ඇති බව. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොමැත. |

ගෙන නොතිබුණි.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | 1982 අංක 04 දරන සහ 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධනය වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 28(අ)(3) වගන්තිය අනුව, අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම සඳහා අධිකරණයේ පවරා තිබුණු නඩු කටයුතු 10 කට අදාළව කඩා ඉවත් කිරීමේ නියෝගය ලබා දී තිබුණ ද, වසර 02 ක කාලයක් ගත වී ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අධිකරණ නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 | අධිකරණ නියෝග අනුව කටයුතු කළ යුතුය. | කඩා ඉවත් කර නොමැති බව පිළිගන්නා අතර, පරීක්ෂා කර බලා අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අධිකරණ නියෝග ක්‍රියාත්මක කර නොමැත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.205,363,030 ක් වූ අතර, ඒකකයක හිඟය රු.500,000 ක් ඉක්මවා තිබුණු වරිපනම් ඒකක 30 කින් රු.36,846,801 ක හිඟ හිටි වරිපනම් ශේෂයක් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 256 වගන්තිය ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ වරිපනම් අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | අංක 1249 හා 2002 අගෝස්තු 09 දිනැති ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කරන ලද මහා නගර සභාවේ, අතුරු ව්‍යවස්ථාවේ 13(1) ට අනුව, කටයුතු කර බදු දී තිබුණු ඉඩම් 725 කින් රු.144,543,178 ක බදු කුලී ආදායමක් අය කර නොතිබුණි. | 2023 | හිඟ බදු අය කිරීමට කටයුතු කළ යුතුය. | හිඟ අය කර ගැනීමට කටයුතු කරන අතර, සුදුසු අවස්ථාවල දී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | ඉඩම් බදු දීම හා බදු මුදල් අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොමැත. |
| (උ) | දුම්රිය පොළ පාරේ නව වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ බදුකරුවන් 263 දෙනෙකුට ඉඩකඩ බදු දීමෙන්, 2015 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.24,614,082 ක බදු කුලී අය කර නොතිබුණි. | 2023 | බදු මුදල් කාලීනව අය කර ගත යුතුය. | 2022 වර්ෂයේ දී මුදල් ගෙවීමට කටයුතු කළ ඉඩකඩ හිමියන් 92 දෙනා සඳහා ඉදිරියටත් එම ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා දී ඉතිරි 171 දෙනාගේ හිඟ මුදල කපා හැරීමට සභා තීරණයක් ගෙන ඇති බව. | බදු කුලී අය කර නොමැත. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.184,551,257 ක ජල ආදායම් හිඟයක් පැවැති අතර, ඉන් ඒකකයක හිඟය රු.100,000 ක් ඉක්ම වූ ජල පාරිභෝගිකයින් 179 ක ගෙන් රු.80,653,971 ක් අය කර නොතිබුණි. | 2023 | හිඟ ජල ගාස්තු අය කළ යුතුය. | හිඟ ආදායම් එකතු කිරීම සඳහා විසන්ධි ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරන බව. | හිඟ ජල ආදායම් අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොමැත. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නාගරික අපජල ව්‍යාපෘතිය යටතේ | 2023 | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ජල සම්බන්ධතා විසන්ධි කිරීමට කටයුතු කිරීම තුළින් හිඟ මුදල් අය කර | හිඟ ජල ආදායම් අය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පාරිභෝගිකයින් 4206 කගෙන් වසර 03 ක කාලයකට එකතුව රු.95,525,371 ක හිඟ ගාස්තු අය කර නොතිබුණි. | | | ගැනීමට කටයුතු කරන බව. | |
| (ඒ) | මහනුවර දළදා වීදියේ අංක 74 දරන ස්මයිල් ගොඩනැගිල්ල බාහිර පාර්ශවයකට බදු දී 2015 වර්ෂයේ සිට මේ දක්වා රුපියල් මිලියන 55 ක මුදලක් අය කර නොගැනීම සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව 2023 ජූලි 12 දින නිකුත් කර තිබුණු අතර, එම වාර්තාවේ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ලෙස රුපියල් මිලියන 55 ක මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමත්, එම නිලධාරීන්ට එරෙහිව මූලික විමර්ෂණයක් සිදු කිරීමටත් නියෝග කර තිබුණ ද, එම නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 | පරීක්ෂණ වාර්තාවල නියෝග අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කරන බව. | මූලික විමර්ෂණයේ නියෝග ක්‍රියාත්මක කිරීම හා හිඟ මුදල් අය කර නොමැත. |
| (ඔ) | 2017 වර්ෂයේ දී, මහනුවර සිට කටුගස්තොට දක්වා ප්‍රධාන මාර්ගයට යාබඳව ජල නළ එළීමේ ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා ටෙන්ඩර් ප්‍රදානය කර | 2023 | අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | ආකෘතිය ලැබී ඇතත්, එය විනය බලධරයාගේ අත්සන රහිතව ලැබී ඇති අතර, ඒ පිළිබඳ විමසීමක් 2024.05.29 දිනැතිව යොමු කර ඇති බවත්, රු.1.500,000 මුදල කොන්ත්‍රාත් | 104(4) පරීක්ෂණ විධිමත්ම සිදු කර නොමැත. අලාභ අය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.86,668,189 ක පාඩුවක් හා ජලනළ උපකරණ ආනයනය කර තිබිය දී, මෙම උපකරණ පරීක්ෂා කිරීමට නිලධාරීන්ට විදේශගතවීමට දැරූ වියදම් වෙනුවෙන් රු.1,500,000 ක අක්‍රමිකතාවයක් සිදු කර ඇතත්, මේ සම්බන්ධව මු.රෙ.104(3) හා 104(4) පරීක්ෂණ සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | සමාගම වෙත ගෙවීමට ඇති අවසන් බිල් පතින් අඩු කර ගෙවීම පිළිබඳ ඔවුන් විසින් එකඟව ඇත. මෙම ව්‍යාපෘතිය මහනුවර මහා නගර සභාවට භාර දීමත් අතර යම්කිසි ප්‍රමාදයක් සිදුව ඇති බැවින්, ඒ සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.5,052,673 ක් අවසන් බිල් පතින් කපා හැරීම සම්බන්ධයෙන් ද මාගා ආයතනය එකඟතාවය එල කර ඇති බව. | |
| (ඕ) | මහා නගර සභාව සතු කැප්පෙටිපොළ, බෝගම්බර, මැණික්කුඹුර හා මධ්‍යම පොදු වෙළඳපොළ මස්කඩ, යන වෙළඳ සංකීර්ණවල කඩ 31 කින් කඩ කුලී අයකිරීමකින් තොරව ව්‍යාජ කුවිතාන්සි පත් අංක යොදා කඩ කුලී ලැබුණු බවට කඩ කුලී ලේඛනයේ සටහන් කර 2018 සිට 2023 ජූලි 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු.8,277,600 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. | 2023 | අක්‍රමිකතා සිදු කිරීම අධීක්ෂණය නොකළ නිලධාරීන් හඳුනා ගෙන අහිමි වූ ආදායම අය කිරීමට හා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. | මු.රෙ 104(4) පරීක්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2023 ඔක්තෝබර් 25 දිනැතිව යොමු කර ඇති බව. | විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර අක්‍රමිකතාවයෙන් රු.5,859,856ක මුදලක් අයකර ඇත. |
| (ක) | මහා නගර සභාව සතු මැණික්කුඹුර, කැප්පෙටිපොළ, බෝගම්බර | 2023 | අක්‍රමිකතා සිදු කිරීම අධීක්ෂණය නොකළ නිලධාරීන් | මු.රෙ 104(4) පරීක්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම | විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හා ජෝර්ජ්. ඊ.ද සිල්වා යන වෙළඳ සංකීර්ණ 04 ක කඩ කාමර 18 ක බදු අයිතිය පැවරීමේ දී අය කළ යුතු මුදල අය කළ බවට රිසිට්පත් ව්‍යාජ ලෙස සකස් කර රිසිට්පත් නොමැතිව කඩ පැවරීම හා සෞඛ්‍ය කාරක සභාවේ හා මහා සභාවේ අනුමැතියකින් තොරව කඩ කාමර පැවරීමෙන් ලබා ගත යුතු එක්වන් මුදල් සහා ආදායමට බැර නොකර, එකතුව රු.13,593,790 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ පවත්වා අලාභය අය කර ගැනීමට හා අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | | හඳුනා ගෙන අහිමි වූ ආදායම අය කිරීමට හා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. | පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2024 අප්‍රේල් 22 දිනැතිව යොමු කර ඇති බව. | අක්‍රමිකතාවයෙන් රු.1,919,805ක මුදලක් අයකර ඇත. |
| (ග) | මහා නගර සභාවේ මුදල් භාර නිලධාරිනිය දින 02 කදී දෛනිකව එකතු කළ රු.5,157,042 ක මුදලක් බැංකුගත නොකර අවභාවිතා කර තිබුණි. මේ සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | මුදල් දෛනිකව බැංකුගත කිරීම පරීක්ෂා නොකළ නිලධාරීන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය | මු.රෙ 104(4) පරීක්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2024 පෙබරවාරි 07 දින යොමු කර ඇති බව. | අහිමි වූ ආදායම අය කිරීම හා විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ජ) | මහනුවර මහා නගර සභාව සතු මධ්‍යම වෙළඳ පොළ ඉඩකඩ, ගුඩ්ෂෙඩ් පහල මහල, ගොහාගොඩ, කටුගස්තොට පාර, දුම්රිය පොළ පාර A හා B, දෙයියන්නේවෙල, දංගොල්ල හා අරුප්පල යන වෙළඳ සංකීර්ණවල කඩ කාමරවල කුලී ලේඛනවල කාර්තුවකින් කාර්තුවකට, වර්ෂයෙන් වර්ෂයට, කඩකුලී ලේඛන තුලනය කර, ශේෂයන් ඉදිරියට ගෙනයාමේ දී, ව්‍යාජ සටහන් තබා හා ආදායම බිල් නොකර 2016 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු.1,443,627 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධ මු.රෙ.104(4) පරික්ෂණය පවත්වා අය කිරීම හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | මහා නගර සභාවට සිදු වූ අලාභය අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමටත්, විනයානුකූල පියවර ගැනීමටත් ක්‍රියා කළ යුතුය. | 104(3) පරික්ෂණය සම්පූර්ණ කර 2024.01.12 දිනැතිව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. මූලික විමර්ශනයක් සිදු කරන මෙන් 2023.10.27 දිනැතිව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. මු.රේ.104(4) කමිටුව පත් කර පරික්ෂණ කටයුතු මාසයක් තුළ නිම කරන බව. | අහිමි වූ ආදායම අය කිරීම හා විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ට) | මහා නගර සභාවේ, ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) කම්කරුවකු 2019 අප්‍රේල් 10 දින සිට 2019 අගෝස්තු 08 දින තෙක් මාස 04 ක් | 2023 | නොසැලකිල්ලෙන් කටයුතු කළ නිලධාරීන්ගෙන් මහා නගර සභාවට අහිමි වූ ආදායම අය කිරීමටත්, විනයානුකූලව | මු.රෙ 104(4) පරික්ෂණ සිදු කළ යුත්තේ මධ්‍යම පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බැවින්, ඊට අදාළ මු.රෙ 104(3) සිදු | අහිමි වූ ආදායම අය කිරීම හා විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවය කර සේවය අතහැර ගොස් තිබුණි. මෙම සේවකයාට 2019 අගෝස්තු 08 දින සිට 2023 අගෝස්තු මාසය දක්වා වසර 04 ක කාලයක් වැටුප් ගණනය කර රු.1,792,460 ක මුදලක් ගෙවීම් කර තිබුණි. පඩි ලැයිස්තුවෙහි "ස්ථාන මාරු" ලෙස සටහන් කර තිබියදීත්, වැටුප නතර කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මහා නගර සභා අරමුදලට පාඩුවක් සිදු වී තිබුණි. | | පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. | කර අදාළ වාර්තා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත 2023.10.27 දින යොමු කර ඇති බව. | |
| (ඩ) | මහනුවර මහා නගර සභාව හා මහනුවර හොටල් සමාගම අතර ඇති වූ අංක L 5664 දරන නඩුවේ තීන්දුව ප්‍රකාරව, රැජින හෝටලයේ ඉඩම් කොටස් 03 ක අයිතිය මහා නගර සභාවට හිමි වී තිබුණි. මෙම හෝටල් පරිශ්‍රය 2011 වර්ෂයෙන් පසු තක්සේරු කිරීමට ද කටයුතු කර නොතිබුණු අතර, 2011 වර්ෂයේ තක්සේරු වාර්තාවලට අනුව, ඊට සාපේක්ෂව වැඩිවීම සැලකිල්ලට ගත් විට 1986 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය සඳහා රු.46,395,250 ක | 2023 | බදු මුදල් නොගෙවන්නේ නම්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්, සන්තකය පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය. | රැජිණ හෝටලය විසින් මහනුවර මහා නගර සභාව වෙත ගෙවීමට ඇති හිඟ මුදල අය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, ඉදිරියේ දී හිඟ මුදල අය කිරීමට නැවත ක්‍රියා කරන බවත්, එසේ අය කිරීමට අපොහොසත් වන්නේ නම්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා සන්තකය පවරා ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආදායමක් අය කර ගෙන නොතිබුණි. | | | | |
| (ණ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සභා අරමුදල් රු.5,443,629 ක් වැය කර ඉදිකරමින් පැවතුණ කටුකැලේ ප්‍රජාශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ වැඩ 2020 ඔක්තෝබර් 13 වන දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 13 වන දින වන වැඩ අවසන් කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එහි ඉදිකිරීම් අතහැර දමා තිබුණි. එකතුව වැඩ විෂයය 12 ක ඉටු කර තිබුණු වැඩ ප්‍රමාණයට වඩා වැඩි වැඩ ප්‍රමාණයක් දක්වා රු.1,478,703 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. | 2023 | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ඒම නිලධාරීන් සම්බන්ධ ක්‍රියාමාර්ග ගත යුතුය. | වැඩිපුර ගෙවීම් කල ප්‍රමාණය රු.1,151,993 ක් වන අතර, එම වැඩිපුර ගෙවන ලද මුදල නැවත ලබා දෙන ලෙස කොන්ත්‍රාත්කරුට ලිඛිතව දන්වා ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉටු කරන ලද දොඩම්වල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ හා මෙම කර්මාන්තයේ රැඳවුම් මුදල් වලින් එම මුදල අයකර ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇති බව. | පරීක්ෂණ පවත්වා ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 3.10 දඹුල්ල මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 875,181,034 | 107,656,353 | 767,524,681 | (46,991,093) | අහිතකර |
| **2022** | 976,156,318 | 147,227,095 | 828,929,223 | 13,791,096 | තත්ත්වාගණනය කළ |
| **2023** | 988,551,232 | 144,928,865 | 843,622,367 | 62,387,440 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් මහා නගර සභාවට භාරදෙන ලද කඩ කාමර 73 ක් සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණද, මහා නගර සභාව බාහිර පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | 2021 | බාහිර පාර්ශවය සමඟ නව ගිවිසුම් වලට එළඹිය යුතුය. | ලිපි මඟින් මෙන්ම වාචිකවද, දැනුම්දීම් සිදු කළ අතර බදුකරුවන් සියලු දෙනා ඊට ප්‍රතිචාරයක් නොදැක් වූ අතර අවම වශයෙන් ගිවිසුම් සකස් කිරීමට අදාල ලියවිලි ද,ඉදිරිපත් නොකරන ලදි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ 226(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.227,709 ක වටිනාකමකට වූ අධිභාර 02 ක් පනවා තිබුණි. ඉකුත් වර්ෂයන් තුළ පැනවූ | 2021 | අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | රු.225,065 ක මුදලට අදාළව එක් අධිභාරලාභියෙකු විසින් සහ රු.227,709 ක මුදලට අදාළව තවත් අධිභාරලාභියෙකු විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | අය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධිභාර සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.433,774 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | | | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මැයි 09 දින අරලියගහ මන්දිරේ පැවති ජන හමුවකට සහභාගී වීම සඳහා නගරාධිපති නිල රථය යොදාගෙන තිබුණු අතර මීරිගම අධිවේගී පිවිසුම අසලදී ගිනි ගැනීමට ලක්ව අනතුරට පත්වී තිබුණි. මෙම රථයේ රු. 11,000,000 ක අලාභය සම්බන්ධව සඳහා මු.රෙ.104 (4) වාර්තාවක් සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටද පිළියෙල කර නොතිබුණි. | 2022 | අප්‍රමාදව පරීක්ෂණ කටයුතු සිදුකර මු.රෙ.104(4) වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | මු.රෙ.104(4) පරීක්ෂණ මණ්ඩලයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පත්කිරීමෙන් අනතුරුව අදාළ පරීක්ෂණ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරන බව. | මු.රෙ.104(4) පරීක්ෂණය සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් කමිටුවක් පත් කර ඇත. පරීක්ෂණ වාර්තා මේ දක්වා ලැබී නොමැත. |
| (ඇ) | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රු.20,972,104 ක් වැයකර සවිකර ඇති කසළ දාහකය මිලදීගත් දින සිට වරින් වර අක්‍රිය වීම, යන්ත්‍රයේ නඩත්තු පැය 3000 ඉක්මවා නොතිබියදී, අළුත්වැඩියාවන් සඳහා රු.969,192 ක් ගෙවීම් කර තිබීම, යන්ත්‍රයෙන් පිටවන වායුව වායු විමෝචනයන්ට අනුකූල බවට මධ්‍යම | 2021<br>2022 | වගකීම් කාලය තුළ වත්කම නඩත්තුව හා අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවූ වියදම් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. | අලුත්වැඩියාවන් සිදුකර යන්ත්‍රය මනා ක්‍රියාකාරිත්වයකට පත්කර 2022.06.20 දින ගෙවීම් සිදුකර ඇති බව හා යන්ත්‍රය ඉදිරියේදී කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමවේදයක් සකසමින් පවතී. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පරිසර අධිකාරිය මඟින් තත්ත්ව සහතිකයක් ලබානොගැනීම, කසළ දාහකයේ සියලුම උපාංග පිරිවිතර වලට අනුව ක්‍රියාත්මක වන බව පරික්ෂා කර බලා තහවුරුවක් ඒ සම්බන්ධ දැනුමක් ඇති පාර්ශවයන්ගෙන් ලබානොගැනීම, එකඟ වූ පරිදි සභාවේ එක් නිලධාරියෙකුට විදේශීය පුහුණු අවස්ථා ලබානොදීම හා නඩත්තු වාර 04 සම්පූර්ණ නොකිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු නොකර යන්ත්‍රයට අදාළ රැඳවුම් මුදල රු.1,941,861 ක් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 03 කදී නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට අදාළ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | | | | |
| (ඉ) | දඹුල්ල ප්‍රාදේශිය සභාවෙන් මහා නගර සභාව වෙත භාරදී තිබුණු වාහන 02 ක් හා මහා නගර සභාව විසින් මිලදී ගෙන තිබුණු ට්‍රැක්ටර් ටේලර් 08 ක් හා සභාවට ලැබුණු මුලාශ්‍රය සොයාගත නොහැකි මෝටර් රථයක්ද, | 2023 | ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කරන බව. | ලියාපදිංචි සහතික ඉදිරිපත් කර නොමැත. |

ඇතුලුව වාහන 12 ක් සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව නිකුත් කල ලියාපදිංචි සහතිකය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 3.11 මාතලේ මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 4,244,762,569 | 247,785,187 | 3,996,977,382 | 74,897,187 | අහිතකර |
| **2022** | 4,361,729,681 | 207,576,200 | 4,154,153,481 | 79,574,869 | තත්ත්වාගණනය කළ |
| **2023** | 4,281,160,712 | 168,901,049 | 4,112,259,663 | 111,343,407 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වසර 18 ක පමණ කාලයක සිට හිඟ හිටි රු.4,802,812 ක ජල ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | 2022 | හිඟ ජල ගාස්තු අයකර ගැනීම සිදුකළ යුතුය. | ජල ව්‍යාපෘතිය ජල සම්පාදන මණ්ඩලය වෙත පැවරීමේදී හිඟ හිටි මුදල් පියවා ගැනීමට නොහැකි වූ බව හා එය අයකර ගැනීමට ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. |
| (ආ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහල ත්‍රිමාණ සිනමා ශාලාවක් සඳහා වර්ග අඩි 2000 ක් සඳහා ගිවිසුම්ගත වී බදු දී තිබුණද ගිවිසුම්ගතවී තිබුණ ප්‍රමාණය ඉක්මවා වර්ග අඩි 3972 ක් පරිහරණය කරන බව 2022 නොවැම්බර් 11 දින කරන ලද පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට | 2022 | ගිවිසුම් විධිමත් කිරීමට හා කුලී අය කිරීමට කටයුතු කල යුතුය. | පඩිපෙළෙහි සිට සිනමා ශාලාව වෙත වර්ග අඩි 191 ක ඉදිකිරීමක් සිදුකර ඇත්ද යන්න පිළිබඳව වාර්තා කරන ලෙස නාගරික ඉංජිනේරු වෙත දන්වා ඇති බව. | අනවසර භාවිතයට අදාල මුදල් අයකිරීමක් හෝ නීත්‍යානුකූල කිරීමක් සිදුකර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.3,719,191 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | | | | |
| (ඇ) | 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 (vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අනුමත ඉන්ධන ඩීසල් ලීටර් 135 කට අදාලව ඉන්ධන දීමනාව වැටුපට එකතු කර ලබාදි තිබියදී එම ප්‍රමාණය ඉක්මවා 2021 ජූනි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය තුල අනුමැතියකින් තොරව නාගරික කොමසාරිස්ගේ ගමන් වෙනුවෙන් ඉන්ධන ලීටර් 4120 ක් සඳහා රු.1,042,721 ක මුදලක් ලබාගෙන තිබුණි. | 2023 | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව මෙම ඉන්ධන ලබා ගැනීම සිදු කරන ලද බව. | මුදල් අයකර නොමැත. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් 01 දින සිට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 30 දක්වා කාල සීමාවට අදාලව මහා නගර සභා ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමේදී ආදාහනාගාර ගාස්තු ලෙස නිලධාරීන් විසින් අයකර තිබූ මුදල් සඳහා වෙනත් ආදායම් ලැබීම් වලට අදාල ලේඛන ව්‍යාජ ලෙස දක්වා, ලදුපත් වෙනස් කිරීම, අදාල | 2023 | කඩිනමින් විමර්ශන කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මු.රෙ. 104 (4) පරීක්ෂණයට අනුව මුදල් අයකර ගැනීමට ලිපි යොමුකර ඇති බව. | සිදු වූ ආදායම අහිමි වීම නගර සභා ආදායමට බැරකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බලපත්‍රයේ සටහන් වෙනස් කිරීම, මුදල් ලබාගෙන ලදුපත් නිකුත් නොකිරීම යනාදී වශයෙන් ලේඛන වෙනස් කර එකතු කරන ලද මුදල් රු.620,000 ක ආදායමට බැර නොකර අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | | | | |
| (ඉ) | ගෑස් සැපයුම්කාර ආයතනයකින් වෙනත් ආයතනයකට නිකුත් කල ඉන්වොයිස් පතක් ලබාගෙන එම ඉන්වොයිස් පතේ වටිනාකම රු.92,675 ක් ලෙස වෙනස් කර 2022 දෙසැම්බර් 19 දින 2439 දරන වවුචරයට අමුණා ව්‍යාජ ලෙස ගෑස් ලබා ගැනීමකින් තොරව අත්තිකාරම් පියවා රු.92,675 ක අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | 2023 | කඩිනමින් විමර්ශන කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර අදාළ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | සිදු වූ පාඩුව අහිමි වීම නගර සභා ආදායමට බැර කරගෙන නොතිබුණි. |
| (ඊ) | ආදාහනාගාරයේ පවත්වාගෙන යමින් තිබූ දෛනික ගෑස් ලැබීම් සටහන් කරන ලද කාඩ්පතට අනුව 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කිලෝ ග්‍රෑම් 37.5 ගෑස් සිලින්ඩර් 330 ක් ලබාගෙන තිබුණද, මහා නගර සභාවේ ගෑස් මිලදී ගැනීම් | 2023 | කඩිනමින් විමර්ශන කටයුතු සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය . | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර අදාළ ක්‍රියා මාර්ග ගැනීම සඳහා කටයුතු කරනු ලබනු බව. | තොග ලැබීම් හා නිකුත් කිරීම් සසඳා තිබූ ඌනතාවය පියවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සඳහා වූ ගෙවීම් වවුචර් අනුව 349 ක් මිලදී ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව රු. 285,741 ක් වූ කිලෝ ග්‍රෑම් 37.5 ගෑස් සිලින්ඩර් 19 ක් ආදාහනාගාරයට ලැබී නොතිබුණි. | | | | |
| (උ) | මහා නගර සභාවට අයත් සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු පදනම මත භාහිර පාර්ශවයන්ට ලබාදීමේදී අයකලයුතු හිඟ එක්වන් මුදල රු.452,115 ක් හා රු.4,308,287 ක දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වසර 5 කට වරක් ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නීතිමය පියවර ගැනීම සඳහා අදාළ ලිපි සකස් කර ගණකාධිකාරී නිර්දේශයට යොමු කර ඇති අතර නිර්දේශ ලද වහාම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟය පියවාගෙන නොමැත. |

## 3.12 ගාල්ල මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,822,574,805 | 380,091,536 | 1,442,483,269 | 215,983,993 | අහිතකර |
| **2022** | 1,509,244,704 | 327,247,053 | 1,181,997,651 | 52,679,076 | අහිතකර |
| **2023** | 1,699,450,366 | 383,311,376 | 1,316,138,990 | 52,577,206 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වර්ෂ 05 කට වරක් තක්සේරුව යාවත්කාලීන විය යුතු වුවද, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය 2013 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේ දී ද ආදායම් අයකර තිබුණි. | 2023 | නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | භූමි ප්‍රමාණ නිර්ණය කිරීමෙන් අනතුරුව කඩිනමින් තක්සේරු වාර්තාවක් ලබා ගන්නා බව. | තක්සේරු කර නොතිබුණි. |
| (ආ) | නාගරික නව මාළු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 30 ක් තක්සේරු කර සභාව වෙත දන්වා තිබුණ ද, බදු දීමේ කටයුතු සිදු කර නොතිබූ බැවින් සභාවට රු.7,004,400 ක ආදායමක් අහිමි වී තිබුණි. | 2023 | සභාව සතු වත්කම්වලින් කඩිනමින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට නියමිත බව. | බදු දී නොමැත. |
| (ඇ) | සියඹලාගහවත්ත නාගරික නිවාස 10 කට අදාළව රු.800,610 ක හිඟ | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක වෙත ලිපි යොමුකර | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ශේෂයක් වූ අතර, වසර 07 ත් 17 ත් අතර කාලයක සිට කිසිදු බදු මුදලක් අදාළ පාර්ශවය විසින් සභාව වෙත ගෙවීම් සිදුකර නොතිබුණි. | | | ඇති බව. | |
| (ඇ) | 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.994,900 ක් වටිනා ලැප්ටොප් 11 ක් හා රු.395,991 ක් වටිනා ටැබ් 09 ක් සභිකයින්ට ලබාදී තිබුණද නැවත භාරදී නොතිබුණි. | 2023 | සභාව සතු වත්කම් කළමනාකරණය සිදුකළ යුතුය. | පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව. |

## 3.13 මාතර මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,246,585,664 | 393,845,477 | 852,740,187 | 142,443,317 | අහිතකර |
| **2022** | 1,270,615,806 | 301,694,804 | 968,921,002 | 162,479,763 | අහිතකර |
| **2023** | 1,323,832,418 | 225,219,818 | 1,098,612,600 | 143,093,918 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වල්ගම පොදු වෙළෙඳපොල කඩ කාමර සංකීර්ණ ගොඩනැගිල්ල මහජනයාට ප්‍රදර්ශනය වන ආකාරයට සැලසුම් කර නොතිබීම නිසා මහජනතාව වෙළෙඳපලට පැමිණීම ඉතා දුර්වල මට්ටමක පැවතීම හේතු කරගෙන කඩ කාමර හා කඩ අල්ලි ලබා ගෙන තිබූ වෙළෙඳුන් 13 දෙනෙකු විසින් කරන ලද තැන්පතු මුදල්, එක්වන් මුදල් හා මාසික කඩ කුලී මුදල් වූ රු. 2,858,410 ක් ආපසු බදුකරුවන්ට ගෙවීමට සභාවට සිදුව තිබුණි. | 2023 | සභාව සතු දේපළවලින් ආදායම් ඉපයීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. | සැලසුමේ අසාර්ථකත්වය මත කඩ කාමර වැසී යාමෙන්, වසා තිබූ කාලයට අදාළව බිල් කරන ලද කඩ කුලී හා එක්වන් මුදල් ආපසු ගෙවන ලද බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකුව විසින් නාගරික අංශ ව්‍යාපෘතිය යටතේ මාතර මහා නගර | 2023 | බාහිර වගකීම් කඩිනමින් නිරවුල් කළ යුතුය. | පැහැදිලි පිළිතුරක් ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභාවට ලබා දී තිබූ රුපියල් මිලියන 154.194 ක ණය මුදල හා හිඟ පොලිය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඈ) | එක්තරා ටෙලිකොම් සමාගමක් විසින් සභාව සතු මැද්දවත්ත එළියකන්ද බ්‍රවුන්ස්හීල්හි පිහිටි සරත් සේදර මාවත කේබල් එලීම සඳහා පලුදු කර තිබූ අතර අදාල සමාගමෙන් පසුගිය වර්ෂයේ දෙසැම්බර් 20 දින රු.3,081,668 ක් සභාවට අයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මාර්ගය අලුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. | 2022 | කඩිනමින් මාර්ග අලුත්වැඩියා කටයුතු සිදු කළයුතුය. | මාර්ගය පිළිසකර කිරීමට අදාළ ඇස්තමේන්තුවක් සකසා මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇති බවත්, අනුමැතිය ලැබුණු පසු මාර්ගය අළුත්වැඩියා කිරීමට බලාපොරොත්තු වන බව. | අලුත්වැඩියා කර නොමැත. |

## 3.14 හම්බන්තොට මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 185,701,034 | 37,549,168 | 148,151,866 | 6,676,131 | තත්ත්වාගණනය කළ |
| **2022** | 209,896,895 | 31,329,548 | 178,567,347 | 13,236,376 | තත්ත්වාගණනය කළ |
| **2023** | 247,366,894 | 40,021,092 | 207,345,802 | 24,248,352 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2021 ජූලි 28 දිනැති අංක 2238/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සාදන ලද නව නියෝග හා රෙගුලාසි වල අංක 30 දරණ රෙගුලාසියේ 05 ඡේදය ප්‍රකාරව වර්ග මීටර් 35 ත් 9393 ත් අතර වූ ව්‍යාපාරික හා නේවාසික අනවසර ඉදිකිරීම් 05 ක් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | 2021 | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කල යුතුය. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපදෙස් ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියට දන්වා ඇත. | ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (ආ) | 1997 වර්ෂයේදී බදු දී තිබූ සභාවට අයත් තිස්ස පාර ඉඩම් 10 ක් සඳහා අයකළ යුතු කුලිය 2016 අප්‍රේල් 12 දිනැති තක්සේරු වාර්තාව පරිදි බදු කුලී අය කිරීමට අනුමැතිය ලැබී තිබියදී, මාසික බදු කුලිය ලෙස රු.165 | 2022 | තක්සේරු වාර්තාව පරිදි කුලී අයකළ යුතු අතර කුලී නොගෙවයි නම් බදු කොන්දේසි අනුව කටයුතු කළයුතුය. | මෙම තක්සේරු මුදල අය කර ගැනීම සඳහා බදුකරුවන් අඛණ්ඩව ලිඛිතව දැනුවත් කරමින් හා සාකච්ඡා ක්‍රියාමාර්ගයකට යමින් දැඩි ප්‍රයත්නයක් ගෙන ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

ක් අයකිරීම මත 2016 අප්‍රේල් 27 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා සභා අරමුදලට වූ පාඩුව රු.5,508,000 ක් විය. එසේම බදු කොන්දේසි කඩ කරමින් මෙම ඉඩම් තුල සාදා ඇති ගොඩනැගිලි බදු ගැනුම්කරුවන් විසින් අතුරු බදුදී මාසිකව රු.15,000 හා රු.150,000 අතර ආදායමක් අවිධිමත්ව උපයාගෙන තිබුණි.

**3.15 අක්කරෙයිපත්තු මහා නගර සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 668,982,148 | 15,400,224 | 653,581,924 | (322,737) | තත්ත්වාගණනය කළ |
| **2022** | 752,162,008 | 12,340,403 | 739,821,605 | 22,325,733 | තත්ත්වාගණනය කළ |
| **2023** | 824,330,502 | 20,118,334 | 804,212,168 | 32,126,681 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති දේපළ බදු රු.67,375,845 ක් වූ අතර එයින් රු. 55,839,877 ක මුදලක් වසර 01 සිට 08 දක්වා කාලයක සිට හිඟව පැවතුණි. | 2022 2023 | අයවිය යුතු හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය. | ආදායම් පරීක්ෂකවරුන් නොමැතිකම හේතුවෙන් ලැයිස්තුගත ආදායම් හිඟ නොමැතිව අයකිරීමට නොහැකි වන අතර, ඉදිරියේදී ආදායම් එකතුකිරීමේ නිලධාරීන් පත්කර හිඟ අයකර ගැනීමට පියවර ගන්නා බව. | හිඟ මුදල් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2011 වර්ෂයේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සේවකයෙකුට සහ ප්‍රජාශාලා මධ්‍යස්ථානයක නිලධාරියෙකුට ලබා දී තිබූ රු. 106,003 ක අත්තිකාරම් 02 ක් අයකිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | අත්තිකාරම් ලෙස ගෙවූ මුදල අයකිරීමට කඩිනමින් පියවර ගත යුතුය. | අදාළ ශේෂයන් කපා හැරීමට මූලික කටයුතු සිදු කර ඇති බව. | අදාළ පුද්ගලයාගෙන් හෝ ප්‍රජා මධ්‍යස්ථානයෙන් අත්තිකාරම් මුදල් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | කඩකාමර කුලි මුදල කාලීනව තක්සේරු නොකර 2011 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව මාසිකව රු. 1,000 සිට රු. 5,250 දක්වා වන පරාසයකට කඩකාමර කුලියට ලබා දීම නිසා දළ වශයෙන් රු. 10,000,000ක ආදායම වාර්ෂිකව සභාවට අහිමි වෙමින් පැවතුණි. | 2023 | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව, කුලිය කාලීනව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. | තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉලිලීම් කර ඇති බව. | කුලිය තක්සේරු කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ විද්‍යුත් පුස්තකාලයක් වශයෙන් රු. 2,848,078ක වියදමින් මහජන පුස්තකාලය 2022 වර්ෂයේ පිහිටුවා තිබුණ ද මෙය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග, සේවර්, තීරු කේත කියවනය සහ තීරු කේත මුද්‍රණ යන්ත්‍රය වැනි විද්‍යුත් උපකරණ පහසුකම් නොමැතිකම හේතුවෙන් මෙම ක්‍රියාවලිය අත්හැර දමා තිබුණි. | 2022<br>2023 | විද්‍යුත් පුස්තකාලයේ අරමුණ ළඟාකරගත හැකි අයුරින් ඉතා කඩිනමින් කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ විද්‍යුත් පුස්තකාලය සඳහා යටිතල පහසුකම් සහ පරිගණක පහසුකම් පමණක් ලබා දී තිබුණි. අනෙකුත් උපකරණ සහ මෘදුකාංග මහා නගර සභා අරමුදලින් මිලදී ගැනීමට සිදුවී තිබුණ බව. | විද්‍යුත් පුස්තකාලයේ අරමුණ ඉටුකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ වෙළඳසැල් ඇති කිරීමට භාණ්ඩ බහාලුම් 03 ක් රු. 5,910,000 කට මිලදී ගෙන තිබුණද මෙම වෙළෙඳසැල්වල සාමාන්‍ය පාරිභෝගික | 2023 | කඩිනමින් අවශ්‍යතා සම්පූර්ණ කර කුලියට ලබා දීමට කටයුතු කළ යුතුය. | භාණ්ඩ බහාලුම් වෙළඳසැල් මිල කැඳවා ලබාදීමට පියවර ගෙන තිබුණද, පෙන්වා දී ඇති අඩුපාඩු සපුරාලීමට 2024 දී ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ | කඩ සාප්පුවල අරමුණ ඉටුකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මූලික පහසුකම් සළසා ලබාදීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන බව. |

## 3.16 කල්මුණේ මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 660,637,449 | 64,494,491 | 596,142,958 | 5,123,295 | තත්ත්වාගණනය කළ |
| **2022** | 762,190,524 | 46,631,380 | 715,559,144 | 59,202,514 | ව්‍යාචනය කළ |
| **2023** | 994,838,729 | 58,201,744 | 936,636,985 | 57,284,725 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ කල්මුණේ පොදු වෙළෙඳපොල සහ මාළු වෙළෙඳපොල බදුදීමෙන් බදු ලබාගත් පුද්ගලයෙකු විසින් සමුපකාර ග්‍රාමීය බැංකුවෙන් රු.5,600,000ක ඇප සුරක්ෂණයක් ඉදිරිපත් කර තිබුණි. මෙම ඇප සුරක්ෂණය ව්‍යාජ ලෙස සකස් කර තිබුණේ වුවද, එය සභාව විසින් පරික්ෂා නොකර පිළිගැනීම නිසා 2024 සැප්තැම්බර් 13 දින දක්වා රු.4,770,100ක් අයනොකර හිඟහිටිව පැවැති නමුත් මේ පිළිබඳව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2022<br>2023 | ආදායම් හිඟ හිටි සියළු පාර්ශවවලින් අයකර ගැනීමට පියවර ගත යුතුය. | මෙම දෝෂය නිවැරදි කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | මියගිය, විශ්‍රාම ගිය සහ සේවයෙන් ඉවත්ව ගිය සභාවේ නිලධාරින් 03කගෙන් අයවිය යුතු එකතුව රු.192,650ක හිඟණය එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2023 | හිඟණය එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගතයුතුය. | මියගිය නිලධාරියාගේ හිඟණය පාරිතෝෂිතයෙන්ද අනෙකුත් නිලධාරින්ගේ හිඟණය ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගන්නා බව. | නිලධාරීන්ගේ ණය අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මහා නගර සභාවේ භාවිතයේ පවතින වාහන 05ක් දීර්ඝකාලයක් පුද්ගලික වාහන අළුත්වැඩියා ගරාජයන්හි නවතා තබා තිබූ නමුත්, ඒවා අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට 2024 ඔක්තෝබර් 07 විගණන දින වන විටත් පියවර ගෙන නොතිබුණි. | 2023 | අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර ගතයුතුය. | මේ සම්බන්ධයෙන් වර්තමානයේ කමිටුවක් ස්ථාපිත කර අළුත්වැඩියාට සහ අපහරණය කිරීමටත් කටයුතු කරමින් පවතින බව. | අලුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මහා නගර සභාවේ භාවිතයේ පවතින වෙනත් ආයතනවල නමින් ඇති වාහන 13ක අයිතිය මහානගර සභාවේ නමට පවරා ගැනීමට වර්ෂ 05කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | 2022<br>2023 | වාහනවල හිමිකාරිත්වය මාරුකර ගැනීමට පියවර ගතයුතුය. | ඉදිරිකාලයේදී පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | අයිතිය පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | මහා නගර සභාව විසින් ආදායම් රැස්කිරීම සඳහා 2020 ජනවාරි 01 දින සිට භාවිතා කර තිබූ පරිගනකගත මෘදුකාංගය අනුමත ආයතනයකින් මිලදී | 2022<br>2023 | එම මෘදුකාංගය අනුමත ආයතනයකින් මිලදී ගෙන, වගකිව යුතු සුදුසුකම්ලත් නිලධාරීන් යොදවා, | මූල්‍ය අංශයේ සිදු වූ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග | මෙම විශේෂ කාරණය සම්බන්ධයෙන් මේ වන තෙක් පියවර ගෙන නොතිබුණි. |

ගෙන නොතිබූ අතර, වගකිව යුතු සුදුසු නිලධාරීන් නොයෙදවීම, ලේඛන පවත්වාගෙන නොයෑම, විධිමත් සුපරීක්ෂාවක් නොමැතිවීම, උසස් නිලධාරීන් විසින් සහතික නොකිරීම, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණනයක් සිදු නොවීම වැනි හේතූන් නිසා දෛනිකව අයකළ ආදායම් සම්පූර්ණයෙන් මහානගර සභාවේ ගිණුම්වලට තැන්පත් නොවී පැවැති අතර, මේ පිළිබඳව නැගෙනහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකය විසින් සිදුකළ පරීක්ෂාවේදී ආදායම් මූලාශ්‍ර 09කින් අයකර තිබූ රු.18,094,795ක් පමණ වූ මුදලක් තැන්පත් නොකර වංචා කර තිබුණි.

විධිමත්ව ලේඛන පවත්වා ගතයුතු අතර, වංචාවට ඉඩ ප්‍රස්ථා සැලසූ පාර්ශවයන්ට විනය ක්‍රියාමාර්ග ගෙන මෙම පාඩුව ඔවුන්ගෙන් අයකර ගැනීමට පියවර ගතයුතුය.

වෙමින් පවතී. මෙම නඩුව අවසන් වූ පසුව මේ පිළිබඳ තොරතුරු ඔබ වෙත දැනුම් දෙනු ලබන බව.

## 3.17 මඩකලපුව මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 1,162,829,000 | 75,262,000 | 1,087,567,000 | 153,674,005 | තත්ත්වාගණනය කළ |
| 2022 | 1,142,310,004 | 111,015,418 | 1,031,294,586 | 156,875,725 | තත්ත්වාගණනය කළ |
| 2023 | 1,196,612,379 | 149,408,908 | 1,047,203,471 | 178,416,549 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 - 110 දක්වා නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ කාර්යාලයට ගින්නෙන් වූ අනතුර හේතුවෙන් රු.800,000ක්වූ PABX System ඇතුළු හානියට පත් ගෘහභාණ්ඩ හා අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිලි කිරීම හැර මුදල් රෙගුලාසි ප්‍රකාර කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩු පිළිබඳ විමර්ශන කටයුතු සිදුකළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාට දැනුම්දී විමර්ශනය සිදුකර වාර්තා ලබාගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 2014 දෙසැම්බර් 26 දිනැති අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2023 | වාහන රක්ෂණය කිරීමට පියවර ගතයුතු වේ. | වාහන ලියාපදිංචි පොත් ලබාගෙන රක්ෂණය කිරීමට පියවර ගනු ලබන | පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභාව සතු වාහන 22ක් රක්ෂණය කර නොතිබුණි. | | | බව. | |
| (ඈ) | හිඟහිටි වරිපනම් ලෙස රාජ්‍ය අංශයේ ආයතනවලින් එකතුව රු.2,142,428ක් වර්ෂ 03කට අධික කාලයක සිට පැවැති අතර මේවා අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | 2023 | හිඟහිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. | වැඩිපුර හිඟ ශේෂයන් පවතින දුම්රිය දෙපාර්තමේන්තුව සහ ධීවර දෙපාර්තමේන්තු වෙත ලිපි යවා ඇති බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | 2022 දෙසැම්බර් 23 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක SEC/2022/03 දරන චක්‍රලේඛයට අනනුකූලව, සභාව විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කළ ස්ථාවර තැන්පතුවල පොලී ආදායමින් සමාලෝචිත වර්ෂයේ රු.4,854,181ක රඳවා තැබීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු වේ. | කඩිනමින් අයකිරිමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඉ) | මහා නගර සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම් කට්ටි කර විකිණීමේදී සභාව වෙත පවරන ලද පර්චර් 97 ක ඉඩම් කැබලි පහක් හිටපු කොමසාරිස් විසින් තමාගේ සහ තම | 2023 | සභාව සතු ඉඩම් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ පිළිබඳව විනය බලධාරියා වෙත වාර්ථා කළ යුතුය. | මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙත අංක BC/1829/2015 මගින් පැමිණිලි කර කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු සිදු කර | කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | භාර්යාවගේ නමට 2003 සිට 2006 දක්වා කාලය තුළ මාරු කර තිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වර්තාවේ සඳහන් කළද, සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | අවසන් බව. | |
| (ඊ) | මහා නගර සභා ආඥා පනතේ (අධිකාරය 252) වගන්තිය 37(අ) සිහිවටන ස්මාරක හෝ පිළිමයන් ඉදි කිරීමට ප්‍රථම අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ පිළිම 05 ක් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2022 | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (උ) | 2000 වර්ෂයේ අංක 56 දරණ පනතෙන් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික ආරක්ෂක පනත අනුව තිරුප්පෙරුම්තුරෛ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබා ගෙන නොතිබුණි. | 2022 | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (ඌ) | ජීව වායු සැකැසීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 02ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත | 2021 | ජීව වායු සැකැසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට | ජීව වායු සැකැසීමේ ව්‍යාපෘතියට බෙදාහැරීමේ බහාලුම්වල | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය අවසාන වන විටත් ජීව වායූ නිෂ්පාදනය හා භාවිතය සඳහා සභාව විසින් විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි. | ඵලදායි පියවර ගත යුතුය. | පිරවීමේ තාක්ෂණික පහසුකම් නොමැති නිසා ක්‍රියාත්මක කළ නොහැකිව පවතී. | |
| (එ) | 2017 අංක 19 දරන 2021 තිරසාර සංර්වධන පනත ප්‍රකාරව මහනගර සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංර්වධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංර්වධන අරමුණු හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | 2030 ර්වෂයේ ළඟාකරගත යුතු පත්‍රය සඳහා සංර්වධන න්‍යාය පිළිබඳව මැනීම ර්දශකයන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

## 3.18 අනුරාධපුර මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 14,079,040,470 | 249,199,125 | 13,829,841,345 | 46,807,370 | තත්ත්වාගණනය කළ |
| 2022 | 14,107,450,672 | 174,503,833 | 13,932,946,839 | 34,570,337 | තත්ත්වාගණනය කළ |
| 2023 | 14,361,385,264 | 256,353,738 | 14,105,031,526 | 108,130,062 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.3.1 සහ 7.2 වගන්ති ප්‍රකාරව 2016 ජුනි 21 දින සිට ස්ථානමාරුවීගිය හිටපු නාගරික කොමසාරිස්වරයා නිල නිවස භාරදී නොමැති අතර ඔහු එම නිවසේ පදිංචි වීම වෙනුවෙන් 2009 නොවැම්බර් සිට 2016 ජුනි දක්වා රු.201,017 ක්ද 2020 ජනවාරි 01 සිට 2022 මාර්තු දක්වා රු228,033 ක්ද නිවාස කුලී ලෙස අයවී නොතිබුණු අතර නිල නිවසේ අනුමැතියක් රහිතව රැදී සිටි (2016 ජුලි සිට 2022 මාර්තු දක්වා) කාලයට රු.376,643 ක දණ්ඩන | 2021 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.3.1 සහ 7.2 වගන්ති අනුව කුලී සහ දණ්ඩන කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | කුලී සහ දණ්ඩන කුලී අයකරගෙන නොමැත. නිල නිවස මේ වනවිට ආපසු භාරදී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කුලීද අයකරගෙන නොතිබුණි. මේ සම්බන්ධව 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ කටයුතු කිරීමද සිදුකර නොතිබුණි. | | | | |
| (ආ) | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.88,745,571 ක හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252(i)(අ) වගන්තිය ප්‍රකාරව නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | 2023 | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බල ප්‍රදේශයේ දේපළ තහනම් කිරීමේ නිවේදන 926 ක් නිකුත් කර ඇති අතර, ඒ අනුව සැලකිය යුතු හිඟ මුදලක් අයකරගෙන ඇත. | හිඟ මුදල් අයවිය යුතුව ඇත. |
| (ඇ) | මහා නගර සභාව සතු කඩ කාමර 511 කට අදාළ වසර 01 ත් 08 ත් කාලයක සිට පවතින හිඟ කුලී රු.66,719,780 ක් සහ පොදු වෙළෙඳ සැල කඩ කාමර 210 ක් වෙනුවෙන් අයවිය යුතු කුලී රු.8,821,505 ක් වසර 01 ත් 08 ත් අතර කාලයක සිට අයවී නොතිබුණි. | 2023 | හිඟ කුලී අයකරගත යුතුය. | හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා අවසන් නිවේදන 28 ක් වාස බද්ධ නිවේදන 20 ක් හා විනිශ්‍රහන බලපත්‍ර 09 ක් නිකුත් කර ඇත. | හිඟ මුදල් අයවිය යුතුව ඇත. |
| (ඈ) | වත්කම් බදුදීම වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.1,967,718 ක් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි. | 2023 | වත්කම් බදුදීම් හිඟ කුලී අයකරගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ මුදල් අයවිය යුතුව ඇත. |
| (ඉ) | සභාවේ සභිකවරියක් භාරයේ පැවති වටිනාකම රු.94,500 | 2022 | අලාභය අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. | නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමුකර ඇත. | එසේම පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් වූ පොත් කට්ටල 88 ක් විනාශ වී තිබුණු නමුත් එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඊ) | මහා නගර සභාවට අදාළව ඉකුත් වර්ෂවලදී සිදුවී තිබුණු රු.56,425,174 ක වංචා හා පාඩු වෙනුවෙන් විනය පරීක්ෂණ හා අවශ්‍ය නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | 2023 | විනය පරීක්ෂණ පවත්වා එම නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | මෙයට ඇතුළත් කාරණා 02 ක් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පවත්වා විනය නියෝග ක්‍රියාත්මක කර ඇත. ඉතිරි කාරණා සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | එසේම පවතී. |
| (උ) | කිරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය 2014 සැප්තැම්බර් 18 දින ගිණි ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් මු.රෙ. 104 අනුව පවත්වා රුපියල් මිලියන 3.3 ක් වූ අලාභයට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 | මු.රෙ. 104 අනුව පරීක්ෂණ කඩිනමින් නිමකර එම නිර්දේශ අනුව කටයුතු කළ යුතු ය. | විමර්ශන වාර්තා නිර්දේශ කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් අනුමැතිය හෝ විධිමත් විනය නියෝගයක් ලබාදී නොමැත. | අවසන් විමර්ශන වාර්තා නිර්දේශ ලබාදී නොමැති බැවින් අයකිරීමක් සිදුකර නොමැත. |
| (ඌ) | මහා නගර සභාවේ සේවය කර 2013 වර්ෂයේදී වෙනත් ආයතනයකට ස්ථානමාරුවී ගොස් තිබුණු සේවකයෙකුට ස්ථානමාරුවී ගිය දින සිට 2018 ජූනි මස දක්වා කාලපරිච්ඡේදය | 2021 | මූලික විමර්ශන වාර්තාවලින් තහවුරු වූ මූල්‍යමය අලාභය අදාළ පාර්ශවයන්ගෙන් හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ | මීට අදාළ විනය පරීක්ෂණ අවසන් වූ පසු විනය නියෝග අනුව ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ඉදිරි කටයුතු සිදුකරනු ඇත. | අයකරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනුවෙන් වැටුප් සහ දීමනා ලෙස රු.1,816,557 ක ගෙවීම් කර තිබීම නිසා සභා අරමුදලට සිදුවී තිබුණු මූල්‍යමය අලාභය මූලික විමර්ශන වාර්තාවලින් ද තහවුරු වී තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | යුතුවේ. | | |
| (එ) | අනුරාධපුර මහා නගර සභාවට අයත් නිල නිවාසයකින් සභාවට අයවිය යුතු හිඟ කුලී රු.11,231,838 ක් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | හිඟ කුලී අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවරගත යුතුය. | මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා සමඟ සාකච්ඡා කර ඉදිරියේදී තීරණ ගැනීමට කටයුතු කරන බව. | එසේම පවතී. |

## 3.19 පොළොන්නරුව මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,685,234,487 | 257,259,525 | 2,427,974,962 | (12,003,474) | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,573,319,282 | 153,337,610 | 2,419,981,672 | (29,640,177) | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,665,541,838 | 142,923,551 | 2,522,618,287 | 712,752 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කසල ගාස්තු ආදායම රු. 10,943,500 ක් විය. | 2023 | හිඟ ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ කසල ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අය වී නොමැත. |
| (ආ) | 2021 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ආරම්භ කරන ලද රු.42,091,260 ක ගිවිසුම් වටිනාකමක් සහිත ව්‍යාපෘති 08 ක් මුදල් නොලැබීම හේතුවෙන් අතරමඟ නවතා දමා තිබුණි. එම ව්‍යාපෘති සඳහා විගණිත දින වන විට රු.6,793,428 ක මුදලක් ගෙවීම් කර තිබුණද, එම වැඩ අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් එම මුදල් නිශ්කාර්ය | 2022 | ව්‍යාපෘති සඳහා වැයකරන ලද මුදල් නිෂ්කාර්ය නොවීමට කටයුතු කළ යුතුය. | එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් ප්‍රතිපාදන ලැබී ඇති බැවින් එම ව්‍යාපෘතිය සඳහා ලංසු ලියවිලි නිකුත් කරමින් පවතී. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වියදමක් බවට පත්ව තිබුණි. | | | | |
| (ඇ) | මහා නගර සභාවට අයත් කඩකාමර 149 කට අදාළ රු.16,238,205 ක හිඟයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | නියමිත පරිදි ආදායම් රැස්කළ යුතුය. | ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරමින් පවතී. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඈ) | 2020 වර්ෂයේ බඳුදී ඇති පොළොන්නරුව මහා නගර සභාවේ නව පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 57 ක් සඳහා හිඟ බදු කුලිය රු.52,918,053 ක් වූ අතර, මෙම කඩ කාමර 57 න් කඩකාමර 06 ක් 2024 පෙබරවාරි මස මුද්‍රා තබා ඇතත් ඉතිරි කඩකාමර 51 සම්බන්ධයෙන් ගිවිසුමේ වගන්ති 20 හා 22 අනුව කටයුතු කර නොතිබුණි. | 2023 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සිදු කරගෙන යන විමර්ශනයෙන් පසු ලබා දෙන තීරණ මත ඉදිරි කටයුතු ඉටු කිරීමට නියමිතය. | අය වී නොමැත. |
| (ඉ) | පොළොන්නරුව මහා නගර සභාවට අයත් පොදු වෙළඳ සංකීර්ණය, බස් නැවතුම්පොළ කඩකාමර හා රෝහල හංදිය කඩකාමර සඳහා සභාව වෙත ලැබිය යුතු රු.15,964,890 ක එක්වන් මුදල (Key money) අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | 2023 | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. | දීර්ඝ කාලීනව පවතින මෙම හිඟ මුදල් වාරික ගෙවීම් කරන බවත් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන බව. | ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන නොතිබුණි. |

## 3.20 බදුල්ල මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,252,695,356 | 162,727,906 | 1,089,967,450 | 40,464,802 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,295,923,702 | 191,646,491 | 1,104,277,211 | (7,436,511) | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,371,224,613 | 227,250,009 | 1,151,974,604 | (14,679,331) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට පැවත එන, චෙක්පත් සංඛ්‍යාව සොයා ගත නොහැකි රු.2,148,709 ක අගරු චෙක්පත් ගිණුම් ශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 | අගරු චෙක්පත් මුදල් කඩිනමින් අය කරගත යුතුය. | අහරු චෙක්පත් අය කර ගැනීම සඳහා 2024 අගෝස්තු 23 දිනැතිව කමිටුවක් පත් කර ඇත. | අය වී නොමැත. |
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ 226(1) විධිවිධාන අනුව විගණකාධිපති විසින් 1994, 2004 සහ 2007 වර්ෂවලදී පනවා තිබුණු අධිභාර 03 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටත් රු.3,754,000 ක් අය කරගෙන නොතිබුණි. | 2022 | අධිභාර කඩිනමින් අය කර ගත යුතුය. | අධිභාර වී ඇති මුදල් අය කරගැනීම සඳහා අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. | අය වී නොමැත. |
| (ඇ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය)180 වගන්තිය අනුව | 2023 | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ | අදාළ ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව | මූලික විමර්ශණ වාර්තාව ලැබී ඇති අතර එහි නිර්දේශ ප්‍රකාරව ඉන් පසුව |

| | | | |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පොදු වැසිකිළි 02ක් රු.9,723,000 ක ලංසුවකට සේවකයින් දෙදෙනෙකුගේ භාර්යාවන්ට ලබාදී තිබුණි. | යුතුය. | මගින් මූලික විමර්ශන කටයුතු සිදු කරන බව. | මේ සම්බන්ධව කටයුතු කිරීමේදී මහ නගර සභා ආඥා පනතේ 180 වගන්තියට ඇතුලත් කර ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතින බව. |

## 3.21 බණ්ඩාරවෙල මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 631,662,252 | 142,542,751 | 489,119,501 | (108,667,276) | ව්‍යාවනය කළ |
| **2022** | 4,215,733,161 | 224,352,699 | 3,991,380,462 | 18,698,430 | ව්‍යාවනය කළ |
| **2023** | 4,590,567,793 | 113,250,223 | 4,477,317,570 | 150,601,799 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2018 වර්ෂයට පෙර සිට විශාඛා පාර තොග එළවළු පොළ සංකීර්ණයේ කඩ කාමර ඉදිකිරීම එකවර අය කිරීම් ලෙස රු.71,822,477 ක් සහා අරමුදලට ලැබී තිබුණද 2022 වර්ෂය අවසන් වනවිටත් වෙළද සංකීර්ණය ඉදිකිරීම් වෙනුවෙන් නොයොදවා වෙනත් කාර්යයන් සඳහා වැය කර තිබුණි. | 2022 | අරමුණුගත කාර්යයට පමණක් අරමුදල් යෙදවිය යුතුය. | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරන බව. | කඩ කාමර ඉදිකර නැත. |

## 3.22 රත්නපුර මහා නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 887,437,016 | 222,290,529 | 665,146,487 | (26,194,733) | තත්ත්වාගණනය කළ |
| **2022** | 933,936,600 | 296,553,730 | 637,382,870 | (49,398,215) | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,080,685,512 | 332,786,677 | 747,898,835 | 33,249,066 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු. 39,878,569 ක් වූ අතර, හිඟ ශේෂය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් නොතිබුණි. | 2021 2022 | කාල විශ්ලේෂණ සකස් කළයුතු අතර හිඟ ආදායම් රැස් කළ යුතු වේ. | වසර 21 ක් පැරණි මෘදුකාංගය බැවින් එම හිඟ ශේෂයට අදාළ කාල විශ්ලේෂනයක් ලබා ගත නොහැකි බව. | හිඟ ශේෂය රු. 31,664,228 ක් බව හා වසර 21 ක් පමණ පැරණි වරිපනම් මෘදුකාංගය මඟින් කාල විශ්ලේෂණයක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් එම තොරතුරු ලබාදිය නොහැති බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිශ්‍ර කසළ මෙට්‍රික් ටොන් 5318 ක් පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව කසළ අංගනය තුළ විවෘත පරිසරයට මුදා හැර තිබුණි. මේ නිසා ප්‍රදේශයේ පාරිසරික හා සාමාජීය ගැටළු රැසකට හේතුවන පරිදි 2023 | 2023 | විවෘත පරිසරයට කසළ බැහැර කිරීම අවම කළ යුතු වේ. | අපද්‍රව්‍ය කළමණාකරණය ආරම්භ කළ දින සිට මෙම භූමියේ අපද්‍රව්‍ය විවෘතව බැහැරලීම කර ඇති බව හා මේ සඳහා විවිධ ආයතන සම්බන්ධ කරගෙන තාක්ෂණික හා මූල්‍ය පහසුකම් ලබා | විවිධ ආයතනවල සහය අනුව මෙම කටයුතු ක්‍රමානුකූලව වෙනස් කරමින් සිටින බවත්, 2017 සිට නිශ්චිත වර්ගීකරණයක් යටතේ පමණක් අපද්‍රව්‍ය වෙන් කර ලබා ගැනීමට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී ම, එම ස්ථානයේ ගිනි ගැනීම් සිදු වී තිබුණි. | | | ගනිමින් උපරිම උත්සාහයෙන් කටයුතු කෙරෙමින් පවතින බව. | විවිධ උත්සාහයන් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස සියයට 50 ට වැඩි ප්‍රතිශතයක් වෙනස් කිරීමට හැකිවූ බව හා අපද්‍රව්‍ය විවෘතව බැහැරලීම සීමා කිරීමට 2024 සිට චක්‍රලේඛ මඟින් යම් සීමා ඇති කිරීමෙන් ද ප්‍රගතියක් ලබා කොට ගෙන ඇති බව. |
| (ඇ) | අනුමත සේවක සඛ්‍යාව ඉක්මවා දරන්නාට පුද්ගලික වනසේ ස්ථිර කරන ලද කම්කරුවන් 157 ක් සේවයේ යොදවා තිබියදී විධිමත් අනුමැතියකින් තොරව කම්කරුවන් 65 ක් හා 40 ක් සේවා ගිවිසුම් මත අදාළ ක්ෂේත්‍ර වෙත බඳවා ගෙන 2023 වර්ෂය සඳහා රු. 23,800,865 ක් වැටුප් ගෙවා තිබුණි. අතිරික්ත සේවකයින් වැඩි දෙනෙකු පරිපාලන කාර්යාලයේ, පුස්තකාලවල හා පෙර පාසැල්වල නිශ්චිත වැඩ පැවරුමකින් තොරව සේවයේ යොදවා තිබුණි. | 2023 | අතිරික්ත සේවකයන් සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතු අතර සියලු සේවකයන් ඵලදායී ලෙස සේවයේ යෙදවිය යුතු වේ. | පුස්තකාල කාර්යය මණ්ඩලය හා පෙර පාසල් වෙත යොදවා ඇති සේවා ගිවිසුම් සේවකයින් දෙදෙනා වෙනුවෙන් ද රාජකාරි පැවරීම් සිදුකර ඇති බව. | අනුයුක්ත කර ඇති සියළු කම්කරුවන් වෙත රාජකාරී පැවරීම් සිදු කර ඇති බව, පළාත් සභාව මඟින් සිදු කළ යුතු විධිමත් පත්කිරීම් සඳහා ඉල්ලීම් කළ ද පත්කිරීම් නොකළ බැවින් එම තනතුරුවල දිගින් දිගටම පවතින පුරප්පාඩු සඳහා වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් රාජකාරි ආවරණය කිරීමට පත් කිරීමෙන් ප්‍රමාණවත් කම්කරු පිරිසක් නොමැති වීම මත සේවා ගිවිසුම් පදනමින් සේවකයින් බඳවා ගෙන ඇති බව හා දරන්නාට පෞද්ගලික වන සේ ස්ථිර කර ඇති |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | වැඩ/ක්ෂේත්‍ර හා සෞඛ්‍ය කම්කරුවන් විශ්‍රාම යන විට ඒ සඳහා නව බඳවා ගැනීමක් සිදු නොකරන බව. |
| (ඇ) | මහා නගර සභා ගොඩනැගිල්ල නවීකරණයේදී මිල දී ගත් රු. 971,631 ක විදුලි උපාංග අස්ථානගත වී තිබුණි. | 2023 | වගකීම නිශ්චය කර අලාභ අයකළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් පළාත් සභාව මඟින් සිදු කරන විමර්ශනය මඟින් වගකිවයුත්තන් හඳුනාගත් පසු අදාල වියදම අය කර ගැනීමට කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

## 3.23 කුරුණෑගල මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 4,604,203,190 | 3,430,839,164 | 1,173,364,026 | 759,129,083 | ව්‍යාවනය කළ |
| **2022** | 5,987,026,771 | 3,926,958,364 | 2,060,068,407 | 12,835,988 | ව්‍යාවනය කළ |
| **2023** | 6,930,472,050 | 4,589,891,244 | 2,340,580,806 | 144,435,202 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මහා නගර සභාවෙන් පිටත ජල සම්බන්ධතා ලබාදීම සඳහා රු.25,862,363 ක මුදලක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමේදී ජල මීටර්වල හා කොන්ක්‍රීට් කණුවල මිල ගණන් කැඳවා අවම මිල ගණන් ලබාගෙන ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අතර, අධි ඇස්තමේන්තු පිළියෙල කර රු.1,889,895ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2021 | ප්‍රසම්පාදන කටයුතු ඇරඹීමට ප්‍රථම පිරිවැය ඇස්තමේන්තුවක් විධිමත්ව සකස් කර අදාළ අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු වේ.<br><br>පිරිවැය ඇස්තමේන්තුව සැකසීමේදී වෙළඳපල මිල ගණන් ලබා ගෙන ඇස්තමේන්තුව සැකසිය යුතු වේ. තාක්ෂණික නිලධාරීන් අදාළ වැඩ විෂයයන් පරීක්ෂා කිරීමෙන් පසු ගෙවීම් කළ යුතු වේ. | ඇස්තමේන්තු සකස් කිරීම් හා පරීක්ෂා කිරීම් සිදු කල නිලධාරීන්ගේ අත්සන හා නිල මුද්‍රාවත්, අනුමත කිරීමේදී නාගරික ඉංජිනේරු නිල මුද්‍රාවත් යෙදීම අතපසු වී ඇත. එම කටයුතු ඉදිරියේදී නිවැරදි කර ගැනීමට පියවර ගන්නා බව දන්වා ඇත. | පෙන්වා දී ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු මේ වන විට මඟ හරවා ගෙන විධිමත්ව කටයුතු කරමින් පවතින බවත් ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු මඟ හරවා ගනිමින් කටයුතු කරන බවත් දන්වා තිබුණු අතර අධි ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් මූලික විමර්ශනයකින් පසු එම මුදල් ආපසු අය කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | නාගරික සංවර්ධන පනත අනුව භූමි සීමාව තුළ ඉදිකිරීමක් සිදු කිරීමේ දී ගොඩනැගිලි සැලැස්මක් අනුමත කළ යුතු වුවද කුරුණෑගල මහා නගර සභා භූමියේ බහුකාර්යය විදුලි හා දුරකථන සම්ප්‍රේෂණ කුළුණ ඉදිකිරීමේදී මහා නගර සභාව විසින් සැලැස්මක් අනුමත කර නොතිබුණි. දුරකථන සම්ප්‍රේෂණ කුළුණ සඳහා බිම් කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරුකල යුතු වුවද එලෙස තක්සේරු කිරීමකින් තොරව බිම් කුලිය තීරණය කර තිබුණි. | 2022 | ඉදිකිරීම් සිදු කිරීමේදී සැලසුම් අනුමත කරගත යුතුය. | මේ වන විට අදාළ බිම් කොටස සඳහා වෙනම පිඹුරුපතක් සකස් කිරීමට අදාල කටයුතු කරමින් පවතින බවත් එය ලද වහාම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර අදාල සංශෝධනයන් සිදු කරන බවත් දන්වා ඇත. | මහ නගර සභා පරිශ්‍රයේ බහුකාර්ය විදුලි හා දුරකථන සම්ප්‍රේශණ කුළුණ පිහිටි ඉඩම මැන පිඹුර සකස් කිරීම සඳහා පිලට් හෝල්ඩින්ග්ස් ආයතනය වෙත දන්වා ඇත.එය ලද වහාම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර අදාල සංශෝධනයන් සිදු කරන බව දන්වා ඇත. |
| (ඇ) | බස් නැවතුම්පල වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ රු.459,590 ක කාර්යය සාධන සුරක්ෂණය හා රු.1,838,361 ක අත්තිකාරම් සුරක්ෂණය ව්‍යාජ ඒවා විය. මෙම ව්‍යාජ සහතික පිළිබඳව කිසිදු පරීක්ෂාවකින් තොරව රු. 1,838,311 ක අත්තිකාරම් මුදල් හා කොටස් මුදල් නිදහස් කර තිබුණි. 2022 අප්‍රේල් මස මුදල් | 2022 | තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කළ නිලධාරීන්ට හා ප්‍රසම්පාදන කමිටුවට පත් වූ නිලධාරීන් වගකීමෙන් තොරව කටයුතු කිරීම පිළිබඳව පරීක්ෂණ පවත්වා නගර සභා අරමුදලට සිදු වූ අලාභය අය කිරීමට කටයුතු කළ යුතුය. | මූලික විමර්ශන ක්‍රියාත්මක කර ඇත. | කුරුණෑගල මහේස්ත්‍රාත් අධිකරණයේ B/14 1/24 අංක දරණ නඩුව ගොනුකර ඇති බවත් වග කිවයුතු පාර්ශය හඳුනා ගැනීමේ මූලික විමර්ශන ක්‍රියාත්මක කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිළිබඳ ස්ථාවර කමිටු නියෝගය අනුව මෙම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රුපියල් ලක්ෂ 18 ක මුදල අත්තිකාරම් සුරක්ෂණය හා කාර්යය සාධන ඇපකර මඟින් ප්‍රතිපූර්ණය කරගත යුතු බව දක්වා ඇතත් ව්‍යාජ සුරක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින් මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | | | | |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ අගරු චෙක්පත් උපලේඛනයට අනුව මාස 03 සිට වසර 16 ක් දක්වා පවතින අගරු වූ චෙක්පත් 26 කට අදාළව රු.1,312,519ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | උපලබ්ධි නොවී කල් ඉකුත්වූ චෙක්පත් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ගණකාධිකාරී (ආදායම්) හා නීති නිලධාරී ඒකාබද්ධව නිරීක්ෂණ හා නිර්දේශ සහිතව වාර්තාවක් ඉදිරි කමිටුවට යොමු කර තීරණ ගැනීමට නියමිත බව දන්වා ඇත. |
| (ඉ) | 2022 සැප්තැම්බර් 31 දින වන විට මධ්‍යම වෙළෙඳපොල කඩකාමර 29 කින් අයවීමට පැවති රු. 90,546,072 ක් සහ ගෙවීම් ප්‍රමාදය සඳහා සියයට 10 දඩ මුදල් 2023 දෙසැම්බර් වන විටත් අයකර ගැනීමට | 2023 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ටෙන්ඩර් ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | අනපේක්ෂිත ලෙස කඩ කාමර ඉදිකිරීම් කටයුතු අවසන් කරගත නොහැකිවූ අතර හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී උත්සාහ කළද, නිම කිරීමේ දිනය | අනපේක්ෂිත ලෙස කඩ කාමර ඉදිකිරීම් කටයුතු අවසන් කරගත නොහැකිවූ අතර හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී උත්සාහ කළද, නිම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හෝ මුදල් නොගෙවූ කඩකාමර සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | | | සම්බන්ධව අවසන් තීරණයක් ගන්නා තෙක් අය කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා මතුව ඇති බව. | කිරීමමේ දිනය සම්බන්ධව අවසන් තීරණයක් ගන්නා තෙක් අය කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා මතුව ඇති බව. |
| (ඊ) | නගර සභාව සතු රන්තලිය තානායමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 4,632,469 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම හිඟ අය කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | රන්තලිය තානායමේ හිඟ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර තානායමේ හිඟ මුදල සම්බන්ධව අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇත. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු මළා පවහන පද්ධතියේ හිඟ ශේෂය රු148,033,671. ක් විය. | 2023 | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථාවක් පැනවීමෙන් හෝ වෙනත් විකල්ප උපාය මාර්ග තුළින් හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගාස්තු නොගෙවූ ගෘහස්ත හා ව්‍යාපාරික ස්ථාන වෙත හිඟ මුදල ගෙවන ලෙස දන්වා ලිපි යොමු කර ඇති බවත් මෙම හිග මුදල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා කරමින් පවතින බව. |
| (ඌ) | නිශ්ශංක මාවතේ පස්වෙනි පටුමගේ නගර සභාව සතු වැහැර වත්ත ඉඩමේ පිහිටා තිබූ පොදු ළිඳ සහිත පර්චස් 20ක් සහ පර්චස් 7.78බැගින් වූ ඉඩම් කොටස් 03කින් යුත් ඉඩම දීර්ඝ කාලයක් තිස්සේ බදු දීමකින් තොරව | 2023 | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | තක්සේරු දෙපාර්ත මේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලද පසු කමිටු නිර්දේශ අනුව මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ඉදිරි තීරණ ගැනීමට අපේක්ෂිත බව දන්වා ඇත. | වැහැර වත්ත ඉඩමේ කැබලි සඳහා වන තක්සේරු වටිනාකම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනවසරයෙන් පුද්ගලයින් විසින් භුක්ති විඳිමින් පැවතුණි. | | | | |
| (එ) | අත්හිටු වූ කර්මාන්තයක් වෙනුවෙන් 2022 මැයි 21 වන දින ගෙවන ලද රු.1,445,847 ක අත්තිකාරමක් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | 2023 | සභාවට සිදු වූ අලාභය සඳහා ඉදිරියේදී අධිභාර පැනවීමට කටයුතු කළ යුතුය. | ආණ්ඩුකාරතුමාගේ අංක NWP/GOV/AD/02/06/13 හා 2022.07.02 දිනැති ලිපිය අනුව මේ වන විට මෙම ඉදි කිරීම් අත්හිටුවා ඇති බවත් අත්තිකාරම් මුදලින් එම බිල්පතෙහි වටිනාකම අඩු කර ඉතිරි මුදල අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වා ඇත. | මෙම මුදල ගෙවීමට කටයුතු කරන ලෙස නැවත දන්වා යවා ඇත. එසේ නොකරන්නේ නම් ඉදිරියේදී නීතිමය කටයුතු කරන බවද දන්වා ඇත. |

## 3.24 යාපනය මහා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,502,223,632 | 207,206,482 | 1,295,017,150 | 272,824,761 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,822,653,572 | 344,220,015 | 1,478,433,557 | 333,243,645 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,108,045,121 | 209,219,573 | 1,898,825,548 | 418,843,362 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු. 145,644,642ක් වූ හිඟහිටි වරිපනම් ශේෂයක් පැවැතිණි. | 2023 | හිඟහිටි ශේෂ අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගත යුතු ය. | ආදායම් රැස් කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් සහ ජංගම සේවාවන් මගින් රැස්කිරීමට කටයුතු කර ඇති බව. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩකුලී රු.11,094,069ක් සහ වෙළෙඳ පොල බදුකුලී රු.7,719,669ක් හිඟහිටිව පැවැතුණි. ඉන් කඩකුලී රු.47,340ක් සහ බදුකුලී රු.7,719,669ක් වර්ෂ 05කට අධික කාලයක සිට පැවැතුණි. | 2023 | හිඟහිටි අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගත යුතු වේ. | අයකිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| (ඇ) | වර්ෂ 05කට අධික කාලයක සිට පොදු සංචිත ගිණුමේ නිෂ්කාර්යව පවතින රු.373,562,914ක් අදාල අරමුණු සඳහා | 2023 | අරමුදල් නිශ්චිත අරමුණු සඳහා උපයෝජනය කළයුතු වේ. | ඉදිරි සංවර්ධන වැඩපිළිවෙලවල් සඳහා උපයෝජනය කිරීමට පියවර ගනු ලබන බව. | අරමුදල් නිශ්චිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | | | | |
| (ඈ) | කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණු වර්ෂ 05ත් වර්ෂ 27ත් අතර කාලයක් පැරණි රු. 6,883,066 ක අත්තිකාරම් 30ක් මේ දක්වාම අය කරගෙන නොතිබුණි. | 2023 | අත්තිකාරම් නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අතිතිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | කඩකාමර 160ක කුලී ගිවිසුම් වර්ෂ 03 සිට 11කට අධික කාලයක් අළුත් නොකර කුලී අයකරමින් පැවතුණි. | 2023 | ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කරමින් පවතින බව. | කුලී ගිවිසුම් අළුත් කර නොතිබුණි. |
| (ඊ) | වර්ෂ 01ත් වර්ෂ 10ත් අතර කාලයක සිට අභාවිතව පවතින වාහන 55ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | 2023 | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. | වාහන වත්කම්වලින් ඉවත් කිරීමටත්, අළුත්වැඩියා කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | වත්කම් භාවිතා කර නොතිබුණි. |

**3.25 මහරගම නගර සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,995,320,960 | 486,134,152 | 1,509,186,808 | (47,172,349) | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,582,461,362 | 579,188,078 | 2,003,273,284 | 81,910,172 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,821,753,142 | 423,626,968 | 2,398,126,174 | 480,318,446 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නාවින්න ක්‍රීඩාංගණය අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට 2021 වර්ෂයේදී රු.13,717,577 ක් ඇතුළුව එකතුව රු.24,554,972 ක් සභාව විසින් ගෙවා තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පුවක් මඟින් පවරා ගෙන නොතිබුණි. | 2021 | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉඩමේ කායික භුක්තිය නගර සභාව වෙත ලබා දී ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනතේ 6(1) වගන්තිය මඟින් සින්නක්කර ඔප්පු අයිතිය ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙතෙක් ලබා දී නොමැති බැවින් ඔප්පු ප්‍රදානය කළ නොහැකි වී ඇත. | 2020 වර්ෂයේ සිට නාවින්න ක්‍රීඩාංගණය විවිධ ඉසව් සඳහා ලබා දී සභාව විසින් ආදායම් උපයා ඇති අතර එහි පිහිටි පිහිනුම් තටාකයද 2023/2026 කාල පරිච්ඡේදයට අදාලව රු.840,000 ක මුදලකට ටෙන්ඩර් ලබා දී ඇතත් නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | 2015 අගෝස්තු මාසයේදී වසා තිබුණු ජංගම ගිණුමක රු.2,052,258 ක නාමික වටිනාකමක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණ | 2021<br>2022<br>2023 | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | පළාත්පාලන සහකාර කොමසාරිස් විසින් 2023 අප්‍රේල් 26 දිනැති ලිපියෙන් විමර්ශන නිලධාරීන් තිදෙනෙකුගෙන් | එම විමර්ශන වාර්තාව මඟින් නාමික ගිණුම නිරවුල් කිරීමට ප්‍රමාණවත් නිර්දේශ හා නියෝග ඉදිරිපත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ද එය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | | | යුතුව පත් කළ විමර්ශන මණ්ඩලයේ වාර්තාව 2024 ජුනි 05 දින සභාව වෙත ලැබුණි. | කර නොමැති අතර 2024 වර්ෂයේ නිරවුල් කර ගැනීමට හැකි වන පරිදි නිශ්චිතව හා පැහැදිලිව උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලමින් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත 2024 ජුනි 28 දිනැතිව ලිපියක් යොමු කර ඇත. මේ දක්වා නිරවුල් කර නොමැත. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 318 කින් රු.15,684,183 ක හිඟයක් පැවතුණි. එම ශේෂයේ වර්ෂ 02 ක සිට වර්ෂ 03 ක් අතර හිඟ පවතින කඩ කාමර 37 කින් රු.2,759,013 ක් ද වර්ෂ 03 ක සිට වර්ෂ 05 ක් අතර හිඟ පවතින කඩ කාමර 51 කින් රු.7,232,760 ක් ද වර්ෂ 05 ට වැඩි හිඟ පවතින කඩ කාමර 06 කින් රු.971,734 ක් ද විය.කඩ කුලී නොගෙවන වෙළඳසැල්වල අයිතිය ගිවිසුම් ප්‍රකාරව නැවත නගර සභාව වෙත ලබා ගෙන වෙනත් පාර්ශවයන්ට බඳු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් දීර්ඝ කාලයක සිට හිඟයන් ඉදිරියට එමින් තිබුණි. | 2023 | හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | දීර්ඝ කාලයක් හිඟ පවතින කඩ 69 ක් නීති කටයුතු වලට යවා ඇත. සෙසු වෙළඳසැල් වලට අවසන් නිවේදන යවා ඇත. | 2024 සැප්තැම්බර් 30 දින වන විට රු.4,550,947 ක් අය කර ගෙන ඇති අතර හිඟ මත පවරා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | සභාව විසින් ඉදුල් කසල විකිණීම සඳහා හෝ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් මඟින් පොහොර නිෂ්පාදනය කිරීමට හා නොදිරන කසල විකිණීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට රු.69,717,610 ක් ද කෙරවලපිටිය තාප බලාගාරයට කසල ප්‍රවාහනය සඳහා සභාව තුළ පවතින වාහනවලට අමතරව පෞද්ගලිකව වාහන සඳහා රු.43,667,950 ක් ද වශයෙන් එකතුව රු.113,385,560 ක් වැයකර තිබුණි. | 2023 | කසල වීකිණීම තුලින් සභාවට ආදායමක් ලබා ගැනීමට හා කසල ප්‍රවාහනය සඳහා හැකිතාක් දුරට සභාවේ වාහන යොදවා ගැනීම කළ යුතුය. | මහරගම බල ප්‍රදේශයේ ජනනය වන කසල ප්‍රමාණය වැඩි බැවින් කරදියාන කසල අංගනයට ගෙවීමට සිදුවන මුදලද ඉහල අගයක් ගෙන ඇත. කෙරවලපිටිය තාප බලාගාරය වෙත කසල ප්‍රවාහනයේදී කුලී පදනම මත වාහන යෙදවීමට සිදුව ඇත. | වර්තමානය වන විටද පසුගිය වර්ෂයේ තත්ත්වයන් එලෙසින්ම සිදු වේ. දිරන කසල එක්රැස් කිරීම සම්බන්ධයෙන් හුවමාරු මධ්‍යස්ථානයක් සහ මිලදී ගන්නන් හඳුනා ගනිමින් පවතී. |

## 3.26 බොරලැස්ගමුව නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 936,532,368 | 99,609,819 | 836,922,549 | 23,913,815 | තත්ත්වාගණනය කළ |
| 2022 | 1,358,693,190 | 114,791,436 | 1,243,901,754 | 49,306,547 | තත්ත්වාගණනය කළ |
| 2023 | 1,420,994,550 | 82,776,499 | 1,338,218,051 | 51,899,404 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් බොරලැස්ගමුව නගර සභාවේ බහු කාර්ය ගොඩනැල්ල දෙවන මහල, ස්ලැබ් මට්ටම් දක්වා ඉදි කර තිබුණද ඉදිකිරීම් කටයුතු 2022 අගෝස්තු මස සිට තාවකාලිකව නතර කර තිබුණි. එම තත්ත්වයෙන් වූ ගොඩනැගිල්ල 2023 පෙබරවාරි 09 දින සභාව වෙත තාවකාලිකව භාර දී තිබුණු අතර 2023 වර්ෂයේ අවසාන දින වන විටත් නැවත වැඩ ආරම්භ කර නොතිබුණි. ඉදිකිරීම් නැවත ආරම්භ වීම ප්‍රමාද වීමෙන් ගොඩනැගිල්ල සඳහා මේ දක්වා වැය කර තිබුණු රු.248,789,106 ක වියදම නිෂ්කාර්යය | 2023 | ගොඩනැගිල්ලේ වැඩ අවසන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් සිදු කර ඇති අතර, සභා අරමුදලින් ඉදිකිරීම් ආරම්භ කරන ලෙස අප වෙත දන්වා ඇත. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ බද්ධ ගිණුමේ ඇති මුදලින් ඉදිකිරීම් සඳහා අනුමැතිය ලැබීමෙන් පසු ඉදිකර ඇති ගොඩනැගිල්ලේ, කාර්යාලය පවත්වාගෙන යෑමට අත්‍යාවශ්‍ය කොටස් ඉදිකිරීම් සිදු කිරීමට නියමිතය. | ඉදිරියේදී අත්‍යවශ්‍ය කොටස් ඉදිකිරීම් සිදු කිරීමට නියමිතව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වියදමක් විය හැකි අතර ගොඩනැගිල්ලේ කම්බි ආදිය දිරාපත් වෙමින් ද පැවතිණි. | | | | |
| (ආ) | සභාව භාවිතා කරන වෙනත් ආයතන නමට ලියාපදිංචි වී ඇති වාහන 06 ක අයිතිය නගර සභාව වෙත පවරා ගැනීමට 2023 වර්ෂයේ අවසාන දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2023 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මෝටර් රථ පවරා ගැනීමේ අයදුම්පත සම්පූර්ණ කර අදාළ ආයතන වෙත යවා ඇත. | පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

## 3.27 කැස්බෑව නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 3,111,606,751 | 681,108,890 | 2,430,497,861 | 49,134,973 | තත්වාගණනය කළ |
| **2022** | 3,285,405,379 | 856,327,319 | 2,429,078,060 | 175,382,222 | තත්වාගණනය කළ |
| **2023** | 3,311,891,434 | 369,402,158 | 2,942,489,276 | 564,836,406 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | විනෝද බදු රු.281,047ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | 2021<br>2022<br>2023 | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙය 2018 වර්ෂයේ කපා හැරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් පසු දෙපාර්තමේන්තුව විසින් කපා හැරීම සඳහා නිර්දේශ කර ඇති නමුත් පළාත් පාලන අමාත්‍යාංශය විසින් එම මුදල සැකසී ඇති ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | මෙම මුදල සැකසී ඇති ආකාරය පිළිබඳ තොරතුරක් ඉදිරිපත් කිරීමට තරම් ලිඛිත සාක්ෂියක් සභාව සතුව නැත .ඒ බව දන්වා නැවත පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නැත. |
| (ආ) | වරිපනම් වසර 05කට වරක් තක්සේරු කළ යුතු වුවත්, සභාව 2012/2013 වර්ෂ වලදී අවසන් වරට තක්සේරු කර තිබූ අතර එම වර්ෂයන් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | 2023 | වරිපනම් තක්සේරු කළ යුතුය. | 2024 වර්ෂය සඳහා තක්සේරු ප්‍රතිශෝධන සිදුකිරීමේ කටයුතු ආරම්භ කරමින් පවතී. | දේපල ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කර ඇත. |

## 3.28 කොළොන්නාව නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| 2021 | 6,632,475,585 | 123,309,879 | 6,509,165,706 | 55,553,690 | තත්වාගණනය කළ |
| 2022 | 6,726,083,401 | 135,644,387 | 6,590,439,014 | 71,698,961 | තත්වාගණනය කළ |
| 2023 | 6,900,182,740 | 287,391,761 | 6,612,790,979 | 34,263,400 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් 2013 මාර්තු 13 දින සභාව වෙත ලබා දුන් රුපියල් මිලියන 4 ක් වටිනාකමැති අත් කඩදාසි යන්ත්‍රය සභාවේ වත්කම් ලෙස ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. එසේම එම යන්ත්‍ර කොටස් නිෂ්පාදන කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව තබා තිබුණි. | 2021 | වත්කම් විධිමත් පරිදි ලේඛනගත කිරීමටත් ඒවා අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමටත් කටයුතු කළ යුතුය. | අත් කඩදාසි යන්ත්‍රයේ කොටස් ඉන්වෙන්ට්‍රි ලේඛනගත කර නොමැත. එම යන්ත්‍ර කොටස් භාර ගන්නා අවස්ථාවේ යන්ත්‍ර කොටස් වෙන් වෙන්ව විධිමත් ලෙස හඳුනාගත නොහැකි වීම හේතුවෙන් රූප සටහන් ඇඳ ගනිමින් එම අවස්ථාවේ පැවති කොටස් ප්‍රමාණයන් සටහන් කරගෙන ගොනු ගත කර ඇත. මෙම යන්ත්‍ර කොටස් එකලස් කර නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි තත්ත්වයේ පැවතුණි. | අත් කඩදාසි යන්ත්‍රයක් වශයෙන් සභාවට ලබා දී නොමැති අතර, යන්ත්‍ර කොටස් පමණක් ලබා ගෙන ඇත. එය එකළස් කිරීමට දැනුම ඇති නිළධාරියෙකු නොමැති බැවින් යන්ත්‍ර කොටස් හඳුනා ගැනිමට නොහැකි වි ඇති අතර, යන්ත්‍ර කොටස් වල රූප ඇඳ නම් කර වෙනම ලේඛණයක් පවත්වාගෙන යනු ලබන අතර නිෂ්පාදන කාර්යක් සඳහා යොදා ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | මු.රෙ 371(5) අනුව අත්තිකාරමක් නිකුත් කළ පසු අදාල කාර්යය අවසන් කර දින 10ක් ඇතුළත එම අත්තිකාරම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 19දී ලබා දී තිබුණු රු.1,106,500ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | 2022 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මු.රෙ.371(5) සංශෝධනය ප්‍රකාරව කටයුතු කළයුතු බවට දැඩිව නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බැවින් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිළධාරින්ට උපදෙස් ලබා දී ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | නිලධාරීන් 36 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.2,212,952ක ශේෂයක් වසර හතරකට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | අදාළ හිඟ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නැත. | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් පස්දෙනාගෙන් තව දුරටත් අය කර ගත යුත්තේ නිලධාරීන් තුන්දෙනෙක් සඳහා වන රු.286,213.12 ක ශේෂයක් වන අතර එම ශේෂය අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු.79,421,106 ක් වූ අතර එයින් රු.40,000 කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති වරිපනම් හිඟ ශේෂ 45 කින් අයවිය යුතුව තිබූ මුදල රු.24,668,316 ක් විය. | 2021<br>2022<br>2023 | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රු.40,000/-ට වැඩි හිග වරිපනම් රු.24,668,316 න් රු.5,122,946 ක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, ඉතිරි හිඟමුදල් ද 2024 මැයි මස සිට දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර අය කර ඇති බව දන්වා ඇත. | 2024 ජනවාරි 16 වන විට රු. 40,000 වැඩි වටිනාකම සහිත දේපළ වලින් අය කර ගැනීමට ඉතිරිව ඇත්තේ රු. 5,896,098 බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | සභාවට අයත් කඩ 2023 කාමර 187 කින් ලැබිය යුතු බදු කුලී ශේෂය රු.7,016,695 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නවවෙළඳ ස්ථාන ලබා දීමේදී හිඟ මුදල් අයකරගෙන ලබා දීමට සැලසුම් කර ඇත. | මෙම හිඟ මුදල ඇති වීමට හේතුව ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය පුළුල් කිරිමේ ව්‍යාපෘතිය හේතුවෙන් ගොඩනැගිලි සංකීර්ණ 02 කඩා ඉවත් කිරිමට යෝජනා වි තිබිම හේතුවෙනි. |

## 3.29 සීතාවකපුර නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 1,064,415,920 | 278,733,550 | 785,682,370 | 32,239,839 | තත්වාගණනය කළ |
| 2022 | 1,062,995,882 | 270,775,890 | 792,219,992 | 15,143,714 | තත්වාගණනය කළ |
| 2023 | 1,069,797,033 | 223,418,613 | 846,378,420 | (5,792,630) | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අක්කර 27 ක් පමණ වූ භූමි භාගයක පිහිටා ඇති වැවේ කැලේ පාරිසරික සංචාරක ස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.11,360,000 ක් වැය කර තිබුණ අතර 2018 වර්ෂයේදී රු. 4,503,193 ක ඇස්තමේන්තු සකස් කරමින් එම භූමියේ ඇති පැරණි ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉවත්කර එම ස්ථානයේ තෙමහල් ගොඩනැගිල්ලක් සකස් කිරීමට ද සැලසුම් කර තිබුණි. එහෙත් එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට පෙර එම භූමියේ නිත්‍ය අයිතිය සමාලෝචිත වර්ෂය | 2021 | අදාල භූමියේ අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | මෙම පවරා දීම ප්‍රාදේශීය ලේකම්ගේ ස්ථාවරය දන්වන ලෙස ලිපියක් යොමු කර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අවසාන වන තෙක් සභාව සතු කරගෙන නොතිබුණි. | | | | |
| (ආ) | සීතාවකපුර නගර මධ්‍යයට යාබදව පෞද්ගලික සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්තපුරයේ අවිධිමත් හා නොසැලකිලිමත් කටයුතුවලින් එහි ආසන්නයේ ජීවත්වන වෙරළුපිටිය ගම්වාසීන්ට විශාල පරිසර හානියක් සිදුවන බව නිරීක්ෂණය විය. ඒ අනුව අපවිත්‍ර ජලය ගගට එකතු වීම, අපවිත්‍ර ජලය නිසා පුවක්පිටිය යටවීම. වාහන වන විෂ දුම හා ශබ්ද නිසා ගම්වාසීන් රෝගාතුර වීම , අප ද්‍රව්‍ය බීමට ගන්නා ජලයට එකතු වීම ආදී පාරිසරික ගැටළු රැසක් පැවති බව නිරීක්ෂණය විය. | 2021 | පරිසර හානි වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය මගින් කර්මාන්ත ආයතනවල සහභාගීත්වයෙන් මාර්ගය පිළිසකර කිරීම සහ රුක් රෝපණ වැඩසටහන සිදු කරන ලද අතර ම.සෞ.ප.මගින් වාර්ෂිකව කර්මාන්තශාලා මෙම බලපත්‍ර ලබාගෙන ඇත්ද යන්න පරීක්ෂා කිරීම සිදු කරයි. | ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ සියලුම ආයතන මධ්‍යම පරිසර අධිකාරිය මගින් වාර්ෂිකව පරිසර බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 1989 ජුනි 09 දිනැති අංක 248/334 දරණ ගිවිසුම අනුව 1988 ජූලි 01 දින තිස් අවුරුදු බදු පදනම යටතේ සභාව සතු භූමියක් ලංකා බැංකුව සඳහා බදු දී තිබුණි. එම බදු ගිවිසුම අනුව මාසික බදු කුලිය රු.80,000 ක් වුවද, 2018 බදු කාලය අවසන් වූ පසු තක්සේරු | 2021<br>2022 | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. | මේ වන විට අවිස්සාවේල්ල ගරු දිසා අධිකරණයේ නඩු අංක 29081/19 යටතේ නඩුකරයක් පවතින අතර, අදාල නඩුකරයේ තීන්දුව මත ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | හිඟ ව පවතින මුදල් අයකර ගැනීමට සහ නව ගිවිසුමක් මත මෙම දේපල එම ආයතනයටම බදු දීම සඳහා සැකසූ නව ගිවිසුම හා ලිපිය ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය ලබාගැනීම සඳහා 2024 සැප්තැම්බර් 11 දින පළාත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ නව තක්සේරුව අනුව මාසික බදු කුළිය රු.475,000 ක් වී තිබුණි. නව තක්සේරුව මත බදු අය නොවීම හේතුවෙන් 2018 ජූලි 01 සිට 2022 නොවැම්බර් 18 දක්වා අය විය යුතු කුලී ආදායම රු.22,561,718 ක් වී තිබුණි. | | | | පාලන සහකාර කොමසාරිස් කො.දි මගින් පළාත් පාලන කොමසාරිස් බ.ප වෙත යොමුකර ඇත. |
| (ඈ) | මූලාා ප්‍රකාශවල 2023 දෙසැම්බර් 31 දිනට සභාවට අය විය යුතු හිඟ වරිපනම් බදු ආදායම රු.27,254,299 ක ශේෂයක් විය. | 2023 | හිඟ වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල අයකර ගැනීම සඳහා දේපල තහනම් නිළධාරි වෙත හිඟ ලැයිස්තු ලබා දීමට කටයුතු කර ඇත. | 2024 සැප්තැම්බර් 30 වන විට හිඟ මුදලින් රු.4,734,826 ක මුදලක් අය කරගෙන ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු2,580,984 ක් වි තිබුණි. | 2023 | හිඟ කඩකුලී අයකිරීමට කටයුතු කළ යුතුය. | හිග අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතියි. | 2024 සැප්තැම්බර් 30 දින වන විට රු.1,351,274 ක හිඟ මුදල් අයකර ඇති අතර ඉතිරි හිඟ අය කිරීමට සිහිකැඳවීම් ලිපි යවා ඇත. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට අය විය යුතු හිඟ තානායම් කුලිය රු.9,181,373 ක් විය. | 2023 | හිඟ තානායම් කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. | අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවති. | නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කළ ද ඒ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් නොදැක්වූ බැවින් ආයතනයේ නීතිඥ මගින් 2024 මැයි 09 දින එන්තරවාසි යොමුකර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (උ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාර රජයේ නිල නිවාසයක පදිංචි කාලය වසර 05ක් විය යුතු වුවත් නගර සභාව වෙත පරිපාලන අයිතිය පැවරී ඇති නිල නිවාස 07ක එකම නිලධාරීන් වසර 07 ක සිට වසර 29 ක් දක්වා කාල පරාසයක පදිංචිවී සිටින අතර එම නිලධාරින්ගේ ගිවිසුම් කාලය වසර 02ක සිට වසර 06 ක කාලයක් ගතවුවද එම අදාල ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | 2023 | නිල නිවාස වල නීතියානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම් යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. | නිල නිවාසවල නීත්‍යානුකූල අයිතිය පවරා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කටයුතු කරන බව දන්වා ඇති බව හා වසර 5 ඉක්මවා නිල නිවාසවල පදිංචිව සිටින සේවකයින් ඉවත් කිරීමටත් පොරොත්තු ලේඛනයේ සිටින සේවකයින් සඳහා නිල නිවාස ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇත. | නිල නිවාස සභාවට පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ඌ) | බස්නැවතුම්පොළ උඩු මහල පිහිටි U කඩ කාමර 35 ක් සඳහා රු. 38,511,660 ක ටෙන්ඩර් මුදලකට අනුමත කර තිබූ අතර එම ටෙන්ඩර්කරුවන්ගෙන් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.9,571,107 ක මුදලක් සභාවට ලබාගෙන තිබූ නමුත් 2023 ඔක්තෝම්බර් 10 දින වන විටද, එම කඩ කාමර ඉදිකිරීම් සැලසුම්කර වර්ෂ 11ක් ගත වී ඇතත් එම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. | 2023 | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. | බස් නැවතුම්පල උඩුමහල (U) කඩ කාමර ඉදිකිරීමට ටෙන්ඩර් කර එකවර ගෙවිය යුතු මුදල් අයකර ඇත. | බස්නැවතුම්පල උඩු මහලේ කඩ කාමර 34ක් ඉදි කිරීමට යෝජිත කොන්ක්‍රීට් තට්ටු වල (Slab) ස්ථායීතාවය සම්බන්ධව ව්‍යුහගත ඉංජිනේරු නිර්දේශය ලබා ගැනීමට කටයුතු යොදා ඇත. |

## 3.30 කළුතර නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 3,772,095,812 | 76,801,497 | 3,695,294,315 | 40,481,432 | තත්ත්වාගණනය කළ |
| **2022** | 3,975,290,849 | 27,196,468 | 3,948,094,381 | 34,345,527 | තත්ත්වාගණනය කළ |
| **2023** | - | - | - | - | මූල්‍ය ප්‍රකාශ ලැබී නැත |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ අනුව සභාව සතු වාහන 04 ක් අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බව සඳහන් වුවත්, ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | 2022 | අළුත්වැඩියා කිරීම ඵලදායි නොවන වාහන අපහරණය කළ යුතුය. | වාහන 02 ක් අළුත්වැඩියා කිරිම ඵලදායි නොවන අතර ඉතිරි වාහන 02 හි වැසි අංක සොයා ගත නොහැකිව ඇත. | අපහරණය කිරීම සඳහා නැවත කමිටුවක් පත් කර ඇත. |

**3.31 පානදුර නගර සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 530,558,715 | 55,039,785 | 475,518,930 | 63,731,152 | තත්වාගණනය කළ |
| **2022** | 3,384,944,912 | 46,744,113 | 3,338,200,799 | 74,959,597 | තත්වාගණනය කළ |
| **2023** | 4,783,833,344 | 40,876,466 | 4,742,956,878 | 82,395,207 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත වරිපනම් හා බදු හිඟය රු.39,639,846ක් වූ අතර එකී හිඟය තුල වර්ෂ 1ත් 05ත් අතර රු.35,715,916ක් ද වර්ෂ 05ට වැඩි රු.3,923,930ක් ද වූ අතර, ඉන් රු.50,000 ඉක්මවූ වරිපනම් ඒකක 101කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.10,109,384ක් විය. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. | දුරකථන මාර්ගයෙන් සහ ගෙයින් ගෙයට ගොස් පවතින හිඟය අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතියි. | ඉතිරි හිඟ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | කඩකුළී තොරතුරු වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ වෙළඳ ස්ථාන කුළී එකතු කළ යුතු ආදායම රු.22,202,312ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට සියයට 45ක් වූ රු.9,961,208 ක මුදලක් අයකර ගත යුතුව පැවතිණි. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. | ජංගම සේවා පවත්වා ඉතිරි හිඟමුදල අය කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අය වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.4,750,971ක් වන අතර, අයකර ගත නොහැකි හා විස්තර නොදන්නා ණය ශේෂ රු.521,639ක් විය. 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,274,706ක් ද, විශ්‍රාම නිළධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,745,121ක් වන අතර මියගිය හා සේවය හැරගිය නිළධාරින්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,209,505ක් විය. | 2023 | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සේවක ණය ශේෂය රු. 4,750,971/- ක් සහ අය කර ගත නොහැකි හා විස්තර නොදන්නා ණය ශේෂය රු. 521,639/- ක මුදල කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්(කළුතර) වෙත ඉල්ලා යවා ඇත. | 2024 සැප්තැම්බර් 30 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ශේෂය රු. 542,220 ක් ද, විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් තව දුරටත් අය විය යුතු ශේෂය රු. 747,400/- ක් වන අතර, මිය ගිය හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ශේෂය රු. 967,951 ක් විය. |
| (ඈ) | 2017 වර්ෂ තුළ පෞද්ගලික සමාගමකින් රු.295,000ක් ගෙවා මිලදීගෙන තිබුණු වැටුප් හා මානව සම්පත් කලමනාකරණ මෘදුකාංගය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා නගර සභාවේ කාර්යාල කටයුතු පරිගණක ගත කිරීම සඳහා විෂයන් 07ක් සහිත මෘදුකාංග පද්ධතිය මිලදී ගත් මුදලට අමතරව භාවිතා නොකර සේවා ගාස්තු වශයෙන් 2022 වර්ෂයේදී රු.178,500ක් ද ගෙවා තිබුණි. | 2022/ 2023 | මෘදුකාංග පද්ධතිය කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | එක් එක් මෘදුකාංගයට වෙන වෙනම සේවා ගාස්තු ගෙවීමට සාපෙක්ෂව මුළු වටිනාකමින් සේවා ගාස්තු ගෙවීම වාසිදායක වන බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

## 3.32 හොරණ නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 657,053,083 | 38,815,344 | 618,237,739 | 30,700,415 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,371,384,196 | 24,183,142 | 2,347,201,054 | (25,910,915) | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,355,002,267 | 21,718,317 | 2,333,283,950 | (24,814,535) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 118 වගන්තිය ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුල එක් රැස් වන මල අපද්‍රව්‍ය නිසි පරිදි බැහැරලීම සඳහා සභාව විසින් ගලිරථ සේවාවක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2023 | යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2017 වර්ෂයේ සිට ගලි රථයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කළ ද මෙතෙක් සභාවට ගලි රථයක් ලැබී නොමැති බව දන්වා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | අංක PB-6383 දරණ වාහනයේ එන්ජිමට හානි සිදු කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | 2022 2023 | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මීට අදාල පත් කරන ලද කමිටු වාර්තාව 2024 මැයි 29 සාකච්ජා කළ අතර අවසන් වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත. | කමිටු වාර්තාව ලද පසු ඉදිරි කටයුතු කිරීමට ඇත. |
| (ඇ) | සභාවේ ඉඩම් ලේඛනය තුල ඇතුලත් ඉඩම් 41 ක අයිතිය සභාව වෙත | 2022 2023 | සභාවට පවරා ගත යුතු ඉඩම් පවරා ගැනීමට කටයුතු | ඉඩම් කැබලි 28 ක් ලැබුණු ආකාරය පිළිබඳ විස්තර | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | |
|---|---|---|
| පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළ යුතුය. | නොමැති අතර ඉතිරි ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.33 බේරුවල නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 626,375,888 | 25,036,660 | 601,339,228 | 50,168,142 | තත්ත්වාගණනය කළ |
| **2022** | 637,189,475 | 20,755,011 | 616,434,464 | 12,368,388 | තත්ත්වාගණනය කළ |
| **2023** | 669,542,200 | 18,434,372 | 651,107,828 | 502,179 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මෘදුකාංග ලබා ගැනීමට අදාලව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර මෙම මෘදුකාංග සභාව සඳහා කොතරම් ඵලදායිත්වයකින් යුතුව භාවිතා කළ හැකිද යන්නත් සභාව සඳහා සත්‍ය ලෙසම අවශ්‍ය මෘදුකාංග මොනවාද යන්නත් පිළිබඳව අධ්‍යයනයකින් තොරව සභාවේ ආදායම් රැස් කිරීම අන්තර්ජාලය හරහා සිදු කිරීමට 2020 ජුනි රු.4,350,000 ක් වැයකර උපාංග 10 ක් සඳහා මෘදුකාංගය මිලදී ගෙන තිබුණු අතර මිලට ගත් දින සිට 2021 දෙසැම්බර් දක්වා භාවිතයට ගෙන නොතිබුණි. | 2021 | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. | ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නැත. තොග ගබඩා, ගිණුම්වාර්තා කළමනාකරණය හා පැමිණිලි කළමනාකරණය යන උපාංග 03 ට අදාල මෘදුකාංග මෙතෙක් ක්‍රියාත්මක නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | රු.1,075,410 ක් වටිනා කායවර්ධන උපකරණ සහිත බේරුවල, මරදාන පිහිටි කායවර්ධන මධ්‍යස්ථානය කායවර්ධන පුහුණුකරුවෙකු නොමැතිවීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට නිශ්කාර්යව පවතින අතර කායවර්ධන උපකරණ සෘජුවම මුහුදු සුළංවලට නිරාවරණය වීම හේතුවෙන් මළ බැඳීමකට ලක්වීමේ අවදානමක් ද පැවතුණි. | 2022<br>2023 | කායවර්ධන මධ්‍යස්ථානයට පුහුණුකරුවෙකු යොදා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ක්‍රියා මාර්ග ගැනීමට බලාපොරොත්තු වෙන බව දන්වා ඇත. | මේවන තෙක් ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (ඇ) | 2012 වර්ෂයේ සිට සභාව භාවිතා කරන ලද කැබ් රථයක් සභාව නමට පවරා ගෙන නොතිබුණි. | 2023 | වත්කම් සභාව නමට පවරා ගත යුතුය. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර ඇත. | මේවන තෙක් ක්‍රියාමාර්ග ගෙන නැත. |

## 3.34 ජා-ඇල නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 4,007,857,865 | 83,750,218 | 3,924,107,647 | 44,943,673 | තත්වාගණනය කළ |
| **2022** | 4,067,804,885 | 118,096,199 | 3,949,708,686 | 25,390,607 | අහිතකර |
| **2023** | 4,171,928,091 | 68,808,617 | 4,103,119,474 | 142,785,008 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.13, 5.6.11, 2.4.1, 2.4.11, 2.3.22, 2.3.23, 2.6.11(i), (ii), (iv), 4.2.21, 4.3.11 යන මාර්ගෝපදේශවලට පටහැනිව නගර සභා කාර්යාල කටයුතු පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග පද්ධති 9ක් මිලදී ගැනීම සඳහා රු.9,387,500ක් ගෙවා තිබුණු අතර විගණිත දින වන 2023 සැප්තැම්බර් 25 දින වන විටත් තොග හා ගබඩා කළමනාකරණ මෘදුකාංගය සහ වැටුප් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක තත්වයේ නොපැවති අතර ඒ සඳහා ගෙවූ | 2023 | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර සභාව වෙත අවශ්‍ය මෘදුකාංගවල අවශ්‍යතාවයන් නිසි ලෙස හඳුනාගෙන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | නිලධාරින් හට ප්‍රමාණවත් පරිගණක දැනුමක් නොමැති වීමත් හේතුවෙන් තොග හා ගබඩා කළමනාකරණ මෘදුකාංගය හා වැටුප් කළමනාකරණ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහගත තත්වයක් මතුවී තිබුණි. | මේ වනවිට පරිගණක දැනුමැති නිලධාරින් යොදවා මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.655,000ක් සහ රු.865,000ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | | | | |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.13, 2.1.21, 2.4.1, 2.4.11, 2.3.22, 2.3.23, 2.6.11(i), (ii), 4.2.21, 4.3.11 හා 5.6.11 යන මාර්ගෝපදේශවලට පටහැනිව අන්තර්ජාලය ඔස්සේ ගෙවීමේ යෙදවුමක් මිලදී ගැනීම - තෙවන අදියර ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.3,595,000ක මුදලක් ගෙවා තිබුණු අතර සම්පූර්ණ පුහුණුව ලබා දී නොතිබියදී සියයට 25ක වටිනාකම රඳවා නොගෙන මුළු මුදලම ගෙවා තිබීමෙන් රු.898,750ක අවිධිමත් ගෙවීමක් නිරීක්ෂණය වූ අතර විගණිත දින වන 2023 සැප්තැම්බර් 25 දින වන විටත් මෘදුකාංග භාවිතයෙන් අදාල කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණු හෙයින් වැයකළ රු.3,595,000ක මුදල ම නිෂ්කාර්ය වියදමක් විය. | 2023 | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දැනට භාවිතා කරනු ලබන මෘදුකාංගය සමග සමගාමීව අන්තර්ජාල ගෙවීම් ද සිදුකළ යුතු බැවින් හා පද්ධති අතර ගැටීම් සිදුවීම වැලැක්වීම සඳහා එකම ආයතනයෙන් අන්තර්ජාල ගෙවීම් සඳහා ද අදාළ මෘදුකාංගය මිලදී ගෙන ඇති අතර, ගිවිසුමේ සඳහන් සියලු මෘදුකාංග කොටස් සඳහා පුහුණුව ආවරණය වී ඇති බැවින් මහ සභාවේ අනුමැතිය මත අදාළ ගෙවීම් සිදුකර ඇත. | ගිවිසුමේ සඳහන් සියලු මෘදුකාංග කොටස් මගින් අදාළ කාර්යයන් සිදුකරමින් ඇත. |

**3.35 වත්තල මාබෝල නගර සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 3,414,766,504 | 109,522,325 | 3,305,244,179 | 48,496,019 | තත්වාගණනය කළ |
| **2022** | 6,273,881,624 | 53,176,558 | 6,220,705,066 | 74,202,464 | තත්වාගණනය කළ |
| **2023** | 6,374,680,572 | 60,298,286 | 6,314,382,286 | 82,282,721 | අහිතකර |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2013 අගෝස්තු 22 දින රු.9,475,000 කට සභාව විසින් මිලදී ගෙන තිබූ අක්කර 01 පර්චස් 29.50 ක ඉඩම මිලදී ගැනීමේදී එහි නිරවුල් අයිතිය ලබා ගෙන මිලදී ගැනිම සිදු කර ගත යුතු වූවද එහි අනවසර පදිංචි නිවාස 03 ක් සමග මිලදී ගෙන තිබු අතර ඉඩම වටා තාප්පයක්ද ඉදිකර තිබුණි. එම නිවාස 03 සදහා විදුලි බලය ලබා ගෙන තිබු බැවින් එම විදුලිය ලබා ගැනීම සභාවේ අවසරයකින් සිදුව තිබු අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු නොකොට 2021 පෙබරවාරි 23 දින සභා තීරණය පරිදි නගර සභාවට කුලී මුදලක් අය කර ගත හැකි | 2021 | වත්කම් ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කර සභාවේ නිරවුල් අයිතිය තහවුරු කළ යුතුය. | ප්‍රදේශවාසීන්ගේ විරුද්ධත්වය හේතුවෙන් අදාල ඉදිකිරීම සිදු කිරීමට නොහැකි වී ඇත. | එම පදිංචි කරුවන් නීති ගත කිරීම සඳහා අදාල අනුමැතියක් ලබා ගෙන ගිවිසුම් ගත වීමේ පදනම මත කුලී ගිවිසුමකට 2023 ජූලි 21 දින සිට 2026 ජූනි 30 දක්වා ගිවිසුම් ගත වී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක්‍රමයකට එම නිවාස පදිංචිකරුවන්ටම ලබා දීමටද තීරණය කර තිබුණි. වාහන අංගනයක් ඉදි කිරීම සඳහා 2021 වර්ෂයේදී 2022 වර්ෂයේ අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබුණද මෙම නිවාස 03 පිහිටීම නිසා එම ගැටළුව නිරාකරණය කර නොගෙන වාර්ෂික අයවැයට ඇතුළත් කර තිබූ හෙයින් මෙම ඉදි කිරීම සිදු කිරීමට නොහැකිවී තිබුණි. | | | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ස්ථාන කුලී හා නිවාස කුලී හිඟ ශේෂය ලෙස රු.16,835,859 ක් වූ අතර, ඉන් රු.6,385,068 ක් එනම්, සියයට 38 ක් වර්ෂ 5 කට අධික කාලයක සිට පැවත එන ශේෂයක් විය. | 2022 | ගිණුම් අනුව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ මුදලින් 2024 අගෝස්තු 31 දිනට රු.847,047 ක් අය කර ඇත. ඉතිරි හිඟ මුදල් අය වෙමින් පවතී. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුලත් තොරතුරු අනුව, සභාව සතු ඉඩම් 15 කට අදාලව ඔප්පු අංක සඳහන් කර නොතිබුණු බව අනාවරණය වූ අතර ඉඩම් සම්බන්ධව හිමිකම් තහවුරු කර ගැනීමට ඔප්පු සකස්කර ගැනීම සභාවේ මූලිකම කාර්යයක් වුවද එසේ සිදුකර නොතිබුණි. | 2022 | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. | ඔප්පු සකස් කිරිමේ ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇත. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් මැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |

## 3.36 මිනුවන්ගොඩ නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,484,331,096 | 92,534,399 | 1,391,796,697 | 22,083,743 | තත්වාගණනය කළ |
| **2022** | 1,623,696,529 | 133,181,423 | 1,490,515,106 | 26,580,197 | තත්වාගණනය කළ |
| **2023** | 1,618,741,700 | 116,096,439 | 1,502,645,261 | 13,239,491 | අහිතකර |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වටිනාකම රු.5,388,056 ක් ගෙවීම් කරමින් හදිරම හන්දියේ ඉදිකරන ලද වැසිකිළි පද්ධතිය 2021 දෙසැම්බර් 31 දින වන විටත් අවුරුදු 04 කට ආසන්න කාලයක් මහජන පරිහරණය සඳහා විවෘත කිරීමකින් තොරව තිබියදී සංචාරක ආකර්ශණීය වෙළඳ මධ්‍යස්ථානයක් හා නවාතැන් පහසුකම් සහිත විවේක ස්ථානයක් ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගෙන මෙම වැසිකිළි පද්ධතිය ඉවත් කිරීමට 2021 මාර්තු 09 දින මහා සභාවේදී යෝජනා කර තිබුණි. ඒ හේතුවෙන් එය ඉදි කිරීම සඳහා | 2021 | ඉදිකිරීම් නගර සංවර්ධන සැලැස්මට අනුව සිදු කළ යුතුය. | පළාත් පාලන අමාත්‍යාංශය විසින් වැසිකිළි පද්ධතිය මහජනතාවට විවෘත කිරීමට කටයුතු කරමින් පවතී. | ශක්‍යතා අධ්‍යනයක් කරමින් පවතින අතර ඉන්පසු ඉදිරි කටයුතු කරන බව දන්වා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වැය කළ මුදල කළමනාකරණයේ පැවති තීරණ ගැනීමේ දුර්වලතාවය නිසා සිදුවූ නිශ්කාර්ය වියදමක් වශයෙන් නිරීක්ෂණය වේ. | | | | |
| (ආ) | මිනුවන්ගොඩ කොළඹ පාරේ අඹගහවත්ත ඉඩමේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සමිතියක් සමඟ ගිවිසුම්ගතවී තිබුණද මේ සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබූ අතර ව්‍යාපෘති වාර්තාවක් හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක්ද අනුමත කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ I අදියරවූ තෙමහල් ගොඩනැගිල්ලේ අත්තිවාරම දැමීම සඳහා ගිවිසුම්ගත මුදල රු.2,355,303 ක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 වගන්තියට පටහැනිව සමිතියක් තෝරා ගෙන ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. මුලු පිරිවැය අනුව මෙම ඉදිකිරිමට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 වගන්තිය අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි කොන්ත්‍රාත් කොන්දේසි හා | 2021 | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැටළු නිරාකරණය කරගෙන ව්‍යාපෘති ආරම්භ කිරීම කළ යුතුය. | මෙම නඩුවට විෂය වී ඇති නඩු නිමිත්ත සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ද නඩුවක් විහාග වන බැවින් නඩු කටයුතු අවසන් වන තුරු ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. | නඩුවක් විභාග වන බැවින් නඩු කටයුතු අවසන් වන තුරු ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිරිවිතර අනුව ගිවිසුම්ගත විය යුතු වුවද එසේ කටයුතු කර නොතිබූ අතර ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ කළද සභාවට අයත් එම ඉඩමේ ආරක්ෂාව පිළිබඳව සභාව කටයුතු නොකිරීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අධිකරණ වාරණ නියෝගයක් මත අතරමග නැවතීම සිදුවී තිබුණි. | | | | |
| (ඇ) | නගර සභාව විසින් 1979 වර්ෂයේ සිට මහජන ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කර නඩත්තු කර තිබුණු අක්කර 08 ක භූමි ප්‍රමාණයක් සහිත ජාපාලවත්ත ක්‍රීඩා පිටිය, ඉඩම් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ ප්‍රතිපාදන අනුව රජය සතු කර ගන්නා තෙක් සංවර්ධන කටයුතු සඳහා නිරවුල් භුක්තිය මිනුවන්ගොඩ ජනාධිපති විද්‍යාලය වෙත සභාවේ විරෝධතාවය නොසලකා පවරා තිබුණි. | 2022 | භූමියේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව තොරතුරු සොයමින් පවතියි. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය VIII වැනි පරිච්ඡේදයේ 9:1ට | 2023 | යොමුගත පරිච්ඡේදයට අනුකූල විය යුතුය. | වැඩ බලන ලේකම්ගේ උපදෙස් පරිදි පැමිණීමේ හා පිටවීමේ අත්සන් | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පටහැනිව විධිමත් පත්වීමක් නොමැති වැඩ බලන නිලධාරියකු වෙත 2022 සැප්තැම්බර් මාසයේ සිට 2023 ජූලි මාසය දක්වා නිවාඩු දින වැටුප් ලෙස රු.121,827ක් ගෙවා තිබුණි. | | | ලේඛණය අනුව නිවාඩු දින වැටුප් ගෙවා ඇත. | |
| (ඉ) | නිව්හැම් පාර ආරම්භවන ස්ථානයේ පිහිටා ඇති සභාවට අයත් රථගාල බදු පදනම මත ලබා දී තිබුණු 2019 වර්ෂයේදීම බදු ගැණුම්කරු එම ස්ථානයේ තාවකාලික කඩ කාමර 10 ක් ඉදිකර 2020 වර්ෂයේ සිට වර්ෂ 3 ක කාලයක් සඳහා වෙනත් අය වෙත බදු පදනම මත ලබා දී තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව සභාව ඊට එරෙහිව කටයුතු කර නොතිබුණි. | 2023 | ගිවිසුම් ප්‍රකාරව කළ යුතුය. | පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් මේ සම්බන්ධව 2024 ජූනි 12 ලිපියක් ඉදිරිපත් කර ඇත. | ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරමින් පවතී. |
| (ඊ) | නගර සභාවේ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා ජිම් කාපට් මිලදී ගැනීමේදී තොරා ගෙන තිබූ ආයතනය ලබා දී තිබුණු මිල ගණන් අනුව අඩි 2 x 2 (මි.මී.10) ප්‍රමාණයේ ජිම් කාපට් එකක මිල රු.4,950ක් බව අනාවරණය වූ අතර එම ආයතනය වෙත සභාව විසින් වර්ග අඩි 1ක් රු.1,100 බැගින් | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සැපයුම්කාර පාර්ශවය විසින් මිල ගණන් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ලිඛිතව ඉදිරිපත් කළ මිල ගණන් මත මිලදී ගැනීම් සිදුකර ඇති අතර අදාල කාර්යය නිමකර ඇත. | වර්තමානයේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම සිදුකරනු ලබයි. මිල කැඳවීමේදී අක්‍රමිකතාවයන් සිදුවී ඇතිද යන්න පරීක්ෂා කර නොමැත. |

වර්ග අඩි 1063.9ක් සඳහා රු.1,170,290 ක් ගෙවා තිබුණි. එහෙත් විගණනය විසින් එම ආයතනයෙන් ලිඛිතව ලබාගන්නා ලද මිල ගණන් අනුව වර්ග අඩි 1ක මිල රු.792 ක් වූයෙන් සභාව වර්ග අඩි 1කට රු.308 ක් බැගින් (රු.1100 -රු.792) වර්ග අඩි 1063.9ක් සඳහා රු.327,681ක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

## 3.37 කටුනායක සීදූව නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 3,688,500,875 | 220,346,365 | 3,468,154,510 | 193,042,302 | තත්වාගණනය කළ |
| 2022 | 3,811,814,066 | 195,336,420 | 3,616,477,646 | 177,782,346 | තත්වාගණනය කළ |
| 2023 | 3,969,701,451 | 163,026,582 | 3,806,674,869 | 147,401,208 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ඇවරිවත්ත දිනපතා පොළ බදු දීම සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 15 දින විගණනය විසින් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී කුලී අයකළ යුතු කඩ කාමරවලට අමතරව පදික වේදිකාවේ ඉදිකර තිබුණු අනවසර කඩ 37 කින් බදුකරු විසින් කුලී මුදල් අයකරමින් තිබුණි. | 2021 | අනවසර කඩකාමර වලින් කුලී අය නොකළ යුතුය. | අනවසර කඩ කාමර ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ භූමියේ අයිතිය හිමි මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දී ඇතත් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | සීදූව ලියනගේමුල්ල පල්ලිය පාරේ සිට කරුණාරත්න මාවත දක්වා දුම්රිය රක්ෂිතය ප්‍රවේශ මාර්ගය ලෙස භාවිතා කළ පදිංචිකරුවන්ට මාර්ග අවහිරතාවය ඉවත් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී පෞද්ගලික ඉඩම්වලින් | 2021 | වන්දි ගෙවීම සභාවට වාසිදායක අන්දමින් සිදුකළ යුතු අතර එය ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. | නගර සභා ආඥා පනතේ 4වන වගන්තිය ප්‍රකාරව ජනතාවට සුබ විහරණය සැලසීමේ අරමුණ ඇතිව ප්‍රවේශය ලබා දීමට කටයුතු සිදු කරන ලදී. | අදාළ වන්දි මුදල් 2017 ජූලි 23 දින ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර ඇති අතර මේ වන විට 5වන වගන්තිය ප්‍රකාශයට පත්කර අවසාන පිඹුර සකස් කර ඇතත් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

අඩි 10 ක බිම් තීරුවක් සභාවට පවරා ගෙන මෙම ඉඩම් කොටස්කරුවන්ට කරුණාරත්න මාවත භාවිතා කිරීමට ඉඩ සලස්වා ඉඩම් කට්ටි අංක 11 තක්සේරුව වූ රු.882,500 ක මුදල වන්දිය ලෙස ගෙවීම සිදු නොකොට, දුම්රිය පල පාර භාවිතා කිරීමට ඉඩ සලස්වා ඉඩම් කොටස් අංක 01 තක්සේරුව වූ රු.1,887,000 ක වන්දි මුදල ප්‍රාදේශීය ලේකම් කටාන වෙත 2017 පෙබරවාරි 23 දින තැන්පත් කර තිබුණි. මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ වන්දියට අමතරව ඉඩමේ හදිසි භුක්තිය භාරගන්නා දිනයේ සිට වන්දි ගෙවීම අවසන් දිනය දක්වා සියයට 7 ක පොලී මුදලක් ගෙවීමට සිදුවන අතර එවිට ඉඩම් කට්ටි අංක 01 පවරා ගැනීමේදී විශාල පොලී මුදලක්ද ගෙවිමට සිදු වනු ඇත. යම් තක්සේරුවක් වර්ෂ 3 ක කාලයක් බල පැවැත්වෙන අතර මේ වන විට වර්ෂ 5 ක කාලයක් ගත වී ඇති අතර ගෙවීමට සිදුවන වන්දි මුදල හා පොලිය මීට වඩා වැඩි වන බවද නිරීක්ෂණය විය.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | දෛනිකව මෙට්‍රික් ටොන් 26.5 ත් 30.5ත් අතර අපද්‍රව්‍ය ප්‍රමාණයක් විවෘත අපහරණ භූමිය වෙත අවිධිමත්ව බැහැර කර තිබූ බව භෞතික පරික්ෂණයේදී නිරීක්ෂණය විය. | 2022 | පරිසර දූෂණය සහ මහජන සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමුකළ යුතුය. | අපද්‍රව්‍ය මත පස් දමා වසා දැමීමට පියවර ගනු ලැබේ. | අපද්‍රව්‍ය බැහැර කර ඒ මත පස් තට්ටුවක් දමා ආවරණය කිරීම සිදු කළද අපද්‍රව්‍ය අවිධිමත්ව බැහැර කිරීම සිදු කරයි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි571(2) ප්‍රකාරව තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර විමසීම් කර බැලීය යුතු වුවත් වර්ෂ 2ක ඉක්මවූ රු.6,309,706ක් එවැනි විමසීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. | මුදල් රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට පියවර ගැනීම. | ඉදිරි වර්ෂවලදී මුදල් රෙගුලාසි අනුවම ක්‍රියා කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | 2023 වර්ෂයේ ඉඩම් කට්ටිකර විකිණීමකදී සභාව වෙත හිමිවී තිබූ පර්චස් 88.8ක පොදු පහසුකම් ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමේදී රු.1,250,000ක් වූ එක් පර්චසයක අවම විකුණුම් මිල හෝ සැලකිල්ලට නොගෙන ලැබී තිබුණු ඔප්පු වටිනාකම වූ රු.100,000ක් ඉඩමේ වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.1,250,000ක් වූ එක පර්චසයක අවම විකුණුම් මිල | 2023 | නිවැරදි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | ඉදිරි වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමට පියවර ගැනීම. | ඉදිරි වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කර ඉඩමට අදාළව සාධාරණ අගයක් අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සැලකිල්ලට ගැනීමේදී පර්චස් 88.8ක පොදු පහසුකම් ඉඩමෙහි වටිනාකම රු.111,000,000ක් ක් විය යුතු වූයෙන් සභාවට හිමිවී තිබූ ඉඩමේ වටිනාකම රු. 110,900,000කින් අවතක්සේරු වී තිබුණි. | | | | |
| (ඊ) | 2022 වර්ෂයේදී අන්තර්ජාලය ඔස්සේ ගෙවීම් කිරීමට මෘදුකාංග 07ක් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත රු.4,985,000ක් ගෙවා තිබුණි. වටිනාකම රු.3,565,000 ක් වූ මෘදුකාංග පද්ධති 05ක් 2023 නොවැම්බර් 24 විගණිත දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෘදුකාංග පද්ධති සක්‍රීය කර ගැනීමට නෙක්ෆා සමාගම සමඟ සාකච්ඡා කර ඇත. | නෙක්ෆා සමාගම සමඟ සාකච්ඡා කර අදාළ සියලු අයිතම සක්‍රීය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 3.38 පැලියගොඩ නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,645,845,040 | 30,515,486 | 1,615,329,554 | 33,203,875 | තත්වාගණනය කළ |
| **2022** | 2,489,864,251 | 26,462,837 | 2,463,401,414 | 33,099,357 | අහිතකර |
| **2023** | 3,094,303,111 | 33,602,556 | 3,060,700,555 | (38,021,625) | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ගේට්ටු පියන් දෙකක් අස්ථාන ගත වීම සම්බන්ධයෙන් වූ රු.312,500ක අලාභය අයකර ගැනීමට ලබා දී තිබුණු නිර්දේශයට මුදල් කමිටුව එකඟ නොවීම මත විමර්ශනයක් සඳහා 2022 පෙබරවාරි 24 දින පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් මාස 10 ක පමණ කාලයක් ගත වී තිබුණද පරීක්ෂණයක් පැවත්වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. | 2022 | පරීක්ෂණ පවත්වා අලාභ අය කරගැනීමට කටයුතු කළ යුතුය. | අලාභය වන රු.312,500ක මුදල ශ්‍රී ජයන්ති ප්‍රජා මණ්ඩලයෙන් අයකිරීමට කටයුතු කරනු ලැබේ. | අධිකරණයේ නඩු පවරා අය කිරීමට නීතිඥයකු වෙත භාර දී ඇතත්. මෙතෙක් අය කර ඒවා නැත. |
| (ආ) | සභාවට අයිතියක් නොමැති දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩමක ඉදිකළ 4 | 2023 | ව්‍යාපෘති ඉටුකිරීමට පෙර හිමිකම පිළිබඳව සහතික | ඉදිරියේ දී සැලකිය යුතු ආදායමක් ලබාගැනීම සඳහා ටෙන්ඩර් | මෙම ඉඩම සඳහා බදු ගිවිසුම ලබා ගැනීම සඳහා 2023 සැප්තැම්බර් 05 |

| | | | |
|---|---|---|---|
| කණුව පොදු වැසිකිළි පද්ධතිය සඳහා වැය කර තිබූ රු.10,204,180 ක මුදල අවිධිමත් ගණුදෙණුවක් වූ අතර නගර සභා ආඥා පනතේ 110(2) වගන්තිය ප්‍රකාරව මහජනයා ගැවසෙන ස්ථානවල අවශ්‍ය පරිදි පොදු වැසිකිලි පහසුකම් සැපයිය යුතු වුවද මහජනයා නොගැවසෙන ස්ථානයක පිරිමි වැසිකිලි 3ක්, ගැහැණු වැසිකිලි 3 ක්, ආබාධිත වැසිකිලි 2 ක් හා ගැහැණු, පිරිමි නාන ස්ථාන 2ක් ලෙස විශාල වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමේ වියදම නිශ්කාර්ය වියදමක් ද විය. | කරගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රදානයකින් තොරව නගර සභාව මගින් පාලනය කරමින් සේවාව සැපයීමට අපේක්ෂා කරනු ලැබේ. | දාතම ලිපියකින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති අතර මේ වන තෙක් බදු ඔප්පුව ලැබී නොමැත. |

## 3.39 ගම්පළ නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 7,285,676,721 | 150,887,444 | 7,134,789,277 | 29,580,076 | තත්ත්වාගණනය කළ |
| 2022 | 7,328,890,205 | 139,611,626 | 7,189,278,579 | 3,839,582 | තත්ත්වාගණනය කළ |
| 2023 | 7,396,387,361 | 125,534,475 | 7,270,852,886 | 48,636,781 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 36 5 (ii) ප්‍රකාරව අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලයින් 134 දෙනෙකුට සහා ඉඩම් බදු දී තිබුණු අතර රු. 3,736,411ක බදු කුලී අයකර ගෙන නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන අනුව නිසි අනුමැතියක් යටතේ ඉඩම් බදු දිය යුතු අතර අදාළ බදු කුලී අයකරගත යුතුය. | හිඟ මුදල් අය කරන බව | අනුමැතිය ලබා ගෙන නොමැත. රු. 2.813,274 ක හිඟ ශේෂය අයකර ගෙන නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු. 9,041,373 ක වාහන 03 ක් හා රු.613,800 ක ට්‍රේලර් 04 ක් වසර 01 ත් 08 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි. | 2023 | අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. | 2024 ජුලි 24 දින තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට යොමුකර ඇත. | අපහරණය කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | පොදු වෙළඳපොල සංකීර්ණයේ කඩ කාමර 38ක් බදු දීමට නොහැකිව වසා දමා තිබුණු අතර ටෙන්ඩර් කර ව්‍යාපාර සඳහා පවරා දී තිබුණු කඩ කාමර 60ක් ගිවිසුම්ගත වීමකින් තොරව අවිධිමත්ව බදු දී තිබුණි. | 2023 | සියලු කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතු අතර විධිමත් බදු ගිවිසුම්වලට එළිඹිය යුතුය. | සන්තකයේ පවරා ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | විධිමත් බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |

## 3.40 වත්තේගම නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 189,475,028 | 24,239,517 | 165,235,511 | 3,301,158 | තත්ත්වාගණනය කළ |
| **2022** | 196,592,006 | 27,918,891 | 168,973,115 | 10,399,107 | තත්ත්වාගණනය කළ |
| **2023** | 199,609,437 | 15,973,876 | 183,635,561 | 7,339,845 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් දෙල්ගහලන්ද ඉඩමේ කොටසක පුද්ගලයන් 44 දෙනෙක් භූමිය අත්පත් කරගෙන අනවසරයෙන් පදිංචි වී තිබුණි. | 2023 | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය . | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ඉවත් කිරීමට කටයුතු කර නොමැත. |
| (ආ) | රු.5,778,125 ක වාහන හා යන්ත්‍රෝපකරණ 07 ක් වසර 04 ත් 15 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි. | 2023 | වෙන්දේසි කිරීමට හෝ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | ජල බවුසරය අලුත්වැඩියාව සඳහා යොමු කර ඇත . | ජල බවුසරය හැර ඉතිරි වත්කම් අභාවිතව පවතී. |

## 3.41 නාවලපිටිය නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 322,003,168 | 37,564,966 | 284,438,202 | 21,629,256 | තත්ත්වාගණනය කළ |
| **2022** | 350,171,108 | 36,288,823 | 313,882,285 | 19,525,232 | තත්ත්වාගණනය කළ |
| **2023** | 381,435,137 | 29,335,619 | 352,099,518 | 23,028,979 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 34 1 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභාවට අයත් බව්වාගම ඉඹුල්පිටිය වත්ත ඉඩමෙහි අක්කර 16 රූඩ් 01 පර්චස් 9.27 ක ප්‍රමාණයක බදු ගිවිසුම් යටතේ 2010 වර්ෂයේ සිට පුද්ගලයින් 143 දෙනෙකු පදිංචි කරවා තිබුණි. | 2023 | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව. | අනුමැතිය ලබාගෙන නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.134,558,962 ක කඩ කුලී හිඟ ශේෂයක් පැවති අතර එතුල කඩ කුලී හිඟය රු.100,000 ක් ඉක්මවූ කඩ කාමර 51 කින් රු.27,213,122 ක් හිඟව පැවතුණි. එමෙන්ම සුපිරි වෙළඳ සංකීර්ණයේ හිඟ | 2023 | හිඟ මුදල් අය කළ යුතුය. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව. | ප්‍රමාණවත් මුදලක් අයකර ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ශේෂය රු.106,075,964 ක් පැවති අතර 2018 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත වූ කුලී වැඩි කිරීම හේතුවෙන් කඩ හිමියන් කුලී ගෙවීම පැහැර හැර තිබුණි. නගර සභාව ඊට එරෙහිව 2019 වර්ෂයේ නඩුවක් ගොනුකර තිබුණි. වෙළඳ සංකීර්ණය පිහිටි භූමියේ අයිතිය පිළිබඳ නීත්‍යානුකූල ලියවිලි නොමැති වීම හේතුවෙන් නඩුව අවසන්ව නොතිබුණි. ගම්පොළ පාරේ හට කඩ කාමර කඩ 03 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.527,600 ක මුදලක් හිඟව පැවතිණි. භූමියේ අයිතිය සභාව සතු කොත්මලේ පාර කඩ කාමර 49 ක් හා සුපිරි වෙළඳසැල අසල කඩ 07 ක් සඳහා 2018 වර්ෂයේ සිදුකල නව තක්සේරුවට අනුව බදුකරුවන් විසින් කඩ කුලී ගෙවීම පැහැර හැරීම හේතුවෙන් රු.24,797,439 ක හිඟයක් පැවතුණි. | | | | |
| (ඇ) | 2020 – 2021 වර්ෂවල හඳුනාගත් වරිපනම් මෘදුකාංගයේ සිදුවී ඇති අක්‍රමිකතාවය වූ රු.1,431,151 ක් සම්බන්ධයෙන් 2022 පෙබරවාරි 21 දින | 2023 | මුදල් රෙගුලාසි අනුව කඩිනමින් අදාළ පරීක්ෂණ සිදුකළ යුතුය. | මු (4)104.රෙ. පරීක්ෂණ කටයුතු සිදුරමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පාඩුව අය කරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පරීක්ෂණ ඇරඹී තිබූ නමුත් වරද හඳුනාගෙන වසර 02 1/2 ක කාලයක් ගතවුවද ඊට අදාළව පොලීසියේ පැමිණිල්ලක් හෝ මු.රෙ.104(3) හා මු.රෙ.104(4) පරීක්ෂණ සිදුකර නොතිබුණි. | | | | |
| (ඈ) | හිටපු සභාපතිවරයා භාවිතා කළ කැබ් රථය 2022 මැයි 09 වන දින අනතුරට පත්වී තිබූ අතර අලාභයේ දළ ඇස්තමේන්තුව රු.9,500,000 ක් තක්සේරු කර තිබුණද, ඊට අදාළ මු.රෙ.104(3) හා මු.රෙ.104(4) පරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සිදුකර නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මු.රෙ.104(4) පරීක්ෂණ කටයුතු සිදුරමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පාඩුව අය කරගෙන නොමැත. |
| (ඉ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත 2013 – 2019 කාලය තුළ බඳවාගත් සේවකයින් 10 දෙනෙකුගේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට සේව්‍යාගෙන් හා සේවකයන්ගේ දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සේවකයින් නඩු පවරා තිබූ අතර ඊට අදාළ නඩු තීන්දුව අනුව සේවකයාගේ සියයට | 2023 | සභාවට සිදු වූ අලාභය අයකරගත යුතුය. | අදාළ පාර්ශවයන්ගෙන් අය කිරිමට කටයුතු කරන බව. | අය කරගෙන නොතිබුණි. |

08 ක දායකය ද සභාවට දැරීමට සිදු වීම හේතුවෙන් වූ අලාභය රු.1,024,978 ක් විය.

## 3.42 කඩුගන්නාව නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 1,092,785,371 | 27,183,795 | 1,065,601,576 | (6,998,535) | තත්ත්වාගණනය කළ |
| 2022 | 1,095,561,520 | 14,463,871 | 1,081,097,649 | 1,771,988 | තත්ත්වාගණනය කළ |
| 2023 | 1,102,353,968 | 14,296,031 | 1,088,057,937 | 980,207 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතෙහි 158 5 ප්‍රකාරව විකිණීම්වලින්, බදු දීම්වලින් හෝ සභාවේ වෙනත් ගනුදෙනුවලින් ලැබෙන සියලු මුදල් සභා අරමුදලට ගෙවිය යුතු බව දක්වා තිබුණද, 2016 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා කාලය තුළ ඝන අපද්‍රව්‍ය අලෙවියෙන් ලද රු.1,163,267 ක ආදායමක් ආදායමට බැර නොකර සෞඛ්‍ය සේවකයින් සඳහා ගෙවා තිබුණි. | 2023 | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත මේ පිළිබඳ දැනුම් දී ඇති බව. | ගෙවූ මුදල් ආපසු අයකරගෙන නොමැත. |
| (ආ) | සංචාරක පුරවරයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021 මාර්තු 03 දින දුම්රිය දෙපාර්තමේන්තුව වෙත රු.1,360,400 ක මුදලක් ගෙවා ඇති | 2023 | ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් ආපසු ලබා ගෙන නොමැත. |

අතර අදාළ දේපල බදු ගැනීම සම්බන්ධව දෙපාර්ශවය විසින් ගිවිසුම්ගත වීමට කටයුතු කර නොමැති බැවින් ගොඩනැගිල්ල සභාවට නොලැබීම හේතුවෙන් ඒ සඳහා ගෙවූ රු.1,360,400 ක මුදල ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.43 තලවාකැලේ ලිඳුල නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 149,692,402 | 36,442,206 | 113,250,196 | 5,941,468 | තත්ත්වාගණනය කළ |
| **2022** | 147,370,039 | 29,201,978 | 118,168,061 | 3,306,896 | තත්ත්වාගණනය කළ |
| **2023** | 148,069,863 | 31,618,766 | 116,451,097 | 491,961 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය සඳහා තානායම බදු දීමට ප්‍රසම්පාදන මිළ ගණන් කැඳවා සභා අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ පෞද්ගලික අභිමතය පරිදි වසර 10 ක බදු ගිවිසුමකට එළඹ තිබුණි. රු.2,016,000ක වාර්ෂික බදු කුලියකට පෞද්ගලික පාර්ශවයකට බදුදීමෙන් පසු රු.1,499,212 ක් සභා අරමුදලින් වැය කර තානායම අළුත්වැඩියා කර තිබුණි. එමෙන්ම තලවාකැලේ තානායම වසරකට බදු දී තිබියදී බදුකරු විසින් සභා අනුමැතියකින් තොරව තානායම් භූමිය තුළ වර්ග අඩි 3000 ක ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | | සභාවට වාසිදායක වන අයුරින් කටයුතු කළ යුතුය. | ටෙන්ඩකරුගේ ඉල්ලීම අනුව තානායම වසර 10 කට බදු දුන් බවත්, තානායම් ගොඩනැගිල්ලට හානියක් නොවන පරිදි එම තාවකාලික ඉදිකිරීම සඳහා හිටපු ගරු සභාපතිතුමා විසින් සිය පෞද්ගලික අනුමැතිය ලබා දී ඇති බවත් දන්වා ඇත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ලිදුල සාප්පු සංකීර්ණයේ තනි මහල් කඩ කාමර ලෙස ඉදිකර සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව ලබා දී තිබුණු කඩ බදුකරුවන් විසින් දෙමහල්, තෙමහල් හා සිවු මහල් ලෙසට සභාවේ අවසරයක් නොමැතිව ඉදිකර තිබුණි. එහෙත් සභාව ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | | නොපමාව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. | කඩ කාමර මහල් ලෙස ඉදිකිරීම 2002 සිට 2005 දක්වා කාලය තුළ ඉදිකර ඇතත් සභාව සමඟ කඩහිමියන් ගිවිසුම් ගත වී ඇත්තේ 2015 වර්ෂයේදී බවත් දන්වා ඇත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධ ගැටළු විසඳී නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.17,280,286 ක යන්ත්‍ර, ලී බඩු හා කාර්යාල උපකරණ ඒකක 327 ක් හා වාහන 07 ක් වසර 02 සිට වසර 10 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | 2022 | අළුත්වැඩියා කර උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර එම නිරික්ෂණ ලැබීමෙන් පසුව ක්‍රියාමාර්ග ගන්නා බව. | වාහන 08 ක් නිෂ්කාර්යව පවතී. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ලොරි රථයක් අළුත්වැඩියාව සඳහා එකතුව රු. 569,890 ක් වැයකර තිබුණද, අදාළ ලොරි රථය භාවිතයට ගත නොහැකි බැවින් ඒ සඳහා වැයකළ මුදල් අනාර්ථික වී තිබුණි. | 2023 | අවශ්‍යතාවය සලකා බලා අළුත්වැඩියාව සිදුකළ යුතුය. | ස්ටාටර් මෝටර් මෙම වාහනයේ නොමැති බැවින් මෙම වාහනය ධාවන තත්වයේ නොමැති බව. | ලොරි රථය භාවිතයට ගෙන නොමැත. |

## 3.44 හැටන් දික්ඔය නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 248,107,873 | 70,306,689 | 177,801,184 | 22,363,248 | තත්ත්වාගණනය කළ |
| **2022** | 235,650,595 | 56,019,023 | 179,631,572 | (5,927,979) | තත්ත්වාගණනය කළ |
| **2023** | 268,839,334 | 58,272,412 | 210,566,922 | 19,312,704 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂය ආරම්භයේ පැවති වරිපනම් බදු හිඟයෙන් රු.8,553,698 ක්ද සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් බදු වලින් රු.4,654,938 ක් ලෙසට ඒකක 2520 කින් පුද්ගලයින් 252 දෙනෙකුගෙන් අයකර ගතයුතු වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොතිබුණි. | 2021 | හිඟ වරිපනම් අයකළ යුතුය. | වරිපනම් බදු නොගෙවූ අයට රතු නිවේදන යොමු කර ඇති බව දන්වා ඇත. | 2024 අගෝස්තු 31 දිනට වරිපනම් බදු හිඟය රු.9,954,751 ක් විය. |
| (ආ) | 2018 හා 2019 වර්ෂවලට අදාළ රු.1,581,710 ක හිඟ තානායම් කුලිය 2023 ජුලි 31 විගණිත දිනය වනවිටද අයකර ගෙන නොතිබුණි. | 2021 | හිඟ තානායම් කුලී අයකළ යුතුය. | තානායම් කුලී ගෙවන ලෙස කිහිප වරක් දන්වා ඇතත් තානායම නැවත ආරම්භ කිරීමෙන් පසු හිඟ කුලී ගෙවීමට කටයුතු කරන බව පැවසුවද | අය වී නොමැත. 2024 අගෝස්තු 31 දිනට හිඟය රු.1,581,710 ක් විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | එය ඉටු නොකිරීම නිසා සභාවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබාගෙන තානායම නවීකරණය කිරීමට කටයුතු කරන බවත් හිඟ මුදල ගෙවා අවසන් කරන ලෙස 2022 මැයි 30 දින තානායම්කරුට නැවත දැනුම් දුන් බවත් දන්වා ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු සමීක්ෂණය නොකර දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ඉල්ලීම් කළ ආයතනයන්ගෙන් පමණක් බිල්පත් යොමු කර රු 235,800.ක මුදලක් අයකර තිබුණද 2022 දින 18 තෝබර්ඔක් විගණන පරීක්ෂාවට ක 36 ලක් වූ පුවරු දැන්වීම් සඳහා ගාස්තු අයකර නොතිබීම හ◌ේතුවෙන් රු 901,200.ක අලාභයක් සිදුවී තිබුණි . | 2022 | සමීක්ෂණයක් කර ආදායම් අයකර ගත යුතුය. | එළැඹෙන වර්ෂයේදී දැන්වීම් පුවරු සම්බන්ධ සමීක්ෂණ කටයුතු නිසි ලෙස සිදු කර , ආදායම් ගැනීමට අයකර කටයුතු කරන බව | අතුරු ව්‍යවස්ථා පනවා නොමැත . ජේදයේ සඳහන් ගාස්තු අය කර .නොමැත |
| (ඈ) | මු.රෙ 104 (3) හා (4) ප්‍රකාරව 2020 ජනවාරි 28 දින හදිසි ගින්නකින් හානි වූ තානායම සඳහා සමාලෝචිත වර්ෂයේ | 2023 | දේපලවල ආරක්ෂාව තහවුරු කළ යුතුය. | තානායමේ මෙම නගර සභාව සතු භාණ්ඩ තිබූ බවට ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නොමැති බැවින් | පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ තුනක කාලයක් ගත වී තිබුණද, පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | | | මු.රෙ 104 (4) පරීක්ෂණයක් සිදු කර නොමැති බව. | |
| (ඉ) | මු.රේ 371 (5) අනුව කාර්ය නිමකළ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවද,1987 සිට 2023 දක්වා කාල පරාසයක සිට පවත්නා, රු. 617,174 ක් වටිනා අත්තිකාරම් 49 ක් පියවීමට කටයුතුකර නොතිබුණි. | 2023 | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. | මු.රෙ. 371 (5) වසර 35 ක කාලයක සිට පැවත එන පැරණි ශේෂය බැවින් ඉදිරියේදි නිරවුල් කිරිමට පියවර ගන්නා බව. | අත්තිකාරම් පියවා නොමැත. |
| (ඊ) | නගර සභා බල ප්‍රදේශයේ පවතින කඩ කාමර 314 ක 2020 සහ 2021 වර්ෂවලදී අවස්ථා 02 කදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණ තක්සේරු වාර්තා අනුව කඩකුලී අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයේ ජුනි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා මාස 19 ක කාලයක් තුළ කඩ කාමර 314 කින් රු.15,481,979 ක කුලී අය කර නොතිබුණි. | 2023 | තක්සේරු වාර්තා අනුව හිඟ ගාස්තු රැස් කළ යුතුය. | ගෙවිය යුතු හිඟ මුදල් පිළිබඳව දැනුම්දී ඇති බව. | නව තක්සේරුව ක්‍රියාත්මක කර නොමැත. |

## 3.45 අම්බලන්ගොඩ නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 258,431,958 | 114,039,724 | 144,392,234 | 29,345,577 | තත්ත්වාගණනය කළ |
| 2022 | 282,030,981 | 125,829,523 | 156,201,458 | 7,238,526 | තත්ත්වාගණනය කළ |
| 2023 | 290,363,774 | 107,731,670 | 182,632,104 | 17,993,651 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | භාවිතා කළ නොහැකි තත්ත්වයක පැවති පැරණි වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 58 ක් සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 | සභාව සතු දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | කඩිනමින් ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව. | මෙතෙක් කඩ කුලී අය කරගෙන නොමැති අතර, කඩා ඉවත් කිරීමට කටයුතු කර නොමැත. |
| (ආ) | සභාව සතු කඩ කාමර පිළිවෙලින් 55 කින් හා 51 කින් 2007 හා 2015 වර්ෂවලින් පසුව තක්සේරු කර බදු අයකර නොතිබුණි. | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව තක්සේරුව සිදු කළ යුතුය. | විගණන නිරීක්ෂනය හා එකඟ වන බව. | තක්සේරු කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත. |
| (ඇ) | නගර සභාවට අයත් තානායම් භූමිය සංවර්ධනය කර පවත්වාගෙන යාම සඳහා 2013 නොවැම්බර් 09 දින සිට වසර 50 ක කාලසීමාවක් සඳහා පෞද්ගලික සමාගමක් සමඟ බදු ගිවිසුමට | 2023 | තානායම් භූමිය සංවර්ධන කටයුතු සඳහා යොදා ගත යුතුය. | ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරී වෙතින් උපදෙස් ඉල්ලා ඇති බව. | අම්/නස/02/17/01 iv හා 2024 ජනවාරි 08 දිනැති ලිපිය මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමුකර ඇති අතර ලැබෙන උපදෙස් මත කටයුතු කරමි. |

එළඹ තිබූ අතර බදු දී වසර 10 ක කාලසීමාවක් ගත වී තිබුණ ද, මෙම භූමිය තුළ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර, නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3.46 හික්කඩුව නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 534,103,024 | 35,811,660 | 498,291,364 | 16,373,126 | තත්ත්වාගණනය කළ |
| **2022** | 548,595,303 | 39,046,118 | 509,549,185 | 4,349,385 | තත්ත්වාගණනය කළ |
| **2023** | 500,722,994 | 35,306,795 | 465,416,199 | 26,411,658 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2022 මැයි 09 දින කොළඹ ගොස් නැවත සභාව වෙත පැමිණීමේ දී සභාව සතු රු.6,400,000 ක් වටිනා වෑන් රථය කලහකාරීන් විසින් සම්පූර්ණයෙන්ම විනාශ කර තිබුණ ද, අලාභ හානිය සම්බන්ධයෙන් මු.රෙ.104 අනුව කටයුතු කර නොතිබුණි. | 2022 | පරීක්ෂණයක් පවත්වා ඊට අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පරීක්ෂණය සඳහා කමිටුවක් පත් කිරීමට අදාළව උපදෙස් ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව හානි සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගත හැකි බව. | මු.රෙ.104 පරීක්ෂණය පළාත් පාලන ආයතනය විසින් පවත්වන ලදී.එහි අතුරු පරීක්ෂණ වාර්තාවක් නගර සභාව වෙත යොමු කර ඇති බව. |

## 3.47 වැලිගම නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 237,087,726 | 40,930,261 | 196,157,465 | 30,991,088 | තත්ත්වාගණනය කළ |
| **2022** | 235,217,739 | 37,386,554 | 197,831,185 | 22,120,182 | තත්ත්වාගණනය කළ |
| **2023** | 236,023,323 | 36,733,087 | 199,290,236 | 9,496,600 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අළෙවි කළ නොහැකි නොදිරන කසළ බැහැර කිරීම සඳහා සභාවට විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණ බැවින් ඒවා කොම්පෝස්ට් භූමියෙහිම පස් දමා වසා දමා තිබුණු අතර එක් රැස්වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ද විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | 2023 | විධිමත් කසල කළමණාකරන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කරන අතර අනෙකුත් කසළ විකිණීම සිදු කරන බවත්, ඉතිරි වන කසල සඳහා ඉදිරියේදී විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | 2002 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ පියවර පෙර පාසල් ව්‍යාපෘතිය යටතේ වැලිගම නගර සභා බලප්‍රදේශයේ සුනාමියෙන් අවතැන්වූ දරුවන්ගේ උන්නතිය සඳහා රු. මිලියන 06 ක මුදලක් වැය කර පන්ති කාමර 05 කින් | 2023 | සභාව සතු දේපල ආරක්ෂා කරගත යුතුය. | අනවසර පදිංචි කරුවන්ට ඉවත් වන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බවත් ඉවත් නොවුනහොත් ඉදිරියේදී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හා වැසිකිලි 05 කින් සමන්විතව ළමුන් 100 දෙනෙකු සඳහා අධ්‍යාපනය ලබාදීමේ පහසුකම් සහිතව ජයවිකුම්ගම පෙර පාසල ආරම්භ කර තිබුණි. 2023 නොවැම්බර් 03 වන දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම ගොඩනැගිල්ලේ දොරවල් කැඩී ,වහළය අබලන් වී, ඇතුළත තෙමීමට ලක් වී බිත්තිවලට හානි සිදු වි තිබුණු අතර එහි කොටසක අනවසරයෙන් පිටස්තර පිරිසක් පදිංචි වී තිබුණි. මෙම පෙර පාසල් ගොඩනැගිල්ලේ අවශ්‍ය පිළිසකර කිරීම් සිදු කර එය ආරක්ෂා කර ගැනීමට අවධානය යොමු වී නොතිබුණ අතර දීර්ඝ කාලයක් තිස්සේ අත හැර දමා විනාශ වීමට ඉඩහැර තිබුණි. | | | | |
| (ඇ) | සභාවේ සේවයට වාර්තා නොකල කළමනාකරණ සේවා නිලධාරිනියක් වෙත මුදල් රෙගුලාසි 237 න් බැහැරව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසයන් වෙනුවෙන් රු.93,880 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එම නිලධාරිනිය | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අය විය යුතු වැටුප් හා ආපදා ණය ශේෂය අදාළ නිලධාරිනියගෙන් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව හා අදාල ගෙවීම් පැහැර හරින්නේ නම් නෛතික ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් සේවයට වාර්තා කර නොතිබුණු අතර රු.286,224 ක වැටුප් හා ආපදා ණය ශේෂයක් අය කර ගැනීමට ද තිබුණි.

## 3.48 තංගල්ල නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 217,607,507 | 25,716,002 | 191,891,505 | 10,012,929 | තත්ත්වාගණනය කළ |
| **2022** | 223,311,169 | 21,611,483 | 201,699,686 | 8,649,295 | තත්ත්වාගණනය කළ |
| **2023** | 287,866,251 | 13,206,169 | 274,660,082 | 27,082,495 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමකින් තොරව පුද්ගලයින් දෙදෙනෙකු විසින් වර්ග අඩි 750 ත් 2000 ත් අතර අනවසර ඉදිකිරීම් 02 ක් ඉදිකර තිබුණද ඒ සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 77 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021 | අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගැනීමට කටයුතු කළ යුතුය. | අනවසර ඉදිකිරීම් සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන මෙන් ඉදිකිරීම්කරුවන් දැනුවත් කළ බව. | එක් ඉදිකිරීමකට අදාලව ඉඩම් ඉදිරියේදී රජයේ තක්සේරුවක් ලබාගෙන නගර සභා ආඥා පනතේ 36 (ඉ) වගන්තිය අනුව කටයුතු කරන බව සහ අනෙක් ඉදිකිරීමට අදාලව මූලික විමර්ශනයක් සිදුකෙරෙමින් පවතින බව. |
| (ආ) | 2021 මැයි 13 දින අනුමැතියකින් තොරව ගමන් කරමින් සිටියදී අනතුරට පත් වී තිබු සභාපතිවරයා විසින් භාවිතා කළ කැබ් රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) අනුව සකස් කළ පූර්ණ වාර්තාව පරිදි අලුත්වැඩියා කිරීමේ | 2022 | සිදුව ඇති අලාභය සම්බන්ධයෙන් මු.රෙ 104 (4) නිර්දේශ අනුව කටයුතු කළයුතුය. | නඩු කටයුතු අවසන් වීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන අතර ලිපියේ විධිවිධාන වලින් බැහැරව සභාපතිවරයා විසින් රථය භාවිතා කර ඇති බව. | මේ සම්බන්ධව ඉහල කළමනාකාරීත්වයේ උපදෙස් හා නීතිමය තත්වය සලකා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත මුළු වියදම රු.6,154,088 ක් වුවද රක්ෂණ ආයතනයෙන් සම්පූර්ණ වන්දි මුදල ප්‍රතිපූර්ණය නොවීම මත නගර සභා අරමුදලට සිදුවූ පාඩුව රු.2,959,088 ක් විය. | | | | |
| (ඇ) | නගර සභා ආඥා පනතේ 74හා 77 වගන්තිය අනුව භූමියෙහි අයිතිය සභාව වෙත නීත්‍යානුකූලව ලබාදී තිබූ වෙළඳ පරිශ්‍රයන් තුළ අනවසරයෙන් ස්ථිර කඩ කාමර ඉදිකර කුලී මුදල්ද නොගෙවා වෙළඳාම් කටයුතු සිදු කරනු ලැබූ කඩ කාමර 13ක් සම්බන්ධයෙන් පනතේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම කඩ කාමර සම්බන්ධයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | ස්ථිරව ඉදිකර ඇති කඩ කාමර නගර සභාවට පවරා ගැනීමටත් තාවකාලිකව ඉදිකර ඇති කඩකාමර ඉවත් කර විධිමත් ආකාරයට තාවකාලික වෙළෙඳසැල් ආකාරයෙන් ස්ථාපිත කිරීමටත් වාර්ෂික බදු පදනම මත ලබා දීමටත් අදාළ ව්‍යාපෘති වාර්තා සකස්කර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරන බව. |
| (ඈ) | නගර සභාවේ සභිකයෙකු ලෙස 2008 වර්ෂයේ සිට 2023 වර්ෂයේ මාර්තු 18 දක්වා කටයුතු කළ පුද්ගලයෙකු විසින් සභාවට අයත් බස් නැවතුම්පොළ අංක S-01 දරණ කඩ කාමරයේ බදුකරු වශයෙන් පෙනීසිටීම නගර සභා ආඥා | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. | මෙම කඩ කාමරය සම්බන්ධයෙන් වාස බද්ද අවසන් කිරීම සඳහා 2023 ඔක්තෝබර් 10 දින දැන්වීම් පල කර ඇති බවත්, ඊට අදාල නඩු වාරය 2024 මැයි 10 දින නැවත කැඳවීමට නියමිත බැවින් ඒ අනුව කටයුතු කරන බව. | බදුකරු විසින් තංගල්ල නගර සභාවට එදිරිව තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පනතේ 227(1) වගන්තියට අනුකූල නොවන බවත්, එම කාල සීමාව වෙනුවෙන් ඔහුට ගෙවන ලද එකතුව රු.1,864,000 ක් වූ දීමනාවල වටිනාකම සහ එම කඩ කාමර වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් ලැබිය යුතු කඩකුලී රු.946,011 ක් හා රු.43,000 ක දඩ මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට සභාව සතු තානායම බදු දීමෙන් ලැබිය යුතු රු 4,349,253 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර හිඟ හිටි ශේෂය තුළ වර්ෂ 02ට වැඩි ශේෂය රු. 790,406ක් විය | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | 2021 පෙබරවාරි 08 දිනට පෙර හිඟයෙන් රු.471,250 ක මුදලක් 2024 ජුනි මස ගෙවා ඇත. ඉතිරි හිඟ මුදල් අය කිරීම සඳහා කටයුතු කරන බව. |
| (ඊ) | නගර සභාවේ දින මුද්‍රාව හා ලිපි ශීර්ෂ භාවිතා කර ගොඩනැගිලි සැලැස්මක් හා අනුකූලතා සහතිකයක් කූට ලෙස සකස් කර බාහිර පුද්ගලයෙකුට ලබාදී තිබූ අතර මෙම කූටලේඛන සභාවේ කාර්මික නිලධාරියෙකු සම්බන්ධ වී සකස් කර අදාළ පුද්ගලයාට ලබාදී තිබූ බවට | 2023 | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම සිදු වීමට අදාළ මූලික විමර්ශනය මේ වන විට සිදු කෙරෙමින් පවතින බව. | මෙම සිදු වීමට අදාළ මූලික විමර්ශනය මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර මූලික විමර්ශණ වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව එහි නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිරීක්ෂණය වූයෙන් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (උ) | අංක S- 24 දරණ කඩ කාමරය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2018වර්ෂයේ ඉදිරිපත් කර තිබූ තක්සේරු වාර්තාවෙහි සඳහන් රු..15,750ක තක්සේරු කුලිය අයකිරීම මාසික මහා සභාව විසින් පිළිනොගැනීම සහ 2022තක්සේරු වාර්තාවේ සඳහන් රු 16,500.ක මාසික තක්සේරු කුලිය අයකිරීම මාසික මහා සභාව පිළිගෙන තිබුණද, නව තක්සේරු මුදලට ගිවිසුම්ගත වීමට සභාව කටයුතු නොකිරීම මත සමාලෝචිත වර්ෂයේ අවසානයට සභා අරමුදලට සිදුවූ පාඩුව රු 1,115,000.ක් විය. | 2023 | තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන කොමාසරිස්ගේ උපදෙස් අනුව කටයුතු කරන බව. | පලාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර දෙනු ලබන උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරන බව. |
| (ඌ) | සභාව සතු අංක - 32 දරණ කඩ කාමරය 1994 මැයි මස 19 දින සිට බදුගත් බදුකරු විසින් බදුකුලී ගෙවීම පැහැර හරිමින් කඩ කාමරය පිහිටි ස්ථානයේ අනවසරයෙන් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ආපනශාලාවක් | 2023 | අනවසර කඩකාමරය සහා සන්තකයට පවරා ගැනීමට කටයුතු කල යුතුය. | කඩකාමරය පිහිටි භූමිය තංගල්ල ප්‍රාදේශීය ලේකම් සතු බවත්, ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව තීරණය කිරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත යොමු කළ බව. | මෙම ඉඩම් කොටස අප සභාවට පවරා නොදීම සම්බන්ධව කරුණු විමසා නැවත ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. |

පවත්වා ගෙන යනු ලැබුවද, ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

## 3.49 කුලියාපිටිය නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| 2021 | 308,806,086 | 429,703,762 | (120,897,676) | (229 ,176 ,464) | ව්‍යාවනය කළ |
| 2022 | 210,997,069 | 785,607,950 | (574,610,881) | (459,631,917) | ව්‍යාවනය කළ |
| 2023 | 219,884,381 | 1,435,519,468 | (1,215,635,087.) | (747,408,375) | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අළුත්වැඩියා කටයුතු සඳහා 2019 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබූ බොබ් කැට් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අළුත්වැඩියාව නිම කර නොතිබුණි. | 2022 | සභාව සතු වත්කම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | අලුත්වැඩියා කිරීම පහැර හැර ඇති බැවින් නීතිමය කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. | අලුත්වැඩියා කිරීම පැහැර හැර ඇති බැවින්, කොමසාරිස් තුමාගේ උපදෙස් මත අදාළ ආයතනයට විරුද්ධව නීතිමය කටයුතු සිදුකිරීම ආරම්භ කර ඇති බව දන්වා තිබුණි. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට 2020 ජනවාරි මාසයේ සිට අයවිය යුතුව පැවති හිඟ තානායම් කුලිය රු.2,062,413 ක් විය. | 2023 | හිඟ තානායම් කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා තිබුණි. | මේ පිළිබඳව ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනයේ ගණකාධිකාරීවෙත ලිඛිතව දක්වා ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය හා සභාපතිවරයකු නොමැති බැවින් තීරණ ගැනීම හා ගෙවීම් කටයුතු නතර වී ඇති බවත්, හැකි ඉක්මනින් අධ්‍යක්ෂ මණ්ඩලය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පත්වූ වහාම අදාල ගෙවීම් කිරීමට සැලසුම්කර ඇති බවත් දන්වා තිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ නමට ලියාපදිංචි නොකළ වාහන 06 ක් විය. | වාහන ලියාපදිංචි කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. |

## 3.50 හලාවත නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 501,796,941 | 86,193,278 | 415,603,663 | 9,727,794 | තත්ත්වාගණනය කළ |
| **2022** | 507,927,836 | 88,069,428 | 419,858,408 | 13,118,797 | තත්ත්වාගණනය කළ |
| **2023** | 549,376,081 | 60,951,538 | 488,424,543 | 43,446,057 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ පුස්තකාල ස්වයංක්‍රියකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොහා මෘදුකාංගය සමඟ උපකරණ 08ක් ලබා දී තිබූ අතර එය මේ වන විට අක්‍රීය වී වසර 6ක් ගතවී තිබූ අතර යථා තත්ත්වයට පත් කරගෙන නොතිබුණි. | 2023 | මෘදුකාංගය සක්‍රීය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් ලබාගෙන එය යථා තත්වයට පත් කර ගැනීමට හැකියාවක් ඇද්දැයි විමසා බැලීමට කටයුතු කළ බවත් ඒ සඳහා තාක්ෂණික වාර්ථාවක් ලබා ගැනීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට මේ වන විට ක්‍රියා කරමින් පවතින බවත් දන්වා ඇත. | යථා තත්වයට පත් කර ගැනීමට හැකියාවක් ඇද්දැයි විමසා බැලීමට කටයුතු කරමින් සිටින බව දන්වා ඇත. |
| (ආ) | 2017 වර්ෂයේදී ශර්ලි කොරයා ශාලාව හලාවත රෝහල වෙත ලබා දී තිබුණද ගිවිසුමකට එළඹ නොතිබූ අතර 2023 වර්ෂය වන විටත් එය සභාව වෙත ආපසු ලබාගෙන නොතිබුණි. | 2023 | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2024 අගෝස්තු 06 වන දින අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කළ බවත් නගර සභා අවශ්‍යතා සඳහා එම ගොඩනැගිලි නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමටත් කටයුතු | 2024 අගෝස්තු 06 වන දින අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කළ බවත්, නගර සභා අවශ්‍යතා සඳහා එම ගොඩනැගිලි නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2017 වර්ෂයේ සිට 2023 මැයි 31 දක්වා හිඟ කුලී මුදල රු.3,646,100ක් විය. | | | කළ බව දන්වා ඇත. | කර ඇත. |
| (ඇ) | 2018 වර්ෂයේ රු.2,842,210ක් වැයකර සවිකරන ලද වායු සමීකරණ යන්ත්‍ර 21න් 07ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් විදුලිබල ධාරිතාවක් නොමැති වීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | 2023 | සහා අරමුදල් වැය කර මිලදී ගන්නා ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය . | නගර සභා පරිශ්‍රයේ සවි කර ඇති ට්‍රාන්ස්ෆෝමරය මඟින් අවශ්‍ය කරන විදුලි ධාරිතාව ලබාගත හැකි ද යන්නත් ,එසේ ලබාගත නොහැකි නම් ඒ සඳහා කළ යුතු ක්‍රියාමාර්ග හා ඒ සඳහා වන වියදම් සඳහා ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙසත් දන්වා 2024.03.28 දින හලාවත ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලිපියක් යොමු කළ බවත්, ඒ සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බවත් දන්වා ඇත. | නගර සභා පරිශ්‍රයේ සවි කර ඇති ට්‍රාන්ස්ෆෝමරය මඟින් අවශ්‍ය කරන විදුලි ධාරිතාව ලබාගත හැකි ද යන්නත් ,එසේ ලබාගත නොහැකි නම් ඒ සඳහා කළ යුතු ක්‍රියාමාර්ග හා ඒ සඳහා වන වියදම් සඳහා ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙසත් දන්වා 2024.03.28දින හලාවත ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලිපියක් යොමු කළ බවත්, ඒ සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බවත් දන්වා ඇත. |

## 3.51 ඇඹිලිපිටිය නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 479,090,409 | 63,910,273 | 415,180,136 | 18,639,190 | තත්ත්වාගණනය කළ |
| **2022** | 490,061,770 | 40,603,340 | 449,458,430 | 15,720435 | තත්ත්වාගණනය කළ |
| **2023** | 453,724,899 | 26,493,612 | 427,231,287 | 19,682,953 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අනීතිකව ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට එරෙහිව ලබාදුන් අධිකරණ තීන්දුවක් මත වන්දි ගෙවීමට සිදුවීමෙන් සභාවට රු. 976,600 ක පාඩුවක් සිදු වී තිබුණි. | 2023 | සභාවට සිදු වූ අලාභය ඊට වගකිව යුතු අයගෙන් අය කළ යුතු වේ. | අධිකරණ නියෝගය අනුව කටයුතු කිරීමට සිදු වූ බව. | මු.රෙ. 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති අතර මු.රෙ. 104 (4) ප්‍රකාරව අවසන් පරීක්ෂණයක්ද සිදු කර දෙන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් කර ඇති ඉල්ලීමට ලැබෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. |
| (ආ) | තෙකලා විදුලිය නොමැතිවීමෙන් 2022 ජූලි මස ලද රු. 950,000 ක් වූ බෙලර් යන්ත්‍රය 2023 දෙසැම්බර් වන විටත් නිෂ්කාර්යයව | 2022<br>2023 | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. | විදුලි සැපයුම ලබා ගැනීමෙන් පසු කඩිනමින් මෙම යන්ත්‍රය ස්ථාපනය කිරීමට කටයුතු කරන බව . | තෙකලා විදුලි බලය ලබා ගැනීමට අවශ්‍ය තත් ඇදීම සිදු කර අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවත්, |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පැවැතිණි. | | | | තෙකලා විදුලි බලය ලබා ගත් වහාම බෙලර් යන්ත්‍රය ස්ථාපිත කර ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට නියමිත බව. |
| (ඇ) | නගර සභා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී රු . 755,ක් වැඩිපුර 770 .ගෙවා තිබුණි ඇස්තමේන්තු සකස් කිරීමේදී, සබරගමුව පළාත් ගොඩනැගිලි රේට වෙනුවට බස්නාහිර පළාත් ගොඩනැගිලි රේට භාවිතා කර තිබුණි. | 2023 | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු වේ. | වැඩිපුර ගෙවීම් රඳවුම් මුදලින් අඩු කර ගැනීමට කටයුතු කරන බව හා අනෙක් ගැටළුව සම්බන්ධයෙන් උපදේශක ආයතනයෙන් ලද පිළිතුරු සමඟ ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂිත බව. | විගණිත කරුණු සම්බන්ධයෙන් අදාළ එක්ව විධිමත් පරිදි කරනු ලබන ස්ථානීය පරීක්ෂණයෙන් හා සාකච්ඡාවෙන් අනතුරුව ගනු ලැබූ තීරණ මත කටයුතු කරන බව. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, 2017 වර්ෂයේදී ලබා දී තිබුණු රු. 150,000 ක අත්තිකාරමක් පියවා නොතිබුණි. | 2021<br>2022<br>2023 | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | මෙම අත්තිකාරම මේ දක්වා පියවා නොමැති බව. | මේ සම්බන්ධව අධිභාර පැනවීම සඳහා තොරතුරු ලබා ගෙන ඇති බවත් ඉදිරියේදී එම උපදෙස් මත ක්‍රියා කරන බව. |
| (ඉ) | වසර 05 ට වඩා පැරණි හිඟහිටි වරිපනම් රු. 43,391,747 ක් මේ දක්වාම අයකර නොතිබුණි. | 2021<br>2022<br>2023 | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අවසන් නිවේදන යවා දේපළ තහනම් කිරීමේ කටයුතු සිදුකර ඇති බව. | නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ අතර 2024 වර්ෂයේද තවදුරටත් එම කටයුතු සිදු කරමින් පවතින බව. |

## 3.52 බලංගොඩ නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 580,640,357 | 137,089,032 | 443,551,325 | 14,698,397 | තත්ත්වාගණනය කළ |
| **2022** | 586,974,736 | 130,515,149 | 456,459,587 | (10,612,433) | තත්ත්වාගණනය කළ |
| **2023** | 583,989,632 | 129,201,631 | 454,788,001 | (1,929,612) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාපතිවරයාගේ අභිමතය පරිදි අනවසර ගොඩනැගිලි 02 ක් සඳහා සැලසුම් අනුමත කර අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. එම අනුමැතිය ලබාදීමේ දී සභාවට අයකර ගත යුතු ආදායම් රු. 886,301 ක් ද අත්හැර දමා තිබුණි. | 2022 | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම ඊට අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව සිදුකළ යුතු වේ. | අයදුම්කරුගේ ඉල්ලීම සලකා, මහ සභාවේ අනුමැතිය මත පදනම්ව සද්භාවයෙන් යුතුව ගොඩනැගිලි සැලසුම් අනුමත කර අදාළ සහතික ලබා දීමට කටයුතු කරන ලද බව. | මෙම කරුණ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් සිදුකර ඇති අතර අදාළ නිර්දේශ ලැබුණු වහාම ක්‍රියාත්මක කිරීමට නියමිත බව. |
| (ආ) | ඉකුත් වර්ෂ හා 2023 වර්ෂයට අදාළ හිඟ වරිපනම් හා බදු රු. 6,119,240 ක් අයකර නොතිබුණු අතර, එහි කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. | 2022<br>2023 | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නව වරිපනම් මෘදුකාංගය සම්පූර්ණ වූ පසුව කාල විශ්ලේෂණ සිදු කරන බව. | හිඟ බදු අයකිරීමට පනත ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව හා නව වරිපනම් පරිගණක වැඩසටහනකට දත්ත මාරු කරමින් පවතින බැවින් එය සම්පූර්ණ වූ පසුව කාලවිශ්ලේෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ගාස්තු අයකරන පිළිවෙල ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කර තිබියදී, ඊට පටහැනිව, ඩිජිටල් දැන්වීම් පුවරුවක ගාස්තු තීරණය කිරීම නිසා 2021 ජූලි සිට වූ දෙවර්ෂයක් සඳහා රු. 510,720 ක ආදායමක් අහිමි වී තිබුණි. | 2023 | සිදු වී ඇති අලාභය වගකිවයුතු අයගෙන් අයකළ යුතු වේ. | සභාපතිවරයා විසින් වර්ග අඩියකට වාර්ෂික ගාස්තුව රු. 200 ක් ලෙස සලකා ගාස්තු අයකර ගැනීමට ලිඛිතව නියෝග කර ඇති බව. | මෙම කරුණ සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදුකර ඇති අතර අදාළ නිර්දේශ ලැබුණු වහාම ක්‍රියාත්මක කිරීමට නියමිත බව . |

## 3.53 කෑගල්ල නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 6,078,493,504 | 115,298,421 | 5,963,195,083 | 1,302,936 | තත්ත්වාගණනය කළ |
| **2022** | 6,115,931,557 | 116,377,791 | 5,999,553,766 | 31,251,351 | තත්ත්වාගණනය කළ |
| **2023** | - | - | - | - | ගිණුම් ලැබී නැත |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අනුමත කරන ලද සැලැසුම් 1100 කින් 996 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබීම නිසා ඒ මත ගාස්තු ලෙස අය කරන රු.3,984,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | 2022 | සැලසුම් අනුමත කළ පසු විපරම් ක්‍රියාවලිය සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ අනුකූලතා සහතික නිකුත් කර වරිපනම් සංශෝධන සිදු කළ යුතුය. | බොහෝ ඉදිකිරීම් අනුමත සැලසුමට අනුකූල නොවන ලෙස ඉදිකර තිබීම, ඉදිකිරීම් අතරමග නවතා තිබීම, නීති කටයුතු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම, අධීක්ෂණ නිළධාරීන් නොමැතිවීම ආදී කරුණු මීට හේතු වි ඇති බව. | අනුකූලතා සහතික ලබාගෙන නොමැති අයගේ ඉදිකිරීම් සම්බන්ධව සොයා බලා වාර්තා කරන ලෙස කාර්මික නිළධාරීන් හා ආදායම් පරීක්ෂක දැණුවත් කර ඇත. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගත් සභාව සතු තානායම 2009 වර්ෂයේ අංක 1589/20 දරන ගැසට් නිවේදනය පරිදි ආපසු භාර දිය යුතු වුවද, 2022 දෙසැම්බර් වන විටත් පවරා දී නොතිබුණි. එමෙන්ම, 2020 සැප්තැම්බර් සිට | 2022 | නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමේ කොන්දේසි අනුව හිඟ කුලී අය කර ගත යුතු අතර, ගැසට් නිවේදනය අනුව දේපළ ආපසු ලබා ගැනීමට කටයුතු කළ | ගෙවීමට ඇති රු.502026 ක මුදල මහ සභා තීරණය අනුව කපා හැරීම් නියෝග සඳහා ඉදිරිපත් කර ඇත. රු.1,506,700 ක මුදල අයකර ගැනීම සඳහා අදාළ පාර්ශව වෙත දැනුම් දී ඇත. දේපළ තහනම් කිරීමට හෝ නඩු | මේ සම්බන්ධව නැවත සිහිකැඳවීම් ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| 2022 මැයි දක්වා කාලයට අදාළව එම අධිකාරියෙන් රු.1,506,700 ක තානායම් කළමනාකරණ ගාස්තුවක් ද අයවිය යුතුව පැවතුණි.තව ද, 2009 වර්ෂයේ සිට 2015 ජුලි දක්වා බාහිර පාර්ශව විසින් එම තානායමෙන් ආදායම් උපදවා ගෙන තිබුණු බැවින්,එම කාලය තුළ හිඟහිටි රු.502,026 ක ගාස්තු කපා හැරීමට කරන ලද ඉල්ලීමක යෝග්‍යතාව ගැටළු සහගත විය. | යුතුය. | පැවරීමට නොහැකි වීමද, හිග අයකර ගැනීමට නොහැකිවීමට හේතු වී ඇති බව. |

## 3.54 හපුතලේ නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 161,750,410 | 15,909,471 | 145,840,939 | 2,082,604 | තත්ත්වාගණනය කළ |
| **2022** | 182,328,060 | 19,671,377 | 162,656,683 | 9,414,044 | තත්ත්වාගණනය කළ |
| **2023** | 232,754,268 | 15,453,666 | 217,300,602 | 21,641,230 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | හපුතලේ නගර සභාවට අයත් තානායම 2021 වර්ෂයේ ජනවාරි 15 සිට ජූලි 31 දක්වා බිල්කල ආදායමෙන් රු.1,132,500 ක මුදලක් කපා හැර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.951,300 ක හිඟ බදු කුලී අය කරගෙන නොතිබුණි. | 2021 | හිඟ තානායම් කුලී අයකරගත යුතුය. | හිඟ තානායම් කුලී අය කර ගැනීමට කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | 2007 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සභාවට අයත් තානායම පවරා දෙන අවස්ථාවේදී අධිකාරිය මඟින් නගර සභාවට ගෙවිය යුතුව තිබුණු රු.4,049,018 ක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් | 2022 | නගර සභාවට අයවිය යුතු මුදල් අය කර ගත යුතුය. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | විගණනය විසින් සඳහන් කර ඇති හිඟ මුදල සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය නිරන්තරයෙන් දැනුවත් කරනු ලබන අතර නාගරික සංවර්ධන අධිකාරිය හා ඒ වන විට සිටි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කටයුතු කර නොතිබුණි. | | | | ටෙන්ඩර්කරු අතර කොළඹ වාණිජ මහාධිකරණයේ අදාළ හිඟ මුදල සම්බන්ධයෙන් නඩුවක් මේ වන විටත් විභාග වෙමින් පැවතිණි. |
| (ඈ) | 2000 අංක 53 දරන පාරිසරික (සංශෝධන) පනතේ 23 (ආ) අනුව නිකුත් කරන ලද කසළ අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. තවද, කොම්පෝස්ට් නිෂ්පාදනය කළ නොහැකි නොදිරන ඝන අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැර කර තිබුණි. | 2023 | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතුය. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සමඟ එකඟ වන බව. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |

## 3.55 අම්පාර නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 278,012,929 | 20,470,906 | 257,542,023 | 7,876,642 | තත්ත්වාගණනය කළ |
| **2022** | 301,779,431 | 17,263,354 | 284,516,077 | 13,522,976 | තත්ත්වාගණනය කළ |
| **2023** | 313,556,951 | 20,036,755 | 293,520,196 | 10,008,803 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගත යුතු වරිපනම් බදු මුදල රු.37,875,918 ක් වූ අතර එය වාර්ෂිකව අයකළ යුතු තක්සේරු මුදල මෙන් හතර ගුණයකට වැඩි අගයක් විය. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ජංගම සේවාවන් හා කලාප මට්ටමින් නිවෙස් වලට ගොස් වරිපනම් මුදල් එකතු කිරීමේ කාර්යය මේ වන විටත් ආරම්භ කර ඇති බව. | ජංගම සේවා පවත්වා හිඟ වරිපනම් අය කරමින් පැවතියද සම්පූර්ණ හිඟ මුදල් අයකර අවසන් කර නොතිබුණි. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 21 දක්වා හිඟ කඩ කුලී ශේෂය අඛණ්ඩව වැඩිවෙමින් පැවති අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.13,218,503ක් විය. | 2023 | හිඟ ශේෂය නිරවුල් කර ගැනීමට හා හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟ කඩ කුලී ශේෂය ලෙස දක්වා ඇති මුදලේ නිරවද්‍යතාවය පිළිබඳව ගැටලුකාරී තත්වයක් මතුව ඇත. නිරවද්‍යතාවය සම්බන්ධයෙන් පසුවිපරමක් සිදු කරනු ලබන අතර යම් වෙනස්කමක් සිදු වුවහොත් එය 2024 අවසන් ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පැවතියද සම්පූර්ණ හිඟ මුදල් අයකර අවසන් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | අම්පාර මහජන උද්‍යානයේ පිහිටි පැරණි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව උත්සව, සම්මන්ත්‍රණ, රැස්වීම් පැවැත්වීම සඳහා කුලියට ලබාදීම මඟින් නගර සභාවේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් අම්පාර මහජන උද්‍යානය සඳහා රු.2,445,535ක වියදමක් දරා 2023 ජුනි මස තුළ අදාළ මිලදී ගැනීම් සිදුකර තිබුණ ද එම භාණ්ඩ 2024 ජනවාරි 04 විගණිත දින වන විටත් භාවිතයට නොගෙන ගබඩා කර පවතින බව නිරීක්ෂණය වූ අතර අම්පාර මහජන උද්‍යානයෙහි පිහිටි ගොඩනැගිල්ල නවීකරණය කිරීමට පෙර මෙම මිලදී ගැනීම හේතුවෙන් මෙම භාණ්ඩ භාවිතයට ගෙන නොතිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 07ක් මේ වන විටත් ඉක්මවා ගොස් තිබුණි. | 2023 | වගකීම් කාලය ඉක්මවා යන බැවින් භාණ්ඩ භාවිතයට ගත යුතුය. | 2023 වසරේදී ප්‍රතිපාදන වෙන් වී තිබූ බැවින් හා අදාල ව්‍යාපෘතිය සඳහා අක්මුදල් අප්‍රමාදව ලබා ගැනීමේ අරමුණ හේතුවෙන් උක්ත භාණ්ඩ කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කර ඇත. භාණ්ඩවල වගකීම් කාල සීමාවෙන් සැලකිය යුතු කාලයක් මේ වන විට ගෙවී ගොස් ඇති බව. | ගොඩනැගිල්ල නවීකරණය කරමින් පවතින අතර භාණ්ඩ භාවිතයට ගෙන නොතිබුණි. |
| (ඈ) | අම්පාර නගර සභාව විසින් බුද්ධංගල පාර, තිස්සපුර යන ස්ථානයේ පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, | 2023 | වලංගු පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රමාණවත් නොවන භෞතික හා මානව සම්පත් තුළින් මෙය නඩත්තු කිරීම හා විධිමත් ආකාරයට සිදු කිරීම මහත් අපහසු කාරණයක් විය. පරිසර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා සපුරාගත යුතු | පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| පරිසර බලපත්‍රය කල් ඉකුත් වී වසර 1½ කට අධික කාලයක් ඉක්මවා තිබියදීත් පරිසර බලපත්‍රය අලුත් කිරීම සඳහා කටයුතු නොකර වලංගු පරිසර බලපත්‍රයක් නොමැතිව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි. | ක්‍රියාවන් සම්පූර්ණ කර නොමැති වීම හේතුවෙන් මේ වන විට පරිසර බලපත්‍රයක් ලබාගත නොහැකි වී ඇති බව. |

## 3.56 චාවකච්චේරි නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 597,731,919 | 36,208,537 | 561,523,382 | 47,715,189 | තත්ත්වාගණනය කළ |
| **2022** | 661,735,739 | 52,127,370 | 609,608,369 | 67,424,605 | තත්ත්වාගණනය කළ |
| **2023** | 726,333,469 | 68,856,122 | 657,477,347 | 76,124,474 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දේපළ 7,136කින් අයකළ යුතුව තිබූ හිඟහිටි වරිපනම් බදු එකතුව රු. 11,363,597ක් වූ ශේෂය හා රු. 131,850 ක් වූ කඩකාමර 05කින් හිඟහිටි කුලී ශේෂය වසර 10කට වඩා පැරණි විය. එමෙන්ම, රු.2,678,345ක ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය වසර 13 කට වඩා පැරණි විය. | 2023 | හිඟහිටි ශේෂ නොපමාව අයකළ යුතුය. | අයකිරීමට සහ කපාහැරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| (ආ) | සභා ජංගම ගිණුමේ පවතින රු.59,339,581ක ශේෂය ආදායම් ඉපැයීමේ මූලාශ්‍රවල යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යෙදවීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. | අවධානය යොමු කරනු ලබන බව. | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යොදවා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | වර්ෂ 03කට වරක් අළුත් කළයුතු කඩකාමර 37ක දීර්ඝකාලීන කුලී ගිවිසුම් එලෙස අළුත් නොකර අඛණ්ඩව පසුගිය වර්ෂ 08 සිට 43ක් දක්වා කාලයක් පවත්වාගෙන ගොස් තිබුණි. | 2023 | කුලී ගිවිසුම් නියමිත කාලවකවානු තුළ අළුත්කිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ගිවිසුම් අළුත්කිරිමට කටයුතු කරමින් පවතින බව. | කුලී ගිවිසුම් අළුත් කර නොතිබුණි. |

## 3.57 පේදුරුතුඩුව නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 549,501,625 | 28,165,742 | 521,335,883 | 36,053,271 | තත්ත්වාගණනය කළ |
| **2022** | 611,196,029 | 19,613,872 | 591,582,157 | 41,822,978 | තත්ත්වාගණනය කළ |
| **2023** | 625,963,254 | 21,269,184 | 604,694,070 | 54,696,492 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වර්ෂ 03කට වරක් අළුත් කළයුතු කඩකාමර 09ක දීර්ඝකාලීන කුලී ගිවිසුම් අළුත් නොකර පසුගිය වර්ෂ 01ත් වර්ෂ 07ත් අතර කාලයක සිට පවත්වාගෙන යමින් පවතී. | 2021 | කුලී ගිවිසුම් නියමිත කාලපරාසය තුළ අළුත්කිරීමට පියවර ගත යුතු වේ. | කඩකාමරහිමියන් හේතු සඳහන් කරමින් කල් ඉල්ලා තිබුණි. ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | කුලී ගිවිසුම් අළුත් කර නොතිබුණි. |
| (ආ) | දීර්ඝකාලීනව බදුදීමේ අරමුණින් පේදුරුතුඩුව නවීන වෙළෙඳ සංකීර්ණයේ ඉහළ මාලයේ 2013 වර්ෂයේ ඉදිකළ කඩකාමර 03ක් සහ හිස් ඉඩම් 02ක් මේ දක්වා අභාවිතව පවතී. | 2021 | සභාවේ ආදායම් මූලාශ්‍ර පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩකාමර කුලියට දීමට අවස්ථා කිහිපයකදීම ලංසු කැඳවා තිබූ නමුත් කිසිදු අයෙකු ඉදිරිපත් නොවුණි. එසේම, ඉඩම් හිමිකම් ඔප්පු ලබාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ආදායම් මූලාශ්‍රයන්හි යොදවා මුළුමනින් උපයෝජනය කර නොතිබුණි. |
| (ඇ) | එකතුව රු. 57,730,000ක ඉඩම් 03ක් මූලා ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස ඇතුළත් කර තිබූ නමුත් | 2022 | වත්කම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිමිකාරීත්වය මාරුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඒවා සභාව සතු නොවී පැවැතුණි. | | | | |
| (ඇ) | වරිපනම් ඒකක 4,691 කින් වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි හිඟ වරිපනම් රු. 14,154,102ක් අයකර නොතිබුණි. එමෙන්ම, වර්ෂ 01ත් වර්ෂ 10ත් අතර කාලයක් පැරණි හිඟ කුලී රු. 414,434ක් අය කර නොතිබුණි. එසේම, ලැබිය යුතු මුද්දර ගාස්තු රු.787,100ක් වර්ෂ 08කට අධික කාලයක සිට පැවැතුණි. | 2023 | හිඟමුදල් අයකර ගැනීමට ප්‍රශස්ත ක්‍රියාමාර්ග ගතයුතු වේ. | හිඟහිට අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |

## 3.58 වැලිවෙරිතුරෙයි නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 292,865,425 | 8,024,228 | 284,841,197 | 13,265,119 | තත්ත්වාගණනය කළ |
| **2022** | 409,490,699 | 7,967,737 | 401,522,962 | 12,829,657 | තත්ත්වාගණනය කළ |
| **2023** | 438,023,720 | 6,289,392 | 431,734,328 | 20,171,175 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ යේ හිඟහිටි වරිපනම් රු. 6,929,252ක් අයකර නොතිබුණි. එසේම, ලැබිය යුතු මුද්දර ගාස්තු රු.278,836ක් වර්ෂ 08කට වඩා පැරණි විය. | 2023 | හිඟ ආදායම් අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. | හිඟ වරිපනම් බදු රැස්කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් සහ ජංගම සේවා මගින් අයකර ගැනීමටත් මුද්දර ගාස්තු අත්හැර දැමීමටත් කටයුතු කර ඇති බව. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| (ආ) | වර්ෂ 05කට අධික කාලයක සිට සංවර්ධන සංචිතයේ නිෂ්කාර්යව පවතින රු.13,890,980ක් සංවර්ධන ව්‍යාපෘති 04ක් සඳහා උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2023 | අරමුදල් නියමිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | සුදුසු ඉඩම් ලැබීමෙන් පසුව අදාල අරමුදල් යොදවන බව. | අරමුදල් නියමිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | එකතුව රු.14,299,896ක් වූ මාළු වෙළෙඳ පොළ ඉඩම හා ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල | 2023 | වත්කම්වල අයිතිය නිරවුල් කරගත යුතු වේ. | සභාවට පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිමිකාරිත්වය මාරුකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඇතුළත් කර තිබූ නමුත් ඒවා සභාවට අයත් නොවී පැවැතුණි. | | | | |
| (ඇ) | පිහිනුම් තටාකය පිහිටි ඉඩම පවරා ගැනීමට ඉඩ මේ හිමිකරුට රු.2,090,000ක් ගෙවා තිබූ නමුත් එය සභාවට පවරා ගැනීමට වර්ෂ 05ක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | වත්කම්වල අයිතිය නිරවුල් කරගත යුතු වේ. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව ස්ථාවර වත්කම්වල ඇතුළත් කරන බව. | හිමිකාරිත්වය මාරුකර නොතිබුණි. |

## 3.59 ත්‍රිකුණාමලය නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 364,286,618 | 147,332,991 | 216,953,627 | 2,374,394 | තත්ත්වාගණනය කළ |
| **2022** | 408,628,626 | 112,210,896 | 296,417,730 | 96,899,734 | තත්ත්වාගණනය කළ |
| **2023** | 514,877,612 | 127,757,219 | 387,120,393 | 59,152,235 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | කඩකාමර 167 ක් කුලියට ලබාදී තිබුණත් ඉන් කඩකාමර 21 ක් සඳහා ගිවිසුම් අත්සන් කර බදු කාලය සඳහන් නොකර දීර්ඝකාලීන බදු දී තිබුණි. | 2021 | බදු ගිවිසුම් අත්සන් කිරීමේදී කොන්දේසි පැහැදිලිව අතුළත් කළ යුතුය. | 2020 සහ 2021 වර්ෂයන්හි කිසිවෙකුත් බදු ලබානොගත් හේතුවෙන් ආදායම් අහිමිවීම වලක්වා ගැනීමට පෙර වර්ෂයේ බද්දට ලබාගත් බදුකරුවන් 21 ටම නැවතත් එය ලබාදීමට පියවර ගෙන තිබුණි. | සියළුම කඩකාමර සඳහා ගිවිසුම් අත්සන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | මධ්‍යම වෙළඳපොළ සංකීර්ණයේ පිහිටි කඩකාමර 176 කින් 2009 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් හිඟකුලී රු.17,480,539 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2021 | හිඟහිටි අයකර ගැනීමට පියවර ගත යුතුය. | 2022 වර්ෂ කාලපරිච්ඡේදයේ හිඟහිටි රු.254,130 ක් අයකර ගෙන ඇත. | අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයට අදාළ රු.16,303,605 ක් සහ ඉකුත් වර්ෂවලට අදාළ වරිපනම් බදු රු.101,596,687 ක් අයවිය යුතුව තිබුණි. | 2022 | පනතේ විධිවිධාන අනුව හිඟ වරිපනම් බදු අය කළ යුතුය. | හිඟ බදු මුදල් අයකරමින් පවතින බව. | සම්පූර්ණ හිඟ මුදලෙන් 2023 වර්ෂයේදී රු.14,277,272 අයකර ගෙන ඇති අතර ලක්ෂ 2 කට වැඩි හිඟ වරිපනම් නොගෙවන පුද්ලගයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරන බව දන්වා තිබුණි. |
| (ඈ) | වර්ග කිලෝමීටර් 7.5ක් යුත් ත්‍රිකුණාමලය නගර සහා බලප්‍රදේශයේ රැස්කරන සියළුම කසල වෙන් නොකර කන්නියාහි පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියේ බැහැර කෙරෙමින් පැවතුණි. කසළ කළමනාකරණය සම්බන්ධයෙන් CGL ආයතනය සමග 2017 වර්ෂයේ අත්සන් කළ ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබුණි. | 2022 | ගිවිසුම් ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරියේදී ගිවිසුම් ප්‍රකාරව නගර සභාව විසින් රැස්කරන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමට ලක්නොකර එලෙසම CGL International පුද්ගලික සමාගමට භාරදීමට හැකි වන බව. | CGL ආයතනය සමග 2017 වර්ෂයේ අත්සන් කළ ගිවිසුම ක්‍රියාත්මක නොවීය. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නව ඉඩමක් ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර අතර මේ වන විටත් එම ඉඩම ලැබී නොමැති අතර ඒ සඳහා ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. |
| (ඉ) | රෝහල් අපද්‍රව්‍ය පිළිස්සීමට සවිකළ රු.5,695,830ක් වටිනා යන්ත්‍රය 2018 වර්ෂයේ සිට මේ දක්වා භාවිතා නොකර නිෂ්කාර්යව පවතින අතර යන්ත්‍රය මුළුමනින්ම මලකඩ බැඳී තිබුණි. | 2022 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ත්‍රිකුණාමලය ප්රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයට එය භාරදීමට උත්සාහ දැරුවද වෙළඳපොලේ ඒ සඳහා අමතර කොටස් නොමැති බව පවසා එය | නැවත එම යන්ත්‍රය භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ පවතින අතර එය ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | භාරගෙන නොතිබුණු බව. | |
| (ඊ) | නගර සභාවට අයත් වාහන 43ක් වර්ෂ 12කට අධික කාලයක් පරිහරණය කළ නොහැකි තත්ත්වයේ පැවැති අතර එම වාහන ඉවත් කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 | එම වාහන ඉවත් කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. | එම වාහන වෙන්දේසියේ විකිණීමට අදාල ලියාපදිංචි පොත් නොමැතිවීම හේතුවෙන් ඒවා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | වාහන 25 අළුත්වැඩියා කර නොහැකි බව වාහන අපහරණ කමිටුව මඟින් තීරණය කර ඇත. නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ පැවති එකතුව රු. 88,514,106 ක දේපළ බදු හිඟය අයකිරීමට සභාව විසින් නිසි කටයුතු කර නොතිබුණි. | 2023 | දේපළ බදු හිඟය අයකිරීමට කටයුතු කළ යුතුය. | හිඟය අයකිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණ හිඟ මුදලෙන් 2023 වර්ෂයේදී රු.14,277,272 අයකර ගෙන ඇති අතර ලක්ෂ 2 කට වැඩි හිඟ වරිපනම් නොගෙවන පුද්ලගයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරන බව දන්වා ඇත. |
| (ඌ) | කඩ 390 ක් සඳහා වන කුලී හිග එකතුව රු. 49,138,586 ක මුදල වසර 13 ක කාලයක සිට අයකිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ අයකරීමට නිසි පියවර ගත යුතුය. | දිගු කාලීන හිඟ ඇති බදු කරුවන්ගෙන් හිඟ අයකරීමට විශේෂ අවධානය යොමු කරණු ලැබේ. | සම්පූර්ණ හිඟ මුදලෙන් 2023 වර්ෂයේදී රු.366,400 ක් අයකරගෙන තිබුණු අතර 2024 වර්ෂයේදී රු.532,743 ක් අයකර ගෙන තිබුණි. |
| (එ) | නගර සභා සතු රක්ෂණය නොකරන ලද වාහනයක් 2023 වර්ෂයේ අනතුරට ලක් | 2023 | අදාළ කටයුතු සිදු කල යුතුය. | වාහන අළුත්වැඩියා සම්බන්ධ අනිකුත් කටයුතු සිදුවෙමින් පවතී. | ප්‍රාථමික විමර්ශන වාර්තා නිකුත් කර ඇති අතර එම වාර්තාව ප්‍රධාන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වී ඇති නමුත් අදාළ අනතුර සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සහ අවසන් වාර්තා සකස් කර නොතිබුණු අතර විගණකාධිපති වෙතද දන්වා නොතිබුණි. | | | | අමාත්‍යාංශය වෙත ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇත. |
| (ඒ) | නගර සභාව සතු කඩ කාමර 126 ක් 2019 වසරේ සිට කුලියට ලබාදී නොතිබුණි. මේ නිසා සභාවට එකතුව රු.22,793,053 ක ආදායමක් අහිමි වී තිබුණි. | 2023 | කඩවල් බදු දීමට කටයුතු කළ යුතුයි. | එම කඩවල් වෙනස් කරීම සඳහා කටයුතු ඉදිරි කාලයේ දී ගෙන කුලියට ලබා දෙනු ලැබේ. | ටෙන්ඩර් කැඳවීම් සිදු කළද එම කඩ ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවූ බවත් එම කඩකාමර නැවත අළුත්වැඩියා කර ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.60 කාත්තණ්කුඩි නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 247,763,000 | 32,657,000 | 215,106,000 | 9,523,357 | තත්ත්වාගණනය කළ |
| **2022** | 321,865,300 | 35,563,723 | 286,301,577 | 9,567,389 | තත්ත්වාගණනය කළ |
| **2023** | 364,357,835 | 42,883,165 | 321,474,670 | 13,148,387 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිවත් බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිවත් පවරා තිබූ නඩු 04ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 | නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සටහන් මගින් හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය. | නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට පියවර ගනු ලබන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2)2 සභාවේ සේවකයින්, කොන්ත්‍රාත්කරුවන් සහ රාජ්‍ය ආයතනවලට ලබාදුන් අත්තිකාරම් රු.10,106,886ක් හඳුනාගෙන නිරවුල් කරගැනීමට මාස 02ක සිට වර්ෂ 16ක් දක්වා කාලයක් පියවර ගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දීර්ඝ කාලයක සිට නිරවුල් නොකළ අත්තිකාරම් විස්තර කමිටුවක් ස්ථාපිත කර විමර්ශනය කිරීමෙන් නිරවුල් කිරීමට පියවර ගෙන ඇති බව. | අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන සහ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ 2020 ජූලි 10 දිනැති අංක EP/01/CMA/Cabinet. Memo/007 දරන ලිපිය අනුව වරිපනම් හා බදු අයකිරීම සඳහා නාගරික සීමාව තුළ පවතින නිශ්චල දේපළ වර්ෂ 05කට වරක් තක්සේරු කළයුතු වුවත්, 2014 වර්ෂයේ තක්සේරු කළ සම්පූර්ණ ඒකක ප්‍රමාණය වන 25,484ක් පදනම් කරමින් වරිපනම් බදු අයකර තිබුණි. | 2023 | නිශ්චල දේපළ වර්ෂ 05කට වරක් තක්සේරු කිරිමට කටයුතු කළ යුතුය. | මෙම කරුණ පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධවී කටයුතු කරන බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ (පරිච්ඡේදය 623) 3(1) වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදලේ II කොටස, 16(1) වගන්තිය ප්‍රකාරව, නියමිත මාසයට අදාල දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට ප්‍රථම එම අරමුදල්වලට ගෙවිය යුතු අතර අපොහොසත් වුවහොත් දඩගාස්තු සමග දායක මුදල් ගෙවිය යුතු බව සඳහන් වේ. එසේ | 2023 | සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් නියමිත කාල වකවානු තුළ ගෙවීමට පියවර ගත යුතුය. | සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් එම අරමුදලට ගෙවීමට වර්තමානයේ පියවර ගෙන ඇති බව. | පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වුවත්, සභාව විසින් 2021 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් එකතුව රු.9,388,517ක් නියමිත දිනයට ගෙවීම් කර නොතිබුණි. | | | | |
| (ඉ) | සභාවේ අළුත්වැඩියා තත්ත්වයේ පවතින වාහන 11ක් සහ ට්‍රේලර් 06ක් අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි වෙන්දේසි කිරීමට පසුගිය වර්ෂ 05ක කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | 2023 | වාහන අළුත්වැඩියා කිරිමට හෝ අපහරණය කිරීමට සුදුසු පියවර ගත යුතුය. | ඉදිරි කාලයේ පියවර ගනු ලබන බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඊ) | සභාව විසින් පරිහරණය කරන වාහන 05ක අයිතිය පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | 2023 | සභාව සතු වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. | වාහනවල හිමිකාරිත්වය ලබාගැනීමට, වාහනවල විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | අයිතිය පවරාගෙන නොතිබුණි. |
| (උ) | කවෂිමා යන්ත්‍රය සවි කිරීම සඳහා රු 67,907,157.ක් වියදමින් ඉදි කරන ලද ගොඩනැගිල්ලේ සහ රු 22,858,774.ක් වැය කර ඉදිකරන ලද පරිපාලන ගොඩනැගිල්ලේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 | වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | ප්‍රවර්තන වර්ෂයේ ඔබගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කරන බව. | 2023 වර්ෂයේද නිවැරදි කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඖ) | මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් වශයෙන් වර්ෂ 05කට වඩා වැඩි කාලයක් දක්වා තිබූ ජල සැපැයුම් ණය හිමි රු 6,643,239.ක මුදල ගෙවා නිම කිරීමට හෝ කපා හැරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2022 | ජල සැපයුම් ණය මුදල ගෙවීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතුය. | දීර්ඝ කාලයක සිට පවතින මෙම මුදල අයකිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් අවශ්‍ය උපදෙස් විමසා ඇති බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ක) | සභාව සතු අළුත්වැඩියා කළ හැකි වාහන 05ක් අළුත්වැඩියා කිරීමට සහ ධාවන තත්ත්වයේ නොපවතින වාහන 06 ක් සුදුසු පරිදි අපහරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2022 | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදි කටයුතු කරන බව. | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (ඛ) | ට්‍රැක්ටර් ට්‍රේලර් යන්ත්‍ර ඇතුළු වාහන 09ක් සඳහා ලියාපදිංචි සහතික සභාව සතුව නොතිබුණි. | 2022 | වාහන ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහනවල ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කරන බව. | සහතික ලබාගෙන නොතිබුණි. |

## 3.61 එරාවූර් නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 247,563,000 | 14,301,000 | 233,262,000 | 12,946,800 | තත්ත්වාගණනය කළ |
| 2022 | 281,432,310 | 21,118,680 | 260,313,630 | 8,726,921 | තත්ත්වාගණනය කළ |
| 2023 | 314,484,652 | 11,843,395 | 302,641,257 | 6,849,118 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 44, 46 හා 49 වගන්ති සභාව විසින් නඩත්තු කරනු ලබන මාර්ග 628ක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. | 2023 | සියලුම මාර්ග ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට පියවර ගත යුතුය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 170(1) හා (2) වගන්ති සමාලෝචිත වර්ෂ අවසානය දක්වා තක්සේරු කළ නිශ්චල දේපළ 10,807කින් රු.10,000ට අධික හිඟ ශේෂ පවතින දේපළ හිමිකරුවන් 304ක ගෙන් රු.6,063,395ක් හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. | වරිපනම් බදු නොගෙවූ දේපළ හිමිකරුවන්ගේ කසල ඉවත් කිරිම නවතා දැමීමට තීරණය කර ඇති බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | 2023 | අත්තිකාරම් ගෙවීම් හඳුනාගෙන | අත්තිකාරම් නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි 371(2)1 සභාවේ 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලබාදී තිබුණු අත්තිකාරම් එකතුව රු.399,386ක් නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | | පියවා ගැනීමට කටයුතු කළ යුතුය. | සිදුකරමින් පවතින බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලංසු මත පොදු වෙළෙඳ පොල සහ කාන්තා පොල බදු දීමෙන් ලැබිය යුතු රු.5,067,459ක් පසුගිය වර්ෂ 02කට අධික කාලයක සිට අයකර නොතිබුණි. | 2023 | හිඟහිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. | පුද්ගලයින් හඳුනා ගැනීමේ ගැටළු හේතුවෙන් මෙම හිඟමුදල් අයකර ගැනීම දුෂ්කර වී ඇති බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඉ) | 1952 ඔක්තෝබර් 03 දිනැති අංක 10459 දරන ගැසට් පත්‍රයෙන් අංක A 1695 දරන සැලැස්ම මගින් ඒරාවූර් නගර සභාව විසින් පවරාගෙන තිබූ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත්ව එම ආයතනයට බදුදීමට හෝ මෙම ඉඩම් නීතිමය ක්‍රියාමාර්ග මගින් ආපසු ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2023 | ඉඩම බදුදීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය. | මඩකලපුව දිස්ත්‍රික් ලේකම්වරයාගේ පිළිතුරු ලැබූ පසුව අදාල ආයතනය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2017 වර්ෂයේ පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව **(COPA)** විසින් අනාවරණය කර තිබූ කාරණා වන අනුමත නොවූ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සහ සංස්කෘතික ශාලාව කුලියට දීම සම්බන්ධ නිර්දේශ පසුගිය වර්ෂ 06ක සිට ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2023 | පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව **(COPA)** විසින් අනාරවණය කළ කරුණු සම්බන්ධයෙන් පියවර පියවර ගත යුතුය. | -එම- | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (උ) | 1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින්, 2008 අංක 01 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන විශේෂ ගැසට් පත්‍රයේ "ආ" වගන්තිය ප්‍රකාරව ඝාතකාගාර, ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන සහ බේකරි 27ක් සඳහා පරිසර බලපත්‍ර සභාව විසින් ලබාගෙන නොතිබුණි. | 2023 | පනතේ ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතුය. | ඝාතකාගාර, ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන සහ බේකරි සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. | බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ඌ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 44, 46 හා 49 වගන්ති සහ මඩකලපුව දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2013 ජූලි 10 දිනැති | 2022 | සියලුම මාර්ග ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට පියවර ගත යුතුය. | සියලුම මාර්ග ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සභාව විසින් වර්තමානයේ කටයුතු කරමින් පවතින බව. | පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අංක BT/ACLG/PL/Road/ 2013දරන ලිපිය සභාව සතු මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. | | | | |
| (එ) | 2013 වර්ෂයේ සිට පවතින කුකුළු මස්කඩ 15ක කසල ඉවත් කිරීමේ හිඟහිටි බදු රු.322,500 ක්, වසර 05 ක සිට පවතින විනෝද බදු රු.177,856 ක් සහ 2012 වර්ෂයෙහි හිඟ මස්කඩ කුලී රු.483,979 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ලිපිලේඛන නොමැති වීම, ගෙවිය යුතු අය විදේශගත වීම සහ මිය යාම හේතුවෙන් අය කර ගැනීමට ගැටලු පැන නැගී ඇති බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ඒ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.7,993,590 ක් සහ මුද්දර ගාස්තු රු.6,036,000 ක් විය. | 2022 | මුද්දර ගාස්තු සහ උසාවි දඩ ගාස්තු ආදායම් ගෙන්වා ගැනිමට පියවර ගත යුතුය. | පිළිතුරු ලැබී නොතිබුණි. | පියවර ගෙන නොතිබුණි. |
| (ඔ) | උපලේඛන නොගැළපීම සහ බැංකුවේ තැන්පත් කළ බවට ලියකියවිලි නොමැතිවීම වැනි හේතු නිසා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලැබිය යුතු පසුගිය වර්ෂ 05ට | 2022 | මුද්දර ගාස්තු ආදායම් නියමිත කාලයේ ගෙන්වා ගත යුතුය. | පිළිතුරු ලැබී නොතිබුණි. | පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අදාල මුද්දර ගාස්තු රු.3,201,500ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | | |
| (ඕ) | 2001 වර්ෂයේ රු. මිලියන 10ක් පමණ වියදමින් ඉදිකර අවසන් වූ ප්‍රධාන මාර්ගයේ පිහිටි කඩකාමර 64කින් යුත් වෙළෙඳපොල ගොඩනැගිලි සංකීර්ණය මේ දක්වා මහජන භාවිතය සඳහා විවෘත නොකර හා කිසිදු කුලී ආදායමක් ඉපැයීමකින් තොරව වසා දමා තිබුණි. | 2022 | වත්කම් භාවිතා කර ආදායම් ඉපැයීමට පියවර ගත යුතුය. | වර්තමානයේ LDSP ව්‍යාපෘතිය යටතේ අදාල වෙළෙඳපොල සංකීර්ණයේ සිදුකරන මාළු වෙළෙඳ සැල් ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු මහජන භාවිතය සඳහා භාරදී සභාව විසින් ආදායම් ඉපැයීමට කටයුතු කරන බව. | පියවර ගෙන නොතිබුණි. |
| (ක) | පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියමය අනුව කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් විස්තීර්ණ වර්තාව (Comprehensive Report) වර්ෂ 05 ක් ගතවී ඇතත්, සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. | 2021 | පාර්ලිමේන්තු නිර්දේශය අනුව සභාව කටයුතු කළ යුතුය. | අදාල වාර්තාව ලබා ගැනීම සඳහා මඩකලපුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාට ලිපි යවා ඇත. | පාර්ලිමේන්තු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ග) | පුන්නයිකුඩා මාර්ගයේ තිබෙන ආගමික ස්ථාන දෙකකට අයත් ඉඩම් අවුරුදු 33 ක දිර්ඝ කාලීන බදු වශයෙන් රු. මිලියන 22.28 කට ලබා ගෙන රු. මිලියන 193 ක ඇස්තමේන්තු මුදලකට වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා 2016 | 2021 | ව්‍යාපෘති අදාල කාල පරිච්ඡේදය තුල නිමකර අදාල අරමුණ සඳහා යොදවාගත යුතුය. | LDSP වැඩ සටහන් යටතේ මාළු වෙළඳ සැල ඉදිකිරීමේ කාර්යයන් නිමවීමෙන් පසු මහජන ප්‍රයෝජනය සඳහා ලබාදී සභාව විසින් බදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අරමුණු ඉටුකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඔක්තෝබර් මාසය ගිවිසුම් අත්සන් කර තිබුණද, එම කොන්ත්‍රාත් නිම කර නොතිබීමෙන් 2016 ඔක්තෝබර් මාසයේ සිට ආදායම් කිසිවක් උපයා නොගෙන මාසිකව රු. 56,000 ක මුදලක් බිම්බදු වශයෙන් සභාව විසින් ආගමික ස්ථානවලට ගෙවමින් පවතී. | | | | |
| (ජ) | 2017 අංක 19 දරණ තිරසාර සංර්වධන පනත අනුව තිරසාර සංර්වධන අරමුණු සහ ඉලක්ක ලබා කර ගැනීමට කටයුතු කර නොතිබිණු. | 2021 | තිරසාර සංවර්ධන දර්ශක ගෙන හඳුනා ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | සංර්වධන ඉලක්ක 17 ක් ඇතුලත් අප සභාවට අයත් ර්දශක 2022 අයවැයට ඇතුලත් කර සකස්කර ඇත. තවද, තිරසාර ඉලක්ක ලහාකර ගැනීම සඳහා සභාව විසින් වැය විස්තර 2021 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇත. | අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

## 3.62 කින්නියා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 233,682,482 | 28,173,980 | 205,508,502 | 5,021,054 | තත්ත්වාගණනය කළ |
| **2022** | 281,318,828 | 31,473,349 | 249,845,479 | (11,674,683) | තත්ත්වාගණනය කළ |
| **2023** | 332,405,933 | 31,914,484 | 300,491,449 | (6,620,365) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු බදු කුලී එකතුව රු. 27,267,000 ක් අයකිරිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟ මුදල් අයකිරීමට පියවර ගත යුතුයි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සභාවේ නීතිඥවරයාට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනුම් දී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බදු වටිනාකමින් සියයට 40 වූ අඩුකිරීම් රු. 244,400ක්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිර්දේශ සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව සභාව විසින් අඩු කිරීම් කර තිබුණි. | 2023 | අදාළ චක්‍රලේඛනට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවි වලක්වනු ලැබේ. | සියයට 40 ක් කපා හැරීමට සභාවට බලය නොමැති අතර පලාත් පාලන කොමසාරිස්වරයා විසින් එම ණය වාරික කපා හැරීම සඳහා ආණ්ඩුකාරයවයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.63 මන්නාරම නගර සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,238,643,883 | 57,367,870 | 1,181,276,013 | 59,992,135 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,493,031,222 | 66,991,028 | 1,426,040,194 | 75,044,641 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,516,813,161 | 50,685,910 | 1,466,127,251 | 99,598,413 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු. 12,000,000ක් පිරිවැය වූ ලොන්ඩරි මධ්‍යස්ථානය විගණන භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය නොවුණි. | 2022 | භෞතිකව නොමැතිවීමට හේතු විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපදෙස් ලබාගෙන තීරණයන් ගනු ලැබේ. | අදාල ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | වර්ෂ 01ත් වර්ෂ 06ත් අතර කාලයක් පැරණි හිඟහිටි රු. 33,328,643ක වටිපනම් බදු ආදායමක් අයකර නොතිබුණි. | 2023 | ආදායම් නොපමාව රැස්කරගත යුතු වේ. | ජංගම ආදායම් රැස්කිරීමේ වැඩසටහන් මගින් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| (ඇ) | කඩකාමර 16කට අදාළ බදුකුලී රු. 1,379,553ක ශේෂය සහ පුද්ගලික සංනිවේදන කුළුණු 03ක් සඳහා බලපත්‍ර ගාස්තු රු.350,000ක ශේෂය වර්ෂ 02ත් වර්ෂ 16ත් අතර කාලයක් පැරණි වුවද, මේ දක්වා | 2023 | හිඟහිටි ආදායම් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | හිඟහිටි අයකර ගැනීමට සහ කපා හැරීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |

අයකර නොතිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පාර්ශව දෙකකින් 2023 ලැබිය යුතු අත්තිකාරම් ගිණුම් ශේෂ රු.650,000ක් වර්ෂ 11කට අධික කාලයකි අයනොවී පැවැති නමුත් ඒවා අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට පියවර ගතයුතු වේ. | අත්තිකාරම් නිරවුල් කිරිම සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇත. | අතිතිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |

## 3.64 වවුනියා නගර සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,538,764,671 | 63,168,311 | 1,475,596,360 | 60,260,795 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,553,764,799 | 49,192,006 | 1,504,572,793 | 54,883,911 | තත්ත්වාගණනය කළ |
| **2023** | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු හෙක්ටයාර් 26.93ක ඉඩම් වෙනුවෙන් වූ හිමිකම් ඔප්පු හා පත්ඉරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 | මූල්‍ය ප්‍රකාශනවල දක්වා නැති ඉඩම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. | වර්තමානයේදී හිමිකාරිත්වය නොමැති ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | අදාල තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | වර්ෂයට වඩා පැරණි වරිපනම් හා බදු කුලී හිඟහිට් ශේෂය රු. 30,137,756 ක් විය. | 2022 | හිඟහිටි ශේෂ අයකර ගැනීමට සුදුසු පියවර ගතයුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී බව. | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| (ඇ) | ගර්හිත තත්ත්වයේ තිබුණු වාහන 09 පසුගිය වර්ෂ 05ක කාලයක් වාහන අංගනයේ නවතා තිබුණි. | 2022 | වත්කම් අබාවිතව නොතැබිය යුතුය. | මෙම වාහනය නැවත අළුත්වැඩියා කර භාවිතා කිරීමට තීරණය කර ඇත. | අළුත්වැඩියා කර භාවිතා කර නොතිබුණි. |
| (ඈ) | සේවයෙන් ඉවත් කළ නිලධාරීන් 03 ක්, විශ්‍රාමික නිලධාරීන් 06 ක් සහ මියගිය නිලධාරියෙකුගෙනුත් | 2022 | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. | අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟමුදල් අයකර නොතිබුණි. |

අයකළ යුතු සේවක ණය හිඟශේෂය රු. 463,632 ක් අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 02ක කාලයක සිට කටයුතු කර නොතිබුණි.

## 3.65 සීතාවක ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| 2021 | 1,209,335,954 | 239,187,220 | 970,148,734 | 147,778,193 | තත්වාගණනය කළ |
| 2022 | 1,303,572,290 | 173,002,652 | 1,130,569,638 | 119,570,029 | තත්වාගණනය කළ |
| 2023 | 1,297,871,959 | 118,362,971 | 1,179,508,988 | 14,928,217 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව සතු කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා අවසන් බිල්පත අනුව රු.4,183,000 ක් ගරාජය වෙත ගෙවා තිබුණද ඒ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ආවරණය නොවූ රු.1,318,275 ක අලාභය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සභාව තීරණය කර නොතිබුණි. පරීක්ෂණ මණ්ඩලය මු.රෙ 104(4) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් නොකර අලාභය සම්බන්ධව වගකිව යුතු පාර්ශවය තීරණය කිරීම මහා සභාවට බලය පවරා තිබීම හේතුවෙන් ඉහත අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2023 | මු.රෙ.104 හි උපදෙස් ප්‍රකාරව කටයුතු කර එම අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | WP PE - 6879 කැබ් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපූර්ණය නොවූ හිඟ මුදල පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට 2024 මාර්තු 26 දිනැතිව ලිපියක් යොමු කර ඇති බවද එමඟින් අදාල හිඟ මුදල පියවා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා ගේ උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. |

## 3.66 කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| 2021 | 7,798,309,689 | 231,961,230 | 7,566,348,459 | 75,111,697 | තත්වාගණනය කළ |
| 2022 | 7,513,903,769 | 174,691,588 | 7,339,212,181 | 67,206,396 | තත්වාගණනය කළ |
| 2023 | 7,609,839,313 | 101,750,058 | 7,508,089,255 | 73,425,256 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| කොටිකාවත්ත කසළ අංගනයේ එක්රැස්වෙන කසළ තුනී කිරීම හා එම කසළ වැසීම සඳහා D6H වර්ගයේ චේන් ඩෝසර් යන්ත්‍රයක සේවය කුලී පදනම මත පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2018 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් මාසය දක්වා කුලී වශයෙන් රු.30,676,250 ක් ගෙවා තිබුණි. දෛනිකව එකතු කරනු ලබන දිරන කසළ ටොන් 30 - 35 ප්‍රමාණයෙන් ටොන් 05 ක් පමණක් කොම්පෝස්ට් නිපදවීම සඳහා යොදාගනු ලබන අතර ඉතිරි ප්‍රමාණය සහ නොදිරන කසළ ටොන් 20 - 25 අතර | 2021 | සභාවේ කසළ කළමනාකරණය නිසි අයුරින් සිදු කරමින් වියදම් අවම කරමින් සභාවට ආදායම් ඉපයීම හා ප්‍රදේශ වාසීන්ට පරිසර හිතකාමී වාතාවරණයක් නිර්මාණය කිරීමට සභාව කටයුතු කළ යුතුය. | මෙම කුණු තල්ලු කිරීමේ කාර්යය සඳහා චේන් ඩෝසරයක් අත්‍යවශ්‍ය වන අතර, එවැන්නක් සභාවට මිලදී ගැනීමට හැකියාවක් නොමැති හෙයින් කුලී පදනම මත මහා සභා අනුමැතිය යටතේ මෙම සේවාව ලබා ගන්නා බව දන්වා ඇත. | 2018 සිට 2021 දෙසැම්බර් දක්වා D6H චේන් ඩෝසරය හා ඊට ප්‍රථම D4 වර්ගයේ චේන් ඩෝසර් යන්ත්‍රයක සේවය කුලී පදනම මත මහා සභා අනුමැතිය යටතේ මෙම සේවාව පෞද්ගලික ආයතනයකින් ලබා ගෙන භාවිතා කර ඒ සඳහා ගෙවීම් සිදුකර ඇත. ජීව වායු නිපදවීම සඳහා වන ව්‍යාපෘතියකට විශාල මූල්‍ය පිරිවැයක් දැරීමට සිදු වීමත්, නිසි තාක්ෂණික සහය නොලැබීමත් මත එවැනි ව්‍යාපෘතියකට |

| | |
|---|---|
| ප්‍රමාණයක් සහ මිශ්‍ර කසළ ටොන් 10 ක් වශයෙන් දෛනිකව එකතුවන ටොන් 45 – 65 පමණ කසළ ප්‍රමාණයක් කොම්පෝස්ට්කරණය හෝ ජීව වායුව නිපදවීම සඳහා යොදා නොගැනීම හේතුවෙන් මෙලෙස කසළ තුනී කිරීම සහ එම කසළ වැසීම සඳහා අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. | යොමු වී නොමැත. |

## 3.67 හෝමාගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,411,164,011 | 596,149,721 | 1,815,014,290 | 215,580,460 | තත්වාගණනය කළ |
| **2022** | 2,651,101,033 | 754,096,096 | 1,897,004,937 | (37,738,951) | අහිතකර |
| **2023** | 7,053,988,059 | 267,026,569 | 6,786,961,490 | 373,112,282 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1996 ජනවාරි 23 දිනැති ඔප්පු අංක 497 මගින් ද ෆිනැන්ස් සමාගම විසින් සභාවට ලබා දී ඇති ලොට් අංක 106 යටතේ රූඩ් 1 පර්චස් 7.52 ක කිරිවත්තුඩුව කහටගහවත්තලන්ද, පුබුදු උයන ඉඩමෙන් පර්චස් 14.66 ක පමණ පොදු පහසුකම් බිම් ප්‍රමාණයක එම ඉඩම අවට පදිංචිකරුවකු විසින් කොන්ක්‍රීට් වහළ සහිත ගෙයක්ද, තාවකාලික ලෙස සකස්කළ කඩයක්ද තනා තිබූ බව අනාවරණය විය. තවද එම නිවස සඳහා ජලය, හා විදුලියද ලබා ගෙන තිබූ අතර, වරිපනම්ද ඉල්ලුම් කර ඇති බව | 2021 | ඉඩම් වල අයිතිය කඩිනමින් තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. | අනවසර ඉදිකිරීමක් පවතින බැවින් එහි සන්තකය පවරා ගැනීමට අදාළ කොමසාරිස් වෙත යොමු කිරීමෙන් පසු ඉදිරි කටයුතු සඳහා නීති නිලධාරී වෙත යොමු කර ඇත. නීති නිලධාරී විසින් මිනිනේදෝරු සැලැස්මේ පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට සභාවේ මිනින්දෝරු මහතාට යොමු කර ඇත. | මෙම ගැටළුව නිරාකරණය කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිරීක්ෂණය විය. නමුත් මෙම ඉඩම සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුද සභාව සතු කරගෙන නොතිබුණි. | | | | |
| (ආ) | ජල්තර රණාල ලක්සිරි උද්‍යානයේ පිහිටි අක්කර 1 පර්චස් 19.50 ක ක්‍රීඩා පිටියට යාබද පොදු පහසුකම් ඉඩම පෞද්ගලික පාර්ශවයක් විසින් අත්පත් කරගෙන වගා කටයුතු සිදුකර තිබුණද. මෙම ඉඩම් වෙන්කර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | 2021 | ඉඩම කඩිනමින් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මැනුම් කටයුතු සිදුකිරීමට මිනින්දෝරු වෙත දන්වා ඇත.එමෙන්ම සභාවේ පොදු ඉඩමක් බවට දැන්වීම් පුවරුවක් සවිකර ඇත.අනවසර වගාවන් ඉවත් කරගන්නා ලෙසට වගාකරුවන්ට උපදෙස් ලබාදී ඇත. | නිරාකරණය වී නොමැත. |
| (ඇ) | බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2016 අප්‍රේල් 28 දිනැති අංක LGD/04/2016 දරන චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාපටිපාටිවලින් බැහැරව රු.80,000,000 ක් වූ ස්ථාවර තැන්පතු මුදල් 2023 පෙබරවාරි සහ මාර්තු මාසයන්හිදි ආපසු ලබාගෙන තිබුණි. | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී චක්‍රලේඛයට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | ඉදිරියේදී ස්ථාවර තැන්පතු ආපසු ගැනීමේදී බස්නාහිර චක්‍රලේඛනයට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණි. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු වරිපනම් වටිනාකම රු. | 2021 2022 2023 | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා සියළු උත්සහයන් දරන බව දන්වා ඇත. | අය වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 122,835,410ක් වූ අතර මෙම වරිපනම් බදු මෙතෙක් අයකරගෙන නොතිබුණි. | | | | |
| (ඉ) | ඉඩම් නිරවුල්කර නොගැනීම සහ ගිවිසුමේ වැරදි සහගතභාවය නිසා සභාවට ලැබීම අවිනිශ්චිත වූ මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙන් 2023 වර්ෂය සඳහා ලැබිය යුතු කුලී ආදායම රු.900,000ක් හා හිඟ හිටි දඩය රු.27,450,000ක් වර්ෂයේ ආදායමට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.28,350,000ක් වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුදල රු.255,150,000 අයකර ගැනීම අවිනිශ්චිත විය. | 2021 2022 2023 | මෙම දේපලෙහි නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | බිම් සවිය සඳහා ඉඩම් මැනීමේදී මෙම ඉඩමේ අයිතිය රජය ලෙස සඳහන් කිරීම හේතුවෙන් මෙම දේපළ සභාව සතු දේපළක් නොවන බවට මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලයේ තර්කය මත කුලී මුදල් ගෙවීම නතර කර ඇති බව බව දන්වා ඇත. | තවදුරටත් දේපල අයිතිය පිළිබඳව ඇති ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුර මත කටයුතු සිදුකරමින් පවතී. |

## 3.68 ජා-ඇල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 8,601,925,080 | 559,516,447 | 8,042,408,633 | 40,748,205 | තත්වාගණනය කළ |
| **2022** | 8,511,261,290 | 533,774,991 | 7,977,486,299 | 22,041,963 | ව්‍යාවනය කළ |
| **2023** | 13,997,236,473 | 180,909,963 | 13,816,326,510 | 108,925,589 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2020 දෙසැම්බර් 22 දිනැති අංක LGD/GM/1/7/පොදු/ 2020 දරන ලිපිය ප්‍රකාර පරිගණක මෘදුකාංග මිලදීගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියක් අනුගමනය කළ යුතු බව අවධාරණය කර තිබුණද කාර්යාල කටයුතු පරිගණක ගත කිරීමේ අරමුණින් සුදුසු ලංසුකරුවෙකු තෝරාගැනීම සඳහා කිසිදු අධ්‍යයනයකින් හා සොයා බැලීමකින් තොරව මාර්ගෝපදේශවලට පටහැනි අවස්ථා දෙකකදී එකතුව | 2022 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූලව මිලදී ගැනීම් සිදුකළ යුතුය. | පද්ධතිය මගින් වර්තමානයේදී වරිපනම්, මිශ්‍ර ආදායම්,ගිණුම් ,තොග හා ගබඩා කලමනාකරණය යන විෂය ක්ෂේත්‍ර සාර්ථකව ක්‍රියාත්මකව පවතින බවද දන්වමි. | අපේක්ෂිත පරිදි වාර්තා ලබාගත නොහැකිය. |

රු.10,030,000 ක් වූ වරිපනම් කළමනාකරණය, මිශ්‍ර ආදායම් කළමනාකරණය,ගිණුම් කළමනාකරණය හා තොග හා ගබඩා කළමනාකරණය සම්බන්ධයෙන් පරිගණක මෘදුකාංග පද්ධති මිල දී ගෙන තිබුණි.

## 3.69 බියගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,076,036,928 | 419,145,779 | 1,656,891,149 | 128,555,443 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,047,043,475 | 165,001,691 | 1,882,041,784 | 188,532,345 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,312,110,314 | 109,794,183 | 2,202,316,131 | 201,645,061 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | එකතුකළ අගය මත බදු ගිණුමේ ශේෂය රු.2,425,043 ක් වසර ගණනාවක සිට නිරවුල් කර නොතිබුණි. | 2023 | නිරවුල් කළ යුතුය. | ඉදිරියේදී නිරවුල් කරන බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | 2018 පෙබරවාරි 02 දින රු.1,025,000 කට ගලි බවුසරයක් මිලදීගෙන තිබුණද, 2020 වර්ෂයෙන් පසුව ගලි බවුසර් සේවාව පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 | නිෂ්කාර්ය වියදම වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතුය. | සභා බල ප්‍රදේශය තුල යොදා ගැනීම ඵලදායී නොවන බැවින් මාර්ග නඩත්තු සඳහා යොදවා ගැනීමට නියමිතව ඇත. | වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට නඩත්තුවට යොමු කර ඇත. අවශ්‍යතාවය හඳුනා නොගෙන මිලදී ගෙන ඇත. |

### 3.70 අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,967,164,458 | 259,752,484 | 2,707,411,974 | 76,585,446 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,878,504,358 | 167,250,036 | 2,711,254,322 | 59,614,955 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,877,941,572 | 94,738,650 | 2,783,202,922 | 72,539,698 | තත්ත්වාගණනය කළ |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තියට පටහැනිව උප කාර්යාල 2 ක වසර 14 ක් පැරණි තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි | 2023 | තක්සේරුව කරවාගෙන නව රේට අනුව වරිපනම් අයකළ යුතුය. | වරිපනම් උඩෘත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | උප කාර්යාල 2 කට තක්සේරුව ලබාදී නොමැත. |
| (ආ) | අංක 39/980 දරන ඉඩම් නඩුකරයේ තීන්දුව ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2019 මැයි 15 දින රු.1,876,800 ක මුදලක් සහා අරමුදලින් නඩුවේ පැමිණිලිකාර පාර්ශවයට ගෙවා තිබුණද වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර නොතිබුණි. | 2022 | අලාභය අයකර ගත යුතුය . | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලද පරීක්ෂණ වාර්තාව අනුව වගඋත්තරකරුවන් වන මහජන නියෝජිතයින් හා නිලධාරීන්ට ගෙවන ලෙස දැනුම් දී ඇත. | මහජන නියෝජිතයින්ට විධිමත් අධිහාර ලිපියක් ලැබී නොමැති බැවින්, ගෙවීම් නොකරයි. |

## 3.71 දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 2,983,174,233 | 188,670,490 | 2,794,503,743 | 48,140,244 | තත්ත්වාගණනය කළ |
| **2022** | 3,123,936,725 | 68,859,116 | 3,055,077,609 | 248,696,808 | අහිතකර |
| **2023** | 3,057,014,875 | 31,591,843 | 3,025,423,032 | 77,987,661 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ වගන්ති අංක 20 ට පටහැනිව 1994 සහ 2004 වර්ෂවල තක්සේරු පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | 2023 | තක්සේරුව කරවාගෙන නව රේට අනුව වරිපනම් අය කළ යුතුය. | තක්සේරු ප්‍රතිශෝධනය සඳහා දේපල 18,000 ක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති බව දන්වා ඇත. | නව තක්සේරු ලබාගැනීම සඳහා දේපළ 14,622 ක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. |
| (ආ) | මු.රෙ. 371 2 ට පටහැනිව 2006 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලබාදී තිබුණු අත්තිකාරම් වටිනාකම රු.2,793,113 ක් අයකරගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් මූලික විමර්ෂණ සිදුකරමින් පවතී. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ඇ) | හඳුනාගෙන තිබුණු වරිපනම් අයකළයුතු දේපල 16,260 ක් අතරින්, වරිපනම් අයකර තිබුණු දේපල 2,774 ක් පමණක් විය. | 2023 | තක්සේරුව ලබාගෙන වරිපනම් අයකළ යුතුය. | දේපල 13,587 කින් බදු අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | නව තක්සේරු ලබාගැනීම සඳහා දේපළ 14,622 ක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. |

## 3.72 ගම්පහ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 3,987,042,254 | 307,945,506 | 3,679,096,748 | 13,806,233 | තත්වාගණනය කළ |
| **2022** | 4,063,453,622 | 247,895,629 | 3,815,557,993 | 8,036,241 | තත්වාගණනය කළ |
| **2023** | 4,031,148,750 | 63,780,496 | 3,967,368,254 | 123,751,969 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ලැබී තිබුණු මහජන පැමිණිලි සංඛ්‍යාව 495 කින් විසඳා තිබුණු පැමිණිලි 202 ක් හෙයින් සියයට 59 ක් විසඳමින් පැවතුණි. | 2023 | මහජන පැමිණිලි විසඳිය යුතුය. | පුද්ගල අභිමතාර්ථ ඉටු කර දීමට ඇති බලය සීමා සහිත වීම නිසා ප්‍රගතිය උපරිමයට ළඟා නොවන බව දන්වා ඇත. | දෙපාර්ශවයන් අතර පෞද්ගලික ආරවුල් මත සමථයකට පත් නොවී ඇති බව දන්වා ඇත. |

## 3.73 දොම්පේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,236,196,397 | 167,618,539 | 2,068,577,858 | 49,034,331 | තත්වාගණනය කළ |
| **2022** | 2,469,504,247 | 91,800,224 | 2,377,704,023 | 76,087,748 | තත්වාගණනය කළ |
| **2023** | 2,552,646,304 | 62,465,409 | 2,490,180,895 | 45,239,814 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 68 ක් වැයකර ඉදිකර, පොළ කටයුතු සඳහා 2020 වර්ෂයේදී සභාව වෙත පවරා දී තිබුණු එක් මහලක් වර්ග අඩි 6,380 ක් පමණ වූ මහල් දෙකකින් යුතු ගොඩනැගිල්ලෙහි, කඩ කාමර 87 ක් පමණ වූ සම්පූර්ණ උඩුමහල සහ කඩ කාමර 73 ක් පමණ වූ බිම් මහලේ ඇතැම් කොටස් වෙළඳුන් විසින් භාවිතා නොකිරීමත්, පොළ දිනය හැර දින 6 ක්ම නිෂ්කාර්යව පැවතීමත් නිසා ගොඩනැගිල්ල ජනතාවට ඵලදායීව සහ සභාවට ආදායමක් ලැබෙන පරිදි යොදවා නොතිබුණි. | 2023 | වත්කම් ඵලදායීව භාවිතා කළයුතුය. | සති පොලකට පමණක් ඉදිකරන ලද බැවින්, උඩු මහල මාකට් ක්‍රමයට ලබා දීමේ දි ගැටලු සහගතය. | සම්පූර්ණ භූමියේම වෙළඳාම් කටයුතු සඳහා බදු දී ඇති අතර පොළ පැවැත්වෙන දින, පෙර දින හා පසු දින පොළ භූමිය පාවිච්චි කරනු ලබන බවත් ඇතැම් සතිපොළ දිනයන්හිද උඩු මහලෙහි සාප්පු බඩු විකුණන බවත් සහ ඉදිරියේදී ඉතිරි දින 4 ද අවශ්‍යතාවයන් සඳහා ලබා දෙන බව දන්වා තිබුණි. |

**3.74 මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,179,623,184 | 1,179,623,184 | - | 171,652,556 | තත්වාගණනය කළ |
| **2022** | 1,343,970,417 | 200,421,577 | 1,143,548,840 | 257,692,865 | තත්වාගණනය කළ |
| **2023** | 1,586,216,392 | 388,649,741 | 1,197,566,651 | 30,650,742 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව විසින් 2018 වර්ෂයේ සිට අවස්ථා 3 කදී රු.6,750,000 ක මුදලක් වැය කරමින් පරිගණක මෘදුකාංගයක් ලබාගෙන තිබූ අතර එම මෘදුකාංගය මගින් සභාවේ ප්‍රධාන කාර්යයන් 13 ක් සඳහා පහසුකම් ලබාගැනීමට හැකියාව ඇති බව දන්වා ඇතත් එම කිසිදු කාර්යයක් සම්පූර්ණ කර ගැනීමට මෘදුකාංගයේ දායකත්වයක් නොමැති බව නිරීක්ෂණය විය. | 2022 | සභාව වෙත මෘදුකාංග මිලදී ගැනීමේදී අවශ්‍යතා නිවැරදිව හඳුනාගත යුතු අතර මිලදී ගත් මෘදුකාංග භාවිතයට ගත යුතුය. | කාර්යයන් කිහිපයක් සාර්ථකව ක්‍රියාත්මක වේ. අනිත් සියළුම කාර්යයන් සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතියි. | කාර්යයන් සියල්ල සාර්ථකව ක්‍රියාත්මක නොවේ. |

## 3.75 මහර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,236,164,456 | 274,538,977 | 961,625,479 | 85,829,929 | තත්වාගණනය කළ |
| **2022** | 1,080,859,328 | 164,322,641 | 916,536,687 | 77,588, 762 | අහිතකර |
| **2023** | 1,315,306,126 | 163,182,326 | 1,152,123,800 | 98,414,694 | තත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.103,578,993 ක්වූ හිඟ වරිපනම් ශේෂයෙන් අයවීම් රු.25,143,780 ක් වූයෙන් අයවීම් ප්‍රතිශතය සියයට 24 ක් වී තිබුණු අතර, මේ තුල වසර 10 ට වැඩි ශේෂය රු.1,385,052 ක්ද, වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.1,480,426 ක්ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.70,973,040 ක්ද වී තිබුණි. | 2023 | හිඟ වරිපනම් ආදායම අයකළ යුතුය. | ඉදිරියේදී අය කිරීමට කටයුතු සිදුකරන බව දන්වා ඇත. | 2023 දෙසැම්බර් 31 දිනට පැවති වරිපනම් බදු හිඟ මුදලින් රු. 26,546,250 ක් අයකර ඇත. |

## 3.76 මීරිගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,498,629,445 | 92,808,857 | 1,405,820,588 | 7,961,437 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,560,065,424 | 66,396,467 | 1,493,668,957 | 62,390,419 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,567,328,581 | 29,912,960 | 1,537,415,621 | 34,416,743 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අංක 25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ස්ථිර කරන ලද 56 ක සේවක සංඛ්‍යාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට මේ දක්වා කටයුතු සිදුකර නොමැති බැවින් සමාලෝචිත වර්ෂය තුලදී එම සේවකයින් වෙනුවෙන් ලබාගත හැකිව තිබූ රු.2,634,737 ක වැටුප් ප්‍රතිපූර්ණ ලැබී නොතිබුණි. | 2021 | අංක 25/2014 චක්‍රලේඛය ප්‍රකාරව ස්ථිර කරන ලද සේවකයින් පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවවෙත දැනුම්දී සේවකයින් සංඛ්‍යාව අනුමත කරවා ගැනීමටත්, වැටුප් ප්‍රතිපූර්ණය කරවා ගැනීමටත් කටයුතු කළ යුතුය. | ස්ථිර කරන ලද සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමට ඉල්ලීම් කර ඇත. | මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. |
| (ආ) | සභාව සතුව ඇති ප්‍රමාණය අක්කර 2 රූඩ් 3 ක් වූ ඉඩම් 16 ක් හා ප්‍රමාණය නිශ්චිතව හඳුනාගත නොහැකි ඉඩම් 6 ක් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2021<br>2022 | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | 2023 වර්ෂයේ අවසන් ගිණුමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | කඩ කාමර 341 න් 206 ක් සමග ගිවිසුම් ගතවී නොතිබුණු අතර, බදු ගිවිසුම් බොහොමයක් වර්ෂ 20 කටත් පෙර අත්සන් කළ ඒවා විය. | 2022 | බදු ගිවිසුම්ගත විය යුතුය. | නව තක්සේරුව ලැබුන පසු කඩ සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | කඩ කුලී සංශෝධනයක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | 2019 වර්ෂයේ කුලියට දී තිබූ කඩ කාමර 31 ක් ව්‍යාපාර කටයුතු කරමින් පැවතුණද, පෙර මුදල් අයකර ගිවිසුම්ගත වීමෙන් පසුව කඩ කාමරවල යතුරු ලබා නොදීම හේතුවෙන්, හිඟ පෙර මුදල් ශේෂය රු.41,510,174 ක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. | 2023 | හිඟ කඩ කුලී අයකළ යුතුය. | ගිවිසුම් ගත වීමට සහ පෙර මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

## 3.77 කැළණිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 2,802,786,499 | 340,531,533 | 2,462,254,966 | 25,202,130 | තත්ත්වාගණනය කළ |
| **2022** | 2,810,295,371 | 147,223,814 | 2,663,071,557 | 111,371,688 | තත්ත්වාගණනය කළ |
| **2023** | 3,180,667,504 | 56,862,794 | 3,123,804,710 | 411,945,994 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | තොරණ හන්දියේ පොදු වෙළඳපල කඩ කාමර 29 න් 15 කට අදාළ වලංගු ගිවිසුම් නොතිබුණ අතර, 11 ක් සඳහා පැවති ගිවිසුම් 1998 වර්ෂයේ සිට 2005 අතර කාලයේදී අවසන්වී තිබුණද නව ගිවිසුම් ඇති කර ගෙන නොතිබුණි. තවද 2020 ඔක්තෝබර් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම කඩ කාමර සඳහා නව තක්සේරුවක් සිදුකර තිබුණද කඩ හිමියන්ගේ විරෝධතා ඉදිරිපත්වීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | 2021 | වලංගු ගිවිසුමක් සහිතව කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද නව තක්සේරු මාසික කුලිය අනුව 2021 මාර්තු 01 දින සිට ගිවිසුම් ගත වීමට පැමිණෙන ලෙස කඩ හිමියන් වෙත දැනුම්දෙන ලදී. එහිදී ඔවුන්ගේ විරෝධතා සලකා බැලීම සඳහා විරෝධතා පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් 2022 පෙබරවාරි 25 දින ඉල්ලීම් කර ඇත. | සභාව සමඟ ගිවිසුම් ගත වීම සඳහා පැමිණෙන ලෙස බදුකරුවන්ව දැනුවත් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 50 ක වියදමක් සහ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා දරා තිබූ අතර පරිසර බලපත්‍රයක් ලබා නොගෙන කොම්පෝස්ට් අංගනයක්ද ඇතුළුව කසළ අංගනයක් පවත්වාගෙන ගොස් තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන leachate ප්‍රතිකර්ම පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු අවසාන නොකිරීම හේතුවෙන් පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇත. | 2021 | පරිසර බලපත්‍රය ලබා ගෙන කොම්පෝස්ට් අංගනය හා කසල අංගනය පවත්වාගෙන යැමට කටයුතු කළ යුතුය. | මෙම වසර තුළදී පරිසර බලපත්‍රය ලබාගැනීමට හැකි බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් දන්වා ඇත. | නිර්දේශය අනුව ක්‍රියාත්මක කර නොමැත. |
| (ඇ) | 2006 මාර්තු 07 දින ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට වාර්ෂිකව රු.1,000 ක නාමික බදු කුලියක් මත බදු ගිවිසුමක් රහිතව පැවරීම් සහතිකයක් මගින් වසර 33 ක් සඳහා බදු දී තිබුණු ඉඩම සඳහා 2018 වර්ෂයේ සිට වාර්ෂික බදු කුලිය ගෙවා නොතිබුණි තවද ඉඩමේ තක්සේරු වටිනාකම | 2021 | බදු ගිවිසුමක් මගින් ප්‍රදානය කිරීමට, හිඟ කුලී අයකර ගැනීමට හා ඉඩම තක්සේරු වියදම පාපන්දු සම්මේලනයෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.19,000,000 ක් හා තක්සේරු වියදම වන රු.89,750 ක් පාපන්දු සම්මේලනයෙන් අයකරගෙන නොතිබුණි. | | | | |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අත්තිකාරම් ශේෂ 45 ක වටිනාකම රු.1,880,535 ක් අයකරගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | නිවැරදි කරන බව දන්වා ඇත. | රු.63,219 ක් 2024 අගෝස්තු 22 දින අය කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළඳ ස්ථාන හිඟ කුලී ශේෂය වසර 5 ඉක්මවූ රු.1,714,507 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.266,972 ක්ද වී තිබුණි. | 2023 | වෙළඳ ස්ථාන කුලී හිඟ ශේෂයන් අයකර ගත යුතුය. | විරෝධතා පරීක්ෂණ අනුව අය කරනබව. | වසර 05 වැඩි හිඟ ශේෂයෙන් රු.476,080 ක් අය වී ඇත. |
| (ඉ) | 2004 වර්ෂයේදී සභාව සතු උත්සව ශාලාව බදුදීමේදී ඇතිවූ හිඟ කුළිය රු.733,489 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | 2023 | හිඟකුළි ශේෂ අයකළ යුතුය. | නඩු තීන්දුවට අවනත නොවූ පාර්ශවකරු වෙත උසාවි නියෝගයක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | නැවත නඩුව ගොනු කිරීමට ගොනුවේ පිටපතක් ලබා ගැනීමට මේ වන විට නොහැකි වී ඇත. |
| (ඊ) | වසර 03 ක් පමණ කාලයක සිට අක්‍රීය තත්ත්වයෙන් පවතින හුනුපිටිය පැරණි ආදාහනාගාරය | 2023 | පිළිසකර කර භාවිතයට ගත යුතුය. | කැඳවූ මිල ගණන් රු.ලක්ෂ 50 ඉක්මවයි. 2024 වර්ෂයේ අළුත්වැඩියාවට | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිළිසකර කරගෙන නොතිබුණි. | | | කටයුතු සිදුකරමින් පවතියි. | |
| (උ) | සභාව විසින් භාවිතා කරන ඉඩම් 97 න් 21 කට පිඹුරුපත්ද, 76 කට හිමිකම තහවුරු කිරීමේ නීත්‍යානුකූල ලියවිලිද නොතිබුණි. | 2023 | පිඹුරුපත් සකසා, හිමිකම් තහවුරු කර ගතයුතුය. | පිඹුරුපත් සකසා ප්‍රකාශණ ඔප්පු සැකසීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ඌ) | සේවය තහනම් කළ, සේවය අතහැර ගිය, මියගිය සහ විශ්‍රාම ගියනිලධාරීන් 11 දෙනෙකුගේ හිඟහිටි සේවක ණය ශේෂය රු.1,318,990 ක් වී තිබුණි. | 2023 | හිඟ සේවක ණය අයකරගත යුතුය. | සේවය තහනම් කළ නිලධාරීන්ට සිහි කැඳවීම් යවා ඇති බව හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ඇපකරුවන් විශ්‍රාම, එතෙර ගොස් ඇති බව හා මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ පාරිතෝෂිතයන් ලැබී නැත. | අයකරගෙන නොමැත. |

## 3.78 වත්තල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,062,602,136 | 161,753,502 | 900,848,634 | 120,504,997 | තත්ත්වාගණනය කළ |
| **2022** | 3,672,073,625 | 101,614,950 | 3,570,458,675 | 263,219,162 | තත්ත්වාගණනය කළ |
| **2023** | 4,057,812,518 | 123,906,081 | 3,933,906,437 | 436,438,354 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1988 වර්ෂයේදී ආචාර්ය නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් විසින් තෑගි ඔප්පුවක් මගින් රු.188,000 ක වටිනාකමින් යුක්ත වූ අක්කර 11 රූඩ් 02 පර්චස් 11 ක් විශාලත්වයෙන් යුත් උස්වැටකෙයියාව පාර්ස් වත්ත ඉඩම, වත්තල ප්‍රාදේශීය සභාවට පිරිනමා තිබුණි. 1991 වර්ෂයේදී සභාපති හා ලේකම් විසින් මෙම ඉඩම ඉඩම් කොටස් 57 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට බෙදා තෑගි ඔප්පු මගින් අන්සතුකර තිබුණි. | 2021 | ඉඩම් පැවරීමේ ඔප්පුවේ සඳහන් අරමුණු අනුව කටයුතු කළයුතුය. | උස්වැටකෙයියාව පාරිස් වත්ත ඉඩමේ ඔප්පු සකස් කළ නීතිඥ මිය වෙත මේ පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා ගැනීමට යොමුකර ඇත. | සභාවට පවරන අවස්ථාවේදීත් ඉඩම කොටස් කර තිබුණු බවත් කොටස් පවරා දීමේ පදනම හඳුනාගත නොහැකි බවත් නීතිඥවරයා විසින් සභාවට දැනුම් දී ඇත. |
| (ආ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 | 2023 | තක්සේරුව සිදුකරවා ගෙන නව රේටයන් අනුව වරිපනම් | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර | 2017 වර්ෂයේ සිට නව තක්සේරුවක් සිදුකර ගැනීමට තක්සේරු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වගන්තිය ප්‍රකාරව දේපල 67,377 ක් 2008 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | | අය කළ යුතුය. | ඇත. | දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණ ද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.83,978,079 ක් වූ හිඟ වරිපනම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුල රු.27,674,227 ක් රැස්කර තිබුණු හෙයින් හිඟයෙන් රැස්කරගත් වටිනාකම සියයට 33 ක් පමණක් විය. | 2023 | හිඟ වරිපනම් ශේෂ අයකර ගත යුතුය. | විවිධ වැඩසටහන් මගින් හිඟ අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2024 අප්‍රේල් 30 දින වන විට පැවැති හිඟයෙන් අය කිරීමේ ප්‍රතිශතය සියයට 17 ක් විය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.8,596,534 ක් වූ හිඟ කඩ කුලී ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ රැස්කරගත් වටිනාකම රු.2,735,759 ක් වූයෙන් රැස්කරගත් වටිනාකම සියයට 31 ක් වී තිබුණි. | 2023 | හිඟ කඩ කුලී ශේෂ අයකර ගත යුතුය. | අය කරමින් පවතියි. | සමස්ත කඩකුලී හිඟයෙන් 2024 අගෝස්තු 31 දින වන විට රු.1,339,883 ක් අයකර ඇති අතර තවදුරටත් අයකර ගනිමින් පවතියි. |
| (ඉ) | වෙනත් රාජ්‍ය ආතනවලින් සභාවේ පරිහරණය සඳහා ලැබී තිබූ වටිනාකම රු.42,644,520 ක්වූ, රථ 5 ක් සහ යන්ත්‍රයක් සභාවට පවරාගෙන නොතිබුණි. | 2023 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | නැවත පැවරීමේ ලිපි සම්පූර්ණ කරමින් පවතියි. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සභාවේ සේවා කාලය වසර 07 ත් 28 ත් අතර කාලයක් සිටි නිලධාරීන් 19 දෙනෙකු සේවා ස්ථාන අතර මාරු කිරීම් සිදුකර නොතිබුණි. | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වසර 5 ට වැඩි නිලධාරින්ගේ ලේඛනයක් පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් හා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරනු ඇත. | 2024 වසරේ නිලධාරීන් 07 කට ස්ථාන මාරු ලැබුණත් අනුප්‍රාප්තික නිලධාරීන් වාර්තා නොකිරීම නිසා නිදහස් කර නොමැත. |

## 3.79 පානදුර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,030,067,195 | 158,717,531 | 871,349,664 | (95,803,562) | තත්වාගණනය කළ |
| **2022** | 1,027,021,259 | 204,331,409 | 822,689,850 | (5,923,009) | තත්වාගණනය කළ |
| **2023** | 1,096,075,226 | 198,441,991 | 897,633,235 | 76,769,142 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් වාර්ෂික බිල් කිරීම රු.29,268,870ක් වූ අතර එම බිල් කිරීමෙන් රු.13,255,536ක් හෙවත් සියයට 45ක් සමාලෝචිත වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රු.50,000ක් ඉක්මවූ වරිපනම් ඒකක 16කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.2,952,995ක් විය. | 2023 | ප්‍රවර්තන වර්ෂයේ හා හිඟ ආදායම් අයකර ගතයුතුය | වරිපනම් ගෙවීමට අන්තර්ජාල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම සහ බදු ගෙවන්නන්ට සභාවෙන් වන සේවාව පිළිබඳ දැනුවත් කළ අත්පත්‍රිකා බෙදා හැරීම සිදු කර ඇත. | 2024 අගෝස්තු 31 දිනට එකතු කළ ආදායම් ප්‍රතිශතය සියයට 45.58 ක් විය. |
| (ආ) | ප්‍රගති වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවිය යුතු වෙළඳ ස්ථාන කුලී ආදායම රු.4,438,163ක් වූ අතර ඉන් රු.1,830,800ක් හෙවත් සියයට 41 සමාලෝචිත වර්ෂය තුල අයකර | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. | ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම මාසිකව පැවැත්වීම/ හා2024 වර්ෂය තුල කඩ 04 ක් බදු දීමට පියවර ගැනීම සිදු කර ඇත. | 2024 අගෝස්තු 30 දින සිට තවදුරටත් අයවිය යුතු මුදල රු.3,692,692 ක් විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොතිබුණි. | | | | |
| (ඇ) | කෙසෙල්වත්ත පොදු වෙළඳපල පැරණි ගොඩනැගිල්ල ඉවත් කර නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 2021 සැප්තැම්බර් 27 වන දින රු.20,000,000ක් ලැබී තිබුණු අතර සෑම මසකම එම ණය මුදල සඳහා පොළී මුදල ලෙස රු.150,000ක් ගෙවිය යුතු විය. ලබා දී ඇති සහන කාලය වර්ෂයකුත් මාස 07 ක් වූ අතර සහන කාලය අවසානයේ වාරික මුදල ගෙවිය යුතු විය. 2022 අප්‍රේල් 26 දින තවත් රු.4,231,000ක ණය මුදලක් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබී තිබුණ ද පොදු වෙළඳපොලේ ඉදිකිරීම් කටයුතු දැනට අතරමඟ නවතා ඇති අතර ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක්ද සිදු කර නොතිබුණි. | 2023 | ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | නැවත දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මෙම ඉදිකිරීම් සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය හැසිරවීම පිළිබඳ තොරතුරු ඉල්ලා දුරකථන ඇමතුමක් ලබා දීමෙන් අනතුරුව ඔවුන් විසින් ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා වන මාර්ගෝපදේශ ඉදිරිපත් කර ඇත. ඒ අනුව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | 1998 වර්ෂයේ සිට අවුරුදු 25ක කාලයක සිට පවතින ජල ප්‍රවාහන ගැටළුවක් | 2022<br>2023 | ව්‍යාපෘතිය අවසන් කිරීමට නොපමාව කටයුතු කළ | 2024.03.14 දින තීරණ කමිටුවේ තීරණ අංක 773 ලෙස අත්පත් කර | මේ වන විට තක්සේරුව අවසන් කර ඇති අතර තක්සේරු |

| | | | |
|---|---|---|---|
| විසදීම සඳහා ආරම්භ කළ දිබ්බැද්ද පුඤ්ඤානන්ද මාවතේ කපුගහවත්ත ඉඩමට මායිම් වන රජයේ ඉඩමේ පොදු කාණුව ඉදිකර වැසි ජලය බැස යාමට සැලැස්වීමේ ව්‍යාපෘතිය යටතේ පුද්ගලික ඉඩමක් හරහා දිවයන කාණු කොටස පමණක් රු.253,577ක සහා අරමුදලක් දරා ඉදිකර ව්‍යාපෘතිය අතරමග අතහැර දමා තිබුණි. මේ හේතුවෙන් මාර්ගයේ කාණුවකින් වැසි ජලය පෞද්ගලික ඉඩම් තුලට ගලායැමෙන් වන හානියට අමතරව වැසි ජලය බැස නොයැමෙන් මාර්ගයද පරිහරණය කළ නොහැකි වී තිබුණි. | යුතුය. | ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණයක් ලබාගෙන ඇත. ඉහත පවරා ගැනීමට අවශ්‍ය තක්සේරු කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලීමක් ප්‍රාදේශීය ලේකම් වෙත 2024.03.22 දින ලිපියක් යොමු කර ඇත. | වටිනාකමට අදාල මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇති අතර අත්පත් කර ගැනීමට අදාල යෝජනාව යොමු කිරීමට අවහ්‍ය කටයුතු කරමින් පවතී. |

## 3.80 බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 581,245,869 | 137,368,640 | 443,877,229 | 52,741,814 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,683,793,093 | 129,151,363 | 1,554,641,730 | 68,792,224 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,791,991,206 | 188,057,823 | 1,603,933,383 | 78,802,975 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවෙන් වෙනම ඒකකයක් ලෙස 2018 පෙබරවාරි 11 දින මිල්ලනිය ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර තිබූ අතර වසර 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද රු.35,663,712 ක් වූ හිඟ මුදල් ගෙවා වත්කම් බෙදීම නිරවුල් කරගෙන නොතිබුණි. | 2021 2023 | හිඟ මුදල් ගෙවා වත්කම්, වගකීම් බෙදීම කඩිනම් කළ යුතුය. | මෙම මුදල කොපමණ වාරික ප්‍රමාණයකින් ගෙවිය යුතුද යන්න කළුතර පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ගිවිසුම අනුව තීරණය වන බව දන්වා ඇත. | ගෙවිය යුතු වාරික ප්‍රමාණය ඇතුළත් කර පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කළ යුතු ගිවිසුම මෙතෙක් ලැබී නොමැත. |
| (ආ) | මියගිය, සේවය හැරගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ නිලධාරින් 11 දෙනෙකුගෙන් එකතුව රු.1,166,832 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | 2023 | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුය. | මියගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.14,800 , විශ්‍රාමික පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත් සේවය හැර ගිය අය වෙත ලිපි යැවුවද ප්‍රතිචාර දක්වා නැති බව දන්වා ඇත. | සේවය හැරගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය වූ රු.422,152 ක් අයකර ගත නොහැකි වී ඇත. ඉතිරි ණය ශේෂයෙන් රු.365,078 ක් අයකර ගෙන ඇත. |

## 3.81 බේරුවල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 689,096,158 | 109,689,863 | 579,406,295 | 75,271,564 | තත්ත්වාගණනය කළ |
| **2022** | 831,592,395 | 79,501,076 | 752,091,319 | 1,640,490 | තත්ත්වාගණනය කළ |
| **2023** | 792,694,113 | 66,922,238 | 725,771,875 | 8,048,882 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 191 ක නීත්‍යානුකූල හිමිකම සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන ආයතනවල පවතින ඉඩම් ගැටළු විසඳීම යටතේ ප්‍රාදේශීය ලේකම් විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා ගැටළු සියල්ල ඉදිරිපත් කර ඇත. | පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | බේරුවල ප්‍රාදේශීය සභාවේ විශාල වශයෙන් රැස්වන කසළ බැහැර කරලීම සඳහා දිගුකාලීන ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | 2022<br>2023 | කසළ බැහැර කිරීම පිළිබඳ ඇති ගැටළුව පිළිබඳව වගකිවයුතු ආයතන දැනුවත් කර තිරසර විසඳුමක් ලබාගත යුතුය. | කොම්පෝස්ට් අංගනයේ ධාරිතාව අනුව දිරන කසළ එම ස්ථානයට යවන අතර ඉතිරි කොටස් පුද්ගලික ඉඩමක බැහැර කරනු ලබයි. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ඇ) | සෝ ඝාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රය ලබාගෙන නොතිබූ අතර එහි ජලය ක්‍රමවත්ව බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති බැවින් අපජලය ඉඩමට යාබඳ බෙන්තර ගඟට මිශ්‍ර වී තිබුණි. | 2023 | පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මධ්‍යම පරිසර අධිකාරිය විසින් බලපත්‍ර ලබාදීමට සිදු කළ ස්ථානීය පරීක්ෂණයේදී අඩුපාඩු පෙන්වා ඇති අතර ඒවා ඉදිරියේදී නිවැරදි කර ගැටළු නිරාකරණය කරන බව දන්වා ඇත. | පරිසර බලපත්‍රය ලබාගෙන නැත. |

## 3.82 බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 480,298,390 | 41,228,.051 | 439,070,339 | 15,093.695 | තත්ත්වාගණනය කළ |
| **2022** | 577,179,366 | 26,236,493 | 550,942,873 | 5,420,731 | තත්ත්වාගණනය කළ |
| **2023** | 612,906,726 | 10,050,520 | 602,856,206 | 2,103,503 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීමට පෙර සභාවේ අවශ්‍යතාවය ඉදිරිපත් කර ඉදි කිරීම් සිදු කළයුතු වුවද, එම අවශ්‍යතාවය හඳුනා නොගෙන නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.153,351,216 ක පිරිවැයක් දරා බහු කාර්ය ගොඩනැගිල්ලක් ඉදිකර ප්‍රාදේශීය ලේකම්ගේ පැවරුම් නියෝග මගින් 2019 නොවැම්බර් සභාව වෙත පවරා තිබුණි. | 2021 | සභාවේ අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිකිරීම් කළයුතුය. | ඉදි කිරීමට පෙර සභාවේ අවශ්‍යතාවය පිළිබඳ විමසීමක් කර නොමැත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. මේ දක්වා ගොඩනැගිල්ල ඌණ උපයෝජිතව පවතී. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය ප්‍රකාරව සියළු වැසිකිළි හා වැසිකිළි වලවල් නිසි කාල සීමාව තුලදී විධිමත් ලෙස පවිත්‍ර කිරීම් හා | 2022, 2023 | බල ප්‍රදේශය තුල මළ අපද්‍රව්‍ය නිසි පරිදි බැහැරලීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ගත යුතුය. | අදාල මහජන ඉල්ලීම් අගලවත්ත හෝ හොරණ ප්‍රාදේශීය සභාවන්ට යොමු කිරීම සිදු කරන බව දන්වා ඇත. | ගලි බවුසරයක් නොමැති බැවින් සේවාව ඉටු කළ නොහැකි වී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හිස් කිරීම් සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය. එහෙත් බල ප්‍රදේශය තුල මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වර්ෂ 2½ ක කාලයක සිට ගලිරථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | | | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වාහන 03 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | වාහනවල අයිතිය ආයතනය නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහන අයිතිය ආයතනයේ නමට පවරාගෙන නැත. | වාහන අයිතිය ආයතනයේ නමට පවරා ගැනීමට කටයුතු කරමින් පවතියි. |

## 3.83 දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 638,649,755 | 58,448,604 | 580,201,151 | 17,750,137 | තත්ත්වාගණනය කළ |
| **2022** | 668,976,701 | 55,561,045 | 613,415,656 | 23,401,881 | තත්ත්වාගණනය නොකළ |
| **2023** | 683,490,798 | 27,354,791 | 656,136,007 | 19,483,543 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| නිවාඩු නිකේතනයක් දීර්ඝ කාලයක සිට බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගියද ඒ බව නොසලකා එම ආයතනයේ අළුතින් ඉදි කරන ලද ගොඩනැගිලි සඳහා වූ සැලසුම් 2019 වර්ෂයේදී සභාව විසින් අනුමත කර තිබුණු අතර 2022 වර්ෂයේදී එම ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකයද නිකුත් කර තිබුණි. | 2023 | නිති,රීතිවලට අනුකූල නොවන ආයතනවලට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් නොවීමට පියවර ගන්නා බව දන්වා ඇත. | එසේම පවතියි. |

## 3.84 කළුතර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 788,078,556 | 70,481,246 | 717,597,310 | 62,107,296 | තත්ත්වාගණනය කළ |
| **2022** | 809,679,235 | 45,165,276 | 764,513,959 | 50,962,414 | තත්ත්වාගණනය කළ |
| **2023** | 855,813,634 | 35,902,309 | 819,911,325 | 44,290,949 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2022 සැප්තැම්බර් 06 දිනැති අංක 2296/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම. | | | | |
| (i) | 2023 මාර්තු 20 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කළුතර මහා නගර සභාවට අය වියයුතු වරිපනම් බදු ආදායම හඳුනා නොගැනීම නිසා කළුතර මහා නගර සභාවට අයවිය යුතු වරිපනම් ආදායමද කළුතර ප්‍රාදේශීය සභාවේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. | පිළිතුරු දී නැත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |
| (ii) | 2023 මාර්තු 20 දින සිට කළුතර මහා නගර සභාවට අයත් විය යුතු වත්කම් ප්‍රමාණය නිශ්චිතව | 2023 | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. | පිළිතුරු දී නැත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හඳුනාගෙන භාරදීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේත් කටයුතු කර නොතිබීම නිසා කළුතර ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව නිරූපණය නොවුණි. | | | | |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය නව වරිපනම් තක්සේරුවක් සිදු කිරීම සඳහා 2019 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණද, ප්‍රවර්තන වර්ෂය සඳහා ද 2013 වර්ෂයේ තක්සේරුව මත බදු අයකර තිබුණි. | 2023 | යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් උපදෙස් ලැබුණු විගස ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කරන බව දන්වා ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

## 3.85 මදුරාවල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 377,851,106 | 17,913,029 | 359,938,077 | (337,255) | තත්ත්වාගණනය කළ |
| **2022** | 408,880,052 | 16,777,673 | 392,102,379 | (3,712,883) | තත්ත්වාගණනය කළ |
| **2023** | 403,202,944 | 15,920,992 | 387,281,952 | (150,222) | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ පුරනැඟුම ව්‍යාපෘති මගින් 2016 වර්ෂයේ රු.20,619,845ක් වැය කර අවසන් කරන ලද නාර්තුපාන | 2021 | | | |
| (i) | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. හෙක්ටයාර් 0.3277 ක් වූ ඉහත ගොඩනැගිල්ල ඉදිකර තිබුණ ඉඩමේ භුක්තිය මදුරාවල ප්‍රාදේශීය ලේකම් විසින් සභාවට භාර දී තිබුණද, 2022 මැයි 31 වන විටත් අයිතිය පවරා ගෙන නොතිබුණි. | | ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. | පවරා ගැනීමට අවශ්‍ය අයදුම්පත් පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. | සිහි කැඳවීම් යවා ඇත. මෙතෙක් පවරා දී නැත. |
| (ii) | ගොඩනැගිල්ල ඉදි කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කර සභාවේ අවශ්‍යතාවය | 2021 | ඌණ උපයෝජිත වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළයුතුය. | වැඩ සටහන් කිහිපයක් පමණක් පවත්වාගෙන යනු ලබයි. | මසකට දින 04 ක් පමණ සභාවේ කටයුතු සඳහා යොදා ගනී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හඳුනාගෙන ඉදි කිරීම් කළයුතු වුවත්, එසේ අවශ්‍යතාවය හඳුනා නොගෙන ඉදි කර තිබුණු පිරිවැය රු.20,619,845 වූ උක්ත ගොඩනැගිල්ල ඉදි කර සභාවට භාරදුන් 2016 නොවැම්බර් සිට අවස්ථා කිහිපයක පමණක් භාවිතා කළද වැඩි කාලයක් ඌන උපයෝජිතව පැවතුණි. | | | | |
| (ආ) | 2016 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු රු.784,300 ක වටිනාකමින් යුත් XT-Pack වර්ගයේ බෙල් මැෂිමක් වසර 03 කට ආසන්න කාලයක් භාවිතයට ගැනීමකින් තොරව පොහොර අංගනයේ පැවතුණි. | 2022 2023 | වත්කම් නිසි ලෙස නඩත්තු කළ යුතු අතර අදාළ අරමුණ සඳහා භාවිතා කළ යුතුය. | අළුත්වැඩියා කටයුතු මේවන විට සිදු කරමින් පවතියි. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

## 3.86 මතුගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 758,123,934 | 54,891,117 | 703,232,817 | 26,494,865 | තත්ත්වාගණනය කළ |
| **2022** | 723,429,492 | 43,452,079 | 679,977,413 | 22,666,765 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,391,191,142 | 47,148,056 | 1,344,043,086 | 21,750,676 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පොත් වටිනාකම රු.12,500,000 ක වටිනාකමකින් යුත් අක්කර 12 යි රූඩ් 02 යි පර්චස් 36 කින් යුත් බටමුල්ලකන්ද ඉඩම 2012 අගෝස්තු 21 දින මැණුම් කිරීමේදී රාජ්‍ය ආයතනයකින් , විහාරස්ථානයකින් සහ නිවාස හිමියන් තිදෙනෙකු විසින් රූඩ් 02 පර්චස් 12.72 ක ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබුණි. වසර 04 කට පසු 2016 නොවැම්බර් මාසයේදී එම කොටස නැවතත් සභාවට බාරදෙන ලෙස රාජ්‍ය ආයතන සහ පුද්ගලයන්ට දැනුම්දීම පමණක් සිදුකර තිබුණද 2022 අගෝස්තු 23 වන විටද එම ඉඩම | 2021 | සභාව සතු ඉඩම් වල අයිතිය තහවුරු කරගත යුතුය. | වනෝද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. භාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන ඇති ඉඩම් කොටස් සම්බන්ධයෙන්ද අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභාවට අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර මෙම ඉඩමේ අක්කර 12 යි පර්චස් 23 ක ප්‍රමාණය සභාව විසින් භාවිතයට ගැනීමෙන් තොරව ඌණ උපයෝජිතව පවතින බවට නිරික්ෂණය විය. | | | | |
| (ආ) | පොත් වටිනාකම රු.20,000,000 ක වටිනාකමකින් යුත් අක්කර 07 ක් රූඩ් 01 ක් සහ පර්චස් 11.4 කින් යුත් මතුගම වත්ත ඉඩමේ අනවසර නිවාස ඉදිකර තිබුණ අතර ඒ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. තවද මෙම භූමියේ සභාවට කිසිදු ගාස්තුවක් ගෙවීමකින් තොරව විදේශ සේවා නියුක්ති කාර්යාංශ ගොඩනැගිල්ල ඉදිකර තිබුණද එම ආයතනයෙන් සභාවට බදු ගෙවීමක් නොකරන බවට නිරික්ෂණය විය. පශු වෛද්‍ය කාර්යාලයද මෙම භූමියේද ඉදිකර තිබුණද එම ආයතනයෙන්ද බදු අයකිරීමක් සිදු නොවන බවට නිරික්ෂණය විය. ඒ අනුව පොත්වල සඳහන් ඉඩම් | 2021 | සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කළ යුතුය. | කළුතර දිසාපති විසින් 1962 දි මතුගම සුළු නගර සභාව වෙත පැවරූ ඉඩමකි. එවකට එහි සේවය කළ අයට පදිංචියට ඉඩදී ඇත. 2003 වර්ෂයේ සිට වර්ෂ 05 ක් සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බදු ගෙවා ඇතත් ඉන් පසුව ගෙවා නැති බවත්, අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ඉඩම් කොටස විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලබාදී ඇත. | නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණයෙන් කොපමණ සභාව සතුද යන්න නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | | | | |
| (ඇ) | 2015 වර්ෂයේ මතුගම, ප්‍රාදේශීය සභාවේ කාර්යයන් පරිගණක ජාලගත කිරීම සඳහා පද්ධති 07 ක් වෙනුවෙන් පුද්ගලික සමාගමකට රු.1,565,000 ක් ගෙවා තිබුණි. අදාල ගිවිසුමේ 06 111 කොන්දේසිය ප්‍රකාරව වැඩ කරන දින 180 ක් ඇතුළත මෘදුකාංග පද්ධති සියල්ල ස්ථාපිත කළ යුතු වුවත්, වරිපනම් හා කඩ කුලී යන පද්ධති 02 හැර සෙසු පද්ධති 05 සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිගණක ජාලගත කර නොතිබුණි. | 2023 | මිලදී ගත් මෘදුකාංග පද්ධති කාර්යක්ෂමව හා ඵලදායිව භාවිතා කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. | ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට දත්ත ඇතුලත් කරමින් පවතින බව හා වැටුප් සැකසීම, පුස්තකාල කටයුතු හා ගබඩා හා ලිපි ලේඛන තොග පාලනයට වෙනත් පද්ධති ක්‍රියාත්මක වන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |
| (ඇ) | මෘදුකාංග පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක නොවී තිබියදීත් 2020 වසරේ සිට 2023 වර්ෂය දක්වා එම ආයතනයට වාර්ෂික ගාස්තු ලෙස එකතුව රු.608,528 ක් ගෙවා තිබුණි. | 2023 | මිලදී ගත් පද්ධතීන් ආර්ථික වාසි සැලසෙන අයුරින් ප්‍රයෝජනයට ගත යුතුය. | මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක කිරීමට මහජන බැංකුව සමඟ සම්බන්ධවී මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් පහසුකම් ලබා ගත යුතුය. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | බෙලිවත්තකන්ද පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.785,795 ක් වැය කර 2022 නොවැම්බර් මස මිලදී ගන්නා ලද වතුර මෝටරය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණු අතර රු.1,994,605 ක් වැයකර තිබුණු එම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභයක් ලබාදී නොතිබුණි. | 2022 2023 | වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. | ව්‍යාපෘතිය 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

## 3.87 පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 462,139,106 | 49,056,523 | 413,082,583 | 49,111,572 | තත්ත්වාගණනය කළ |
| **2022** | 404,266,712 | 22,759,522 | 381,507,190 | 5,738,191 | තත්ත්වාගණනය කළ |
| **2023** | 405,502,578 | 15,706,317 | 389,796,261 | 8,643,976 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | බදුරලිය පොළ 2013 වර්ෂයේ බදු දීමේදී බදු කුලිය ලෙස අයවිය යුතු රු.108,599 ක මුදල අය කිරීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් සභා අරමුදලට සිදු වූ මූල්‍යමය පාඩුව එවකට සභාවේ ලේකම්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2018 ජනවාරි 03 දිනැති අංක LGN/6/4/1/P29/1 දරන ලිපියෙන් දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 | පළාත් පාලන කොමසාරිස්ගේ නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සභාවට ගෙවන ලෙස නිලධාරියාට ලිපියකින් දන්වා ඇත. | 2022 වර්ෂයේ සභාවට ගෙවන ලෙස නිලධාරිනියට ලිපියකින් දන්වා ඇතත් මෙතෙක් ගෙවා නොමැත. |
| (ආ) | සභාව භුක්ති විඳින ඉඩම් 08 ක අයිතිය සභාව වෙත පවරා | 2023 | භුක්ති විඳින ඉඩම්වල අයිතිය සභාව වෙත | මැනුම් කටයුතුවලට අවශ්‍ය ප්‍රතිපාදන පළාත් පාලන | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගැනීමට කටයුතු කර නොතිබුණි. | | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. | |
| (ඇ) | පාලින්දනුවර ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසානභූමි 30 ක හිමිකම සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | 2022 2023 | සුසානභූමිවල හිමිකම සභාව විසින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලද පසු මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | පවරාගෙන නොමැත. |

## 3.88 වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 277,419,972 | 118,090,459 | 159,329,513 | 1,469,855 | තත්ත්වාගණනය කළ |
| **2022** | 320,408,242 | 68,648,653 | 251,759,589 | (55,306) | තත්ත්වාගණනය කළ |
| **2023** | 285,732,607 | 29,220,548 | 256,512,059 | (13,572,596) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය තුල ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.470,301ක හිඟ ආදායම් පොත් වලින් කපාහැර තිබුණි. | 2023 | ප්‍රාදේශීය සභා පනතේ යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. | ආණ්ඩුකාරවරයා ගෙ--න් අනුමැතිය මෙතෙක් ලැබී නොමැත. |
| (ආ) | සභාපතිට ලබාදී තිබූ එකතුව රු.751,884 ක් වූ පරිගණක හා උපාංග 2022 වර්ෂයේ විනාශවීම සම්බන්ධයෙන් වගකියයුත්තන් නිශ්චය කිරීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. | 2022<br>2023 | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභය අය කර ගත යුතුය. | පරීක්ෂණයක් සිදු කරන ලෙස 2023 මැයි 22 දින සහ 2024 අප්‍රේල් 01 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. | සභාවට ආසන්න රාජ්‍ය ආයතනයකින් විමර්ශනයක් කරන ලෙස පළාත් පාලන දෙපාර්මේන්තුව 2024 මැයි 02 දින දන්වා තිබීම අනුව මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම කර තිබුණද පිළිතුරු දී නොතිබුණි. |

## 3.89 ඇල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 439,499,952 | 23,856,585 | 415,643,367 | (2,660,587) | තත්ත්වාගණනයකළ |
| **2022** | 444,749,379 | 17,094,650 | 427,654,729 | 99,844 | තත්ත්වාගණනයකළ |
| **2023** | 552,260,659 | 19,657,087 | 532,603,572 | 13,183,111 | තත්ත්වාගණනයකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රදේශයේ මංමාවත් අලුත්වැඩියා කිරීම සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ලබා දීමට ප්‍රාදේශීය සභාව පියවර ගත යුතු වුවද, දේශීය හා විදේශීය සංචාරකයින් විශාල වශයෙන් පැමිණෙන ඇල්ල ප්‍රදේශයේ ආරුක්කු 09 පාලම සහ පුංචි ශ්‍රීපාදය සඳහා පිවිසුම් මාර්ග සංවර්ධනය කර නොතිබුණු අතර, වැසිකිළි පහසුකම්ද සපයා නොතිබුණි. | 2022 | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව මංමාවත් අලුත් වැඩියා කිරීම සහ වැසිකිළි පහසුකම් ලබා දීම සිදු කළ යුතුය. | පුංචි ශ්‍රී පාද ස්ථානයේ ඉඩම් ගැටළු හේතුවෙන් වැසිකිළි පහසුකම් නැත. ඉදිරියේදී 98 හෝටල් හිමිකරු සමඟ සාකච්ඡා කර එම පහසුකම් සැලසීමට කටයුතු කරමි. ආරුක්කු 9 පාලම අසල සියළු සනීපාරක්ෂක සහිත ව්‍යාපෘතියක් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් මෙම වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව ඇත. පුංචි ශ්‍රී පාද පිවිසුම් මාර්ග ශ්‍රමදාන කටයුතු මඟින් පිරිසිදු කිරීමට කටයුතු කරන ලද බව. | අවශ්‍ය පහසුකම් සපයා නොතිබුණි. |
| (ආ) | ඇල්ල සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධව 2016 වර්ෂයේදී | 2023 | නායයෑම් අවදානම් සහිත ප්‍රදේශයක් බැවින්, ජාතික ගොඩනැඟිලි | එකඟ වන බව. මෙම කර්මාන්තය ආරම්භ කර ඇත්තේ ඌව පළාත් සංචාරක අමාත්‍යාංශයෙනි. එම | තත්ත්වය එලෙසම පවතී. |

| | | |
|---|---|---|
| ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය නිකුත් කර තිබුණු ඉදිකිරීම් යෝග්‍යතා සහතිකය අනුව, ප්‍රමාණවත් ඉසුලුම් ධාරිතාවයක් සහිත දෘඩ මව් පාෂාණ ස්ථරයක් මත ගොඩනැඟිල්ලේ කුළුණු පාදම් යෙදිය යුතු බවට නිර්දේශ කර තිබුණත්, භෞතික පරීක්ෂාව අනුව ගොඩනැඟිල්ලේ පාදම් සහිත වැඩ කොටස් ඉටු නොකර ඉදිකිරීම් වෙනුවෙන් රු.6,599,634 ක් ගෙවා තිබුණි. | පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබාගෙන ඉදිකිරීම් කළ යුතුය. | නිසා ඌව පළාත් සංචාරක අමාත්‍යාංශයෙන් තොරතුරු විමසා ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව. |

## 3.90 ඌව පරණගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 208,198,109 | 47,368,703 | 160,829,406 | 11,013,880 | තත්ත්වාගණනය කළ |
| **2022** | 222,505,263 | 34,240,203 | 188,265,060 | 2,725,691 | තත්ත්වාගණනය කළ |
| **2023** | 255,238,727 | 13,927,500 | 241,311,227 | 19,305,539 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| වැසිකිළි අවශ්‍ය ස්ථාන හඳුනාගෙන වැසිකිළි පහසුකම් සැපයිය යුතු වුවද, සභාවට අයත් බෝඹුරු ඇල්ල සංචාරක ප්‍රදේශය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට වැසිකිළි පහසුකම් ලබා දී නොතිබුණි. | 2022 | අවශ්‍ය ස්ථාන හඳුනාගෙන පොදු පහසුකම් ලබා දිය යුතුය. | වැසිකිළි ඉදිකිරීම සඳහා ඉඩමේ මැනුම් කටයුතු සඳහා ගෙවීම් කටයුතු කර ඇති අතර,ඉඩම නිත්‍යානුකූලව පැවරීමෙන් පසු වැසිකිළි ඉදිකිරීමට කටයුතු කරන බව. | වැසිකිළි සඳහා ඉඩමක් ලබා ගැනීමේ ගැටළුව හේතුවෙන් වැසිකිළි ඉදි කිරීම ප්‍රමාද වී ඇත. |

## 3.91 කන්දකැටිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 205,347,085 | 85,113,388 | 120,233,697 | (206,849) | තත්ත්වාගණනය කළ |
| **2022** | 241,267,881 | 8,793,275 | 232,474,606 | (1,607,454) | තත්ත්වාගණනය කළ |
| **2023** | 260,344,480 | 11,451,672 | 248,892,808 | (1,251,215) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත්ව තිබුණු කන්දකැටිය මංසන්ධියේ පර්චස් 12 ක ඉඩම තුළ පිහිටි කඩ කාමර 05 ක් ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු විසින් අනවසරයෙන් භුක්ති විදි අතර, 1995 වර්ෂයේ දී ව්‍යාපාරිකයා ඉවත් කරන ලෙස අධිකරණයෙන් නියෝග ලබා දී තිබුණි. එසේ වුවද අධිකරණ ක්‍රියාමාර්ග අනුව කටයුතු නොකර අදාළ පාර්ශවකරු සභාවට කිසිදු මුදලක් නොගෙවා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද ව්‍යාපාරික කටයුතු කරමින් පැවතුණි. | 2022 | අධිකරණ නියෝග අනුව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධ සියලු ලිපිගොනු පළාත් පාලන දෙපාර්තුමේන්තුව වෙත ගෙන ගොස් ඇති බව. | අදාළ කඩ කාමර මෙම ව්‍යාපරිකයා විසින්ම භුක්ති විඳින අතර, සභාවට කුලී මුදලක් අය නොවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2013 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිපාදන මත රු.824,466 ක් වැය කර ඉදිකළ ගෝඩුන්න ජල ව්‍යාපෘතිය සඳහා ලීටර් 20000 ක ජල ගබඩා ටැංකිය 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අපේක්ෂිත අරමුණට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | 2023 | නිවැරදි සැලැස්මකට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. | එම ජල ටැංකිය මේ වනතෙක් ජලය පිරවීමක් සිදුකර නොමැති බවත් ඊට හේතුව සොයා බැලීමේදී තාක්ෂණික දෝෂයක් බව. | තාක්ෂණික හේතු මත මෙම ජල ටැංකිය භාවිතයට ගැනීම කළ නොහැකිව ඇත. |
| (ඇ) | 2021 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත රු.3,584,393 ක් වැය කර තැන්නපංගුව සතිපොළ සඳහා ගොඩනැඟිලි 02 ක් සහ වැසිකිළි සංකීර්ණයක් ඉදි කර තිබුණද, 2023 දෙසැම්බර් 31 වනවිටත් අපේක්ෂිත කාර්ය සඳහා යොදා නොගැනීම හේතුවෙන් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | 2023 | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ප්‍රවර්ධන ප්‍රචාරක කටයුතු සිදුකර සතිපොළ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | සතිපොළ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | කන්දකැටිය ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශය තුළ වාර්ෂිකව එක්රැස් වන ටොන් 25 කට ආසන්න දිරන සහ නොදිරන කසළ වෙන් නොකර | 2023 | කසළ බැහැර කිරීම විධිමත්ව සිදු කළ යුතුය. | මීගහකිවුල සහ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා සමඟ ඒකාබද්ධව විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ඇති කිරීමේ වැඩසටහනක් ආරම්භ වෙමින් | කසළ බැහැර කිරීම සඳහා වෙනත් ස්ථානයක් ලබාගන්නා තෙක් මෙම ස්ථානයේම කසළ බැහැර කරමින් පවතින බව. |

| | |
|---|---|
| බුද්ධංකෝට්ටේ ප්‍රදේශයේ පිහිටි මහවැලි වන රක්ෂිතයට දැනට වසර 05 කට අධික කාලයක සිට අක්‍රමවත් ලෙස වලවල් කපා බැහැර කර තිබුණි. | පවතින බව හා ඉන් පසුව මෙම ගැටළුවට ස්ථිර විසඳුමක් ලැබෙනු ඇති බව. |

## 3.92 පස්සර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 387,296,010 | 91,904,878 | 295,391,132 | (976,513) | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 388,714,149 | 81,777,879 | 306,936,270 | (3,091,099) | තත්ත්වාගණනය කළ |
| **2023** | 409,509,439 | 34,672,683 | 374,809,756 | 19,313,403 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන සහ පස්සර ප්‍රාදේශීය සභාව පොදු වෙළඳපොළ කඩහිමියන්ගෙන් රැස් කරගෙන තිබුණු රු.44,770,559 ක මුදල් යොදවා 2017 වර්ෂයේ කඩ කාමර 46කින් යුතු පොදු වෙළඳපොළ සංකීර්ණයක් ඉදිකර තිබුණි. 2018 වර්ෂයේදී කඩ කාමර බදු දීමේදී පැරණි කඩහිමියන්ට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව වසර 30 ක දිගුකාලීන බදු පදනම මත කඩ කාමර 20 ක්, ටෙන්ඩර් ක්‍රමයෙන් දීර්ඝකාලීන බදු | 2023 | ගිවිසුම් අනුව කටයුතු කර හිඟ ආදායම් අයකරගත යුතුය. | ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව මාසික තක්සේරු කුලිය අඩු කිරීමෙන් පසු ගෙවිය යුතු හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන අතර ආපසු නොගෙවන හා තව දුරටත් ගෙවිය යුතු මුදලින් දේශීය ණය සංවරධන ණය අරමුදලේ ඉතිරි ණය ශේෂය පියවීමට කටයුතු කරනු ලැබේ. | හිඟ කුලී අයකරගෙන නොතිබුණි. |

පදනම මත කඩ කාමර 21 ක් සහ වාර්ෂික ටෙන්ඩර් මත කඩ කාමර 05 ක් බදුදීමට සභාව තීරණය කර තිබුණි. මෙම කඩ කාමර 46 න් 2023 ඔක්තෝබර් 31 දිනට රු.12,165,159 ක කඩ කාමර කුලී හිඟ හිටව පැවතුණි.

## 3.93 බණ්ඩාරවෙළ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 153,325,750 | 5,778,537 | 147,547,213 | 1,688,233 | තත්ත්වාගණනය කළ |
| **2022** | 209,250,637 | 19,389,889 | 189,860,748 | 540,254 | තත්ත්වාගණනය කළ |
| **2023** | 288,305,436 | 3,047,267 | 285,258,169 | 23,607,673 | තත්ත්වාගණනය කළ |

| **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) ප්‍රතිපාදන උපයෝගී කරගෙන කසළ කළමනාකරණය සඳහා කන්ටේනර් බහාලුම් 02 ක් රු. 3,975,000 කට මිලදීගෙන තිබුණද, අදාළ කාර්ය සඳහා භාවිත කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | 2023 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය. | කසල කළමණාකරන සම්පත් මධ්‍යස්ථානයක් ලෙස යොදාගැනීමට අවස්ථා ගණනාවකදී උත්සහ කලද එය අසාර්ථක වූ බැවින් මේ වන විට එම මධ්‍යස්ථාන දෙක කඩ කාමර ලෙස ටෙන්ඩර් කිරීමට ආණ්ඩුකාර අනුමැතිය සඳහා යොමුකර ඇති බව. | ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයට කසළ ගෙනවිත් භාරදීමට ප්‍රදේශවාසීන්ගේ උනන්දුවක් නොමැත. |

## 3.94 මහියංගනය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 204,089,235 | 42,173,167 | 161,916,068 | 20,980,048 | තත්ත්වාගණනය කළ |
| **2022** | 196,466,501 | 28,343,094 | 168,123,407 | 5,061,765 | තත්ත්වාගණනය කළ |
| **2023** | 202,030,888 | 25,298,236 | 176,732,652 | 8,750,803 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මහියංගණය නගරයේ පිහිටි සභාවට අයත් ඉඩමක බදුකරුවන් විසින් මුදල් වැයකර ඉදිකර තිබුණු කඩ කාමර 31 කින් සමන්විත වෙළඳ සංකීර්ණය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම විවිධ පාර්ශවයන් වෙළදාම් කටයුතු සිදු කරමින් සිටින අතර, සභාව බදුකරුවන් සමඟ ගිවිසුම් වලට එළඹ බදු කුලී අයකරගෙන නොතිබුණි. | 2021 | බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ හිඟ බදු ආදායම් අයකර ගත යුතුයි. | ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරමින් සිටින බව. | කඩ කාමර 04 ක් සඳහා පමණක් ගිවිසුම්ගතවී කුලී අයකරමින් පැවතුණි. |
| (ආ) | 2016 වර්ෂයේදී කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සඳහා මහියංගණ දෙහිගොල්ල ග්‍රාමයේ අක්කර 05 ක පමණ භූමියක් වෙන් කරගෙන රු.16,203,454 ක් | 2022 | වැයකර ඇති මුදලට ආර්ථිකභාවයක් ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය. | දෙහිගොල්ල ප්‍රදේශයේ ඉදිකර ඇති කසළ අංගනය ගොඩනැඟිල්ල 2021 අගෝස්තු 01 දින සිට මේ දක්වා බාහිර පාර්ශ්වයකට කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා කුලී පදනම මත | කසළ ප්‍රතිචක්‍රීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වැය කර ස්ථිර කසළ අංගනයක්, කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකර ගොඩනැඟිලි වලට අවශ්‍ය විදුලි සම්බන්ධතාවයද ලබාගෙන තිබුණි. එසේ වුවද, ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය හේතුවෙන් එම ස්ථානයේ කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද සිදු කර නොතිබුණි. | | | ලබාදී ඇති බව. | |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු කුලී හා ගාස්තු අයකර ගැනීම ලේකම්වරයාගේ කාර්යභාරයක් විය යුතු වුවද, පොදු වෙළඳපොළ බිම් මහළෙහි පිහිටි කඩ කාමර 20 සම්බන්ධයෙන් 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කඩ කාමර බදු කුලී අයකර ගෙන නොතිබුණි. | 2022 | විධිමත්ව ගිවිසුම් වලට එළඹ බදු කුලී අය කර ගත යුතුය. | බිම් මහළ කඩ හිමිකරුවන් 25ස් අවුරුද්දකට බදු කාලයක් ලබාදීමට කටයුතු කරන මෙන් දන්වමින් ගිවිසුම්ගත වීම ප්‍රමාද කර ඇති බව. | මෙතෙක් ගිවිසුම්ගතවී කුලී අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | ව්‍යාපෘති වාර්තාවක් සකස් කර, ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඒ සඳහා ඇමතිවරයාගේ අනුමැතිය ලබා | 2022 | සභාවට අයත් ඉඩමක ඉදිකිරීම් සිදු කිරීමේදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතු | මහියංගණය ප්‍රාදේශීය සභාව සහ මහියංගණය පොදු වෙළෙඳ සංගමය සමඟ ගිවිසුම්ගතව රජයේ | මේ දක්වා ගිවිසුම්ගතවී කුලී අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගැනීමෙන් පසු විධිමත් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර පුද්ගලයින් කිහිප දෙනෙකු විසින් පිහිටුවාගත් වෙළඳ සංගමයක් මඟින් මුදල් රැස්කර ප්‍රාදේශීය සභාවට අයත් කැබලි අංක 5035 දරන ඉඩමේ ඉදිකර තිබුණු පැරණි වෙළඳපළ කඩ කාමර 24 ක් හා පොළ භූමියේ කුට්ටි කඩ කාමර 20 ක් කඩා ඉවත් කර නව කඩ කාමර 88 ක්, සිනමා ශාලාවක් සහ කුට්ටි කඩ කාමර 32 කින් යුත් වෙළඳ සංකීර්ණයක් 2012 වර්ෂයේ සිට ඉදිකරමින් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද එහි වැඩ නිමකර නොතිබුණි. | | අතර,කඩිනමින් ව්‍යාපෘති නිම කරවා ගත යුතුය. | දායකත්වයකින් තොරව වෙළෙඳ සංගමයේ මැදිහත්වීමෙන් බදුකරුවන්ගෙන් මුදල් අයකර කොන්ත්‍රාත් ආයතනයක් හරහා සිදුකර ඇත. එමෙන්ම ඉදිකිරීම් අවසානයේ සභාව වෙත පැවරීමේ එකඟතාවය මත ඉදිකිරීම් කර ඇති බව. | |
| (ඉ) | 2013 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් රුපියල් මිලියන 21.5 ක මුදලක් වැය කර මහියංගණය ලංකා ගමනාගමන මණ්ඩල බස් නැවතුම්පොළෙහි කඩ කාමර 29 ක් ඉදිකර තිබුණි. 2014 ජනවාරි සිට | 2022 | නව කොන්දේසි යටතේ විධිමත් ප්‍රසම්පාදනයක් තුළින් කඩ කාමර බදු දිය යුතුය. | අදාළ කඩ කාමර 29 අවස්ථා කිහිපයකදී ටෙන්ඩර් කළ අතර එහිදී කඩ කාමර 11ක් ටෙන්ඩර් විය. ඉන් 5ක් ගිවිසුම් ගතවී ඇති නමුත් ඉතිරි කඩ කාමර 6න් 3කට අදාළව වාරණ නියෝගයක් පනවා ඇති බැවින් ගිවිසුම්ගතවීම | කඩ කාමර 11 ක් පමණක් බදුකරුවන් විසින් ලබාගෙන ඇති අතර, කඩ කාමර 18 ක් බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇතත් බදුකරුවන් ඉදිරිපත් නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කඩ කාමර බදු නොදීම හේතුවෙන් සභාවට රු.10,040,000 ක කඩ කුලී ආදායමක් අහිමි වී තිබුණි. | | | තාවකාලිකව නවතා ඇත. ඉතිරි කඩ කාමර ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | |
| (ඊ) | සභාව විසින් සතිපොළ භූමියෙහි පැරණි කඩ කාමර 49 ඉවත් කරන අවස්ථාව වනවිට (2012) කඩ කාමර හිමියන්ගේ හිඟ හිටි කඩ කාමර කුලී රු. 5,776,700 ක් සමාලෝචිත වර්ෂය දක්වාම අයකරගෙන නොතිබුණි. | 2022 | නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව හා සභා අරමුදලට අවාසිදායක නොවන ලෙස කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | අලුතින් ඉදිකරන ලද කඩ කාමර බදුදීම සඳහා ගිවිසුම් වලට එළඹ නොමැති අතර, පැරණි කඩ කාමර වලින් සභාවට ලැබුණු ආදායමද අහිමිවී ඇත. |
| (උ) | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබා නොගෙන හා පාරිසරික අධ්‍යයනයක්ද සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.778,500 ක් වැය කර නිසල අරණ ආදාහනාගාර භූමියට යාබඳව ගලා බසින මහවැලි ගඟ ආසන්නයේ ගලි අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගලි වලක් 2022 වර්ෂයේදී සකස් කර තිබුණි. 2023 වර්ෂය අවසන් වන විටත් ගලි වල භාවිතා කර නොතිබුණි. | 2022 | ගලි ද්‍රව්‍ය බැහැර කිරීමට ගලි වල භාවිත කළ යුතුය. | කාර්මික නිලධාරීගේ අධීක්ෂණය යටතේ ගලි වල ඉදිකිරීම සිදුකර ඇත. මේවන විට ගලි වලවල් දෙකම ගලි දැමීම සඳහා යොදාගන්නා බව. | අලුතින් ඉදිකරන ලද ගලිවල මෙතෙක් ගලි බැහැර කිරීම සඳහා භාවිතා කර නොමැත. |

## 3.95 මීගහකිවුල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 134,439,432 | 9,279,938 | 125,159,494 | 2,858,159 | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 143,654,469 | 20,900,531 | 122,735,938 | (1,755,705) | තත්ත්වාගණනය කළ |
| **2023** | 139,411,426 | 5,785,519 | 625,907,133 | 2,750,143 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ඉකුත් වර්ෂයේ මැයි 09 දින කොළඹ ප්‍රදේශයේ ඇති වී තිබුණු නොසන්සුන්කාරී වාතාවරණය හේතුවෙන් ගිනි තබා විනාශ කර තිබුණු රු.7,650,000 ක් වූ කැබ් රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) අනුව පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. | 2023 | පරීක්ෂණ කටයුතු සිදුකර හානියේ වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. | 2023 සැප්තැම්බර් 07 දින සභා ලේකම්ගෙන් සහ රියදුරුගෙන් ප්‍රකාශ ලබාගෙන ඇති බව. | කැබ් රථයට අදාල පරීක්ෂණ කටයුතු පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරන අතර, මේ වන විට සභා ලේකම්, විෂයය නිලධාරි, රියදුරු වෙතින් ප්‍රකාශ සටහන් කරගැනීම සිදු කර ඇත.තවද, අදාල ලිපිලේඛන පරීක්ෂණ මණ්ඩලය වෙතින් ලබාගැනීම සිදු කර ඇත. |

### 3.96 රිදී මාලියද්ද ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 170,880,867 | 18,152,674 | 152,728,193 | (1,253,791) | තත්ත්වාගණනය කළ |
| **2022** | 163,835,530 | 22,690,101 | 141,145,429 | (2,144,507) | තත්ත්වාගණනය කළ |
| **2023** | 205,521,100 | 21,958,074 | 183,563,026 | 3,148,153 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) මූල්‍ය ප්‍රතිපාදන මත රු.5,200,000 ක් වැය කර ඉදිකර තිබුණු කඩ කාමර 02 ක් බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණු අතර, කඩ කාමර බදු දීමට පුවත්පත් දැන්වීම් පළකිරීම සහ එම දැන්වීම් නැවත අවලංගු කිරීම වෙනුවෙන් රු.116,458 ක් වැය කර තිබුණි. | 2023 | නිවැරදිව කළමනාකරණ තීරණ ගත යුතුය. | කළමනාකරණ කමිටු නිර්දේශ අනුව වසර 03 ක කාලයකට බදුදීමට නියමිත කඩ කාමර සඳහා පුවත්පත් දැන්වීම් පළ කර ඇත. පසුව පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව වසර 25කට කඩ කාමර බදුදීමට තීරණය කර ඇති බැවින් පුවත් පත් දැන්වීම් පළකිරීම හා එය අවලංගු කිරීම සිදු කර ඇති බව. | කඩ කාමරයක් සඳහා වන තක්සේරු මුදල ප්‍රමාණවත් නොවන බැවින්, නැවත තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් කර ඇති බැවින්, තවදුරටත් මෙම කඩ කාමර වසා දමා ඇත. |
| (ආ) | 2014 සහ 2015 වර්ෂවලදී "ගමින් ගමට දොරින් දොරට" මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුමත සමිති 13කට ලබාදී තිබුණු රු.481,487 ක | 2023 | කාර්ය නිමවූ විගසම අත්තිකාරම් පියවා ගත යුතුය. | දීර්ඝ කාලයක පැවත එන නොපියවූ අත්තිකාරම් ශේෂ ගිණුම් වලින් කපා හැරීමට වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමාට යොමු කිරීමට | මේ දක්වා පියවීම හෝ කපා හැරීම සිදුකර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අත්තිකාරම් පියවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | | | කටයුතු කරන බව. | |
| (ඇ) | සභාවට අයත් වාහන 05 ක් අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම සහ භාවිතයට නොගැනීම හේතුවෙන් වසරකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | 2023 | සභාවට අයත් වාහන අලුත්වැඩියා කටයුතු සිදුකර භාවිතයට ගත යුතුය. | ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් අලුත්වැඩියා සිදු කර නොමැති බව. | ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් අලුත්වැඩියා කර නොමැත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේදී ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතවරුන් 19කට මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා ලෙස රු.105,357 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | වැඩිපුර ගෙවා තිබුණු මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා අය කරගත යුතුය. | මහජන නියෝජිතයින් කීපදෙනෙක් මේ වනවිට මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා ආපසු ගෙවා ඇති අතර, අනෙක් පාර්ශවයන්ට ලිඛිතව දැනුම්දී ඇති බව. | රු.11,733 ක් පමණක් අයකරගෙන ඇත. |

## 3.97 වැලිමඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 520,871,294 | 56,773,965 | 464,097,329 | (4,522,217) | තත්වාගණනය කළ |
| **2022** | 618,621,215 | 44,673,610 | 573,947,605 | 47,097,077 | තත්වාගණනය කළ |
| **2023** | 733,822,424 | 55,622,287 | 678,200,137 | 26,935,892 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණු පෞද්ගලික ගෝසාතකාගාර 03 ක් සඳහා දින 14න් 14 ට අලුත් වන පරිදි තාවකාලික වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. | 2022 2023 | සෝ සෝතකාගාර සඳහා විධිමත් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනිම සඳහා උපදෙස් ලබා දුන් පසු අයදුම්පත් යවා ඇති බව. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගෙන නොමැත. |
| (ආ) | වැලිමඩ නගරයේ පොදු බස්නැවතුම්පල ආසන්නයේ පිහිටි ප්‍රාදේශීය සභාවට අයත් මාළු වෙළඳසැල්වලින් සහ ව්‍යාපාරික ස්ථාන වලින් බැහැර කරන මළ අපද්‍රව්‍ය උමා ඔයට මුදා හැර තිබුණි. | 2023 | පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | අප ජලය බැහැර කිරීමට ප්‍රතිකාරක ටැංකියක් හා උරණ වලක් සැකසීමට සැලසුම් කර ඇති බව. | ප්‍රතිකාරක ටැංකියක් හා උරණ වලක් සැකසීමේ කටයුතු සිදු කිරිම සඳහා මේ වන විට සැලසුම් කර ඇත. |

## 3.98 සොරණාතොට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 708,900,498 | 24,485,231 | 684,415,267 | (2,594,530) | තත්ත්වාගණනය නොකළ |
| **2022** | 729,761,861 | 19,930,240 | 709,831,621 | 4,630,590 | තත්ත්වාගණනය කළ |
| **2023** | 733,619,948 | 19,302,299 | 714,317,650 | 151,276 | තත්ත්වාගණනය නොකළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් දුන්හිඳ දියඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කළ යුතු වුවද, ප්‍රවේශ මාර්ගයේ සිට දියඇල්ල දක්වා වූ මාර්ගයේ පවතින අනාරක්ෂිත ස්ථානවල වැට ඉදිකිරීම, මාර්ගයට නැඹුරුව පවතින දිරාපත් වූ ගස් ඉවත් කිරීමට සහ මාර්ගය දෙපස බහුලව රැඳී සිටින රිළවුන්ගෙන් සංචාරකයින්ට සිදුවන හිරිහැර සම්බන්ධයෙන් වන ගැටළු වැලැක්වීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 2023 | සංචාරකයින්ගේ ආරක්ෂාව සඳහා සුදුසු ආරක්ෂිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. | මේ වන විටත් අදාල ඉදිකිරීම් සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකොට සුදුසු කොන්ත්‍රාත් කරුවෙකු මඟින් ඉදිකිරීම් කරමින් පවතී.සතුන් ගෙන් සිදුවන හානි පිළිබඳ සංචාරකයින් දැනුවත් කිරීමට දැන් වීම් පුවරු ප්‍රදර්ශනය කර ඇති බව. | සුදුසු ආරක්ෂිත වැඩපිළිවෙළක් මේ දක්වාම ක්‍රියාත්මක වී නොතිබුණි. |

## 3.99 හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 176,475,744 | 24,957,505 | 151,518,239 | 2,023,463 | තත්වාගණනය කළ |
| **2022** | 178,746,255 | 24,626,372 | 154,119,883 | (956,802) | තත්වාගණනය කළ |
| **2023** | 180,647,719 | 11,682,092 | 168,965,627 | 3,189,285 | තත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1982 නොවැම්බර් 08 දින ප්‍රාදේශිය සභාවේ කොස්ලන්ද උප කාර්යාලයට අයත් නිවාසයක් බදු ගිවිසුමකට එළඹ ප්‍රාදේශිය සභාවේ සේවකයකුට ලබා දී තිබුණු අතර, 1984 ජනවාරි 01 දින එම නිලධාරියා විශ්‍රාම ගොස් තිබුණි. නමුත් 2023 වර්ෂය අවසන් වන විටත් අදාළ නිවාසය ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණි. | 2022 | සභාවේ දේපළ ආරක්ෂාව තහවුරු කළ යුතුය. | ඉඩම සඳහා සභාව නමින් පැවරුම් ඔප්පුවක් නොමැතිවීම මත නෛතික ක්‍රියා මාර්ග ගැනීමේ දුෂ්කරතා පවති. | අවශ්‍ය කටයුතු කර නොමැත. |
| (ආ) | 2012 අගෝස්තු 24 දිනැති අංක 1773 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 4 2 කොටසේ ප්‍රසිද්ධ කර ඇති පරිදි දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ශනයට ලක් වූ බෙරගල මංසන්දියේ | 2022 | මහජනතාවට පීඩාවන ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ඉදි කිරීම් ස්ථිර නොවන ඉදි කිරීම් නිසා ප්‍රාදේශීය සභාව වීසින් ඉවත් කිරීමට උත්සහ කරන ලදි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, RDA හා හපුතලේ පොලිසිය එක්වී ඉවත් කිරීමට යාමේදි විශාල | අනවසර ඉදිකිරීම් ඉවත් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට උඩ විහාරගල දක්වා වූ දර්ශන පථය අවහිරවන ලෙස ඉදිකර තිබුණු අනවසර ජංගම වෙළඳකුටි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉවත් කර නොතිබුණි. | | | මහජන විරෝධතාවයක් එල්ල විය. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණයකට යොමු කර ඇත. | |
| (ඇ) | 2021 වර්ෂයේදී රු.1,892,539 ක් වැය කර කසළ ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය රැස්කිරීමේ ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණද, කසළ ප්‍රතිචක්‍රීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2023 | කසළ කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු කළ යුතුය | ඉවතලන නොදිරන කසළ යොදා පවිත්‍ර කර විකිණීම සඳහා දැනට ටැංකි 02 ක් ඉදි කර ඇති අතර ඉදිරියේදී මෙම ගැටළුව අවම වනු ඇති බව. | ප්‍රතිචක්‍රීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. |

## 3.100 හාලිඇල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 258,780,166 | 63,305,026 | 195,475,140 | 9,827,800 | තත්ත්වාගණනය කළ |
| **2022** | 256,022,351 | 63,588,377 | 192,433,974 | (6,208,219) | තත්ත්වාගණනය කළ |
| **2023** | 342,593,075 | 40,591,170 | 302,001,905 | 11,909,135 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සහා අරමුදලින් උඩුවර කොල්ලුවත්ත මාර්ගයේ කාණුව සැකසීමේ කර්මාන්තය සඳහා ගෙවීම් කිරීමේදී වැඩ විෂයය අයිතම අංක 02, 03 සහ 04 වෙනුවෙන් රු.174,781 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, ඉදිකර තිබුණු කාණුවේ ආරම්භයේ සිට දකුණු පස බැම්මෙහි මීටර් 02 ක දුරක් පතුළ හැරී පතුලෙන් දකුණුපස බැම්ම සම්පූර්ණයෙන්ම වෙන්ව ගොස් තිබුණි. හැරුණු ස්ථානවල කාණුවේ බැම්මේ උසට මීටර් 0.3 ක වැරගැන්නුම් යෙදූ බවට නිරීක්ෂණය නොවුණි. | 2022 | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | වැඩිපුර ගෙවීම් අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේදී මහජන නියෝජිතවරුන්ට මන්ත්‍රී දීමනා රු.177,833 ක් සහ දුරකතන දීමනාව රු.12,467 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | වැඩිපුර ගෙවීම් වැලැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | අය කර ගැනීමට ඇත්තේ මහජන නියෝජිතයින්ගෙන් රු.126,500 ක් හා දුරකථන දීමනාවෙන් රු.8433.41 ක් පමණි. | සිහි කැඳවීම් ලිපි යවා ඇති අතර දෙදෙනෙකු විසින් රු.11,733 ක මුදලක් ගෙවා ඇත. |

## 3.101 කතරගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 351,990,275 | 41,179,348 | 310,810,927 | 10,617,414 | තත්ත්වාගණනය කළ |
| **2022** | 381,627,449 | 90,667,097 | 290,960,352 | 10,307,877 | තත්ත්වාගණනය කළ |
| **2023** | 700,817,319 | 86,953,539 | 613,863,780 | 3,624,703 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාල සීමාවට අදාලව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා භාවිතා කරන කැබ්රථය සඳහා මාසයකට අනුමත ඉන්ධන සීමාව වූ ලීටර් 400 ඉක්මවා රු.369,058 ක ඉන්ධන ලීටර් 2134 ක් භාවිතා කර තිබුණි. | 2022 | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම් කළ යුතුයි. | මේ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් විමර්ශනයක් සිදු කළ අතර එම විමර්ශන වාර්තාව අනුව කටයුතුකිරිමට බලාපොරොත්තු වන බව. | හිටපු සභාපති හා උප සභාපති වෙත මෙම මුදල් ප්‍රාදේශීය සභාව වෙත ගෙවන මෙන් දන්වා ඇත. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය අනුව සේවකයන් 04 දෙනෙකු සඳහා 2001 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාල සේවක අර්ථ සාධක දායක මුදල් නොගෙවීම හේතුවෙන් | 2023 | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අධිභාර මුදල් අයකරගත යුතුය. | අංක 54627 දරන නඩුවේ තීන්දුව අනුව අධිභාර මුදල් ගෙවා ඇති බව. | කතරගම ප්‍රාදේශීය සභාවට විරුද්ධව හම්බන්තොට සහකාර කම්කරු කොමසාරිස් විසින් තිස්සමහාරාම මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කරන ලද අංක 54627 දරන නඩුවේ තීන්දුව අනුව මෙම රු. 198,360 ක මුදල |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවකයාගෙන් අයකළ යුතු සියයට 08 ක දායක මුදල වූ රු. 198,360 ක මුදල් සහ රු. 247,950 ක අධිභාර මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණි. | | | | සහා අරමුදලින් ගෙවා ඇති අතර නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 2016 මැයි සිට 2022 දෙසැම්බර් දක්වා කාලයට අදාලව සියයට 03 ක දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු. 380,710 ක අධිභාර මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණි. | 2023 | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන අදාල අධිභාර මුදල් අයකරගත යුතුය. | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයේ කළමනාකරුගේ ලිපිය අනුව මෙම මුදල් ගෙවා ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 150 ක් ගිවිසුම් ගතවීමකින් තොරව බදු දී තිබුණි. | 2023 | සභාව සතු දේපල බදුදීමේදී බදුකරුවන් සමඟ ගිවිසුම්ගත විය යුතුය. | කඩහිමියන් සමඟ කඩිනමින් ගිවිසුම්ගතවීම සඳහා ඔවුන් දැනුවත් කර ඇති බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

**3.102 තණමල්විල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,804,784,012 | 28,238,139 | 1,776,545,873 | (5,017,959) | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,823,995,175 | 46,822,328 | 1,777,172,847 | (040,379,29) | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,898,868,775 | 48,906,975 | 1,849,961,800 | 25,879,718 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | තණමල්විල ප්රාදේශීය සභාවට අයත් ඩංඩුම සතිපොල අසල අංක 05 සහ අංක 06 කඩ කාමර දෙක 2019 වර්ෂයේදී බදු දී තිබුණු අතර, ප්‍රසම්පාදන ලංසු මුදලින් සියයට 50 ක මූලික මුදල වූ රු. 1,500,200 ක් ගෙවූ බවට කඩ කාමර බදුදීමට අදාල ලිපි ගොනුවල දක්වා තිබුණද එම මුදල සභා අරමුදලට බැර වී නොතිබුණි. | 2023 | අදාළ ගනුදෙනුව සම්බන්ධයෙන් සොයා බලා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගත යුතුය. | අදාළ මුදල් සභා අරමුදලට බැරවී නොමැති බව පරීක්ෂාවේදී තහවුරු වන අතර මේ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇති බව. | අධිභාර නිවේදනයක් යොමු කර ඇත. |
| (ආ) | තණමල්විල ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 22 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර ඉන් වාහන 07 ක් සඳහා ලියාපදිංචි සහතිකයද ලබාගෙන | 2023 | නියමිත කාලය තුල වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. | මෙම ගැටළුව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මෙම සභාව සතු වාහන සඳහා දිර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති අතර දඩ මුදල් ගෙවීම සමබන්ධයෙන් පළාත් පාලන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොතිබුණි. | | | | සහකාර කොමසාරිස් කාර්යාලය වෙතින් ලැබෙන උපදෙස් පරිදි කටයුතු කළ යුතුව ඇත. |
| (ඇ) | සභාව සතු කැබ් රථයේ එන්ජින් අංකය 4D56DE9507 වු අතර ලියාපදිංචි සහතිකයේ එන්ජින් අංකය 4D56JN0914 වී තිබුණි. | 2023 | සභාව සතු වත්කම් පරිහරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුය. | නව එන්ජිමක් සවිකළ බවට තොරතුරු ගොනුවේ අඩංගු නොවන බැවින් මේ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉල්ලීමක් සිදුකර ඇති බව. | නව එන්ජිමක් සවිකළ බවට තොරතුරු ගොනුවේ අඩංගු නොවන බැවින් මේ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදු කිරීමට නියමිතව ඇත. |

## 3.103 බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 492,026,274 | 62,807,300 | 429,218,974 | 1,412,034 | තත්ත්වාගණනය කළ |
| **2022** | 468,023,317 | 35,724,601 | 432,298,716 | (1,847,792) | තත්ත්වාගණනය කළ |
| **2023** | 501,632,834 | 3,698,034 | 497,934,800 | 8,019,009 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 78 ක මැනුම් කටයුතු හා ඉඩම් 98 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාල කටයුතු සිදුකර නොතිබුණි. | 2022 | සභාව සතු ඉඩම්වල මැනිම් කටයුතු සිදුකර නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුය. | මැනුම් කටයුතු සිදු කරන ලද ඉඩම් පැවරීමේ කටයුතු සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇති අතර ඉතිරි ඉඩම් සඳහා ද අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව. | නිර්දේශ කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබුණි. |
| (ආ) | 2009 ජුනි මාසයේ විශේෂ මහ සභා තීරණයක් මත කසල ප්‍රතිචක්‍රීකරන වැඩසටහනට පුස්සැල්ලාව ග්‍රාම නිලධාරී වසමේ අක්කර 15 ක ඉඩම් කොටසක් 2010 දෙසැම්බර් 14 දින සභාවේ භුක්තියට පවරාගෙන තිබුණි. ඉඩම මැනුම් කටයුතු සඳහා 2010 වර්ෂයේදී රු. 120,000 ක්ද වැයකර | 2022 | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතුයි. | පුස්සැල්ලාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෙකුඹුරවත්ත ඉඩම තුළ කසල ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට යාමේදී මහජන විරෝධතා ඇතිවීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ | කසල ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට යාමේදී මහජන විරෝධතා ඇතිවීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති අතර ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇත. |

| | | |
|---|---|---|
| තිබුණ අතර අදාල වැඩ සටහන ක්‍රියාත්මක කර නොතිබුණි. 2022 නොවැම්බර් මාසය වන විට මෙම ඉඩමෙහි අනවසර පවුල් 25 ක් පදිංචි වී තිබුණි. | | කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇති බව. |

## 3.104 බිබිල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 843,399,015 | 116,158,072 | 727,240,943 | 24,380,733 | තත්ත්වාගණනය කළ |
| **2022** | 855,227,643 | 127,999,712 | 727,227,931 | (8,159,094) | තත්ත්වාගණනය කළ |
| **2023** | 774,218,324 | 26,361,985 | 747,856,339 | (3,763,620) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 84 කට අදාල බදු ගිවිසුම්වල ගිවිසුම අවසන් වන කාලය දක්වා නොතිබුණු අතර ඉන් කඩ කාමර 23 ක් බදු දී වසර 20 ක කාලයක් ඉක්මවා තිබුණි. | 2023 | බදු ගිවිසුම් විධිමත්ව පවත්වා ගෙන යා යුතුය. | පැරණි ගිවිසුම්වලද බදු කාල සීමාව ඇතුලත් කර නොමැති බැවින් නව බදු ගිවිසුම් වල ද බදු කාල සීමාව ඇතුලත් කිරීමට බදුකරුවන් එකඟ නොවීම හේතුවෙන් කාලය සඳහන් කර ගිවිසුම් ගත වීමට නොහැකි වී ඇති බව. | බදුකරුවන් එකඟ නොවීම හේතුවෙන් කාලය සඳහන් කර ගිවිසුම් ගත වීමට නොහැකි වී ඇත. |
| (ආ) | සභාව විසින් ගලි සේවාව මගින් ඉවත් කරනු ලබන මළ අපද්‍රව්‍ය පුවක් පැලය කසල අංගනය පිහිටි භූමියේ විවෘත කාණුවකට බැහැර කරන බවත් එම භූමියට මායිම්ව පිහිටි කුඩා දොල පාරට එකතු වී මාදුරු ඔයට එකතු වන බව නිරීක්ෂණය විය. | 2023 | මල අපද්‍රව්‍ය බැහැර කිරිම විධිමත්ව සිදු කල යුතුය. | මල අපද්‍රව්‍ය බැහැර කිරිමේ පද්ධතියක් සකස් කර ගැනීමට අදාල ව්‍යාපෘති වාර්තාව පලාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කල බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.105 බුත්තල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 453,255,018 | 31,115,879 | 422,139,139 | 1,309,921 | තත්ත්වාගණනය කළ |
| **2022** | 452,872,485 | 21,905,932 | 430,966,553 | (32,247) | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,060,908,846 | 24,828,139 | 1,036,080,707 | 11,561,970 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයකින් 2022 ජූලි 14 දින වටිනාකම රු.64,000 ක ඩීසල් ලීටර් 161.9 ක් අවිධිමත් ලෙස බැහැර කර තිබුණු අතර 2023 පෙබරවාරි 21 දින වන විටත් ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම මුදල අයකරගෙන නොතිබුණි. | 2022 | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම් සිදුකළ යුතුය. | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ඉන්ධන අස්ථානගත වීම සම්බන්ධයෙන් බුත්තල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කල අතර ,ඒ පිළිබඳව විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී. | මූලික විමර්ෂණ කටයුතු මේ වන විටත් අවසන් කර නොමැත. |
| (ආ) | සභාවට අයත් ඉඩම් 52 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | 2022 | සභාවට අයත් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. | අප ආයතනය විසින් භුක්ති විඳින ලද දේපළ පැවරුම් නියෝග මඟින් පවරා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර එය කඩිනමින් කර ගැනීම සඳහා බුත්තල ප්‍රාදේශීය ලේකම් | පැවරුම් නියෝග මඟින් පවරා නොගත් ඉඩම් මැනුම් කටයුතු සඳහා යොමුකර ඇති අතර මැනුම් කර ඇති ඉඩම් පවරා ගැනීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | තුමන් වෙත 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් නැවත දන්වා යවා ඇත. | යොමු කර ඇත. |
| (ඇ) | මාර්ග ග්‍රැවල් කිරීමේ ව්‍යාපෘති 03 කට අදාලව ලුණුගල කොළණියේ ග්‍රැවල් ලබා ගන්නා ස්ථානයේ සිට සංවර්ධනය කරන මාර්ගය දක්වා ග්‍රැවල් ප්‍රවාහනය කිරීම සඳහා පවතින දුර වැඩිපුර දැක්වීම හේතුවෙන් රු. 111,974 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | 2022 | වැඩිපුර ගෙවා ඇති මුදල අය කර ගත යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල සම්බන්ධව පරීක්ෂා කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඈ) | 2010 – 2023 කාල පරිච්ඡේදයට අදාලව සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු රු. 11,296,080 ක යන්ත්‍ර කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ඉදිරියේදී අදාල හිඟ මුදල් අයකර ගන්නා බව. | තවදුරටත් රු.5,506,589 ක ශේෂයක් අයකර ගත යුතුව ඇත. |
| (ඉ) | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල දී පනවන ලද අධිභාර 06 කට අදාලව රු. 559,108 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ | 2023 | කඩිනමින් අධිභාර මුදල් අයකරගත යුතුය. | 2024 වර්ෂයේදී අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | තවදුරටත් රු.421,975 ක මුදලක් අයකර ගත යුතුව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඊ) | සභාපතිවරයා භාවිතා කළ කැබ් රථය 2021 ජනවාරි සිට 2023 ජූලි මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාලව ධාවනය නොකළ කිලෝමීටර් 16,230 ක් සඳහා ඉන්ධන වියදම් ලෙස රු. 709,433 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | 2023 | සභා අරමුදලින් වැඩිපුර දරන ලද ඉන්ධන වියදම වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය. | කැබ් රථයේ ධාවන සටහන් වෙනස්වීමට අදාලව මූලික විමර්ශනයක් සිදුකරන මෙන් පළාත් පාලන කොමසාරිස්තුමා ගෙන් ඉල්ලීම් කර ඇති බව. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මඟින් මූලික විමර්ෂණ කටයුතු සිදුකරමින් තිබුණි. |

## 3.106 මඩුල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 369,655,101 | 59,664,403 | 309,990,698 | 7,768,588 | තත්ත්වාගණනය කළ |
| **2022** | 445,993,004 | 16,587,479 | 429,405,524 | (4,880,963) | තත්ත්වාගණනය කළ |
| **2023** | 458,549,021 | 9,127,546 | 449,421,475 | 6,001,544 | තත්ත්වාගණනය කළ |

| | **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 26 ක මැනුම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 63 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර නිත්‍යානුකූල අයිතිය ලබා ගත යුතුය. | සභාවට අයත් ඉඩම් හා සුසාන භූමි ඉඩම් මැනීමේ කටයුතු සිදු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ඉල්ලීම් කරමින් මඩුල්ල ප්‍රාදේශීය ලේකම්ට ලිපි යොමු කර ඇති බව. | සභාවට අයත් ඉඩම් හා සුසාන භූමි ඉඩම් මැනීමේ කටයුතු සිදු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ඉල්ලීම් කරමින් මඩුල්ල ප්‍රාදේශීය ලේකම්ට ලිපි යොමු කර ඇත. |
| (ආ) | ඉගිනියාගල මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ කොටසක් ආවරණය කරමින් බාහිර පාර්ශවයන් විසින් ඉදිකර තිබුණු අනවසර ඉදිකිරීම 2024 පෙබරවාරි වන විටත් ඉවත්කර නොතිබුණි. | 2023 | සභාව සතු දේපලවල ආරක්ෂාව තහවුරුකර ගත යුතුය. | ඉදිරියේදී මෙම ගැටළුව විසඳීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල පියවර ගන්නා බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**3.107 මැදගම ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,701,992,662 | 46,137,435 | 1,655,855,227 | 8,934,030 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,754,044,364 | 22,474,413 | 1,731,569,951 | 5,594,359 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,762,987,714 | 15,571,221 | 1,747,416,493 | 11,483,075 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ඉකුත් වර්ෂවලට අදාලව දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 6,662,759 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.108 මොණරාගල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,714,990,144 | 78,389,705 | 1,636,600,439 | (13,693,430) | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,692,180,296 | 63,492,389 | 1,628,687,907 | (20,784,531) | තත්ත්වාගණනය කළ |
| **2023** | 211,1,746,577 | 10,831,847 | 1,735,745,364 | 6,817,614 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2016 - 2022 කාල පරිච්ඡේදයට අදාලව දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 9,914,947 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. | කොවිඩ් වසංගත තත්ත්වය පැවති කාල පරිච්ඡේදයට අදාල හිඟ ආදායම් කපා හැරීමට ආණ්ඩුකාර තුමා වෙත අනුමැතිය සඳහා යොමුකර ඇති බව. | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී දී පැවති ටෙන්ඩර් බදු කුලී හිඟයෙන් රු. 66,390 ක් පමණක් අයකරගෙන ඇත. |

## 3.109 වැල්ලවාය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 436,023,241 | 846,64,502 | 371,520,395 | 10,682,682 | තත්ත්වාගණනය කළ |
| **2022** | 446,365,549 | 68,347,958 | 378,017,591 | 3,905,313 | තත්ත්වාගණනය කළ |
| **2023** | 604,019,622 | 23,027,255 | 580,992,367 | (3,370,578) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2018 වර්ෂයට පෙර සිට සහ 2019 සිට 2023 වර්ෂය දක්වා සභාව සතු දේපල 13 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 6,933,148 ක කුලී ආදායම අයකරගෙන නොතිබුණි. | 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.110 සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 387,947,575 | 50,162,043 | 337,785,532 | 2,241,918 | තත්ත්වාගණනය කළ |
| **2022** | 458,638,187 | 30,999,022 | 427,639,165 | 359,636 | තත්ත්වාගණනය කළ |
| **2023** | 481,244,189 | 17,310,304 | 463,933,885 | (536,374) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 57 ක් 2023 දෙසැම්බර් 15 දින වන විට බදු පදනම මත ලබා දී තිබුණු අතර එම කඩ කාමර සඳහා කිසිදු දිනක ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හෝ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | 2023 | සභාවට ලැබිය යුතු බදු සහ ගාස්තු අයකරගත යුතුය. | අදාල අයකර ගැනීම් සිදුකිරීම සඳහා ආදායම් පරීක්ෂක වෙත උපදෙස් ලබා දුන් බව. | බදු අයකරගෙන නොතිබුණි. |
| (ආ) | සභාව සතු වාහන 2 ක එන්ජින් අංකද එක් වාහනයක වැසි අංකයද වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් එන්ජින් හා වැසි අංක සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය විය. | 2023 | සභාව සතු වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. | මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය පියවර මේ වන විට ගනිමින් සිටින බව. | මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි. |

## 3.111 ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 213,490,596 | 35,663,983 | 177,826,613 | 3,401,739 | තත්ත්වාගණනය කළ |
| **2022** | 388,490,613 | 39,188,974 | 349,301,639 | 7,360,137 | තත්ත්වාගණනය කළ |
| **2023** | 526,653,829 | 25,669,985 | 500,983,844 | (2,396,394) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | කර්මාන්ත 07 කට අදාළව මාර්ගයේ උස් වූ ස්ථාන සඳහා පස් කැපීමට (Reducing high side soil) මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා වූ මිල ගණන් භාවිතා කර තිබුණ ද, මේ සඳහා ස්කැවේටර් යන්ත්‍ර සහ JCB යන්ත්‍ර භාවිතා කිරීම නිසා ඝණ මීටර් 310.18 ක් සඳහා රු.363,726 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | 2022 | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී පළාත් මාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලැබෙන සවිස්තරාත්මක වැඩ විස්තරය හා නිශ්චිත මිළ ගණන් අනුව කටයුතු කිරීමට උපදෙස් දී ඇත. | පළාත් පාලන කොමසාරිස් වෙත අංක ඇප්‍රාස/සං/05 හා 2024 අගෝස්තු 09 දිනැතිව ලිපියක් යොමු කර ඇත.එම සාකච්ඡාවේ ගන්නා තීරණ අනුව වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගෙන නොතිබුණි. |
| (ආ) | කර්මාන්ත 05 කට අදාළව මාර්ගයේ පැති කාණු වල පස් කැපීම සඳහා මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා වූ මිල අනුපාත භාවිතා කර තිබුණ ද, ඒ සඳහා ස්කැවේටර් යන්ත්‍ර හා JCB යන්ත්‍ර භාවිතා කොට තිබීම නිසා කාණු වල පස් | 2022 | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී පළාත් මාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලැබෙන සවිස්තරාත්මක වැඩ විස්තරය හා නිශ්චිත මිළ ගණන් අනුව කටයුතු කිරීමට උපදෙස් දී ඇත. | 2024 අගෝස්තු 09 දිනැතිව ලිපියක් යොමු කර ඇත.එම සාකච්ඡාවේ ගන්නා තීරණ අනුව වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර නොතිබුණි. |

කැපීම සිදුකර තිබීම නිසා ඒ සඳහා රු.137,456 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

## 3.112 ඉමදූව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 193,483,931 | 23,256,237 | 170,227,694 | 10,469,801 | තත්ත්වාගණනය කළ |
| **2022** | 219,376,099 | 64,809,652 | 154,566,447 | (19,946,801) | තත්ත්වාගණනය කළ |
| **2023** | 226,015,395 | 29,553,742 | 196,461,653 | (17,034,709) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සංවර්ධන බලපත්‍රයකට අදාලව අනුමැතියකින් තොරව ඉදිකර තිබුණු වර්ග මීටර් 334.7 ක් සඳහා රු.502,050 ක් ද වාහන නැවතුම් ස්ථාන 10 ක් සඳහා රු.2,500,000 ක් ද අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමුවන බව. | අය වී නොතිබුණි. |
| (ආ) | වසර 17 කට පෙර රු.9,605,882 ක වියදමක් දරා ඉමදූව නගර මධ්‍යයේ ඉදිකර තිබුණු වර්ග මීටර් 260 ක වෙළඳ සංකීර්ණය ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා ගැනීමට හැකි පරිදි අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | 2023 | වෙළෙඳ සංකීර්ණය ඵලදායි ආර්ථික කටයුත්තකට යෙදවිය යුතුය. | ඵලදායී ආර්ථික කටයුතු සඳහා යෙදවීමට සැලසුම් කර ඇති බව. | ඵලදායී කටයුත්තකට යොදාගෙන නොමැත. |

## 3.113 කරන්දෙනිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 341,247,662 | 40,110,000 | 301,137,662 | (29,060,936) | තත්ත්වාගණනය කළ |
| **2022** | 353,101,880 | 35,432,122 | 317,669,758 | 124,632,737 | තත්ත්වාගණනය කළ |
| **2023** | 406,278,741 | 20,920,353 | 385,358,388 | (17,821,434) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවියයුතු මුළු ආදායම රු.13,691,865 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.10,124,944 ක් විය. 2023 වර්ෂය සඳහා කිසිදු වරිපනම් බදු මුදලක් නොගෙවූ ඒකක 1127 ක් පැවති අතර, එම ඒකක වලින් අය වියයුතු හිඟ වරිපනම් ශේෂය රු.3,817,535 ක් විය. | 2023 | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතුය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය ප්‍රමාණවත් නොවේ. |

## 3.114 තවලම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 95,169,302 | 16,231,573 | 78,937,729 | (4,587,763) | තත්ත්වාගණනය කළ |
| **2022** | 135,075,844 | 5,700,716 | 129,375,128 | 2,085,523 | තත්ත්වාගණනය කළ |
| **2023** | 142,309,936 | 9,416,876 | 132,893,060 | 649,869 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ආයතන 63 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා එමඟින් පරිසරයට වන හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණු බව හා බලපත්‍ර ගාස්තු වශයෙන් රු.283,500 ක් හා පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.189,000 ක් සභාව අය කරගෙන නොතිබුණු බව ද දක්නට ලැබුණි. | 2023 | පාරිසරික බලපෑම පරීක්ෂා කර බලා බලපත්‍ර නිකුත් කළ යුතුය. | ඉදිරියේ දී බලපත්‍ර ලබා දී ගාස්තු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | 2024 ඔක්තෝබර් 15 දක්වාම බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොමැත. |
| (ආ) | වටිනාකම රු.464,634 ක් වටිනා ඉඩම් 41 කට අදාළ හිමිකම් ඔප්පු සභාව සතුව නොතිබුණු අතර, එම ඉඩම් පවරාගෙන අයිතිය නිරවුල් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2023 | සභාව සතු ඉඩම් පවරා ගත යුතුය. | දැනට පත් කරන ලද කමිටුව මඟින් එම ඉඩම් සභාව සතු ද යන්න හඳුනාගෙන එම ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | 2024 ඔක්තෝබර් 15 දක්වාම අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි. |

### 3.115 නාගොඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 193,701,359 | 40,926,733 | 152,774,626 | (5,096,691) | තත්ත්වාගණනය කළ |
| **2022** | 172,381,050 | 26,276,755 | 146,104,295 | (3,842,959) | තත්ත්වාගණනය කළ |
| **2023** | 12,344,848,681 | 62,408,086 | 12,282,440,595 | (2,271,216) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු 08 ක් සඳහා පෙර සැරි ගාස්තු රු.240,000 ක් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2023 | අදාළ ගාස්තු අය කළ යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයකරගෙන නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයට අදාළ පිවිසුම් මාර්ගය ඉදි කිරීමේදී පස් කැපීමට අදාළ මිල අනුපාත යටතේ ප්‍රමාණය පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව රු.1,270,225 ක් අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි. | 2023 | ප්‍රමාණය පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතුය | යන්ත්‍ර පැය පදනම මත ගෙවීම් කර ඇත.අයකිරීමට කටයුතු කරමින් පවතී. | අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෙක්ටයාර් 17,971 ක වර්ග | 2023 | වරිපනම් බදු පැනවිය යුතු ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු | ග්‍රාම සේවා වසම් 06 ක් හඳුනාගෙන ගැසට් කර ඇත. | අයකර ගැනීමේ කටයුතු මෙතෙක් ආරම්භ කර නොමැත. |

| | |
|---|---|
| ප්‍රමාණයකින් යුතු ග්‍රාම සේවා වසම් 53 ක් පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව එහි දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර සභාවේ ආදායම් ඉහල නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළ යුතුය. |

## 3.116 නියාගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 160,075,657 | 48,498,168 | 111,577,489 | (6,177,357) | තත්ත්වාගණනය කළ |
| **2022** | 232,852,812 | 110,168,910 | 122,683,902 | (4,239,830) | තත්ත්වාගණනය කළ |
| **2023** | 167,234,836 | 31,192,295 | 136,042,541 | (22,430,411) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයෙන් පසු රු.19,947,965 ක වියදමින් ඉදි කරන ලද හා සංවර්ධනය කරන ලද කිලෝමීටර් 4764 ක් වූ මාර්ග 36 ක් මාර්ග ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම දිනවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග,පාලම්,බෝක්කු ,විදි ලාම්පු ආදී භූගෝලීය තොරතුරු රැස් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතී.එම වැඩසටහන අවසන් කල පසු එහි වාර්තාව පදනම් කරගෙන මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලින කර පවත්වාගෙන යනු ලබන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තිය ප්‍රකාරව තල්ගස්වල ඇතුළු දියුණු ගම් ප්‍රදේශවලින් වරිපනම් බදු අය කිරීමට ප්‍රාදේශීය සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ කටයුතු කඩිනමින් සිදු කරන බව. | කටයුතු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් බුක්තිවිඳින හා පරිහරණය කරන ඉඩම් 03 ක පර්චස් 271 ක භූමි ප්‍රමාණයක් මෙන්ම වටිනාකම රු.52,400,000 ක් හා වර්ග මීටර් 413 ක් වූ ගොඩනැගිලි 03 ක් ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | 2023 | සභාව සතු දේපල ඵලදායී කටයුතු සඳහා භාවිතා කළ යුතුය. | ඵලදායී කටයුතු සඳහා ඉදිරියේ දී කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

**3.117 නෙළුව ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 292,812,342 | 14,008,258 | 278,804,084 | 32,388,347 | තත්ත්වාගණනය කළ |
| **2022** | 321,710,584 | 23,086,541 | 298,624,043 | 3,621,295 | තත්ත්වාගණනය කළ |
| **2023** | 302,759,272 | 51,452,211 | 251,307,061 | 2,578,385 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර සඳහා වූ සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත්, කඩ කාමර 17 කට අදාළ බදු ගිවිසුම් 2017 හා 2019 වර්ෂ වලින් පසු යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාල කටයුතු ඉදිරියේදි සිදු කරමි. | චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වසර 01 ත් 03 ත් අතර කාලයක සිට මාළු අලෙවි සැල කුලියට ලබා දීම මත රු.175,165 ක මුදලක් ද, දූවිලි ඇල්ල වාර්ෂිකව ටෙන්ඩර් මත අයවිය යුතු කුලී මුදල සඳහා පුද්ගලයින් | 2023 | හිඟ ආදායම් අයකර ගත යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

දෙදෙනෙකුගෙන්
රු.615,809 ක් ද
අයවීමට තිබුණි.

## 3.118 බද්දේගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 467,151,950 | 36,607,236 | 430,544,714 | 297,751 | තත්ත්වාගණනය කළ |
| **2022** | 529,877,422 | 25,403,244 | 504,474,178 | 27,060,421 | තත්ත්වාගණනය කළ |
| **2023** | 569,449,348 | 31,786,216 | 537,663,132 | 3,104,539 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පානීය ජල පහසුකම් සැපයීම සඳහා රු.4,250,000 ක ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන අනුමත කර තිබුණ ද, එම ව්‍යාපෘති ඉටුකර නොතිබුණි. | 2022 | ප්‍රතිපාදන අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ | නිරීක්ෂණ පිළිගන්නා බව | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | කාසිදෙණිය වෙන්දේසි ඉඩමෙහි ක්‍රීඩාපිටිය සකස් කිරීම කර්මාන්තයේ වැඩ විෂය අංක 02 සඳහා ක්‍රීඩාංගනයෙන් ලබාගෙන තිබුණු පස් ඝණ මීටර් 830 ක් එස්කැවේටර් යන්ත්‍රය භාවිතා කර කිරීම සිදුකර තිබුණු බැවින් මේ සඳහා නියමිත මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා රු.200,030 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | අදාළ නිල රේට් භාවිතා කළ යුතුය. | අදාළ නිල රේට් විග්‍රහ සටහන් නොලැබීම හේතුවෙන් මෙම භාවිතා කරන ලද රේටය භාවිතා කිරීම සිදු කරන ලද බව | අදාළ නිල රේට් භාවිතා කර නොතිබුණි. |

## 3.119 බලපිටිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 308,029,743 | 39,203,028 | 268,826,715 | 8,477,103 | තත්ත්වාගණනය කළ |
| **2022** | 325,790,739 | 49,287,141 | 276,503,598 | (14,288,250) | තත්ත්වාගණනය කළ |
| **2023** | 504,223,096 | 37,807,167 | 466,415,929 | (6,057,395) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | බලපිටිය බහු කාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමරයක් සී/ස.බලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය මගින් 2021 වර්ෂයේ සිට බදුගෙන බදුකුලි නොගෙවීම නිසා 2023 වර්ෂය අවසානයට හිග කඩ කුලි ශේෂය රු.1,467,000 ක් හා හිග අධි ගාස්තු මුදල රු.195,300 ක් වශයෙන් එකතුව රු.1,662,300 ක් හිගව පැවතුණි. | 2023 | කාලීනව බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ලේඛණ ඉදිරිපත් කර අවසන් තීරණයක් ගන්නා තෙක් සී/ස.බලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය සහන කාලයක් ඉල්ලා ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | හිග කඩ කුලි නොගෙවීම සම්බන්ධව දිගින් දිගටම දැනුවත් කර තිබුණ ද අයකරගෙන නොතිබුණි. |
| (ආ) | සභාව සතු රු.28,788,300 ක් වටිනා ඉඩම් 14 ක් හා වටිනාකම හදුනා ගත නොහැකි ඉඩම් 09 ක් භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | 2023 | ඉඩම් ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතුය. | ඉඩම් ඵලදායි අයුරින් උපයෝජනය කිරීමට ක්‍රියා කරන බව. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.120 බෙන්තොට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 352,427,203 | 68,272,512 | 284,154,691 | 36,030,421 | තත්ත්වාගණනය කළ |
| **2022** | 355,300,520 | 88,413,004 | 266,887,516 | (44,462,884) | තත්ත්වාගණනය කළ |
| **2023** | 395,360,617 | 45,394,791 | 349,965,826 | 7,327,536 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු.28,308,586 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.18,604,712 ක් විය. ප්‍රධාන කාර්යාලයට අයත් සහා බල ප්‍රදේශය තුළ පැවති වරිපනම් ඒකක 6501 කින් රු.2,182,037 ක වටිනාකමැති ඒකක 924 ක් වසර 10 කට වඩා වැඩි කාලයක සිට බදු ගෙවීම පැහැර හැර තිබුණි. ඉඳුරුව උප කාර්යාලයට අයත් බදු ඒකක 446 කින් ඒකක 26 ක රු.10,000 ට වඩා වැඩි අයවීමට තිබූ හිඟ ශේෂයන්ගේ එකතුව රු.5,701,292 ක් විය. | 2023 | හිඟ වරිපනම් හා බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ වරිපනම් අයකර ගැනීමට අදාළව ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ මුදල අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.121 රජගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 484,717,108 | 38,400,034 | 446,317,074 | 447,989 | තත්ත්වාගණනය කළ |
| **2022** | 525,857,394 | 28,355,198 | 497,502,196 | 483,820 | තත්ත්වාගණනය කළ |
| **2023** | 554,187,158 | 18,807,343 | 535,379,815 | 533,927 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් කඩ කාමර සඳහා නව තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,874,300 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | 2022 | නව තක්සේරුව ක්‍රියාත්මක කළ යුතු වේ. | නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්තුමිය හා පළාත් පාලන කොමසාරිස්තුමිය දැනුවත් කොට ඇති අතර වැඩි දුරටත් උපදෙස් ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇත. | නව තක්සේරුව ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | පිරිවැය රු.10,921,373 ක් වූ වාහන 03 ක් හා පිරිවැය සඳහන් නොවූ ගලිබවුසරය, ජල බවුසර් ට්‍රේලරය ඇතුළු වාහන 06 ක් අළුත්වැඩියාවකින් තොරව වසර 01 ත් 10 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | 2023 | සභාව සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුය. | ඉදිරි මුදල් කමිටුවේදී තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | 2024 ඔක්තෝබර් 15 තෙක් ක්‍රියාත්මක කර නොමැත. |

## 3.122 හබරාදූව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 497,763,943 | 34,603,120 | 463,160,823 | (33,088,943) | තත්ත්වාගණනය කළ |
| **2022** | 456,241,925 | 26,357,375 | 429,884,550 | 59,423,243 | තත්ත්වාගණනය කළ |
| **2023** | 474,731,357 | 29,461,146 | 445,270,211 | (69,243,012) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වටිනාකම රු.30,000,000 ක් වූ අහංගම උප කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මහල ශ්‍රවණාගාරය භාවිතා නොකර නිෂ්ක්‍රීයව පවතින අතර, සිවිලිම සම්පූර්ණයෙන්ම ගැල වී ගොස්, බිත්ති පුපුරා තිබුණි. | 2022 | කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාවට අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | පළාත් පාලන ප්‍රධාන ඉංජිනේරු වෙතින් පරීක්ෂණයක් පවත්වා උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර එම උපදෙස් ලැබුණු වහාම කඩිනමින් ගොඩනැගිල්ල පිළිබඳ තීරණයක් ගැනීමට නියමිතය. |
| (ආ) | සභාවට අයත් කොග්ගල නිදහස් වෙළඳ උද්‍යානය හා ජෝවි උද්‍යානය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවීම නිසා ඊට අදාලව මුද්‍රණය කරන ලද රු.3,966,990 ක් වටිනා ටිකට්පත් 7850 ක් නිෂ්කාර්යව පැවතුණි. | 2023 | අළුත්වැඩියා කටයුතු කඩිනම් කර ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. | අළුත්වැඩියා කටයුතු අවසන් වූ පසු ටිකට්පත් භාවිතා කර ආදායම් ඉපයීමට කටයුතු කරන බව. | ජෝවි උද්‍යානය අලුත්වැඩියා කිරීමේ කටයුතු දැනට සිදුකරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ වහාම ටිකට්පත් භාවිතා කර ආදායම් ඉපයීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුමෙහි 03 වන වගන්තිය ප්‍රකාරව කඩ කාමර 85 කින් අය නොවී පවතින හිඟ ආරක්ෂිත ඇප මුදල රු.1,534,200 ක් වූ අතර, එම මුදල අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | ඇප මුදල් අය කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේ දී කටයුතු අයකරගෙන නොතිබුණි. කළ යුතුය. |

## 3.123 අකුරැස්ස ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 382,106,442 | 59,873,106 | 322,233,336 | 17,133,372 | තත්ත්වාගණනය කළ |
| **2022** | 421,820,434 | 48,446,200 | 373,374,234 | (925,273) | තත්ත්වාගණනය කළ |
| **2023** | 545,757,656 | 25,727,347 | 520,030,309 | 9,355,475 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව කඩ කාමර 18 කින් රු.929,554 ක එක්වන් මුදලක් අය කර ගැනීමට තිබුණු අතර 05 වන ඡේදය ප්‍රකාරව සභාවට අයත් වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 133 ක බදු ගිවිසුම් වසර 02 ත් වසර 32 ත් අතර කාල පරාසයක සිට යාවත්කාලීන කර නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව ලෝක වෙළෙඳපොල කඩ කාමර සංකීර්ණයේ කඩ කාමර 99 ක බදු මුදල් | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉතිරි එක්වන් මුදල් සමථ මණ්ඩලය හරහා ගෙවීමට කැමැත්ත පල කර ඇති බව හා විධිමත්ව කඩ කාමර ඉදිකර බදු දීමට සභාවේ අවධානය යොමුව ඇති බව. එසේම කඩකාමර තක්සේරුව ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව හා අතුරු බදු දීම් පරීක්ෂාවට කමිටුවක් පත් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තක්සේරුව යාවත්කාලීන කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව කඩ කාමර 14 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදු දී තිබුණි. | | | | |
| (ආ) | සභාව සතු ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය සඳහා රු.1,992,735 ක් වැය කර තිබූ අතර කාල පරිච්ඡේදයට නියමිත රේටයන් භාවිතා නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු රු.221,719 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද ගිවිසුම්ගත සියළු වැඩ කොටස් නිමකර නොතිබියදී සියළු වැඩ කොටස් නිම කළ බවට සලකා ගෙවීම් සිදුකර තිබුණි. | 2023 | නියමිත රේටයන්ට හා ඉටු කළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. | ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේ පැවැති මිල ගණන්වලට අනුව ඇස්තමේන්තු සකස් කළ බවත් සමිතියට වැඩිපුර ගෙවා ඇති මුදල රඳවුම් මුදල් වලින් අයකර ගන්නා බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දරුවන් අතර බෙදා දීම සඳහා රු.4,449,900 ක් වටිනා පිටු 120 CR පොත් 21190 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය ,1988 | 2022 | පනත, රීති හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හා විධායක නිලධාරි වන සභාපතිවරයාගේ ලිඛිත උපදෙස් මත කටයුතු කර ඇති බවත්, ප්‍රාදේශීය සභා පනතේ 132 11 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොමැති බව පිළිගනු ලබන බව. | ප්‍රාදේශීය සභාව මට්ටමින් ක්‍රියා මාර්ග ගත නොහැකි බව. |

ප්‍රාදේශීය සභා මුල්‍ය හා පරිපාලන රීති 14, 103, 178(7)(2), 207, 208, 211, 213 හා මුදල් රෙගුලාසි 237, යන විධිවිධානයන්ගෙන් බැහැරව කටයුතු කර තිබූ අතර මේ සම්බන්ධයෙන් සාධ්‍යතා වාර්තාවක් ද සකස් කර නොතිබුණි.

**3.124 අතුරලිය ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 173,758,550 | 20,046,235 | 153,712,315 | 315,020 | තත්ත්වාගණනය කළ |
| **2022** | 173,540,187 | 15,377,627 | 158,162,560 | 196,720 | තත්ත්වාගණනය කළ |
| **2023** | 185,177,971 | 11,772,715 | 173,405,256 | 16,271,215 | තත්ත්වාගණනය කළ |

| **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|
| දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක ද.ප.පා/ප.පා.කො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ II ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු තිබ්බොටුවාව කඩ සංකීර්ණයේ කඩකාමර 07 ක් වෙනත් පාර්ශවයන් වෙත සභාව අයකරන මාසික කඩ කුලියට වඩා ඉහල කුලී මුදලකට බදුකරුවන් විසින් අතුරු බදු දී තිබුණි. එසේම ඉහත චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාව සතු තිබ්බොටුවාව පොදු වෙළඳ සංකීර්ණයට අයත් මාළු ලැලි 05 කට අදාලව අයකල යුතු එක්වන් මුදල වූ | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අතුරු බදු දුන් කඩකාමර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර වෙනත් පාර්ශවයන් සඳහා ලබාදී ඇති කඩකාමර සඳහා අදාල ගිවිසුම් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරන බව හා මාළු ලැලී සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

රු.2,447,500 ක් අයකර ගෙන නොතිබුණි.

## 3.125 දෙව්නුවර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 371,316,224 | 27,665,131 | 343,651,093 | 19,207, 364 | තත්ත්වාගණනය කළ |
| **2022** | 382,289,884 | 24,607,489 | 357,682,395 | 20,240,880 | තත්ත්වාගණනය කළ |
| **2023** | 468,026,959 | 27,099,959 | 440,927,000 | 31,491,763 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/ 01 දරන චක්‍රලේඛයේ 11 ඡේදය ප්‍රකාරව බදුකරු වෙනත් පාර්ශවකරුවෙකු වෙත බදු අයිතිය පැවරීම සභාවේ අනුමැතියකින් තොරව සිදුනොකළ යුතු වුවත්, සභාව සතු වෙළෙඳ සංකීර්ණ 03 ක කඩකාමර 14 ක් වෙනත් පාර්ශවයන් විසින් භාවිතයට ගෙන තිබුණි. | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය | අතුරු බදු දී තිබූ කඩ කාමරවලින් කෝපිවත්ත අංක 03 කඩ කාමරය සඳහා සන්තකය පවරා ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි එතෙක් හිඟ මුදල බදු කරුගෙන් ලබා ගෙන එම බදු කරුටම නැවත කඩ කාමරය ලබා දෙන ලද බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | 2014 වර්ෂයේ රු.1,271,174 ක වියදමක් දරා අඩක් නිම කරන ලද ගන්දර සෞඛ්‍ය මධ්‍යස්ථානය 2024 අප්‍රේල් 25 දින වන විටත් වැඩ | 2023 | මුදල් ඵලදායිව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | ගොඩනැගිල්ල ඉදිකර අවසන් කර ගන්දර පුස්තකාලය එහි ස්ථාපනය කිරීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිමකර එලදායි කාර්යයක් සඳහා යොදා ගැනීමට සභාවේ වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඇ) | දෛනිකව එකතුවන කසළ ටොන් 3 ½ කට ආසන්න ප්‍රමාණය කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට හා නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සභාවට නොතිබුණු බැවින් වැල්ලමඩම මෝලවත්ත නමැති ඉඩමට බැහැර කර පස් දමා වසා දමා තිබුණ අතර මේ නිසා ප්‍රදේශයේ වසංගත රෝග පැතිර යාමේ අවධානමක්ද පැවතුණි. | 2023 | විධිමත් කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දිය යුතුය. | 2024 මාර්තු මාසයේ සිට, දිරන කසළ හා නොදිරන කසළ වෙන් කර ලබා ගැනීමට කටයුතු කර ඇති බවත්, දිරන කසළ වැල්ලමඩම ඉඩමට බැහැර කිරීමටත්, නොදිරන කසළ මාසිකව, ගාල්ල මොන්රෝවියාවත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කිරීමටත් තීරණය කර ඇති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

**3.126 දික්වැල්ල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 630,060,690 | 128,520,067 | 501,540,623 | 75,375, 089 | තත්ත්වාගණනය කළ |
| **2022** | 641,692,643 | 148,094,153 | 493,598,490 | 45,788,643 | තත්ත්වාගණනය කළ |
| **2023** | 682,160,048 | 104,141,865 | 578,018,183 | 66,721,653 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධාන වලින් බැහැරව අළුතින් ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැගිලි 08 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබා ගෙන නොතිබුණු අතර ගැසට් නිවේදනයේ 2 වන උපලේඛනය ප්‍රකාරව සැලසුම් අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබූ එහෙත් ඉදිකිරීම් කර තිබූ ගොඩනැගිලි අයදුම්පත් 03 ක් වෙනුවෙන් රු.1,187,570 ක ගාස්තු අයකර එම | 2023 | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව හා ගොඩනැගිලි සැලසුම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර අදාළ අනුමත ආවරණ ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

ඉදිකිරීම් විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.127 කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 454,303,743 | 131,574,607 | 322,729,136 | 21,406, 094 | තත්ත්වාගණනය කළ |
| **2022** | 522,752,664 | 96,484,706 | 426,267,958 | 1,662,212 | තත්ත්වාගණනය කළ |
| **2023** | 496,467,689 | 21,836,863 | 474,630,826 | 1,469,241 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ II වන කොටසේ 4(1) හා 28(1) වගන්ති වලින් බැහැරව සංවර්ධන බලපත්‍රයක් නොමැතිව පිළිවෙළින් 2021 වර්ෂයේදී මාපලාන ප්‍රදේශයේ කනත්තවත්ත හෙවත් කැටකාලගහවත්ත පුටුගහකොරටුව නැමැති අක්කර 01 පර්චස් 15.20 ක ඉඩම කැබලි කර විකුණා තිබුණ අතර සංවර්ධන බලපත්‍රයක් නොමැතිව සහා බලප්‍රදේශයේ නාගරික සීමාව තුල අළුතින් ඉදිකර තිබූ | 2023 | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අඩුපාඩු සම්පූර්ණ කර අයදුම්පත්‍රය නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා යවා ඇති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හෝ ඉදිකරමින් පැවති ගොඩනැගිලි 04 ක් ද විය. | | | | |
| (ආ) | රු.324,835 ක බිල්පත් වටිනාකමකට වැඩ අවසන් කර තිබූ, මාර්ග 2 ක් සංවර්ධනය කිරීමේදී මාර්ගයේ පස් සන මීටර් 208.45 ක් කපා ඉවත් කිරීම සඳහා ගෙවීම් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යන්ත්‍ර භාවිතයෙන් පස් කැපීම සඳහා E1-027 යටතේ 2022 වර්ෂයේ හඳුන්වා දී තිබූ රේටයන් භාවිතා නොකර E1-003 යටතේ මිනිස් ශ්‍රමය යොදවා එම කාර්යය ඉටු කිරීමට හඳුන්වා දී තිබූ රේටයන් භාවිතා කිරීම නිසා රු. 259,040 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. | තාක්ෂණ නිලධාරීන් විසින් විමසුමට පිළිතුරු සපයා නොමැති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 3.128 කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 185,011,537 | 44,242,025 | 140,769,512 | (515,070) | තත්ත්වාගණනය කළ |
| **2022** | 182,464,647 | 36,893,886 | 145,570,761 | (4,683,492) | තත්ත්වාගණනය කළ |
| **2023** | 168,879,611 | 5,216,607 | 163,663,004 | (6,567,491) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2020 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන හා 2020 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් පැති කාණු, පැති බැම් හා බෝක්කු ඉදිකිරීමේ කර්මාන්ත 09 ක කොන්ක්‍රීට් බැම් ඉදිකිරීමේදී පදනම සකස් කිරීම සඳහා කාණු කැපීමේ වැඩ විෂයට අදාළව ඇස්තමේන්තු සකස් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 පළමු භාගය සඳහා DR-005A යටතේ හඳුන්වාදුන් රු.664.22 රේටය වෙනුවට E1-003 යටතේ හඳුන්වාදී තිබූ | 2023 | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. | ඉදිරියට ඇස්තමේන්තු සැකසීමේදී හා බිල්පත් ගෙවීමේදී මිළ විශ්ලේෂණයන් අදාළ ආයතන මගින් ලබාගෙන ඒ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.1,108.30 රේටය භාවිතා කිරීම නිසා පස් සන මීටරයකට රු.444.08 ක් බැගින් පස් සන මීටර් 324 ක් සඳහා රු.143,882 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | | | | |
| (ආ) | 2019 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව අවිධිමත් ලෙස ක්‍රියාත්මක කර තිබූ උදාගම්මාන නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 1982 අංක 04 හා 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත මගින් සභාව වෙත පැවරී ඇති බලතල හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම අනවසර ඉදි කිරීම නීත්‍යානුකූල කර වීම සඳහා කටයුතු කරමින් සිටින බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

**3.129 කොටපොල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 288,253,325 | 90,111,465 | 198,141,860 | (4,599,517) | තත්ත්වාගණනය කළ |
| **2022** | 291,944,956 | 75,951,290 | 215,993,666 | (5,833,966) | තත්ත්වාගණනය කළ |
| **2023** | 242,733,353 | 22,910,506 | 219,822,847 | (1,356,373) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් කරන කසළ ටොන් 06 පමණ කසළ වලින් නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම සඳහා ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුළදී ද ක්‍රියාත්මක කර නොතිබුණු අතර නොදිරන කසළ අනින්කන්ද ප්‍රදේශයේ පිහිටි සභාව සතු ඉඩමක වල දැමීම සිදුකර තිබුණි. | 2023 | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. | ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාව පරිදි පොලිතින් පිරිසිදු කර ලබාදීමට පහසුකම් නොපවතින බැවින් ඒවා එක් රැස් කර තබා ගන්නා බවත්, අනෙකුත් නොදිරන කසළ වල දැමීම සිදු කරනු ලබන බව හා ඉල්ලුම් කර ඇති ඉන්සියුලේටර් යන්ත්‍රය ලැබුණු පසු නොදිරන කසළ නිසි පරිදි දහනය කර පරිසරයට හිතකර අයුරින් විනාශ කිරීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | 2019 අප්‍රේල් 10 දින රු.900,900 ක් වැය කර මිලදී ගෙන තිබූ ෆීනික්ස් නෙළුම් වර්ගයේ ප්ලාස්ටික් පුටු 1300 න් ඌනතාවයක් පැවති | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සිදු වූ පාඩුව අය කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව විමර්ශන නිළධාරිගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඒ | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පුටු 170 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් හඳුනාගෙන අදාළ වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | අනුව කටයුතු කරමින් පවතින බවත්, ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට කටයුතු කරන බව. | |
| (ඇ) | 2009 වර්ෂයේදී රු.මිලියන 7.2 ක් වැයකර එක්තරා පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ JCB යන්ත්‍රය දෝෂ සහිත බව දක්වමින් 2012 වර්ෂයේ බස්නාහිර පළාත්බද මහාධිකරණයේ (වාණිජ) නඩුවක් පවරා ඒ වෙනුවෙන් සභා අරමුදලින් නීතිඥ උපදේශන ගාස්තු වශයෙන් රු.765,250 ක් වැයකර තිබූ අතර සභාව නඩුවෙන් පරාජය වීම හේතුවෙන් 2022 වර්ෂයේදී නීති උපදේශන ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා පෙත්සමක් ගොනු කරන ලෙස දැනුම් දී තිබුණද ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවූ අතර ඊට අදාළ විමර්ශන කටයුතු ද | 2023 | යෝජිත ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා පෙත්සම් ගොනු කරන ලෙස දැනුම් දී තිබුණ ද සභාව විසින් ඒ සඳහා නීති උපදේශන ගාස්තු නොගෙවන ලද බවත්, 2024 අප්‍රේල් 27 දින වන තෙක් මෙම රථය සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ කමිටු සාමාජිකයින් කිසිවකු පරීක්ෂණය සඳහා පැමිණ නොමැති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මේ දක්වා සිදුකර නොතිබුණි. | | | | |
| (ඇ) | මෙදේරිපිටිය පැරණි පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබූ කොන්ත්‍රාත්තුවට අදාළව තාවකාලික පාලමක් ඉදිකිරීම අදාළ කොන්ත්‍රාත්කරුගේ කාර්යභාරයක් වන නමුත්, කොටපොල ප්‍රාදේශීය සභාව විසින් අදාළ තාවකාලික පාලම ඉදිකිරීමේදී දොඹකර ගාස්තු හා සිමෙන්ති සැපයීම සඳහා රු.420,604 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. | 2023 | ගිවිසුම්ගත කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ගෙවීම් කළ යුතුය. | විගණන නිරීක්ෂණය සඳහා පිළිතුරු සැපයීම සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් පිළිතුරු සැපයීම සඳහා අමතර සති 02ක කාලයක් ඉල්ලා ඇති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 3.130 මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 440,666,037 | 48,086,649 | 392,579,388 | 9,740,481 | තත්ත්වාගණනය කළ |
| **2022** | 438,751,475 | 35,324,748 | 403,426,727 | 8,459,120 | තත්ත්වාගණනය කළ |
| **2023** | 409,070,389 | 35,978,558 | 373,091,831 | 15,269,110 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක ද.ප.පා/ප.පා.කො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු කඩ සංකීර්ණයේ කඩ කාමර 03 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදුදී තිබුණි. | 2023 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගිවිසුම් උල්ලංඝනය කරන කඩ බදු හිමියන් සඳහා නීතිමය කටයුතු සිදු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | අලෙවි කළ නොහැකි නොදිරන කසළ බැහැර කිරීමට සභාවට විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු බැවින් ඒවා කොම්පෝස්ට් භූමියෙහිම පස් දමා වසා දමන බව විගණනයට නිරීක්ෂණය විය. | 2023 | විධිමත් කසල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. | නොදිරන කසල ගාල්ල මොන්රෝවියාවත්ත කසල කළමණාකරණ ඒකකය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

**3.131 මාතර ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 449,432,528 | 131,481,387 | 317,951,1411 | 26,218,678 | තත්ත්වාගණනය කළ |
| **2022** | 382,387,042 | 40,738,717 | 341,648,325 | 7,180,069 | තත්ත්වාගණනය කළ |
| **2023** | 482,127,531 | 21,575,433 | 460,552,098 | 10,957,838 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| මාතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ දෛනිකව කසළ ටොන් 02 ක් පමණ එක්රැස් කරන අතර නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම සභාව විසින් දිරන කසළ භාවිතාකර නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය පිළිබඳ වාර්තා කිරීම සඳහා ලේඛනයක් නොතිබීම නිසා දෛනික කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා ඉතිරි තොගය පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි විය. | 2023 | විධිමත් කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම හා විධිමත් ලේඛන නඩත්තුවක් කළ යුතුය. | නොදිරන කසළ එකතුකිරීමේ වැඩසටහන නැවත ආරම්භ කර ඇති බව හා පොහොර පැකට් කරනු ලබන ආකාරය අනුව නිෂ්පාදනය කරනු ලබන පොහොර ප්‍රමාණය මැනීම් කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 3.132 මුලටියන ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 277,807,517 | 77,274,916 | 200,532,601 | (9,446,679) | තත්ත්වාගණනය කළ |
| **2022** | 279,295,519 | 37,251,497 | 242,044,022 | 155,125 | තත්ත්වාගණනය කළ |
| **2023** | 279,863,325 | 27,824,508 | 252,038,817 | 2,258,639 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 04 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදු දී තිබුණි. | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වෙනත් පාර්ශවයන් වෙත බදු දී නොමැති බව බදුකරුවන් ප්‍රකාශ කරන බවත්, වාචික ප්‍රකාශ මත පමණක් පදනම්ව බදු දී ඇති බව නිරීක්ෂණය කර ඇති බවත්, සභාව වෙත නිසියාකාරව බදුකරුවන් මාසික කුලී ගෙවන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 3.133 පස්ගොඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 625,129,773 | 113,126,245 | 512,003,528 | 11,036,507 | තත්ත්වාගණනය කළ |
| **2022** | 648,681,008 | 43,871,804 | 604,809,204 | 31,630,036 | තත්ත්වාගණනය කළ |
| **2023** | 660,311,335 | 14,843,229 | 645,468,106 | 12,724,937 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 05 වන ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 22 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබීමෙන් කාල සීමාව ඉකුත්වී වසර 01 යි මාස 06 ක කාලයක් ගතවී තිබුණි. එසේම ඉහත චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 22 ක් බදුගෙන තිබූ බදුකරුවන් විසින් අධික කුලියක් මත වෙනත් පාර්ශවයන්ට කඩ කාමර අතුරු බදු දී තිබුණි. | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නව තක්සේරු බදු මුදල් සමඟ එකඟ නොවීම නිසා නව ගිවිසුමකට එළඹීමට බදුකරුවන් අකමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් බදු ගිවිසුම් යාවත්කාලීන කර ගැනීමට නොහැකි වී ඇති බව හා වෙළඳ සංකීර්ණ ඉදිකිරීමේදී පෙර ගෙවුම් පදනම මත ටෙන්ඩර් ක්‍රමයට කඩ කාමර බදු දීම සිදු කරනු ලබන බැවින් ධනවත් ව්‍යාපාරිකයින් ටෙන්ඩර් ඉදිරිපත් කර අමතර ආදායමක් ඉපයීම සඳහා කඩ කාමර ලබා ගන්නා බවත්, ඔවුන් විසින් මාසික වාරික මුදල් ගෙවා ඇති බැවින් සභාවට පාඩුවක් වී නොමැති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 3.134 පිටබැද්දර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 422,673,122 | 16,957,947 | 405,715,175 | 5,339,119 | තත්ත්වාගණනය කළ |
| **2022** | 452,185,031 | 22,494,850 | 429,690,181 | 19,640,754 | තත්ත්වාගණනය කළ |
| **2023** | 489,573,360 | 22,350,807 | 467,222,553 | 14,159,614 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහළ මහළෙහි ඉදිකිරීම් සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 08 කදී රු.12,474,726 ක් වටිනා අස්තමේන්තු සකස් කර රු.10,936,007 ක ගිවිසුම්ගත මුදලකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු හා අනුමත සමිති වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණ ද ගොඩනැගිල්ලේ ඉහළ මහළෙහි සියළු වැඩ ආවරණය වන සේ ඉදිකිරීම් සැලසුම් කර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර, පවතින ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන, ඉටුකළ යුතු වැඩ | 2023 | සියළු කාර්යයන් හඳුනාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතුය. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

ප්‍රමුඛතාවය හඳුනාගෙන ඉදිකිරීම් සිදු නොකිරීම නිසා 2024 ජනවාරි 24 දින වන විටත් ඉහළ මහලෙහි ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

## 3.135 තිහගොඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 257,316,648 | 103,836,313 | 153,480,335 | 13,617,546 | තත්ත්වාගණනය කළ |
| **2022** | 227,499,722 | 58,374,039 | 169,125,683 | 19,271,767 | තත්ත්වාගණනය කළ |
| **2023** | 202,408,583 | 20,924,529 | 181,484,054 | (3,366,126) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුලත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධාන වලින් බැහැරව සභා බල ප්‍රදේශයට අයත් නාගරික සීමාව ඇතුළත (2022 ඔක්තෝබර් 19 දිනැති අංක 2302/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් තිහගොඩ ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය නාගරික බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පෙර) ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැඟිලි 09 ක් සඳහා | 2023 | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාල ආයතන සම්බන්ධ කර ගනිමින් සාකච්ඡාවක් පැවති අතර ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය පියවර ගන්නා බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

සංවර්ධන බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණු අතර තවද එම ඉදිකිරීම් සැලසුම් හා සංවර්ධන නියෝගවලට අනුකූල නොවන පරිදි ඉදිකර තිබුණි.

**3.136 වැලිගම ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 629,519,261 | 96,176,809 | 533,342,452 | 150,321,069 | තත්ත්වාගණනය කළ |
| **2022** | 710,239,596 | 100,221,847 | 610,017,749 | 89,001,946 | තත්ත්වාගණනය කළ |
| **2023** | 708,279,464 | 56,792,390 | 651,487,074 | 79,998,357 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේදී පූතික ටැංකි වලින් බැහැර කරන අපජලය පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ව්‍යාජ අයිතිකරු නමින් රු.16,800,000 කට ඉඩමක් මිලදී ගෙන තිබූ අතර ඒ සඳහා නීතිඥ හා මුද්දර ගාස්තු වශයෙන් රු.785,100 ක් සහා අරමුදලින් වැය කර තිබුණ ද ව්‍යාපෘතිය සඳහා ඉඩම ප්‍රමාණවත් නොවීමෙන් කිසිදු කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | 2023 | සභා දේපල ඵලදායී ලෙස යොදා ගත යුතුය. | පවත්නා භූමි ප්‍රමාණයෙහි පූතික අපජලය පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා තාක්ෂණිකව යෝග්‍ය බැව් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් තහවුරු කරන ලද බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | සභාව සතු වරකාපිටිය ආදාහනාගාරය සඳහා රථගාල පිහිටි ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 27 | 2023 | අනුමැතිය පරිදි කටයුතු කළ යුතුය. | පැවරුම් නියෝගය ලැබී නොමැති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වගන්තිය අනුව සභාවට පැවරීමට අනුමැතිය ලැබී තිබියදී, සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තක්සේරු වාර්තාවක් ලබාගෙන තුන්වන පාර්ශවයක් වෙත රු.4,000,000 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | | | | |
| (ඇ) | 2013 වර්ෂයේදී පොදු කටයුතු සඳහා සභාවට පවරන ලද අක්කර 01, රූඩ් 01, පර්චස් 2.80 ක් වූ කළුවර බැද්ද ඉඩම, හිටපු සභාපතිවරයෙකුගේ ඥාති සම්බන්ධතා ඇති සහ ඔහු විසින් 2012 දෙසැම්බර් 01 සිට 2013 නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් බදු ගෙන තිබූ කඹුරුගමුව බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගරාඬුව කඩලාන අක්කර 01 යි රූඩ් 2 ක් වූ පෞද්ගලික ඉඩමට හුවමාරු කරගෙන තිබූ අතර එම හුවමාරු කරන ලද කළුවර බැද්ද ඉඩම කැබලි කිරීම සඳහා ව්‍යාජ ලෙස අනුමැතිය ලබාදී නැවත එම ඉඩමෙන් අංක 4 හා 5 කොටස් | 2023 | පිරිවැය අවම වන ආකාරයට ඉඩම් මිලදී ගත යුතුය. | ඉඩමෙහි මැනුම් කටයුතු මෙතෙක් සිදුකර නොමැති බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පොදු කටයුතු සඳහා රු.3,850,000 ක් වැයකර සභාවට මිලදී ගෙන තිබුණි. | | | | |
| (ඇ) | පසුගිය වර්ෂයේ දී කඹුරුගමුව කසළ ව්‍යාපෘතියට යාබදව පිහිටි පිඹුරු අංක 35/215 දරන ඉඩමෙන් පර්චස් 100 ක් සභාවට මිලදී ගැනීමේදී තක්සේරු දෙපාර්තමේන්තුවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඉඩමේ වටිනාකම රු.9,400,000 කට තක්සේරු කරවාගෙන මිලදී ගැනීමට පෙර හිටපු සභාපතිවරයෙකුගේ නමින් තිබූ ඉහත ඉඩම තම දියණියගේ ස්වාමි පුරුෂයාට විකුණා ඔහුගෙන් රු.9,400,000 කට ඉඩම සභාවට මිලදී ගෙන තිබුණි. පසුගිය හා සමාලෝචිත වර්ෂයේදී ඉඩම මිලදී ගැනීම සඳහා මුද්දර ගාස්තු හා නීතිඥ ගාස්තු වෙනුවෙන් රු.424,000 ක් සභා අරමුදලින් දරා තිබුණි. | 2023 | පිරිවැය අවම වන ආකාරයට ඉඩම් මිලදී ගැනීම සිදුකළ යුතුය. | මෙම ඉඩමෙහි මැනුම් කටයුතු ආරම්භ කිරීමට නියමිත බවත්, වැට මායිම් යොදා කොම්පෝස්ට් අංගනයේ කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඉ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:4(i) විධිවිධාන වලින් බැහැරව 2021 වර්ෂයේ සිට 2023 | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එකඟ වන බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

අගෝස්තු දක්වා කාල සීමාව තුළ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 14 දෙනෙකු වෙත රු.63,931,823 ක ගිවිසුම්ගත වටිනාකමකට පවරන ලද කොන්ත්‍රාත් 37 කට සුරක්ෂණ ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක අත්තිකාරම් ලෙස රු.13,173,881 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.137 අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 394,145,400 | 149,863,012 | 244,282,388 | 1,241,833 | තත්ත්වාගණනය කළ |
| **2022** | 332,678,207 | 71,830,001 | 260,848,206 | 4,109,195 | තත්ත්වාගණනය කළ |
| **2023** | 285,294,289 | 27,384,590 | 257,909,699 | (2,423,251) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2020 වර්ෂයේ සිට අක්‍රියව පවතින ලංකා බෙල් දුරකථන සම්බන්ධතා 05 ක් විසන්ධි කිරීමට කටයුතු නොකිරීම නිසා එහි ස්ථාවර ගාස්තු ලෙස මසකට රු.500 බැගින් ගෙවීම් කිරීමෙන් සහා අරමුදලට වූ පාඩුව රු.102,500 ක් වූ අතර එය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | 2023 | සභා අරමුදලට සිදුව ඇති පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. | ඉදිරියේදී මෙවැනි හානි හා පාඩු හඳුනාගත් වහාම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්තමානය වන විට එම දුරකථන සමාගම සමඟ පැවති සියලු දුරකථන සබඳතා විසන්ධි කර තිබුණ ද සිදු වූ පාඩුව අයකරගෙන නොතිබුණි. |

## 3.138 බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 559,153,771 | 192,446,887 | 366,706,884 | 5,654,173 | තත්ත්වාගණනය කළ |
| **2022** | 527,095,883 | 180,274,106 | 346,821,777 | 5,150,607 | තත්ත්වාගණනය කළ |
| **2023** | 473,431,673 | 49,050,181 | 424,381,492 | 16,432,199 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස්(දකුණ)ගේ චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර 15 ක් සම්බන්ධයෙන් රු.3,837,500 ක එක්වන් මුදල් අයකරගෙන නොතිබුණි. | 2022 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2023 ජනවාරි 17 දින වර්තමාන බදුකරුවන්ට එක්වන් මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇති අතර ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | පළාත් පාලන කොමසාරිස් වෙතින් ගැටළුව සඳහා උපදෙස් ඉල්ලා ඇති අතර, උපදෙස් ලබා දුන් පසු ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ඇත. |
| (ආ) | සභාව විසින් පෙර වර්ෂයන් වලදී නඩු පවරන ලද පුද්ගලයන් තිදෙනෙකුගෙන් ලැබිය යුතු රු.519,632 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | 2022 | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අධිකරණයෙන් තොරතුරු ඉල්ලා ඇති අතර ලද පසු ඉදිරිපත් කරන බව. | නඩුවල කාර්ය සටහන් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත 2024 අගෝස්තු 28 දින සිහිකැඳවීමේ ලිපියක් යොමු කර ඇත. |
| (ඇ) | සභා කාර්යාල ගොඩනැගිල්ලෙහි දෙවන මහලේ පිහිටි වර්ග අඩි 2860 කින් යුත් කොටසක් 2013 වර්ෂයේ දෙසැම්බර් මස සිට විගණිත දිනය වූ 2024 ජනවාරි 22 දින | 2023 | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන් බව. | හිඟ මුදල් ගෙවීම සඳහා වර්තමාන තක්සේරුව අනුව ගිවිසුම්ගත වීමට අදාළ ආයතනය දැනුවත් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වන විටත් කිසිදු කුලියක් අයකිරීමකින් තොරව පෞද්ගලික පාර්ශවයක් වෙත ලබාදී තිබුණි. | | | | |
| (ඇ) | කඩ කාමර බදු දීමේදී එක්වන් මුදල් එකවර අයකර ගැනීම හෝ බදුකරුගේ ඉල්ලීම මත මාස 06 ක් ඇතුළත අයකර ගතයුතු වුවත්, ඥාතීන් නොවන බදුකරුවන් වෙත පැවරූ කඩ කාමර 20 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.5,140,000 ක් අයකර ගෙන නොතිබූ අතර එක්වන් මුදල් අයනොකළ කාලපරාසය වසර 02 ත් වසර 09 ත් අතර විය. | 2023 | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පළාත් පාලන කොමසාරිස් වෙතින් ගැටළුව සඳහා උපදෙස් ඉල්ලා ඇති බව. | පළාත් පාලන කොමසාරිස් වෙතින් ගැටළුව සඳහා උපදෙස් ලබා දුන් පසු ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ඇත. |

## 3.139 හම්බන්තොට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 375,165,085 | 90,304,037 | 284,861,048 | (4,137,677) | තත්ත්වාගණනය කළ |
| **2022** | 312,087,553 | 37,452,112 | 274,635,441 | (14,357,570) | තත්ත්වාගණනය කළ |
| **2023** | 308,877,415 | 23,623,280 | 285,254,135 | (1,579,801) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| පිරිවැය රු.8,483,140 ක වියදමක් දරා 2021 වර්ෂයේදී වැඩ නිමකර තිබූ වියළි කලාපීය උද්භිද උද්‍යානය අසල රථ වාහන නැවතුම් අංගනය නිශ්කාර්යව පැවතීම නිසා දරන ලද වියදම ඵලදායී නොවන වියදමක් බවට පත්ව තිබුණි. | 2023 | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට හැකිවන පරිදි කටයුතු කළයුතුය. | යටිතල පහසුකම් සැපයීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අයත් මෙම රථගාල භාවිතා නොකර උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් උද්‍යානයේ අභ්‍යන්තරයේ රථගාල භාවිතා කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වී ඇත. |

## 3.140 කටුවන ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 604,342,464 | 111,052,238 | 493,290,226 | 3,022,051 | තත්ත්වාගණනය කළ |
| **2022** | 600,976,786 | 122,831,063 | 478,145,723 | (10,624,215) | තත්ත්වාගණනය කළ |
| **2023** | 515,891,470 | 32,838,048 | 483,053,422 | 2,233,920 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| කඩ කාමර බදු දුන් දිනයේදී හෝ මාස 06 ක් ඇතුළත උපරිම වාර 06 කට යටත්ව එක්වන් මුදල් අයකළ යුතු වුවත්, 2017 හා 2022 යන වර්ෂවල බදු දුන් කඩ කාමර 10 කින් ලැබිය යුතු රු.9,534,333 ක එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රු.49,000 ක් අයකර ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා උපදෙස් ලබා ගැනීමට ප්‍රධාන අමාත්‍යංශ ලේකම් වෙත ලිපි යොමු කොට ඇති අතර ලැබෙන උපදෙස් මත ඉදිරි කටයුතු සිදුකරන බව. | හිඟ එක්වන් මුදල ඉදිරියේදී අයකර ගැනීම සඳහා වූ ලිපි බදුකරුවන් වෙත යොමුකර ඇත. |

## 3.141 තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 363,382,256 | 92,821,963 | 270,560,293 | (5,550,236) | තත්ත්වාගණනය කළ |
| **2022** | 369,799,304 | 87,426,928 | 282,372,376 | 3,171,163 | තත්ත්වාගණනය කළ |
| **2023** | 893,551,038 | 90,738,994 | 802,812,044 | 117,226,792 | අහිතකර |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පන්නෙගමුව ආලෝක මාවත ආරම්භයේ සිට ජයවර්ධන මහතාගේ නිවස දක්වා වූ මාර්ගයෙහි අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරීම සඳහා වූ කර්මාන්තයේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල්වල අගය නියමිත ශක්තියෙන් තොරව ගෙවීම් කිරීම නිසා දරන ලද රු. 1,731,840 ක් වූ වියදම ඵලදායි නොවන ගෙවීමක් වූයෙන් ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයන් සහා කළමනාකාරීත්වය විසින් සමාලෝචිත වර්ෂයේදීත් ගෙන නොතිබුණි. | 2022 | නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතුය. එසේ නොමැතිනම් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකරගත යුතුය. | තත්ත්ව පරීක්ෂණ වාර්තා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබා ගැනීමට කටයුතු කළ බව. | අවස්ථා දෙකෙහිදීම තත්ත්ව පරීක්ෂාව මාර්ග සංවර්ධන අධිකාරියෙන් සිදුකළද ලබාදුන් වාර්තා එකිනෙකට පරස්පර වී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | පන්නෙගමුව පොදු වෙළඳපොළ තුළ නව වෙළඳ සංකීර්ණය කඩකාමර 28 ක් හා විවෘත ගොඩනැගිල්ලක් රු.62,915,634 ක වියදමකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකර 2021 වර්ෂයේ සභාව වෙත භාරදී තිබූ අතර, විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 11 දින වන විටත් ප්‍රයෝජනයට නොගැනීම නිසා ගොඩනැගිලි පරිශ්‍රය තුළ වල් බිහිවී දැඩි ලෙස අපවිත්‍ර වී තිබුණි. මහජන මුදල් රු.මිලියන 62.9 ක් වැයකර සභාවට භාරදී තිබූ මෙම වෙළඳ සංකීර්ණය ප්‍රයෝජනයට නොගැනීම මහජන මුදල් නාස්තියක් හා සභාවට ලැබිය හැකිව තිබූ ආදායම් අත්හැරීමට කටයුතු කිරීමක් බවට නිරීක්ෂණය කෙරේ. | 2023 | සභාව සතු වත්කම් වලින් උපරිම ප්‍රතිඵල ලබාගත යුතුය. | තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එය ලැබුණු පසු කඩ කාමර විවෘත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණ ද මේ දක්වා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | කඩකාමර 48 කින් යුත් බිම් මහලද, ප්‍රාදේශීය සභා කාර්යාලය පවත්වාගෙන යාම සඳහා පළමු මහලද, රැස්වීම් ශාලාව සඳහා දෙවන මහලද සහිතව නාගරික සංවර්ධන අධිකාරිය විසින් | 2023 | ඉදිකිරීම් කටයුතු නිමකර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගතයුතුය. | දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය ලබාගෙන ඉදිකිරීම් කටයුතු නිම කරන බව. | දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය ලබාගෙන ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිස්සමහාරාම බස්නැවතුම්පොළ අසළ ඉදිකර තිබූ මෙම ගොඩනැගිල්ල 2019 දෙසැම්බර් 02 දින ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණි. කඩකාමර 48 පිහිටි බිම් මහලෙහි වැඩ සම්පූර්ණයෙන්ම නිමකර තිබූ අතර අනෙක් මහල් දෙකෙහි ඉදිකිරීම් කටයුතු වලින් සැලකියයුතු ප්‍රමාණයක් නිමකර තිබුණි. ගොඩනැගිල්ල සභාවට භාරදී වසර 04 ක් ගතවී තිබුණද කඩකාමර බදුදී ආදායම් ඉපැයීමට කටයුතු කර නොතිබූ අතර අනෙක් මහල් දෙකෙහි වැඩ නිමකර ප්‍රයෝජනයට ගැනීමටද කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඇ) | 2017 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (XXXIII) ප්‍රකාරව ප්‍රවාහන පහසුකම් සපයන නිලධාරීන්ට කාර්යාලය සහ නිවස අතර ගමන් කළ හැකි උපරිම දුර ප්‍රමාණය කිලෝමීටර් 50 නොඉක්මවිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර සභා ලේකම් විසින් දිනකට යාමට | 2023 | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව කටයුතු කර සභා අරමුදලට සිදුකර ඇති පාඩුව වගකිවයුතු පාර්ශවයෙන් අයකළ යුතුය. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණ ද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

සහ ඒමට කිලෝමීටර් 100 ඉක්මවා ප්‍රවාහන පහසුකම් සලසාගෙන 2020 නොවැම්බර් 02 දින සිට 2023 ඔක්තෝබර් 02 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දිනකට කිලෝමීටර් 100 ඉක්මවා ධාවනය කර තිබූ කිලෝමීටර් 19272 ක් සඳහා සහා අරමුදලින් මිලදීගෙන තිබූ ඉන්ධන පිරිවැය රු.323,403 ක් වූ අතර එම අතිරේක ඉන්ධන පිරිවැය වටිනාකම සභා අරමුදලට පාඩුවක් විය.

## 3.142 තංගල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 603,737,427 | 117,845,190 | 485,892,237 | 49,132,725 | තත්ත්වාගණනය කළ |
| **2022** | 565,361,227 | 67,885,649 | 497,475,578 | (5,299,820) | තත්ත්වාගණනය කළ |
| **2023** | 705,921,939 | 19,402,003 | 686,519,936 | 113,952,198 | අහිතකර |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2019 සැප්තැම්බර් මාසයේදී සභාවට භාරදී තිබූ රන්න බටහිර රැස්වීම් ශාලා ගොඩනැගිල්ලේ 01 හා 02 අදියරයන් වලදී වැයකළ මුදල් පිළිබද විස්තර විගණනයට ඉදිරිපත් නොකළ අතර 03 වන අදියරේදී පමණක් වැයකළ මුදල රු.28,913,959 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් රැස්වීම් ශාලාව සභාව විසින් ඵලදායී කාර්යයක යොදවා නොතිබුණි. | 2022 | පවරා ගැනීම් සිදු කර වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | නිශ්චිත පැවරීමක් සිදු කරන තෙක් ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා නඩත්තු කිරීම් කළ නොහැකි බැවින් නිශ්චිත කාර්යයක් සඳහා යොදා ගැනීම ගැටලු සහගත බව. | දිස්ත්‍රික් ලේකම් විසින් ගොඩනැගිල්ලේ වැය වටිනාකම් ලබාදී තිබුණද පවරා දීම සිදු කර නොමැත. ඉඩමේ පවරා දීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකර නොමැත. |

## 3.143 වීරකැටිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,106,707,787 | 259,252,350 | 847,455,437 | 6,646,470 | තත්ත්වාගණනය කළ |
| **2022** | 956,014,136 | 158,301,018 | 797,713,118 | (4,737,002) | තත්ත්වාගණනය කළ |
| **2023** | 888,432,900 | 29,193,440 | 859,239,460 | 34,572,634 | අභිතකර |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරී සංශෝධිත පනත හා අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඊට සිදුකර තිබූ සංශෝධන ප්‍රකාර අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම මත එක් දිනකට රු.50 ක් වූ රු.614,940 ක දඩ මුදලක් ගොඩනැගිලි සංවර්ධන සැලසුම් 10 කින් අයකර නොතිබුණි. | 2021 | පනත සහ ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී අදාළ පනත හා ඒ හා සම්බන්ධ ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කරන බව. | අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම / භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ ගොඩනැගිලි 10 ට අදාළ තොරතුරු මේ වන විට සකස් කරමින් පවතින අතර, එම තොරතුරු සකස් කිරීමෙන් අනතුරුව ඊට අදාළ ප්‍රගතිය කඩිනමින් ඉදිරිපත් කරනු ලබන බව. ඒ අනුව නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.144 අඹගමුව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 395,840,218 | 127,605,432 | 268,234,786 | 1,564,588 | තත්ත්වාගණනය කළ |
| **2022** | 777,276,644 | 72,657,702 | 704,618,942 | 8,240,798 | තත්ත්වාගණනය කළ |
| **2023** | 543,745,521 | 23,761,227 | 519,984,294 | 1,273,039 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා කාල පරාසයට අදාළ රු.47,823,809 ක ණයහිමි ශේෂයන් 110 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී, නිවැරදි කරන බව | 2024 අගෝස්තු වනවිට තව දුරටත් රු.12,743,097 ක ශේෂයක් නිරවුල් කර නොමැත. |
| (ආ) | අඹගමුව ප්‍රාදේශීය සභාව පරිහරණය කරන ඉඩම් කොටස් 35 ක අයිතිය පවරාගෙන නොතිබුණු අතර වටවල පොදු ඉඩම අනවසරයෙන් බාහිර පාර්ශවයන් භාවිතා කර තිබුණි. | 2022 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුය. | පවරා ගැනීම සඳහා කටයුතු ඉටු කරන අතර අනවසර පිවිසුම් කරුවන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2024 අගෝස්තු වන විටද ඉඩම් අයිතිය පවරාගෙන නොමැත. අනවසර පාර්ශව ඉවත් කර නොමැත. |

**3.145 ආගරපතන ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 35,776,121 | 14,504,535 | 21,271,586 | 3,579,586 | තත්ත්වාගණනය කළ |
| **2022** | 27,517,220 | 8,888,262 | 18,628,958 | (2,379,205) | තත්ත්වාගණනය කළ |
| **2023** | 29,912,048 | 23,560,207 | 6,351,841 | 2,305,376 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2020 සැප්තැම්බර් 05 දින සිදු වූ වාහන අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104 පරීක්ෂණ අවසන් කර නොතිබුණු අතර අදාළ වාහනය අළුත්වැඩියා කිරීමටද කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සභාපතිවරයාගේ ගමන් වෙනුවෙන් කුලී වාහනයක් යොදවාගෙන ඒ සඳහා වර්ෂය තුළ රු. 4,729,849 ක් ගෙවීම් කර තිබුණි. | 2022 | අළුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. | අදාළ රථය පෞද්ගලික ආයතනයක් වෙත යොමු කර අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් ඉල්ලුම් කර ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

**3.146 කොටගල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 166,633,239 | 24,405,525 | 142,227,714 | 40,295 | තත්ත්වාගණනය කළ |
| **2022** | 178,448,394 | 22,072,830 | 156,375,564 | (7,121,181) | තත්ත්වාගණනය කළ |
| **2023** | 168,198,363 | 19,466,045 | 148,732,318 | 2,131,942 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකර තිබුණු ව්‍යාපෘති 03 ක් සඳහා රු.2,856,631 ක් ගෙවා තිබුණු අතර එම ව්‍යාපෘතිවල වැඩ විෂයයන් 08 ක් සඳහා රු.1,370,536 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2021 | වැඩිපුර ගෙවූ මුදල අයකිරීමට කටයුතු කළ යුතුය. | අදාළ මුදල් අයකිරීමට කටයුතු කර විගණනයට වාර්තා කරන බව දන්වා ඇත. | 2024 අගෝස්තු වන විටද වැඩිපුර ගෙවීම් අය කර නොමැත. |
| (ආ) | සභාව නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2015 මැයි 11 දින රු.83,373,432 කට ගිවිසුමකට එළඹ තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු.21,559,211 ක් ගෙවීම්කර තිබුණි. පරිපාලන සහ තාක්ෂණික ගැටළු | 2023 | ඉදිකිරීම් අවසන් කර උපයෝජනය කළ යුතුය. | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින අතර කඩිනමින් ණය ගොනුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ඉදිකිරීම් අවසන් කර නොමැත. |

හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිට එහි වැඩ අත්හිටුවා වසර 08 කට අධික කාලයක් ගත වී තිබුණද, වැඩ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.147 කොත්මලේ ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 282,575,945 | 72,425,159 | 210,150,786 | 2,936,276 | තත්ත්වාගණනය කළ |
| **2022** | 608,796,759 | 72,118,714 | 536,678,045 | (16,994,625) | තත්ත්වාගණනය කළ |
| **2023** | 656,586,817 | 39,889,295 | 616,697,522 | (19,770,215) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාළ රු. 58,610,536 ක ණයහිමි ශේෂ 87 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 | ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | 2023 වර්ෂය තුළදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | 2024 අගෝස්තු 31 දින වන විට තව දුරටත් මිලියන 19 ක පමණ මුදලක් නිරවුල් කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු. 10,863,360 ක් විය. | 2023 | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගත යුතුය. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර නොමැත. |
| (ඇ) | දුනුකේදෙණිය ගම්මැද්ද පානීය ජල ව්‍යාපෘති සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයක් තුළ ව්‍යාපෘති 3 ක් යටතේ රු.4,000,000 ක් වැයකර තිබුණද, | 2023 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | විදුලි බළ හා බලශක්ති අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකරඇති බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොමැත. |

ජල මෝටරය සඳහා තෙකලා විදුලිය ලබා ගෙන නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

**3.148 නුවරඑළිය ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 225,324,010 | 28,110,450 | 197,213,560 | (2,891,374) | තත්ත්වාගණනය කළ |
| **2022** | 214,170,723 | 27,716,663 | 186,454,060 | (7,495,758) | තත්ත්වාගණනය කළ |
| **2023** | 259,147,992 | 36,379,636 | 222,768,356 | 20,564,344 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාවේ කඩ කාමර සඳහා අයකරගත යුතු එක්වන් මුදල එකවර අයකර ගැනීම වෙනුවට වසර 05 කින් අය කිරීමට සභාව තීරණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කඩ කාමර 22 කින් එකතුව රු.10,680,620 ක් අයකර ගෙන නොතිබුණි. | 2023 | එක්වන් මුදල් අය කර ගත යුතුය. | එක්වන් මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | අයකර නොමැත. |

## 3.149 නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 119,481,725 | 47,560,132 | 71,921,593 | (1,652,343) | තත්ත්වාගණනය කළ |
| **2022** | 146,818,734 | 43,590,546 | 103,228,188 | 4,678,451 | තත්ත්වාගණනය කළ |
| **2023** | 185,897,540 | 58,192,731 | 127,704,809 | 18,942,351 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් පවරා දුන් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවට අයත් 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරාසයට අදාළ සභා දේපල බදුදීමෙන් අයවිය යුතු රු.1,747,020 ක බදු කුලිය සමාලෝචිත වර්ෂය තුළදී ද අය කර නොතිබුණි. | 2021 | හිඟ ආදායම් අයකළ යුතුය. | නොපමාව අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2024 අගෝස්තු 31 දිනට රු.1,632,460 ක් අයකර නොමැත. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.703,489 ක් හා මුද්දර ගාස්තු රු.15,236,501ක් විය. | 2023 | ඉතිරි හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගන්නා බව | හිඟ ආදායම් අයකර නොමැත. |

## 3.150 මස්කෙළිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 178,744,258 | 12,413,450 | 166,330,808 | 470,302 | තත්ත්වාගණනය කළ |
| **2022** | 183,365,701 | 16,038,789 | 167,326,912 | (5,422,547) | තත්ත්වාගණනය කළ |
| **2023** | 210,090,538 | 14,341,661 | 195,748,877 | 4,524,562 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාවට අයත් කැබ් රථයක් හා ට්‍රැක්ටර් රථයක් 2018 සිට අවුරුදු 5 කට ආසන්න කාලයක් මස්කෙළිය ප්‍රදේශයේ ගරාජයක් තුළ අළුත්වැඩියා නොකර නිෂ්කාර්යයව ගාල් කර තිබුණු අතර කැබ් රථයේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් එන්ජින් අංකය හා භෞතිකව පවතින එන්ජිමේ අංකය පරස්පර විය. | 2023 | එංජින් අංකයේ වෙනසට හේතු පරීක්ෂා කළ යුතුය. | එන්ජින් අංකය පොතේ සඳහන් අංකය හා පවතින එන්ජිමේ අංකය අතර වෙනසක් පිළිබඳව ලබා දෙන ලද ලිපි ලේඛන වල සඳහන් කර නොමැති බව. | අවශ්‍ය පියවර ගෙන නොමැත. |

## 3.151 වලපනේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 172,877,272 | 37,144,733 | 135,732,539 | 7,295,043 | තත්ත්වාගණනය කළ |
| **2022** | 189,413,347 | 39,892,898 | 149,520,449 | 499,026 | තත්ත්වාගණනය කළ |
| **2023** | 178,897,785 | 26,759,011 | 152,138,773 | 1,402,245 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| රාගල නගරයේ කඩ කාමර 07 කට අදාළව 2015 වර්ෂයේ සිට පැවත එන රු.3,448,868 ක හිඟ කුලී සහ වලපනේ ප්‍රදේශයේ කඩ කාමර 26 කට අදාළව වසර 01 සිට 10 අතර කාලයක සිට පැවත එන රු.3,502,648 ක කඩකාමර කුලී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද අයකර නොතිබුණි. | 2021 | හිඟ ආදායම් අයකළ යුතුය. | ඉදිරියේදී කපා හැරීමට යොමු කරන බව දන්වා ඇත. | 2024 අගෝස්තු 31 දිනට රාගල නගරයේ කඩ කාමර 07 න් රු. 3,448,868 හා වලපනේ කඩ කාමර මඟින් රු.1,557,620 ක් තව දුරටත් අය විය යුතුව ඇත. |

## 3.152 අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 145,102,051 | 39,351,128 | 105,750,923 | (2,997,073) | තත්ත්වාගණනය කළ |
| **2022** | 145,021,741 | 23,286,448 | 121,735,293 | (143,662) | තත්ත්වාගණනය කළ |
| **2023** | 128,300,010 | 6,338,025 | 121,961,985 | (173,798) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව පරිහරණය කරන රු.533,750 ක් වටිනා ඉඩම් 70 ක හා රු.1,784,050 ක් වටිනා වාහන 03 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | 2023 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | පවරා ගැනීමේ කටයුතු මේ දක්වා අවසන් වී නොමැත. |

## 3.153 උකුවෙල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 389,114,136 | 54,877,997 | 334,236,139 | 1,361,289 | තත්ත්වාගණනය කළ |
| **2022** | 376,331,645 | 37,847,305 | 338,484,340 | (12,743,646) | තත්ත්වාගණනය කළ |
| **2023** | 371,365,803 | 22,367,817 | 348,997,986 | (17,202,327) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව පරිහරණය කරන වටිනාකම තක්සේරු කර නොතිබුණු ඉඩම් 67 ක් සහ රු.13,756,000 ක ඉඩම් 11 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව . | ඉඩම් වල අයිතිය පවරාගෙන නොමැත. |

## 3.154 නාඋල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 246,262,747 | 29,009,467 | 217,253,280 | 10,528 | තත්ත්වාගණනය කළ |
| **2022** | 808,750,632 | 18,706,678 | 790,043,954 | 753,296 | තත්ත්වාගණනය කළ |
| **2023** | 701,588,224 | 7,353,913 | 694,234,311 | 112,140 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | එකතුව රු. 199,000,000 ක් වූ ඉඩම් 17 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | 2022 | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. | ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට අදාලව කටයුතු කර ඇති අතර, ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරන බව. | ඔප්පු හා පැවරුම් නියෝග ලබාගෙන නොමැත. |
| (ආ) | සභාව විසින් භුක්ති විඳින රු.102,500,000 ක වටිනාකමින් යුත් ඉඩම් කොටස් 22 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | පවරා ගැනීමට කටයුතු කල යුතුය. | පවරා ගැනිමේ කටයුතු ඉදිරියේදි සිදු කරන බව. | පවරා ගෙන නොමැත. |

## 3.155 මාතලේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 481,959,250 | 30,793,150 | 451,166,100 | 45,582,047 | තත්ත්වාගණනය කළ |
| **2022** | 499,384,410 | 48,502,328 | 450,882,082 | (6,949,911) | තත්ත්වාගණනය කළ |
| **2023** | 510,760,214 | 32,874,977 | 477,885,237 | 20,634,598 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | විසල් මාතලේ ජල ව්‍යාපෘතියේ මාර්ග පළුදු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමේ පරිපාලන වියදම් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ලැබී තිබු මුදලින්, කිසිදු රාජකාරියක් හෝ අධීක්ෂණයක් කල බවට සාක්ෂි ඉදිරිපත් කිරීමකින් හා අනුමැතියකින් තොරව සභාපති හා තවත් නිළධාරින් දෙදෙනකුට රු.2,215,053 ක් ගෙවා තිබුණි. | 2022 | මෙම ජල ව්‍යාපෘතිය අධීක්ෂණය කළ බවට පැහැදිළි හා විධිමත් ලේඛන ඉදිරිපත් කළයුතුය. | ගෙවීම් සම්බන්ධ තොරතුරු ගොනුවේ හා ලේඛන වලින් තහවුරු කරගත හැකි බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර වලින් සමාලෝචිත වර්ෂයේ | 2023 | පනතේ විධිවිධාන ප්‍රකාරව අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අධිභාර නිවේදන වල ඇතුළත් හිග අධිභාර මුදල අය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | රු. 406,018 ක මුදලක් තවදුරටත් අයකර නොමැත. |

අවසන් දිනට
රු.537,018 ක
මුදලක් තවදුරටත්
අයකර ගැනීමට
තිබුණි .

**3.156 යටවත්ත ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 234,215,192 | 11,777,206 | 222,437,986 | 8,836,576 | තත්ත්වාගණනය කළ |
| **2022** | 245,226,660 | 8,712,269 | 236,514,391 | 8,451,106 | තත්ත්වාගණනය කළ |
| **2023** | 260,120,332 | 11,955,244 | 248,165,088 | 6,647,550 | තත්ත්වාගණනය නොකළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| එකතුව රු.350,600 ක සභාවට අයත් පර්චස් 59.40 ක ඉඩම් 4 ක් බාහිර පුද්ගලයින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි. | 2023 | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළයුතුය. | සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | සන්තකය ආපසු ගැනීමට කටයුතු කර නොමැත. |

## 3.157 රත්තොට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 305,447,448 | 45,733,851 | 259,713,597 | (7,180,112) | තත්ත්වාගණනය කළ |
| **2022** | 341,672,841 | 64,696,997 | 276,975,844 | (1,970,091) | තත්ත්වාගණනය කළ |
| **2023** | 344,857,599 | 44,538,866 | 300,318,733 | (12,308,536) | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන එකතුව රු.1,724,744 ක අක්කර 6 යි රූඩ් 1 පර්චස් 22 ක ඉඩම් කැබලි 12 ක් , ප්‍රමාණය හඳුනා නොගත් ඉඩම් 04 ක් හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා පුද්ගලික හිමිකාරීත්වය යටතේ පවතින ඉඩම් 78 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. | අදාළ ඉඩම්වල අයිතිය හඳුනාගෙන සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1(v) ඡේදය ප්‍රකාරව ජනක බණ්ඩාර | 2023 | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ලිපි ගොනු පරීක්ෂා කර අදාළ කඩ හිමියන් වෙත එක්වන් මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා , අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු | අදාල මුදල අයකරගෙන නොමැත. |

තෙන්නකෝන් මාවතේ කඩ කාමර 6 ක එක්වන් මුදල වාරික වශයෙන් අයකිරීමට ඉඩකඩ ලබාදී තිබුණද, මහ බැංකු පොලී අනුපාතය මත ගණන් බැලූ පොලියක් අය කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එක්වන් මුදල හා ඒ සඳහා වන පොලී රු.3,141,246 ක් අයකර නොතිබුණි.

කරමින් පවතින බව.

**3.158 දඹුල්ල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 344,332,194 | 97,387,236 | 246,944,958 | 71,337 | තත්ත්වාගණනය කළ |
| **2022** | 307,106,525 | 72,048,982 | 235,057,543 | (18,463,107) | තත්ත්වාගණනය කළ |
| **2023** | 335,215,428 | 80,855,358 | 254,360,070 | 43,610,921 | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂ වලදී හිඟ ආදායම් ලෙස හඳුනාගත් සංචාරක හෝටල් බලපත්‍ර ගාස්තු රු.3,652,076 ක් නිසි අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | 2022 | නිසි අනුමැතියක් ලබාගැනිමෙන් පසු හිඟ ආදායම් කපාහැරිමට කටයුතු කළ යුතුය. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේදි නැවත ආදායමට ගෙන නිවැරදි ක්‍රියාමාර්ග ගන්නා බව. | නිවැරදි වි නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වසර 5 ට වැඩි ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.5,019,988 ක් විය. | 2021 2022 | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකිරිමට කටයුතු කළ යුතුය. | හිඟ හිටි වෙනත් ආදායම් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි බවත් දඹුල්ල මහා නගර සභාවෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධව මහා නගර සභාවට දන්වා යවා ඇති අතර ජංගම ගිණුමේ ශේෂය කඩිනමින් නිවැරදි කරන බව. | නිරවුල් කර නොමැත. |
| (ඇ) | 2017 හා 2020 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු රු.2,356,580 | 2023 | විධිමත් අනුමැතියක් ලබාගැනිමෙන් පසු හිඟ ආදායම් | නිසි අනුමැතියකින් කපාහැරීමට කටයුතු කරන බව. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් අයකර නොගත් පාර්ශවයන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව ලැබීම් කාලසීමාව ඉක්මවීම් මත යැයි දක්වමින් විධිමත් අනුමැතියකින් තොරව ජර්නල් සටහන් අංක 63 මගින් කපාහැර තිබුණි. | | කපාහැරිමට කටයුතු කළ යුතුය. | | |
| (ඈ) | 2015 අප්‍රේල් 13 දින කැබ් රථයක් අනතුරට පත්කිරිමට අදාළව 2021 මැයි 18 දින නිකුත් කල මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාවේ නියෝග වලට අනුව සභාපතිවරයාගෙන් අයකරගත යුතු රු.2,367,534 ක් අය කරගැනිමට කටයුතු කර නොතිබුණි. | 2023 | අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී ඇති බව. | අය කිරීම් ආරම්භ කර නොමැත. |

## 3.159 ලග්ගල-පල්ලේගම ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 109,798,225 | 58,286,768 | 51,511,457 | 3,506,445 | තත්ත්වාගණනය කළ |
| **2022** | 118,183,709 | 50,467,671 | 67,716,038 | 1,945,551 | තත්ත්වාගණනය කළ |
| **2023** | 83,152,760 | 20,950,011 | 62,202,749 | (1,081,109) | තත්ත්වාගණනය නොකළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ රු.4,000,000 ක ඇස්තමේන්තුවකට අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ඉදිකරමින් පවතින පිටවල සංචාරක මධ්‍යස්ථානයේ බිම් මහල අදාළ ඉදිකිරිමට බිල්පතෙහි සඳහන් වැඩ කොටස් වලින් සියයට 20 ක් පමණක් ඉටුකර තිබියදී හා වැඩ කොටස් අවසන් කර නොතිබියදී තාක්ෂණ නිලධාරිවරයා විසින් වැඩ අවසන් බවට නිර්දේශ කර රු.3,354,894 ක බිල්පත් 2021 දෙසැම්බර් 31 දින පළාත් පාලන දෙපාරත්මේන්තුවට යවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද | 2022 | ඉටුකරන ලද වැඩ සඳහා බිල්පත් සකස් කල යුතු අතර ඉදිකිරිම් අවසන් කරගත යුතුය. | ලබා දුන් ප්‍රතිපාදන මුදල් රඳවා තබා ගැනීම සඳහා අවසන් බිල්පත් සකස් කර ඉදිරිපත් කළ ද කොන්ත්‍රාත්කරුට කිසිඳු ගෙවීමක් සිදු කර නොමැති බව. | කොන්ත්‍රාත්කරුට කිසිඳු ගෙවීමක් සිදු කර නොමැති වුවද,නිලධාරින් සම්බන්ධන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගිවිසුම්ගත වැඩ කොටස් ඉටු නොකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | | | | |
| (ආ) | විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහනෙහි ප්‍රතිපාදන මත ඉදිකිරීම් ආරම්භ කර තිබූ කිවුලවාඩිය ජල යෝජනා ක්‍රමය මඟින් පාරිභෝගිකයන් 110 කට ජලය සැපයීමට අරමුණ කර තිබුණද, 2022 නොවැම්බර් 02 දින වන විට ඉන් කොටසක් ඉදිකර රු.2,377,539 ක් වැයකර තිබුණි. එමඟින් පාරිභෝගිකයින් 12 කට ජලය සැපයීමට හැකිව තිබුණද,සමාලෝචිත වර්ෂය අවසන් වන විට කිසිදු පාරිභෝගිකයෙක් ජල සම්බන්ධතා අයදුම්කර නොතිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා වැය කළ රු.2,377,539 ක් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | 2023 | වැඩි පාරිභෝගිකයන් ප්‍රමාණයකට පානීය ජලය ලබාදීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. | පිරිවැය ඉහළ යාම මත වැඩි පාරිභෝගිකයින් පිරිසක් සිටින ස්ථාන වලට ජල නල එළීමට නොහැකි වීම මත ජල සම්බන්ධතා ලබාදිමට නොහැකි බව. | මේ දක්වා ජල සම්බන්ධතා ලබා දී නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 12 ක එකතුව රු.12,374,008 ක් වූ අතර ඉන් වසර 01 | 2021<br>2023 | ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ ශේෂයන්වලට අදාල තොරතුරු පවත්වා නොමැති බැවින් අයකරගැනීමේ හැකියාවක් | හිඟ ශේෂ නිරවුල් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට වසර 03 ත් අතර කාලපරාසයට අයත් රු.990,423 ක් හා වසර 05 කට වැඩි කාලයක් තිස්සේ පැවති එකතුව රු.11,383,585ක් අයකර ගෙන නොතිබුණි. | | | නොමැති බව. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.8,316,598ක් වූ අතර ඉන් වසර 03 සිට වසර 05 අතර කාලයට අයත් රු.743,808 ක් හා වසර 05 කට වැඩි කාලයක් තිස්සේ පැවති එකතුව රු.7,572,790 ක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | 2021<br>2023 | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ණයහිමි ශේෂයන් වලට අදාල තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් නිරවුල් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව. | හිඟ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොමැත. |

## 3.160 උඩුදුම්බර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/(ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 278,054,514 | 17,440,220 | 260,614,294 | 6,029 | තත්ත්වාගණනය කළ |
| **2022** | 291,692,387 | 13,738,373 | 277,954,014 | 1,174,153 | තත්ත්වාගණනය කළ |
| **2023** | 286,923,382 | 11,451,641 | 275,471,741 | 1,629,837 | තත්ත්වාගණනය කළ |

| **විගණන නිරීක්ෂණය** | **වාර්තාවේ වර්ෂය** | **විගණකාධිපති නිර්දේශය** | **විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය** |
|---|---|---|---|---|
| පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 14ක් වෙනුවෙන් 2018 මැයි 22 දින ලබාගත් නව තක්සේරු වාර්තාව 2019 ක්‍රියාත්මක කිරීමේ දී කඩ 06කින් එම තක්සේරුවට මුදල් ගෙවීම පැහැර හැර තිබුණු අතර 2020 වර්ෂයේ නඩු පැවරීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට මෙම කඩ විවෘතව පැවති අතර මෙම කඩ කාමර 06ට අදාළව රු. 3,051,905 ක හිඟ කඩ කාමර කුලී ශේෂයක් පැවතුණි. | 2023 | නඩු තීරණ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අතුරු තහනම් නියෝග නිකුත් කර ඇති බව. | හිඟ කඩ කාමර කුලිය අයකරගෙන නොතිබුණි. |

## 3.161 මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 798,790,945 | 122,611,361 | 676,179,584 | (40,285,282) | තත්ත්වාගණනය කළ |
| **2022** | 960,096,397 | 116,608,461 | 843,487,936 | 39,071,929 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,134,434,195 | 186,070,692 | 948,363,503 | 17,752,702 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් රු.18,720,121 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි ඒකක 364 කින් අය විය යුතු රු.3,842,241 ක් ඇතුළත්ව තිබුණි. | 2021 | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ගෙයින් ගෙට ගොස් වරිපනම් බදු අය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම තුළින් හිඟ අය කර ගැනීම. | වර්තමානය වන විට රු.7,222,897 ක හිඟයක් අය කර නොමැත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 අනුව, ටෙන්ඩර් පරිපාටියෙන් තොරව පේරාදෙණිය - කොළඹ පාරේ කඩ කාමර 05 ක් වසර 40 කට වැඩි කාලයක් දිගින් දිගටම එකම පුද්ගලයින්ට බද්දට දී තිබුණි. එසේම, බදුකරුවන් කඩ පිටුපස අනවසර ඉදිකිරීම් ද සිදු කර | 2022 | ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර කඩ කාමර පැවරිය යුතු අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. | 2023 වර්ෂය සඳහා ලබාගන්නා ලද නව තක්සේරුව අනුව කඩ ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමේ දී, කඩහිමියන් පැමිණිලි කර ඇත. ඒ අනුව, පැමිණිල්ල විමර්ශනය කරන තෙක් 2023 දෙසැම්බර් 31 දින දක්වා නව තක්සේරුව අනුව කඩ කාමර | ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොමැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණි. | | | හිමියන්ගෙන් මාසික කුලී මුදල් අයකරනු ලබන බව. | |
| (ඈ) | 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2020/06 දිනැති මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02.2(1) ඡේදය අනුව, කටයුතු නොකර, කමිටු අනුමැතියකින් රු.50,000,000 ක ස්ථාවර තැන්පතුවක් 2023 දෙසැම්බර් 21 දින නිදහස් කර ගෙන තිබුණි. | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී එවැනි අත පසු වීම් සිදු නොවීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොමැත. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව විගණකාධිපති විසින් ඉකුත් වර්ෂය තුළ දී රු.262,608 ක අධිභාරයක් පනවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022<br>2023 | අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ අය කිරීම් සිදු කරන බව. | අධිභාර අය කර නොමැත . |
| (ඉ) | සභාව සතු මුද්‍රණ යන්ත්‍රයක් හා ටැබ් යන්ත්‍රයක් සභාවේ සභිකයෙකු වෙත ලබා දී තිබුණු අතර, සභාව විසුරුවා හැරීමෙන් පසු මෙම යන්ත්‍ර නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | යන්ත්‍ර නැවත සභාව වෙත ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | ලිඛිතව දැනුවත් කර මෙම ටැබ් යන්ත්‍රය හා මුද්‍රණ යන්ත්‍රය භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වා ඇති බව. | මෙම යන්ත්‍ර සභාවට භාර දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2023 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා ගොඩනැගිලි හා මාර්ග සම්මත මිල රේටයන් සංශෝධනය කර තිබිය දී, 2023 මුල් අර්ධ වර්ෂයේ රේටයන් මත පදනම්ව ඇස්තමේන්තු සකස් කර, මාර්ග, කාණු, බෝක්කු සහ පාළම් හා වැටවල් ඉදිකිරීම ව්‍යාපෘති 28 කට රු.2,500,881 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | මාර්ග සම්මත මිල රේටය (HSR) වලට අනුකූල නොවී ඇස්තමේන්තු සෑදූ හා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය. | වැඩිපුර ගෙවීම් කර ඇති මුදල එම කොන්ත්‍රාත් සමිති සඳහා ඉදිරියේ දී නිදහස් කිරිමට ඇති රැදවුම් මුදල්වලින් අය කරන බව. | රු.434,369 ක මුදලක් අය කර නොමැත. |

## 3.162 මිනිපේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 315,639,716 | 36,262,651 | 279,377,065 | 5,306,843 | තත්ත්වාගණනය කළ |
| **2022** | 322,524,426 | 18,500,938 | 304,023,488 | 6,847,447 | තත්ත්වාගණනය කළ |
| **2023** | 335,422,147 | 271,447,640 | 63,974,506 | 10,608,433 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1997 වර්ෂයේ සභාව සතු ඉඩමක අනවසරයෙන් ඉදිකළ අත්තිවාරමක් එවකට සිටි සභාපතිවරයා විසින් කඩා ඉවත් කිරීම හේතුවෙන්, රු.500,000 ක අලාභයක් ඉල්ලා නඩු පවරා තිබුණු අතර, සභාව වෙනුවෙන් කිසිවෙකු පෙනී නොසිටීම නිසා, රු.500,000 ක් වන්දි මුදල් හා නඩු ගාස්තු වශයෙන් රු.30,500 ක් ලෙස එකතුව රු.530,500 ක මුදලක් ගෙවන ලෙස ඒක පාර්ශවික අධිකරණ තීරණයක් ලබා දී තිබුණි. මෙම රු.530,500 ක අලාභය සඳහා මු.රෙ.104(04) පරීක්ෂණයෙන් පුද්ගලයින් 04 දෙනෙකුගෙන් | 2021<br>2022<br>2023 | වගකිව යුතු පුද්ගලයින්ගෙන් අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | මේවන විට නඩු කටයුතු සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාව අනුව අලාභ අය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.134,950 ක් බැගින් අය කිරීමට තීරණය කර ඇතත්, අය කර නොතිබුණි. | | | | |
| (ආ) | හසලක වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 20 කින් රු.11,255,232 ක බදු මුදලක් අය විය යුතු වුවද, බදුකරුවන් මෙම මුදල් ගෙවීම පැහැර හැර තිබුණු අතර, මෙම කඩ කාමරවල ලිපිගොනු පරීක්ෂාවේ දී, සභාව හා බදුකරුවන් අතර 2009 වර්ෂයෙන් පසු ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. සියලුම කඩ කාමරවල විශාලත්වය බදු ගිවිසුම අනුව, අඩි 13 X 29 ප්‍රමාණයේ වුව ද, මෙම කඩ කාමර අඩි 13 X 60 ප්‍රමාණයේ දිගින් යුතුව ඉදිකිරීම් සිදු කර තිබුණු අතර, කඩ කාමරවල බදුකරුවන් කඩ කාමරය පිටුපස ස්ථිරව පදිංචි වී සිටින බව ද, මෙම වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ ගොඩනැගිලි ඉදිකිරීම සභාව සිදු කළ යුතු වුවත්, බදුකරුවන් අනවසරයෙන් ඉහළ මහළ ඉදිකර තිබුණු අවස්ථා ද, මෙහි දී එකවර අය කළ යුතු මුදල් අය කර ගෙන ද | 2021<br>2022<br>2023 | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමටත් සියලු බදු මුදල් කාලීනව අය කර ගත යුතුය. | සභාව විසින් ලිඛිතව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කර ඇතත්, බදුකරුවන් විසින් කිසිදු අනුකූලතාවයක් දක්වා නැති බව. | නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණු අතර, සියලු බදු මුදල් කාලීනව අය කර ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොතිබුණි. | | | | |
| (ඇ) | පිරිවැය රු.71,949,560 ක් වැය කර පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකළ බහු කාර්යය ගොඩනැගිල්ලේ දෙවන මහලේ වර්ග අඩි 7,000 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | 2023 | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගත යුතුය. | නාගරික සංවර්ධන අධිකාරිය හා පෞද්ගලික අංශයේ සහාය ලබා ගෙන මෙහි ඵලදායී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බව. | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගෙන නොමැත. |
| (ඈ) | ප්‍රාදේශීය සභාවට 2000 ඔක්තෝබර් 20 දිනැති අංක 4/3/9672 දරන පැවරුම් නියෝගයෙන් පවරා ඇති හසළක සති පොළ ඉඩමෙහි අනවසර පදිංචිකරුවෙකු පර්චස් 07 ක පමණ ඉඩම් කොටසක් අල්ලා ගෙන ඇතත්, අනවසරකරු ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | අනවසර අත්පත් කර ගැනීම් ඉවත් කළ යුතුය. | අනවසර පදිංචිකරු ඉවත් කිරීම සම්බන්ධයෙන් මේ වන විට පළාත් පාලන කොමසාරිස් මඟින් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | සභාව සතු ඉඩම්වල අනවසර අත්පත් කර ගැනීම් ඉවත් කර නොමැත. |

## 3.163 උඩුනුවර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 487,548,192 | 76,557,448 | 410,990,744 | (556,046) | අහිතකර |
| **2022** | 545,229,761 | 59,410,899 | 485,818,862 | 39,282,503 | අහිතකර |
| **2023** | 771,419,603 | 18,783,505 | 752,636,098 | 8,726,107 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම්ආදායම් එකතු කිරීමේ දී, මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු වී තිබුණු අතර, එම මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව තවදුරටත් ක්ෂේත්‍රය තුළින් කරුණු හෙළිදරව් වී තිබුණි. මෙයට අදාළ මූලික හා අවසන් පරීක්ෂණවල දී රු.1,028,451 ක හිඟ වරිපනම් ශේෂයක් අය කර ගත යුතු බව නිගමනය කර, “අය කර ගත යුතු වරිපනම් වංචා ගිණුම” ලෙස නව ගිණුම් ශේෂයක් 2018 ගිණුම් වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය | 2021 | වරිපනම් බදු වංචාව ලෙස සඳහන් මුදල අය කර ගැනීමට හා හිඟ වරිපනම් බදු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | වරිපනම් දත්ත පද්ධතිය හා ගිණුම නිවැරදි කර ඇත. | අයවිය යුතු රු.1,028,451 ක මුදල අය කර ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අවසානය දක්වා වසර 04 කට අධික කාලයක් ගත වී තිබුණ ද, මෙම වරිපනම් මුදල් අය කර නොතිබුණු අතර, ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.32,120,181 ක හිඟ හිටි වරිපනම් ශේෂයේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත් වීමට නොහැකි විය. එමෙන්ම, එම ශේෂය තුළ ඒකකයක හිඟයරු.10,000 ඉක්ම වූ දේපළ 521 කට අදාළව අය විය යුතු රු.8,343,921 ක හිඟ වරිපනම් බදු දඇතුළත්වතිබුණි. | | | | |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,085,636 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | 2023 | අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අභියාචනා පරීක්ෂණය අවසන් කර එය පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන නියෝග මත ඉදිරි අය කර ගැනීම් සිදු කරන බව. | අධිභාර අය කර නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ රු.1,989,935 ක් වැය කර පුමුණුව පිත්තල කර්මාන්ත | 2023 | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය | තක්සේරු වාර්තාව ලද පසු මෙම ගොඩනැගිල්ල බදු ලබා දිම සඳහා | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයන් සඳහා යොදවා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ශාලාව ඉදිකර තිබුණ ද, අපේක්ෂිත අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි. | | | ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු යොදා ඇති බව. | |
| (ඇ) | සභාව සතු එකතුව රු.23,152,179 ක වාහන 09 කින්, එක් වාහනයක් වසරකට වැඩි කාලයක් හා අනෙකුත් වාහන 08 වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ගර්හිතව පැවතුණි. | 2023 | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය. | රජයේ තක්සේරුව ගෙන්වා ගැනීමෙන් අනතුරුව වෙන්දේසි කළ යුතු වාහන වෙන්දේසි කිරීමටත් භාවිතයට ගත හැකි වාහන අළුත්වැඩියා කිරීමටත් කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

## 3.164 යටිනුවර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 645,711,407 | 76,782,483 | 568,928,924 | 15,581,433 | තත්ත්වාගණනය කළ |
| **2022** | 676,417,139 | 83,049,162 | 593,367,977 | 10,400,651 | තත්ත්වාගණනය කළ |
| **2023** | 730,184,493 | 96,943,424 | 633,241,069 | 23,069,989 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| පේරාදෙණිය, කොළඹ ප්‍රධාන පාර ආසන්නයේ පුද්ගලයෙකු අනුමැතියක් ලබා ගැනීමකින් තොරව මහවැලි රක්ෂිතයට හානි කරමින් ඉදිකිරීම් කරමින් පැවතුණ ද, සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | ඉඩම් හිමිකරු විසින් ඉදිකිරීම් සැලැසුම අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, ස්ථානීය පරීක්ෂාවක් සිදු කර එම ඉදිකිරීම් කටයුතු සඳහා විධිමත් අනුමැතියක් ලබා දීමට හැකි ද, යන්න තීරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හා මහවැලි සංවර්ධන අධිකාරියේ මූලික සැලැසුම් තීරණයක් සඳහා යොමු කර ඇති බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කර නොමැත. |

**3.165 පන්විල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 176,896,622 | 27,227,242 | 149,669,380 | 2,970,282 | තත්ත්වාගණනය කළ |
| **2022** | 165,945,176 | 15,325,515 | 150,619,661 | (4,340,391) | තත්ත්වාගණනය කළ |
| **2023** | 161,049,503 | 5,638,844 | 155,410,659 | (566,046) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 30 ක කඩ කුලී 2016 වර්ෂයේ තක්සේරු කර 2019 වර්ෂයේ මෙම තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණද කඩ හිමියන් විසින් තක්සේරුව ප්‍රතික්ෂේප කර කුලී ගෙවීම පැහැර හැර තිබුණි. මේ හේතුවෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා එකතුව රු.5,872,250 ක කඩ කුලී අයකර නොතිබුණි. | 2023 | හිඟ කඩ කුලී අයකළ යුතුය. | නිත්‍යානුකූලව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් සඳහා යොමු කර ඇත. |
| (ආ) | 2015 වර්ෂයේදී රු.2,000,000 ක් වැයකර ඉදිකර තිබුණු නකල්ස් | 2023 | ඵලදායි කාර්යයකට යොදාගත යුතුය. | ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කරන බව. | නිශ්කාර්යව පවතී. |

නිවාඩු නිකේතනය සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි. මෙම ගොඩනැගිල්ල සංචාරක ආකර්ශනය ලබාගෙන ආදායම් ඉපයීම අරමුණු කරගෙන ඉදිකර තිබුණද අරමුණුගත කාර්ය ඉටුනොකර විනාශ වීමට ඉඩහැර තිබුණි.

## 3.166 හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 499,543,071 | 71,735,669 | 427,807,402 | (4,154,983) | තත්ත්වාගණනය කළ |
| **2022** | 613,673,983 | 109,084,424 | 504,589,559 | (61,845,819) | තත්ත්වාගණනය කළ |
| **2023** | 765,717,526 | 23,928,425 | 741,789,101 | 44,158,828 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වටිනාකම රු .17,699,179 ක් වූ බැකෝ යන්ත්‍රයක් හා ට්‍රැක්ටර් ට්‍රේලර් 03ක් වසර 03 ත් 24 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | 2023 | අපහරණය හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. | අපහරණයට හා වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අපහරණය කර නොමැත. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2014 වර්ෂයේදී මැදවල ක්‍රීඩාපිටිය පිහිටි ඉඩමේ භෞතික භුක්තිය සභාවට පවරා දීමෙන් පසුව එම ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා වසර 09 ක කාලය තුල අත්පත් කර ගැනීමේ ගාස්තු, පරිපාලන වියදම්, වන්දි ගෙවීමේ හා මැනුම් ගාස්තු ලෙස එකතුව රු.1,564,617 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා | 2023 | වත්කම් පවරා ගත යුතුය. | පවරාගැනීමට කටයුතු කරමින් පවතින බව. | පවරාගෙන නොමැත. |

තිබුණද, වර්ෂය අවසාන දින වන විටත් එහි අයිතිය පවරාගෙන නොතිබුණි.

## 3.167 කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,908,569,632 | 368,208,957 | 1,540,360,675 | (82,099,947) | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,975,321,994 | 394,961,349 | 1,580,360,645 | 627,911 | තත්ත්වාගණනය කළ |
| **2023** | 2,085,306,502 | 320,975,745 | 1,764,330,757 | (52,988,943) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව හෝටල් 02 කින් 2015 සිට 2017 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ බලපත්‍ර ගාස්තුව රු. 14,753,555 ක් අයකර ගෙන නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ආදායම් අයකළ යුතුය. | ගාස්තු අය කිරීමට කටයුතු කරන බව. | ආදායම් අයකරගෙන නොමැත. |
| (ආ) | මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්‍රකාරව සභාව සතු කැබ් රථය 2022 ජනවාරි 20 දින හදිසි ගිනි ගැනීමකට ලක්වී තිබූ අතර ඒ සම්බන්ධව පරීක්ෂණ අවසන් කර නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මෙතෙක් කටයුතු කර නොමැත. |
| (ඇ) | කාබනික පොහොර අංගනය සඳහා කසළවල අධික තෙතමනය ඉවත් කිරීමට 2021 | 2023 | නිසි පරීක්ෂාවකින් යුතුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. | විදුලි සම්බන්ධතාවය නොමැති බව . | ක්‍රියාත්මක තත්වයේ නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂයේ රු. 10,287,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු යන්ත්‍රය මිලදී ගත් දින සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. | | | | |
| (ඇ) | අලුත්වත්ත සණ අපද්‍රව්‍ය ව්‍යාපෘතියේ පොලිතින් හා ප්ලාස්ටික් මගින් ඉන්ධනයක් නිෂ්පාදනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2021 වර්ෂයේ ජනවාරි 28 දින සභාව පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ වී නොතිබුණු අතර සභාව ව්‍යාපෘති භූමිය සකස් කිරීම සඳහා 2021 සිට 2022 දක්වා රු.29,782,203 ක වියදමක් දරා තිබුණි. එහෙත් මෙම යන්ත්‍රය සවිකිරීමට ගිවිසුම්ගතව පවරා තිබුණු කොන්ත්‍රාත්කරු එය සවි නොකිරීම හේතුවෙන් ඒ වෙනුවෙන් සභාව දැරූ වියදම් නිශ්ඵල වී තිබුණි. මේ සම්බන්ධව කොන්ත්‍රාත්කාර | 2023 | අරමුණට අදාළ කාර්යයන් ඉටු කළ යුතු අතර අධීක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කළ යුතු අතර වැඩ ඉටු නොකිරීම සම්බන්ධව කොන්ත්‍රාත් ආයතනය සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | නිෂ්ඵල වියදමක් නොවූ බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

ආයතනය
සම්බන්ධව අවශ්‍ය
ක්‍රියාමාර්ග ගෙන
නොතිබුණි.

## 3.168 මැදදුම්බර ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 307,897,807 | 37,979,718 | 269,918,089 | 3,303,709 | තත්ත්වාගණනය කළ |
| **2022** | 413,617,984 | 23,901,062 | 389,716,922 | 41,472,288 | තත්ත්වාගණනය කළ |
| **2023** | 459,670,068 | 49,519,586 | 410,150,482 | 28,883,885 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු.13,470,887 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.4,542,105 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.4,572,290 ක් අයකර නොතිබුණි. | 2023 | ලැබිය යුතු ශේෂ අයකරගත යුතුය. | අයකරගැනීමට මු.රෙ 104(4) පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන බව. | මේ වන විටත් අයකරගෙන නොතිබුණි. |
| (ආ) | වටිනාකම රු.17,850,000 ක් වූ වාහන 07 ක් හා රු.177,500 ක් වටිනා ජල බවුසරයක් වසර 02 සිට 09 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | 2023 | අලුත්වැඩියා කිරීමට හා අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා කිරීමට හා අපහරණය කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අලුත්වැඩියා කිරීමට හා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3.169 පාතදුම්බර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 433,494,505 | 68,400,908 | 365,093,597 | (3,223,794) | තත්ත්වාගණනය කළ |
| **2022** | 430,625,055 | 67,682,961 | 362,942,094 | (31,467,990) | තත්ත්වාගණනය කළ |
| **2023** | 450,914,508 | 54,636,334 | 396,278,174 | (7,710,416) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන අනුව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පසුගිය වර්ෂ 05 ක සංවර්ධන බලපත්‍ර 786 ක් අනුමත කර තිබුණද අනුකූලතා සහතික 731ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණද ඒ සම්බන්ධයෙන් පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | සංවර්ධන බලපත්‍ර ලබා දී ඇති ඉදිකිරීම් අවසන් කළ ගොඩනැගිලි සම්බන්ධයෙන් සොයා බලමින් පවතින බව. |

## 3.170 ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 338,443,490 | 74,825,214 | 263,618,276 | 728,409 | තත්ත්වාගණනය කළ |
| **2022** | 349,127,382 | 45,531,446 | 303,595,936 | 975,705 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,931,532,877 | 24,464,299 | 1,907,068,578 | 741,561 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සිද්ධීන් 04 කට අදාළ මුදල් රෙගුලාසි පරීක්ෂණ කටයුතු අවසන් කර, අවසන් වාර්තා 2020 මාර්තු වන විට ලබා දී ඇතත්, රු.1,559,795 ක් වූ හානි පූර්ණය කර නොතිබුණි. | 2021 | වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන හානි පූර්ණය කර ගත යුතුය. | හානි පූර්ණය සඳහා නඩු පැවරීමට හා මුදල් හිලව් කර ඉතිරිය අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | වගකිව යුතු පාර්ශවවලින් අලාභ අය කර නොමැත. |
| (ආ) | අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කොටසක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.11,006,088 ක් වැය කර තිබුණ ද, භාවිතයට ගැනීමට නොහැකිවී තිබුණි. | 2022 | ව්‍යාපෘතිය නිම කර මහජන අවශ්‍යතා ඉටු කළ යුතුය. | ප්‍රතිපාදන ලැබී නොමැති බවත්, අඩු ආදායම්ලාභී සභාවක් බැවින්, ලක්ෂ 40 ක් යොදවා ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ බව. | මෙම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. |
| (ඇ) | ගඟ ඉහළ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - රු.74,612,900 | 2022 | | | |
| (i) | මෙම වෙළඳ සංකීර්ණය ඉදිකරන භූමිය ඉඩම් | | ඉඩම් පවරා ගෙන ඉදිකිරීම් කළ යුතුය. | ස්ථාවර තැන්පතුව කල් පිරීමෙන් පසු ඉඩම පවරා ගැනීමට | ඉඩම පවරා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වුවද මෙම ඉඩම පවරා ගැනීමකින් තොරව ඉදිකිරීම් කරමින් පැවතුණි. | | | කටයුතු කරන බව. | |
| (ii) | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2022 පෙබරවාරි 07 දින මාස 10 ක කාලයකින් වැඩ අවසන් කිරිමට ගිවිසුම් අත්සන් කර, සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 14 දින වැඩ නිම කළ යුතු බව දන්වා තිබුණ ද, තවත් මාස 03 කට කාලය දීර්ඝ කර දී තිබුණි. එම කාලය 2023 පෙබරවාරි 14 දින වන විට අවසන් වුව ද, ගොඩනැගිල්ලේ අත්තිවාරම් මට්ටම දක්වා පමණක් ඉදිකිරීම් නිම කර තිබුණි. | 2022 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | භාණ්ඩවල වෙළඳ පොළ මිල උච්චාවචනය විම හා වෙළඳ පොළ පැවැති භාණ්ඩ හිගය යන හේතුන් නිසා, කොන්ත්‍රාත්තුව නියමිත දිනට වැඩ අවසන් කිරිමට නොහැකි වූ බව. | ඉදිකිරීම් නිම කර නොමැත. |
| (ඇ) | 2020 සැප්තැම්බර් 28 දිනැති අංක 2020/06 දිනැති මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02.2(1) ඡේදය ප්‍රකාරව ස්ථාවර තැන්පතුවල ඇති මුදල් යොදවා සිදු කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත | 2023 | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | පළාත් පාලන කොමසාරිස්තුමිය ගේ උපදෙස් ලබා ගෙන කටයුතු කිරීමට අපේක්ෂා කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යුතු වුවත්, එසේ කිරීමකින් තොරව රු.20,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 04 ක් නිදහස් කර ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ගෙවීම් කර තිබුණි. | | | | |
| (ඉ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමර්සෙඩ් කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉකුත් වර්ෂයේ මාර්තු 25 දින කාර්යය අවසන් කර මෙම මධ්‍යස්ථානයට විවිධ ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබුණු ඇඳන් හා උපාංග 297, ප්ලාස්ටික් පුටු 301, ලී ස්ටූල් 23, රූපවාහිනී හා උපාංග 04, රෙදි සෝදන යන්ත්‍ර 03, කෑම මේස 08, ජෙනරේටරයක්, විදුලි පංකා 63, CCTV කැමරා 16, වතුර මෝටර් 07, ප්ලාස්ටික් වතුර ටැංකි 07 ක්, වතුර ෆිල්ටර් 07 හා ශීතකරණයක් ඇතුළු උපකරණ ඉකුත් වර්ෂයේ මාර්තු 25 දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ, සභාපති වෙත ලිඛිතව භාර දී තිබුණි. මෙම | 2023 | අවශ්‍යතාවය හඳුනා ගෙන විධිමත් ක්‍රමවේදයකින් අවශ්‍ය ලේඛන සහ ලිපිගොනු පවත්වා ගෙන බැහැර කළ යුතු අතර, අවිධිමත් නිකුත් කිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. | සියලු භාණ්ඩ ලේඛනගත කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කර ඇත. සභාව මඟින් ලබා දුන් භාණ්ඩ නැවත ලබා ගැනීමට කටයුතු කර ඇත. අනෙකුත් භාණ්ඩ ගරු ඇමතිතුමාගේ උපදෙස් පරිදි විහාරස්ථාන හා ආයතන වෙත ලබා දීමේ අරමුණින් මහින්දානන්ද පදනමට ලබා දී ඇති බව. | පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උපකරණවලින් විදුලි පංකා 10 ක් ඇඳන් හා උපාංග 12 ක් හා රෙදි සෝදන යන්ත්‍රයක් පමණක් නිකුත් කළ බවට සනාථ කිරීම් ඉදිරිපත් කර තිබුණු අතර, අනෙකුත් භාණ්ඩ නිකුත් කිරීමේ තොරතුරු ඉදිරිපත් නොවූ බැවින්, මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු අය තීරණය කර අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඊ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 01 රූඩ් 03 පර්චස් 05.26 ක් වූ කුරුඳුවත්ත පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 28 වන දින රු.9,993,090 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. සභාව විසින් 1997 වසරේ සිට 2010 වසර දක්වා කාලය තුළ මෙම ඉඩම පරිහරණය කිරීම වෙනුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට | 2023 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඔප්පුව කඩිනමින් ලබා ගැනිම සඳහා කටයුතු කරන බව. | ඉඩමේ අයිතිය පවරා ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.87,360 ක පරිහරණ ගාස්තුවක් ද ගෙවා තිබුණි. | | | | |
| (ඩ) | ගොඩනැගිලි 02 ක් ඉදිකිරීම සඳහා රු.11,284,645 ක මුදලක් වැයකර තිබුණ ද, අර්ධ වශයෙන් ඉදිකර ඇති බැවින්, අපේක්ෂිත නිමවුම් මට්ටම (output) අත්පත් කරගෙන නොතිබුණි. | 2023 | ව්‍යාපෘතිය නිම කර මහජන අවශ්‍යතා ඉටු කළ යුතුය. | මෙම වැඩ අවසන් කර අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා ගැනීමට අපේක්ෂා කරන බව. | ව්‍යාපෘති 02 නිම කිරීමට කටයුතු කර නොමැත. |
| (ඪ) | මල්වත්ත වසමේ කුරුඳුවත්ත ආපදා ගම්මානයේ ජල ව්‍යාපෘතියේ 02 අදියර ඉටු කිරීම - රු.1,611,565<br>මෙම ව්‍යාපෘතියේ වැඩ විෂයය අංක 02 අනුව, මි.මී.40 බට යෙදීමේ දී 2023 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂයේ වාරි සම්මත රේටය (WSR) P:8 රු.1,658 රේටය භාවිතා කළ යුතු වුවත්, 2023 වර්ෂයේ පළමු අර්ධ වර්ෂයේ වාරි සම්මත රේටය WSR P:8 රු.2,248 ක් භාවිතා කිරීම හේතුවෙන්, මීටර් 659.86 කට රු.590 ක් බැගින් රු.388,752 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | සම්මත මිල ගණන් (WSR) අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. | සංශෝධිත WSR නොලැබීම හා මහජන ඉල්ලීම මත පැවති WSR භාවිතා කර විනිවිදභාවයකින් ක්‍රියාත්මක කළ බව. | නිවැරදි වාරි සම්මත මිල ගණන් අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම හා අලාභය අය කර නොමැත. |

## 3.171 තුම්පනේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 368,129,036 | 88,107,337 | 280,021,699 | 916,334 | තත්ත්වාගණනය කළ |
| **2022** | 376,973,067 | 83,287,186 | 293,685,881 | 333,345 | තත්ත්වාගණනය කළ |
| **2023** | 357,567,462 | 15,322,933 | 342,244,529 | 1,656,302 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු හිටපු සභාපතිවරයා භාවිතා කළ මෝටර් රථය 2014 වරසරේදී ගිනි ගැනීමකට ලක් වී අනතුරක් සිදුවී තිබුණද ඒ සම්බන්ධව හිටපු සභාපතිවරයා විසින් පොලිසීයේ පැමිණිලි කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධව අනතුර සිදුවී වසර 03 කට පසුව මු.රෙ.104(3) පරීක්ෂණයක් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මු.රෙ.104(4) පරීක්ෂණ සිදුකර වගකිවයුත්තන් හඳුනාගෙන නොතිබුණි. 2023 පෙබරවාරි 16 දිනැති | 2023 | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකළ යුතු අතර අදාළ නීතිමය ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතුය. | වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන ඇති අතර අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පැවතුණි. | වගකිව යුතු පාර්ශවයෙන් අලාභය අයකරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභා වාර්තාව අනුව මෝටර් රථය පන ගැන්වීමට පමණක් වැයවන අලුත්වැඩියා වියදම රු.1,009,400 ක් බැවින් දළ වශයෙන් රු.1,009,400 ඉක්මවන අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | | | | |
| (ආ) | එකතුව රු.27,020,461 ක වාහන 04 ක් හා යන්ත්‍රයක් වසර 01 ත් වසර 08 ත් අතර කාල පරාසයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. වි | 2023 | අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වත්කම් අලුත්වැඩියා කිරීමත් අනෙකුත් වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා සිදුකිරීම හා වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා සිදුකිරීම හා වෙන්දේසි කිරීම සිදුකර නොමැත. |

## 3.172 පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 521,269,188 | 44,122,331 | 477,146,857 | 16,124,937 | තත්ත්වාගණනය කළ |
| **2022** | 579,776,696 | 20,840,798 | 558,935,898 | 22,130,179 | තත්ත්වාගණනය කළ |
| **2023** | 651,304,832 | 27,916,710 | 623,388,122 | 44,096,865 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.18,550,388 ක් වූ අතර, රු.10,000 ඉක්මවූ ජල පාරිභෝගිකයින් 824 දෙනෙකුගෙන් රු. 6,000,311 ක හිඟයක් විය. | 2023 | හිඟ ශේෂ අයකළ යුතුය. | ජංගම සේවා පවත්වා අය කරන බව. | සැලකියයුතු ප්‍රමාණයක් අය වී නොමැත. |
| (ආ) | 2016 වර්ෂයේදී සභාබල ප්‍රාදේශයේ ග්‍රාම නිලධාරී වසම් 09 ක් ආවරණය වන සේ රු. මිලියන 70.39 ක ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කළ අංකෙලිපිටිය මොරගොල්ල ජල ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 51.16 ක් වැය කර 2018 වර්ෂයේ සිට අතරමඟ නවතා දමා තිබුණි. නිමකල වටිනාකමින් රු.මිලියන 19.2 ක් තවදුරටත් | 2023 | අදාළ මුදල් ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව. | මෙතෙක් ව්‍යාපෘතිය ක්‍රියාතමකව නොතිබුණි. |

කොන්ත්‍රාත්කරුවන් ට ගෙවීමට තිබුණි. සහා බල ප්‍රදේශයේ උග්‍ර පානීය ජල හිඟයක් පවතින අතර මහ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට පත්ව තිබුණි. එසේ වුවද අදාල ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර දැනට වැය කර තිබූ රු. මිලියන 51.16 නිෂ්කාර්ය වී තිබුණි. මෙම ව්‍යාපාතිය සඳහා කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගෙන තිබුණු රු.3,582,000 ක් වටිනා ජල මෝටර් 4 ක් හා රු.2,587,000 ක් වටිනා විදුලි සැපයුම් යනාදිය නිෂ්කාර්යව පැවතුණි.

**3.173 උඩපළාත ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 896,729,198 | 32,933,727 | 863,795,471 | (1,929,384) | තත්ත්වාගණනය කළ |
| **2022** | 891,598,943 | 19,388,828 | 872,210,115 | 2,647,808 | තත්ත්වාගණනය කළ |
| **2023** | 944,303,307 | 22,151,565 | 922,151,742 | 1,969,082 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් හිඟ හිටි ජල ගාස්තු රු.3,095,924 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි පාරිභෝගිකයින් 171 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,230,891 ක් හා ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වසර 05 ක කාලයක් ඉක්මවා ඇති හිඟ ජල පාරිභෝගිකයින් 165 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,199,099 ක් ඇතුළත්ව තිබුණි. | 2021 | හිඟ ජල ගාස්තු අය කර ගැනීමට සඳහා කටයුතු කළ යුතුය | හිඟ ජල බදු අය කර ගැනීමට විසන්ධි නිවේදන යවා ඇති අතර, අය කර ගත නොහැකි ශේෂ සභා අනුමැතියක් මත කපා හැරීමට කටයුතු කරන බව | 2023 වර්ෂය අවසාන වන විට ද රු.803,614ක් අයකර නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවලඇ තුළත් හිඟ හිටි කඩ කුළී රු.2,979,594 ක් අය කර නොතිබුණු | 2021 | හිඟ කඩ කුළී ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය | පුස්සැල්ලාව උප කාර්යාලයේ හිඟ ආදායම් හඳුනා ගැනීමේ ගැටළුවක් පවතින අතර, අනෙකුත් හිඟ | වර්තමානය වන විට ද මෙම හිගයෙන් රු.2,030,454 ක් අය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි කඩ කාමර 66 ක් සඳහා අය විය යුතු රු.2,842,130 ක් හා ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වසර 05 ක කාලයක් ඉක්මවා ඇති කඩ කාමර 37 කින් අය විය යුතු රු.2,138,578 ක් ඇතුළත්ව තිබුණි. | | | මුදලින් කොටසක් අය කර ඇති අතර, ඉතිරි මුදල් අය කර ගන්නා බව | |
| (ඇ) | පුස්සැල්ලාව කළුගලවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ දී, තරුණ අභිවෘද්ධි සහ සමාජ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කොන්ත්‍රාත්කාර සමිතිය විසින් රු.956,809 ක වැඩ වටිනාකමකට ඉදිකිරීම් අවසන් කර තිබුණි. එම කොන්ත්‍රාත්කාර සමිතියට අදාළ කොන්ත්රාත් වටිනාකම නොගෙවීම හේතුවෙන්, කොන්ත්‍රාත්කාර සමිතිය විසින් නඩු පවරා තිබුණු අතර, 2023 මාර්තු 24 දිනැති නඩු තීන්දුව අනුව, කොන්ත්‍රාත්කරුට | 2023 | වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය | අදාළ පරීක්ෂණ කටයුතු මත ඉදිරි කටයුතු සිදු කරන බව | පරීක්ෂණ පවත්වා අලාභ අය කර නොමැත. |

රු.2,519,240 ක වන්දි මුදලක් ගෙවීමට සභාවට නියෝග කර ඉන් රු.1,007,696 ක් ගෙවා තිබුණි. සභාවට සිදු වූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර නොතිබුණි.

**3.174 පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 278,028,767 | 49,510,106 | 228,518,661 | 9,900,042 | තත්ත්වාගණනය කළ |
| **2022** | 288,145,890 | 39,860,095 | 248,285,795 | 190,197 | තත්ත්වාගණනය කළ |
| **2023** | 295,029,946 | 22,467,777 | 272,562,169 | 18,771,870 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| එකතුව රු.13,919,744 ක වාහන 03 ක් හා යන්ත්‍රෝපකරණයක් සහ වටිනාකම හඳුනාගත නොහැකි වාහනයක් වසර 03 ත් 07ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | 2023 | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හා භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | අලුත්වැඩියාවන් කිරීමට හා වෙනත් සභාවකට පැවරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගෙන නොතිබූ අතර අපහරණය කළ හැකි වත්කම් අපහරණය කර නොතිබුණි. |

## 3.175 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 331,988,147 | 49,102,039 | 282,886,108 | 4,892,324 | තත්ත්වාගණනය කළ |
| **2022** | 387,880,533 | 92,167,862 | 295,712,671 | 9,819,510 | තත්ත්වාගණනය කළ |
| **2023** | 354,997,738 | 43,865,865 | 311,131,873 | 18,021,596 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාවට අයත් ජල ව්‍යාපෘති 06 ක ජල පාරිභෝගිකයින් 587 කගෙන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අය කළ යුතු ජල සම්බන්ධතා ගාස්තු එකතුව රු.3,579,406 ක් අය කර නොතිබුණි. | 2021<br>2023 | හිඟ ගාස්තු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගෙන නොමැත. |

## 3.176 අයගම ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 174,622,482 | 39,699,737 | 134,922,745 | 6,293,292 | තත්ත්වාගණනය කළ |
| **2022** | 146,401,713 | 25,715,260 | 120,686,453 | (2,248,357) | තත්ත්වාගණනය කළ |
| **2023** | 169,405,318 | 35,348,166 | 134,057,152 | (3,672,870) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 08 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2022 | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතු වේ. | මේ සඳහා නීති සහය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ පැවැති අනවසර ඉදිකිරීම් 43 ක් නියමානුකූල කිරීමට හෝ ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | මේ සඳහා වූ නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව. | අයගම නගරයේ පවතින බොහෝ ඉදිකිරීම් ගඟ රක්ෂිතය හා මාර්ග රක්ෂිතය තුළ පිහිටා ඇති හෙයින් මෙම ඉදිකිරීම් නියමානුකූල කිරීමට වර්තමානයේදී උත්සාහ කළද එය ප්‍රාදේශීය සභාවට පමණක් සිදු කළ හැකි කාර්යක් නොවන බවත් ඊට අදාළ නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන පෙර පාසලක දරුවන්ගෙන් 2023 වර්ෂය තුළ අයකරගත් රු. 1,776,000 ක් සභාව වෙත බැඳීමට කටයුතු නොකර පෙර පාසලේ ගුරුවරියන් අතර බෙදා ගෙන තිබුණි. අනුමත කාර්ය මණ්ඩලය තුළ පෙර පාසැල් ගුරු තනතුරක් අනුමතව නොතිබීම නිසා එම ගාස්තු සභාව වෙත අයකරගෙන ගුරුවරියන් වෙත දීමනා ගෙවීමට නොහැකිව තිබුණු අතර සභා ගොඩනැගිල්ල සඳහා කුලියක් අයකිරීමට ද කටයුතු කර නොතිබුණි. | 2023 පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 01/2021 අනුව කටයුතු කළ යුතු වේ. | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පෙර පාසල් පාලිකා තනතුරක් නොමැති වීම නිසා ඔවුන්ට නිශ්චිත වැටුපක් තීරණය කළ නොහැකි වේ. පෙර පාසල් දරුවකුගෙන් අයකරනු ලබන මුදල ද සභාව තීරණය කර නොමැති බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.177 ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 391,086,925 | 50,699,035 | 340,387,890 | 15,518,245 | තත්ත්වාගණනය කළ |
| **2022** | 361,617,264 | 31,950,236 | 329,667,028 | 991,015 | තත්ත්වාගණනය කළ |
| **2023** | 407,390,774 | 35,187,501 | 372,203,273 | 29,708,366 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1500 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 16,041,867 ක පිරිවැයක් හා කාර්යය මණ්ඩල සේවකයින් 21 දෙනෙකු ද වාහන 04 ක් ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව බේරුවාන ප්‍රදේශයේ භූමියක වලවල් හාරා ඒ තුළට අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දමා තිබුණි. මේ සම්බන්ධයෙන් මහජන පැමිණිලි | 2021 | කසළ කළමනාකරණ සැලැස්මට අනුමැතිය ලබාගෙන ඒ අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදුකළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය සැලැස්මක් මේ වනවිට සකස් කර ඇති අතර, අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව හා මේ වනවිට බේරුවාන කොම්පෝස්ට් අංගනයේ කාබනික පොහොර නිපදවන බැවින් බැහැරලීමට වැඩි කසළ ප්‍රමාණයක් නොමැති බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලැබී ඇත. | | | | |
| (ආ) | මුදල් රෙගුලාසි 371 (5) අනුව, 1995 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලය තුළ අවස්ථා 41ක දී ලබා දී තිබුණු රු. 1,902,321 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | 2022 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 1993 වර්ෂයේ සිට 2009 වර්ෂය තෙක් නොපියවා ඇති අත්තිකාරම් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට හා 2010 වර්ෂයේ සිට 2019 දක්වා වූ අත්තිකාරම් පියවා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | රු. 99,068 ක අත්තිකාරම් අවස්ථා 04 ක් පියවා ඇති අතර කපා හැරීමට අනුමැතියට යැවූ 1993 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වන අත්තිකාරම් සම්බන්ධයෙන් උපදෙස් පරිදි මු.රෙ. 104 පරීක්ෂණයක් සිදු කරන බව දන්වා ඇත. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට රු. 23,616,980 ක් වූ හිඟ වරිපනම් හා අක්කර බදු ශේෂය තුළ වසර 05 ට වඩා පැරණි රු. 16,903,961 ක ශේෂයක් විය. | 2022 2023 | හිඟ ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. | ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව. | 2024 ජූලි 31 දින වන විට හිඟ මුදලින් රු. 3,408,247 ක් අයකර ගෙන ඇති අතර සම්පූර්ණ හිඟ ශේෂය අයකරගෙන නොමැත. |
| (ඈ) | දුරකථන කුළුණු 14 කින් වර්ෂ 2004 - 2021 කාලය සඳහා ව්‍යාපාර බදු අය නොකිරීම නිසා රු. 525,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | 2023 | හිඟ ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. | ඉදිරියේ දී ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ පනවාගත යුතු අතුරු ව්‍යවස්ථා 30 න් 28 ක්ම පනවා ගෙන නොතිබුණි. | 2023 | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතු වේ. | ඒ සඳහා කටයුතු කරමින් පවතින බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.178 ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 257,070,481 | 119,428,065 | 137,642,416 | (1,722,924) | තත්ත්වාගණනය කළ |
| **2022** | 265,173,386 | 149,347,517 | 115,825,869 | (27,464,380) | තත්ත්වාගණනය කළ |
| **2023** | 806,448,100 | 84,953,202 | 721,494,898 | 15,472,320 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 මැතිවරණයෙන් තේරී පත් වූ සභිකයින් 07 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාරව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 2022 | වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වත්කම් බැරකම් ප්‍රකාශ භාර දෙන ලෙසට දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 11 ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2022 | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා 19 ක් වැළඳගෙන ඇති අතර ඉතිරි කාරණා 11 න් 04 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කරමින් පවතින බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | සභාව භුක්ති විඳින අක්කර 03 රූඩ් 02 පර්චස් 10 ක් වූ ඉඩම් | 2022 | වත්කම්වල අයිතිය පැවැත්ම හා ආරක්ෂාව | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 07 ක් හා වපසරිය නොදත් තුංකම සතිපොල ඉඩමේ අයිතිය පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | | තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | | |
| (ඈ) | මුදල් රෙගුලාසි 371(5) අනුව, 2013 වර්ෂයේදී දී ලබා දී තිබුණු රු. 130,853 ක අත්තිකාරම් 02 ක් පියවා නොතිබුණි. | 2022<br>2023 | මෙම මුදල් කඩිනමින් පියවා ගත යුතු වේ. | දිස්ත්‍රික් විගණන කමිටුව විසින් අධිහාර කිරීම සුදුසු බව නිර්දේශ කර ඇති බව. | දිස්ත්‍රික් විගණන කමිටුව විසින් අධිහාර කිරීම සුදුසු බවට යෝජනා කර ඇත. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට රු. 9,332,561 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05 ට වඩා පැරණි රු. 1,433,568 ක ශේෂයක් විය. | 2022<br>2023 | සභාවේ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. | ජංගම සේවා වැනි විවිධ ක්‍රම මඟින් හිඟ අයකර ගන්නා බව. | වසර 05 ට වැඩි හිඟයෙන් ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙන් අය වීමට ඇති රු. 730,248 ක මුදල රාජ්‍ය භාණ්ඩාගාරයෙන් අය කර ගැනීම සඳහා යොමුකර ඇති බවත්, සමස්ථ හිඟ මුදලින් 2024 ජූලි 31 දිනට රු. 1,583,981 ක මුදලක් අය කර ගෙන ඇති බව දන්වා ඇත. |
| (ඊ) | ජලජ පරිසරයක් දූෂණය කරමින් හා මහජන විරෝධතා පවා නොසලකමින් චන්ද්‍රිකා වැව් ඉස්මත්තේ පිහිටි භූමියකට 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කසළ මෙට්‍රික් ටොන් 3029ක් බැහැර කර තිබුණි. | 2021<br>2022<br>2023 | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු වේ. | කසළ බැහැර කිරීමට ඉඩමක් නොමැති නිසා කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.179 ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 205,841,632 | 26,562,699 | 179,278,933 | 3,035,488 | තත්ත්වාගණනය කළ |
| **2022** | 181,993,913 | 5,436,262 | 176,557,651 | (938,407) | තත්ත්වාගණනය කළ |
| **2023** | 267,600,848 | 8,915,766 | 258,685,082 | 6,832,893 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හි දී රු. 4,561,397 ක් වැයකර තිබුණ ද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි ඉතිරි සංවර්ධන කටයුතු සිදුකර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එය නිෂ්කාර්යයව පැවතුණි. | 2021 | ප්‍රතිපාදන සපයා ගෙන පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධනය කළ යුතු වේ. | 2018 වසරේ මෙම පොළ භූමියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සති පොළ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු අනුමැතියට යවා ඇති අතර මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු සතිපොළ වෙළඳුන්ට පරිහරණය කළ හැකි පරිදි සකස් කිරීමට කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (අ) සහ (ආ) උපවගන්ති පරිදි සභාව සතු මාර්ග හඳුනාගෙන ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | 2022 | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2023 මැයි මාසය වන විට මාර්ග ගැසට් ලේඛනය නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | පනතේ ප්‍රකාරව කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | පාරිභෝගිකයින් 2209 දෙනෙකුට ලබා දෙන ජලය බීමට සුදුසු ද යන්න පරීක්ෂා කර නොතිබුණි. යොදා තිබුණු ජල මීටර් 145 ක් අක්‍රියව පැවැති අතර 2024 මාර්තු 31 දිනට රු. 5,316,619 ක හිඟ ජල ගාස්තු අය වීමට පැවැතිණි. | 2023 | අදාළ පරීක්ෂණ සිදුකළ යුතු අතර හිඟ ගාස්තු අයකරගත යුතු වේ. | පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කර ඇති බව, අක්‍රිය මීටර් අලුත්වැඩියා කරමින් පවතින බව හා හිඟ අයකර ගැනීමට ජංගම වැඩසටහන් පැවැත්වීම හා ජල සම්බන්ධතා විසන්ධි කිරීමට කටයුතු කෙරෙන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඈ) | සංවර්ධිත ප්‍රදේශ ලෙස 2018 වර්ෂයේදී හඳුනාගත් කලාපවල පදිංචි පවුල් ඒකක 783 කින් වරිපනම් බදු අයකර නොතිබුණි. | 2023 | ආදායම් නොපමාව අය කළ යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | පෙර පාසල් 02 ක ළමුන්ගෙන් 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් අයකළ රු. 800,000 ක ගාස්තු සභා අරමුදලට බැරකර නොතිබුණි. එසේ වුවත්, එම පෙර පාසැල්වල පාලිකාවන් වෙත රු. 12,000 බැගින් මාසික දීමනා ගෙවා තිබුණු අතර, සියලු නඩත්තු කටයුතු ද සභාව මඟින් ඉටුකර තිබුණි. | 2023 | ව්‍යාජ පිළිතුරකි . රු. 1,000 බැගින් මාසික ගාස්තු අය කෙරේ. දරුවන්ගෙන් අයකරන ගාස්තු සභා අරමුදලට බැර කළ යුතු වේ. | සභාව සතුව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් එහි අනෙකුත් නඩත්තු කටයුතු සිදුකරන්නේ පෙර පාසල මඟිනි. ඒ සඳහා මුදල් අයකර ඇති අතර, එය මාසිකව සිදුකළ අයකිරීමක් නොවන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඊ) | පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 42 ක් වැයකර ඉදිකළ 2016 වර්ෂයේදී සභාවට | 2023 | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. | මෙම ගොඩනැගිල්ල ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදවා ගැනීමට සාකච්ඡා කරමින් | මෙම ගොඩනැගිල්ල සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ආදායම් උපයා ගැනීම සඳහා |

| | | |
|---|---|---|
| පවරා දුන් ගලගම බහුකාර්යය ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | පවතින බව. | අලුත්වැඩියා කටයුතු සිදුකිරිමට පළාත් සභා සංචාරක කටයුතු අමාත්‍යාංශයෙන් රු. 8,500,000 ක ප්‍රතිපාදන වෙන්කරදී ඇති බැවින් ඒ අනුව අලුත්වැඩියා කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතව ඇත. |

**3.180 කලවාන ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 146,645,348 | 97,712,738 | 48,932,610 | (18,026,434) | අහිතකර |
| **2022** | 131,110,086 | 60,495,995 | 70,614,091 | 4,721,578 | තත්ත්වාගණනය කළ |
| **2023** | 156,330,263 | 64,093,548 | 92,236,715 | 1,950,847 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 17,167,333 ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු, මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | 2022 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | තවදුරටත් සොයා බලා මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | කසළ අංගනයක් සඳහා ඉඩමක් ලබා ගැනීමට 2021 වර්ෂයේ දී කලවාන ප්‍රාදේශීය ලේකම් වෙත රු. 50,000 ක් ගෙවා තිබුණද, අත්පත් කර ගැනීමේ කටයුතු නිමකර නොතිබුණි. එමෙන්ම, නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණය සඳහා 2022 අගෝස්තු මාසයේ පළාත් සභාවෙන් ලද රු. 950,000 ක් | 2022 | ඉඩම පවරා ගැනීම හා තෙකලා විදුලි සැපයුම ලබාගෙන බෙලර් යන්ත්‍රය උපයෝජනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | සභාවේ මුදල් තත්ත්වය යහපත් වූ පසු මෙම කාරණා අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවන ලද මුදල නැවත ගෙවීමට කටයුතු කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව සහ බෙලර් යන්ත්‍රය දැනට කලවාන පොදු ආදාහනාගාර භූමිය තුළ සවිකිරීමට අදාළ කටයුතු සිදු කරමින් ඇත. කසල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වටිනා බෙලර් යන්ත්‍රය 2023 ජනවාරි වනවිටත් අභාවිතව පැවතුණි. | | | | |
| (ඇ) | වාර්ෂිකව කසළ මෙට්‍රික් ටොන් 1620 ක් පමණ බැහැර කිරීමට සේවකයින් 05 දෙනෙකු සහ වාහන හා යන්ත්‍ර උපකරණ 02 ක් වෙනුවෙන් රු. 4,187,615 ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණි. | 2022 | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා සුදුසු භූමියක් නිරීක්ෂණය කරමින් පවතින බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඈ) | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂයේදී රැගෙන ගොස් තිබුණු ගල්රෝල ආපසු භාර දී නොතිබුණි. එය මාස 08 ක පමණ කාලයක් වැද්දාගල ප්‍රදේශයේ නිවසක රඳවා තිබිය දී එහි බැටරි 02 ක් සොරකම් කිරීමෙන් වූ රු. 187,260 ක හානිය ප්‍රතිපූරණය කර නොතිබුණි. | 2022 | හිඟ ආදායම් රැස්කර ගැනීමටත්, හානිය ප්‍රතිපූරණය කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇති අතර රු. 265,360 ක කුලී වටිනාකමින් රු. 168,900 ක් මේ වනවිට අයකරගෙන ඇති බව. | මාර්ග තලනයට සිදුව ඇති හානිය මේ දක්වා ප්‍රතිපූර්ණය කරගෙන නොමැති අතර ඒ සම්බන්ධයෙන් මු.රෙ.104 අනුව පරීක්ෂණ අවසන් කර නොතිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 177(1) පටහැනිව, 2023 සැප්තැම්බර් මාසයේ ආදායම් නිළධාරීන් රැස් කළ රු. 317,204 ක් ප්‍රේෂණය කිරීමට 2024 ජනවාරි දක්වා | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සම්පූර්ණ මුදල් අය කර ඇති බව හා නිලධාරියා සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

ප්‍රමාද කර තිබුණි.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | පහළකන්ද, පාලින්දගොඩ පර්චස් 160 ක් වූ සුසාන භූමියෙන් පර්චස් 124 ක්ම අනවසරකරුවන් විසින් 1997 වර්ෂයේ සිට අත්පත් කරගෙන තිබුණද, ඊට එරෙහිව කිසිදු නීතිමය පියවරක් මේ දක්වාම ගෙන නොතිබුණි. | 2023 | අනවසරකරුවන් ඉවත් කිරීමට නීතිමය පියවර ගත යුතු වේ. | නීති උපදෙස් ලබාගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.181 කුරුවිට ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 337,601,118 | 220,198,983 | 117,402,135 | (34,050,836) | අහිතකර |
| **2022** | 434,737,564 | 177,170,003 | 257,567,561 | 55,960,976 | ව්‍යාවනය කළ |
| **2023** | 398,423,238 | 118,867,885 | 279,555,353 | (7,339,125) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 115(2), (3), (4) ප්‍රකාරව, 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු. 50,266,187 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | 2021 | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ පැවත එන ණයහිමි ශේෂ, ආදායමට ගැනීමෙන් ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීම පිළිබඳව මුදල් රෙගුලාසි අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | 2023 දෙසැම්බර් 31 වන විට ණයහිමි ලේඛනයේ රු. 12,690,785 ක මුදලක් ගෙවා ඇති අතර ශේෂය රු. 37,575,402 ක මුදලක් තවදුරටත් ගෙවීමට ඇත. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2021 ජුනි දක්වා හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 60 කින් 10 ක් සඳහා පමණක් නෛතික කටයුතු ආරම්භ කර තිබුණි. අනෙකුත් අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමට හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් ගනු | 2021 | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පවතින නීතිරීති අනුව කටයුතු කළ යුතුය. | අනවසර ඉදිකිරීම් 10 ක් සඳහා නඩු පවරා ඇති බවත් ඉතිරි අනවසර ඉදිකිරීම් සඳහා කඩා ඉවත් කිරීමේ නියෝග යැවූ බවත්, ඉතිරි ඒවා සඳහා නඩු පැවරීමට නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ගැසට් නොකල නිසා නොහැකි වී | අනවසර ඉදිකිරීම් 10 ක් සඳහා නඩු පවරා ඇති අතර ඉතිරි අනවසර ඉදිකිරීම් සඳහා නඩු පැවරීමට නැවත පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන දැන්වීම් ලිපි යවන ලෙස නීතීඥවරයා උපදෙස් ලබා දී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලැබූ ක්‍රියාමාර්ග මොනවාද යන්න විගණනයට ඉදිරිපත් නොවුණි. | | | ඇති බව. | |
| (ඈ) | අයිතිය සභාව සතු නොවූ කැබ් රථයක් 2015 වර්ෂයේ සිට අභාවිතව තිබී පසුව 2022 මැයි මාසයේ දී එය ගිනි තබා විනාශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව හානිය හා වගකිව යුතු අය නිශ්චය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | 2022 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අධිකරණ කටයුතු අවසන් වී නොමැත. 2018 අංක 34 දරන හානිපූර්ණ කාර්යාල පනත යටතේ අලාභ අය කිරීමට ජනාධිපති කාර්යාලය වෙත යොමුකර ඇත. හානිය පිළිබඳ මු.රෙ.104 යටතේ පරීක්ෂණ සිදුකර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බව. | මෙම අනතුර සම්බන්ධව රත්නපුර අධිකරණයේ නඩු අංක 66041/A යටතේ අධිකරණමය කටයුතු සිදුකරමින් ඇත. |
| (ඇ) | සභාවේ නඩු කටයුතු සඳහා රු. 25,000 ක මාසික දීමනාවකට නීතිඥවරයෙකුගේ සේවය ලබා ගැනීමට 2021 ජූලි 16 දින පැවති මහා සභාවේ දී තීරණය කර එදිනම ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව නීතිඥවරයෙකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. පසුව, 2021 ජූලි සිට 2022 දෙසැම්බර් දක්වා ඔහු වෙත රු. 425,000 ක් මාසික දීමනා ලෙස ගෙවා තිබුණි. එහෙත්, ඊට අමතරව එම කාලපරිච්ඡේදය වෙනුවෙන්ම සභාවේ | 2022 | මාසික දීමනාවක් ගෙවා නීතිඥවරයෙකු ගේ සේවය ලබා ගන්නේ නම් නඩු කටයුතු සඳහා අමතර ගාස්තු නොගෙවිය යුතු වේ. | විශාල මුදලක් වැය වන නඩු කටයුතු වෙනුවෙන් නීතිඥවරයකු පත්කර ගැනීමට සහ මාසික දීමනාවක් ලබාදීමට මහා සභාවේ යෝජනා ස්ථිර කර ඇති බවත් නීතිඥවරයා සමඟ ගිවිසගත් දිනට පෙර සිට ඔහු විසින් සහ අනෙකුත් නීතීඥවරු විසින් මෙහෙයවන නඩු සඳහා ගාස්තු ගෙවා ඇති බව. | මාසික දීමනාවක් ගෙවා නීතිඥවරයෙකුගේ සේවය ලබාගැනීම 2023 පෙබරවාරි මස සිට නතර කර ඇති අතර මේ සම්බන්ධයෙන් මු.රෙ. 104 අනුව පරීක්ෂණයක් සිදු කර පාඩුව සම්බන්ධයෙන් අයකිරීම් සිදුකළ යුතු අයට ඔවුන්ගෙන් අයවියයුතු මුදල් ප්‍රමාණයන් 2024 අගෝස්තු 28 දිනැති දන්වා යවා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නඩු කටයුතු සඳහා ඔහු වෙත තවත් රු. 103,920 ක් හා වෙනත් නීතීඥවරුන් වෙත රු. 578,627 ක් ගෙවා තිබුණි. | | | | |
| (ඉ) | මුදල් රෙගුලාසි 371 (5) අනුව, 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අවස්ථා 27 කදී නිකුත් කළ අත්තිකාරම් රු. 2,597,900 ක් මේ දක්වාම පියවා නොතිබුණි. | 2022, 2023 | එම මුදල් කඩිනමින් පියවාගත යුතු වේ. | පරීක්ෂණ මණ්ඩලය ලබා දුන් නිර්දේශ අනුව අත්තිකාරම් පියවීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | මු.රෙ. 104 (4) පරීක්ෂණයක් පවත්වා ඇති අතර, වාර්තාව මෙතෙක් ලැබී නැති බව හා 2023 දෙසැම්බර් 31 දින වන විට රු. 17,080 ක මුදලක් පියවා ඇත. |
| (ඊ) | වෙළඳ සංකීර්ණයේ වූ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේදී රු. 3,188,688 ක් වැඩිපුර ගෙවා තිබුණි. එය රු. 34,793,520 ක් වැයකර 2022 වර්ෂයේ නිමකර තිබුණ ද, මූලික අවශ්‍යතා අසම්පූර්ණ වීම නිසා 2023 දෙසැම්බර් වන විටත් නිෂ්කාර්යයව පැවතිණි. | 2023 | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු අතර වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. | ප්‍රමාණවත් පිළිතුරු ලබා දී නොතිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.182 කොලොන්න ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 271,412,124 | 66,271,237 | 205,140,887 | 3,493,747 | තත්ත්වාගණනය කළ |
| **2022** | 264,948,483 | 61,372,361 | 203,576,122 | 7,926,003 | තත්ත්වාගණනය කළ |
| **2023** | 262,436,660 | 28,376,858 | 234,059,802 | 11,951,535 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව සතු සුසාන භූමි 49 කින් 32 ක අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි. | 2022 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව. | ඉඩම්වල පවතින පොදු ගැටළු වන අනවසර වගාව පැවතීම, ඉඩම් කිහිපයක ස්ථිර පදිංචිය හා ඉඩම් කොටස්වල රජයේ ගොඩනැඟිලි පිහිටීම යනාදිය විසදා ගනිමින්, එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලව සිදු කරමින් පැවතුණි. |
| (ආ) | හලර් යන්ත්‍රයක් මිල දී ගැනීමට ආයතන 02 කින් මිල ගණන් ලැබී තිබුණ ද, එක් ආයතනයකින් පමණක් මිළ ගණන් ලද බවට සාවද්‍ය ලෙස කරුණු දක්වා තිබුණි. මේ නිසා ඇගැයීමකට ලක්නොවූ ආයතනය විසින් ඉදිරිපත් කළ අවම මිල | 2022 | පිළිතුරු සාවද්‍ය වේ. අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. | අවම මිල ඉදිරිපත් කළ ආයතනයේ යන්ත්‍රය පිරිවිතර වලට අනුකූල නොවීම නිසා අනෙක් ආයතනයෙන් යන්ත්‍රය මිලදී ගත් බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

නොපිළිගැනීම නිසා
සභාවට රු. 644,400
ක් මූල්‍යමය හානියක්
සිදු වී තිබුණි.

**3.183 ගොඩකවෙල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 319,048,849 | 120,422,742 | 198,626,107 | (42,458,273) | තත්ත්වාගණනය කළ |
| **2022** | 348,945,326 | 110,873,026 | 238,072,300 | 161,980 | තත්ත්වාගණනය කළ |
| **2023** | 560,478,610 | 310,118,971 | 250,359,639 | (1,098,235) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 09 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2022 | පනත අනුව කටයුතු කළ යුතු වේ. | 21 වන අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන වාර්ෂිකව ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන බව. | මේ දක්වා අතුරු ව්‍යවස්ථා පනවා නැත. |
| (ආ) | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා හඳුනාගත් අනවසර ඉදිකිරීම් 25ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව ඉවත් කර නොතිබුණි. | 2022 | ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වනවිට කාර්මික නිලධාරින් විසින් අනවසර ඉදිකිරීම් පිළිබඳ පසු විපරම් සිදු කරන බව. | මේ දක්වා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | බලවින්න කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් අත්හැර දැමීම නිසා ඒ සඳහා ගෙවූ රු. 1,223,807 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | 2022 | ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කඩිනමින් නිම කළ යුතු වේ. | එම වැඩ නිමකළ නොහැකි වුවද, කසළ ගැටළුව විසඳීමට මුදල් ලබා දීමට පළාත් ප්‍රධාන අමාත්‍යාංශය එකඟ වී ඇති බව. | ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | නොදිරන කසළ රැස්කිරීමේ මධ්‍යස්ථානය ඉදි කිරීමේදී පිරිවිතරවලට අනුකූල නොවූ වැඩ සඳහා රු. 92,752 ක් ගෙවා තිබුණි. | 2022 | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. | මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | රක්වාන නගරයේ ළමා උද්‍යානය ඉදිකිරීමේදී ඇස්තමේන්තුගත පිරිවැය රු. 533,936 කින් ඉක්මවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එමෙන්ම, වැඩ විෂයයන් 04 ක් සඳහා රු. 198,535 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. | පළාත් ඉංජිනේරු උපදෙස් පරිදි ගෙවීම් කරන ලද අතර වැඩිපුර ගෙවා ඇති රු. 50,812 ක් රැඳවුම් මුදලින් අඩුකර ගත් බව. | සම්පූර්ණ වැඩිපුර ගෙවීම් අයකරගෙන නොතිබුණි. |

**3.184 නිවිතිගල ප්‍රාදේශිය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 273,221,855 | 54,588,588 | 218,633,267 | 9,776,086 | තත්ත්වාගණනය කළ |
| **2022** | 297,178,206 | 40,889,682 | 256,288,524 | 475,861 | තත්ත්වාගණනය කළ |
| **2023** | 368,100,546 | 23,276,519 | 344,824,027 | 32,298,957 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | නිකුත් කළ කොඩිකණු 96 ක් ආපසු භාර දී නොතිබුණි. ඉන් කණු 15 ක වටිනාකම අයකර ගෙන තිබුණද, රු. 1,032,750 ක් වූ කොඩිකණු 81 ක වටිනාකම, මහා සභා තීරණය පරිදි වගකිව යුතු අයගෙන් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, භාණ්ඩ 35ක ඌනතාවට වගකිව යුතු අය නිශ්චය කර නොතිබුණි. | 2022 | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගත යුතු වේ. | කොඩි කණු 51 ක් ගෙන්වා ගැනීමට නිවේදන නිකුත් කර ඇත. ඉතිරි කණු 30 ගෙන්වා ගැනීමට හෝ ඊට අලාභය අය කිරීමට හෝ කටයුතු කරන බව හා භාණ්ඩ ඌනතා සඳහා වගකිව යුතු අයගේ 2023 අප්‍රේල් මස වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇති බව. | කොඩි කණු පිළිබඳ මූලික විමර්ශනය සිදුවෙමින් පවතින අතර, විමර්ශන කටයුතු අවසානයේ ලබා දෙන නිර්දේශ අනුව කටයුතු කරන බව දන්වා ඇත. |

## 3.185 පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 386,477,229 | 46,400,106 | 340,077,123 | 12,779,086 | තත්ත්වාගණනය කළ |
| **2022** | 246,681,705 | 38,466,944 | 208,214,761 | 11,307,949 | තත්ත්වාගණනය කළ |
| **2023** | 222,917,396 | 51,965,119 | 170,952,277 | (9,074,638) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සභාව විසින් අනුගමනය කර නොතිබුණු අතර, මහජන පැමිණිලි හා ක්ෂේත්‍ර පරීක්ෂාව මඟින් අනවසර ඉදිකිරීම් 66 ක් පමණ හඳුනාගෙන තිබූ අතර, ඉන් 56 ක් සම්බන්ධයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම පමණක් සභාව විසින් සිදුකර තිබුණි. | 2021 | අනවසර ඉදිකිරීම් හඳුනාගෙන නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වේ. | විධිමත් කිරීමට කටයුතු කරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | හිටපු සභිකයෙකු සහ නිලධාරීන් තිදෙනෙකු විසින් 1994 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා | 2022 2023 | හිඟ ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළයුතු වේ. | ණයකරුවන් සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු රැස් කරමින් පවතින අතර, නිරවුල් කිරීමට | අයකර ගත හැකි මුදල් අය කර ගැනීමට හා අයකර ගත නොහැකි මුදල් කපා හැරීමට |

| | | |
|---|---|---|
| කාලය තුළ ලබාගත් ණය මුදලින් හිඟහිටි රු. 94,584 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද, අයකර නොතිබුණි. | ක්‍රියාකරන බව. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. |

## 3.186 බලංගොඩ ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 199,763,264 | 32,425,589 | 167,337,675 | 3,842,440 | තත්ත්වාගණනය කළ |
| **2022** | 532,052,715 | 19,043,936 | 513,008,779 | 1,927,563 | තත්ත්වාගණනය කළ |
| **2023** | 560,908,283 | 16,491,944 | 544,416,339 | 21,002,318 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වේළිඔය නගරයේ 2015 වර්ෂයේ දී ඉදිකළ රු. 27,253,473 ක් වූ දෙමහල් ගොඩනැගිල්ල 2022 වර්ෂය අවසන් වනවිටත් අභාවිතව පැවැතිණි. | 2022 | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුවේ. | ගොඩනැගිල්ල සංවර්ධනය සඳහා ණය මුදලක් ලබා ගැනිමට ගිවිසුම් අත්සන් කර දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත යවා ඇති බව. | මෙම දෙමහල් ගොඩනැගිල්ලේ පහල මහල මේ වන විට කඩ කාමරවලට වෙන් කර ඇති අතර 2025 වර්ෂයේ සිට එම කඩකාමර බදු දීම සඳහා අදාළ කඩකාමර තක්සේරු කර ගැනීමට යොමු කර ඇත. |
| (ආ) | කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සඳහා 2022 වර්ෂයේදී රු. 4,868,664 ක් වැයකර කසළ අංගනයක් ඉදිකර තිබුණද, 2023 වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ නිසා 2022 ජූලි මස ලද රු. 950,000 ක් වූ බෙලර් යන්ත්‍රය ද අභාවිතව පැවැතිණි. | 2021<br>2022<br>2023 | කසළ කළමනාකරණ කටයුතු විධිමත් කළ යුතු වේ. | අවශ්‍ය පහසුකම් සකසා ගැනීමෙන් පසු කසළ අංගනයේ වැඩ කටයුතු ආරම්භ කරමි. ඉන් පසු බෙලර් යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | කසළ අංගනයේ වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය වැසිකිළි පහසුකම්, කාර්යාල ගොඩනැගිලි, කම්කරුවන්, ජල පහසුකම් සකසා ගැනීමෙන් පසු වැඩ කටයුතු ආරම්භ කරන බව හා බෙලර් යන්ත්‍රය කසළ අංගනයේ ස්ථාපිත කර ඇති අතර අවශ්‍ය තාක්ෂණික දැනුම ලද වහාම අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ආරම්භ කළ හැකිව ඇත. |

## 3.187 රත්නපුර ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 176,647,430 | 27,850,189 | 148,797,241 | (2,079,020) | තත්ත්වාගණනය කළ |
| **2022** | 181,458,669 | 20,165,627 | 161,293,042 | 5,627,487 | තත්ත්වාගණනය කළ |
| **2023** | 134,500,111 | 18,999,430 | 115,500,681 | (4,371,388) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාපතිවරයාගේ ගමන් සඳහා භාවිතා කරන කැබ් රථයට 2020 මැයි 06 දින යෙදූ ටයර් 04, මාරුකර නැවත 2021 මාර්තු 08 දින රු. 224,000 ක් වැයකර ජපානයේ නිෂ්පාදිත කි.මී. 50,000 ක් පමණ ධාවනය කළහැකි ටයර් මිලදී ගෙන තිබුණි. මිලදී ගත් ටයර් මාස 02 දින 27 ක් තුළ කිලෝමීටර් 8,936 ක් ධාවනය කිරීමෙන් පසු නැවත 2021 මැයි 27 දින විදේශයක නිෂ්පාදිත ටයර් මාරු කිරීම සඳහා රු. 231,600 ක් වැයකර තිබුණි. මෙසේ මාරු කරන ලද ටයර් හඳුනා ගැනීම සඳහා ටයර් මිලදී ගන්නා අවස්ථාවේ එම | 2021 | ටයර් නිෂ්පාදකයා සහතික කරන අවම දුර හෝ ධාවනය කර මහජන මුදල් උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව පරිහරණය කළ යුතුය. | ටයර්වල හඳුනාගැනීමේ අංක මින් පෙරද ලොග් පොතට ඇතුළත් කර නොමැති බවත්, කාර්මික නිලධාරි වාර්තාව අනුව පරණ ටයර් ගබඩාවට භාර දී ඇති බවත්, සිදුවී ඇති අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට විෂයයභාර නිලධාරී දැනුවත් කිරීමට කටයුතු කරන බව. | මේ සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂයක් පවතින අතර ඉදිරියේ දී එම පරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කිරීමට ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ටයර්වල සඳහන් හඳුනාගැනීමේ අංක ලොග් පොතෙහි ද දක්වා නොතිබුණි. | | | | |
| (ආ) | මුදල් රෙගුලාසි 371 (5) පරිදි, 2005, 2014 හා 2023 වර්ෂවල දී ලබා දී තිබුණු රු. 917,010 ක අත්තිකාරම් 10 ක් පියවා නොතිබුණි. | 2021 2023 | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | අත්තිකාරම් පියවීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම්ගතවීමකින් තොරව සභාපතිවරයාට කුලී පදනම මත 2023 වර්ෂයේදී වාහනයක් ලබා ගෙන ඊට ඉන්ධන සඳහා රු. 76,950 ක් වැයකර තිබුණි. කෙසේ නමුත්, එම කාලය තුළ ඔහු සභාවේ කටයුතු සඳහා සහභාගී වී නොතිබුණු අතර ගරු අධිකරණය විසින් ඔහුට එරෙහිව වරෙන්තුවක්ද නිකුත් කර තිබුණි. | 2022 2023 | සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු වේ. | එම කාලසීමාවේ සේවයේ නියුතුව සිටි සියළුම නිලධාරින් මේ වන විට ස්ථාන මාරු වී ඇති බැවින් මේ පිළිබඳව කරුණු විමසීමෙන් පසුව ඉදිරි කටයුතු කරන බව. | මෙම කාරණය සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් ඉල්ලීමට කටයුතු කර ඇති අතර එම නිර්දේශ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට ඇත. |
| (ඇ) | හිදැල්ලන, වාහන සේවා කිරීමේ ස්ථානයක් ඉදිකිරීම සඳහා ලබා දුන් අවසරය අවලංගු කිරීමට එරෙහිව රුපියල් මිලියන 70 ක වන්දියක් ඉල්ලා 2014 වර්ෂයේදී නඩු | 2023 | මූලික විමර්ශනයක් කළ යුතු වේ. | ලිපිගොනුව අස්ථානගතවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන බව. | මෙම කාරණය සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් ඉල්ලීමට කටයුතු කර ඇති අතර එම නිර්දේශ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පවරා තිබුණි. මෙම ඉදිකිරීමට අදාළ විෂය ලිපි ගොනුව ඉදිරිපත් කරන ලෙස 2023 වර්ෂයේදී ගරු අධිකරණය විසින් නියෝග කර තිබුණ ද, එය අස්ථානගත වී ඇති බවට සභාව විසින් අධිකරණය වෙත දන්වා තිබුණි. | | | | |
| (ඉ) | විෂය නිලධාරිණිය විසින් ඉන්ධන බිල්පත් පියවීමේදී කූට ලේඛන සකස් කර 2023 මැයි සිට 2024 ජනවාරි දක්වා කාලය තුළ රු. 2,227,400 ක පමණ මූල්‍ය අක්‍රමිකතාවක් සිදුකර ඇති බව ඒ සඳහා පත් කළ මූලික විමර්ශන කමිටුව වාර්තා කර තිබුණි. අභ්‍යන්තර වැඩ බෙදීමක් නොමැති වීම මීට හේතුව වී තිබුණි. වවුචර් සමඟ වූ ඉන්ධන ඇණවුම් සියල්ල විකෘති කර ඇති බව ඉතා පැහැදිලි වුවත්, එම වවුචර් පරීක්ෂා කරන, නිර්දේශ කරන, අනුමත කරන හා ගෙවීම් සහතික කරන නිලධාරීන් ඒ පිළිබඳ නොසලකා හැර කටයුතු කර තිබීම ප්‍රශ්නගත විය. | 2023 | මේ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර විධිමත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කළ යුතු වේ. | මේ පිළිබඳව මූලික විමර්ශනයක් හා පොලිස් විශේෂ අපරාධ විමර්ශන ඒකකය මඟින් පරීක්ෂණයක් පැවැත්වෙන බැවින් එම පරීක්ෂණ වාර්තා මත පදනම්ව ඉදිරි කටයුතු කරමි. අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව. | මේ පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වෙන අතර ඉදිරියේ දී එම නිර්දේශ අනුව කටයුතු කිරීමට ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2006 වර්ෂයේදී සභාව විසින් අයුතු ලෙස පෞද්ගලික ඉඩමක් හරහා මාර්ගයක් ඉදිකිරීමට එරෙහිව පවරන ලද නඩුවක තීන්දුව ලෙස, පැමිණිලිකාරියට එම ඉඩමේ නිරවුල් භුක්තිය නැවත ලබා දී තිබුණු අතර වන්දි මුදල්, නඩු ගාස්තු හා නීතිඥ ගාස්තු ලෙස රු. 479,505 ක් 2022 වර්ෂයේ දී ගෙවීමට සභාවට සිදු වී තිබුණි. මාර්ගය ඉදිකිරීමේදී නොසැලකිලිමත් ලෙස කටයුතු කළ පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට 2023 දෙසැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි. | 2022, 2023 | නොසැලකිලිමත් ව කටයුතු කළ පාර්ශවවලින් එම මුදල් අය කළ යුතු වේ. | මේ වන විට මු.රෙ.104 අනුව පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව. | මේ පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වෙන අතර ඉදිරියේ දී එම නිර්දේශ අනුව කටයුතු කිරීමට ඇත. |

**3.188 වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 246,314,103 | 81,979,237 | 164,334,866 | 5,150,349 | තත්ත්වාගණනය කළ |
| **2022** | 345,687,908 | 61,785,406 | 283,902,502 | (8,783,343) | තත්ත්වාගණනය කළ |
| **2023** | 329,839,397 | 43,889,062 | 285,950,335 | 3,934,410 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 12 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2022 | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථා සහ පළාත් සභාව විසින් පැනවූ අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇති බව හා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සකස් කරමින් පවතින බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | සියලු දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලින් ගාස්තු අයකර නොතිබුණි. සභා තීරණයක් ගෙන තිබුණද, අනවසර සම්ප්‍රේෂණ කුළුණකට හා ඔවුන් මාර්ගයට සිදුකළ හානියට එරෙහිව නිතිමය පියවර ගෙන නොතිබුණි. | 2022 | හිඟ ආදායම් අයකළ යුතු අතර සභා තීරණය පරිදි නීතිමය පියවර ගත යුතු වේ. | හිඟ මුදල් සඳහා ආයතන වෙත සිහිකැඳවීම් යවන බව හා මාර්ගය පිළියම් කරන ලෙස එම ආයතනයට දන්වා ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371 (5) අනුව, 2007 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුළ අවස්ථා 14 ක දී ලබා දී තිබුණු | 2023 | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වේ. | නොපියවූ අත්තිකාරම් පිළිබඳ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | අත්තිකාරම් පියවා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු. 828,505 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | | | | |
| (ඈ) | ජල පාරිභෝගිකයින් 2159 දෙනෙකුට සපයන ජලය බීමට නුසුදුසු බවට තහවුරු කර තිබුණි. යොදා තිබුණු ජල මීටර් 165 ක් අක්‍රීයව පැවතීම නිසා පාරිභෝගිකයින්ගෙන් ස්ථාවර ගාස්තුවක් අයකරමින් පැවැතිණි. එමෙන්ම, ජල පාරිභෝගිකයින් 2018 දෙනෙකුගෙන් 2024 අප්‍රේල් 30 දිනට හිඟ ජල ගාස්තු රු. 1,433,323 ක් අයකර නොතිබුණි. | 2022 2023 | ජලය පිරිසිදු කර බෙදා හැරීමට හා හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජලය පිරිපහදු කිරීමට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දන්වා ඇත. ජලය සමඟ රොන්මඩ මිශ්‍රව ඇති බැවින් නව මීටර් සවිකළ හොත් එම මීටර්ද ඉක්මනින් අක්‍රිය විය හැකි බව. | නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.189 රඹුක්කන ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 664,958,405 | 33,298,959 | 631,659,446 | 32,107,023 | තත්ත්වාගණනය කළ |
| **2022** | 719,733,978 | 35,438,322 | 684,295,656 | 17,986,577 | තත්ත්වාගණනය කළ |
| **2023** | 870,992,062 | 35,950,613 | 835,041,449 | 53,430,337 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| රඹුක්කන, කිරිවල්ලාපිටියේ 1986 වර්ෂයේ ඉදිකර තිබුණු මහල් 04 ක ගොඩනැගිල්ලක් සඳහා කිසිදු අනුමැතියක් නොතිබුණි. එහි පැවැති අක්‍රමවත් වූ ජල අපහරණය හා මලපවහනය ප්‍රදේශවාසීන්ට පීඩාවක් ඇතිකර තිබුණි. | 2022 | අනවසර ඉදි කිරීම් හා මහජන අපහසුතා පිළිබඳ සැළකිලිමත් විය යුතු වේ. | මෙම ගොඩනැගිල්ල අයත් ඉඩම අපගේ වරිපනම් බල ප්‍රදේශයට අයත් නොවේ. එසේ වුවත්, ඉදි කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන බව. | මේ වනවිට නඩු කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. |

## 3.190 රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 592,409,117 | 70,746,041 | 521,663,076 | 65,070,410 | තත්ත්වාගණනය කළ |
| **2022** | 575,062,670 | 47,877,496 | 527,185,174 | 34,568,584 | තත්ත්වාගණනය කළ |
| **2023** | 553,048,254 | 44,341,181 | 508,707,073 | 2,433,757 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පළාත් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගෙන මාසිකව අනුමත ඉන්ධන ලීටර් 500 ඉක්මවා 2012 අප්‍රේල් සිට 2020 සැප්තැම්බර් දක්වා ඉන්ධන ලීටර් 17,265.85 ක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිල රථය සඳහා යොදවා තිබුණි. මේ අනුව මුදල් රෙගුලාසි 156(i) අ(i) අනුව නිසි අධිකාරී බලය නොමැතිව සහ 156 (7) ට පටහැනිව ඉන්ධන සඳහා රු.1,898,611 ක් වියදම් දරා තිබුණි. මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | 2021 | අනුමැතිය රහිතව ලබාගෙන ඇති ඉන්ධන සඳහා වැයවූ මුදල් අයකිරීමට කටයුතු කලයුතුය. | සභාපතිතුමාගේ නිල රථය සඳහා අනුමත මාසික ඉන්ධන ප්‍රමාණය ලීටර් 750 දක්වා වැඩිකර ගැනීමට පළාත් විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා යෝජනාවක් මහා සභාව මගින් ඒකමතිකව සම්මත කර ඇති බවත් විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමක් සිදුකර නොමැති බවත් දන්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂාවක් සිදුකර දෙන මෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත 2022 සැප්තැම්බර් මස ඉල්ලීමක් සිදුකර ඇති බව දන්වා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | රුවන්වැල්ල නගර සංවර්ධනයට අදාලව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වෙළඳුන් 23 දෙනකුගේ රු.6.610,000 ක පෙරගෙවුම් මුදල් (Key Money) ලබාගෙන තිබුණු අතර බිම් මහලේ කඩකාමර 6 ක් වෙනුවෙන් රු.3,014,484 ක කොටස් ගෙවීම් 2ක් කර තිබියදී ඉඩමේ අයිතිය සම්බන්ධව පැවරූ නඩුවකට අදාලව ඉඩම් අත්පත්කර ගැනිම් පනතේ 38 වගන්තිය යටතේ අත්පත්කර ගැනීමට අදාල ගැසට්පත්‍රය හා පිඹුරේ සහතිකකල පිටපතක් සභාව විසින් අධිකරණය වෙත ඉදිරිපත් නොකිරීම මත ඉඩමේ අයිතිය පැමිණිලිකාර පාර්ශවයට හිමි වී තිබීමෙන් ඉදිකිරීමට දැරූ රු.4,819,144 ක මුදල ප්‍රාදේශීය සභාවට පාඩුවක් වී තිබුණු අතර, වෙළඳුන්ගෙන් ලබාගත් මුදල් වෙනුවෙන් ව්‍යාපාරික ස්ථාන ලබාදීමටද නොහැකි වී තිබුණි. එහෙත් මේ සඳහා වගකිවයුක්තන් | 2021 | වගකිවයුක්තන් නිශ්චය කර සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කලයුතුය. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය කටයුතු කර දෙන ලෙස කෑගල්ල සහකාර පළාත් පාලන කොමසාරිස් මගින් ඉල්ලීමක් කර ඇති බව. | මේ සම්බන්ධයෙන් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් විමර්ශන කටයුතු සිදුකරමින් පවතින බව. |

නිශ්චය කර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.191 කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 543,053,439 | 14,296,368 | 528,757,071 | (7,583,201) | තත්ත්වාගණනය කළ |
| **2022** | 536,312,674 | 18,305,975 | 518,006,699 | (14,041,880) | තත්ත්වාගණනය කළ |
| **2023** | 565,226,411 | 14,094,773 | 551,131,638 | (17,796,749) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාවට අයත් කහටගස්දිගිලිය සතිපොළෙන් 2023 වර්ෂයේ ජනවාරි සිට ජුනි 31 දක්වා කාලය තුළ අයකර තිබුණු රු.1,074,390 ක ගාස්තු සභාව වෙත ලබානොදීම සම්බන්ධයෙන් එම කාලය තුළ කටයුතු කළ ආදායම් පරීක්ෂක නිලධාරියා වෙනත් සභාවක් වෙත ස්ථාන මාරුකිරීම පමණක් සිදුකර තිබුණු නමුත් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා සභාවට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | 2023 | විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා සභාවට සිදුවූ පාඩුව අයකරගත යුතුය. | අදහස් දක්වා නොමැති බව. | විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා අලාභය අයකරගෙන නොමැත. |

## 3.192 කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 633,538,319 | 34,762,005 | 598,776,314 | (8,156,102) | තත්ත්වාගණනය කළ |
| **2022** | 633,851,772 | 15,101,391 | 618,750,381 | 1,444,662 | තත්ත්වාගණනය කළ |
| **2023** | 617,461,914 | 12,889,163 | 604,572,751 | (8,847,010) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | කැබිතිගොල්ලෑව බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ පිහිටි සභාවට අයත් කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති තක්සේරු කුලියට වඩා වැඩි කුලියක් අය කිරීමට මහ සභාවේ විශේෂ යෝජනාවක් මඟින් තීරණය කර තිබීම නිසා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීමෙන් කඩ කාමර 23 ක් නිෂ්කාර්යව පවතින අතර, සභාවට රු.1,200,000 ක කුලී ආදායමක් ද අහිමි වී තිබුණි. | 2023 | තක්සේරු දෙපාර්තමේන්තු කුලී වටිනාකමට බදු දීමට කටයුතු කළ යුතුය. | පිළිගන්නා බව. | එසේම පවතී. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ එකතුවන ඝන අපද්‍රව්‍ය වර්ග කිරීමකින් තොරව ලදු කැලෑ | 2021 | කසළ විධිමත්ව බැහැර කිරීමට හා කොම්පෝස්ට් නිෂ්පාදනය විධිමත් කිරීමට | ඉදිරියේදි මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට පියවර ගනිමින් පවතී. | තවදුරටත් අවිධිමත් ලෙස කසළ බැහැර කරමින් පවතී. |

| | |
|---|---|
| ප්‍රදේශයකට බැහැර කර ගිනි තැබීම සිදු කරමින් පවතී. | පියවර ගත යුතු වේ. |

## 3.193 තලාව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 584,731,411 | 34,043,678 | 550,687,733 | 14,234,885 | තත්ත්වාගණනය කළ |
| **2022** | 565,467,964 | 25,989,394 | 539,478,570 | (11,591,444) | තත්ත්වාගණනය කළ |
| **2023** | 668,858,933 | 23,078,632 | 645,780,301 | 22,477,373 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | කරගහවැව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියෙන් රු.5,760,735 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඒ අනුව 2012 ජනවාරි 27 දින ගිවිසුම්ගතවී මාස 06 ක කාලයක් තුළ එහි වැඩ අවසන් කළ යුතුව තිබුණි. අදියර 04 ක් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු මෙම ව්‍යාපෘතියේ පළමු අදියරයන්ට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර අනෙකුත් අදියරයන් සඳහා රු.1,077,389 ක වියදමක් සිදුකර එම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | 2022 | මෙම ස්ථානයේ තිබෙන වත්කම් ආරක්ෂා කර ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | කරගහවැව කොම්පෝස්ට් අංගනය පරීක්ෂා කර සුදුසු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරන බව. | නිෂ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | තඹුත්තේගම සතිපොළ සඳහා 2017 වර්ෂයේදී රු.9,500,000 ක් වැය කර ඉදිකරන ලද ස්ථානය වෙත සතිපොළ රැගෙන යාමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. එම නිසා ඒ සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි. | 2023 | විවෘත කිරීමට කටයුතු කළ යුතුය. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පසු විවෘත කිරීමට බලාපොරොත්තු වෙන බව. | එසේම පවතී. |
| (ඇ) | 2019 අප්‍රේල් 15 දින අනතුරකට ලක්වී තිබුණු සභාවට අයත් කැබ්රථයේ අලාභයෙන් රු.4,458,993 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණු නමුත් එම මුදල් අයකරගෙන නොතිබුණි. | 2023 | අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිගන්නා බව. | සභාපතිවරයාගෙන් අයකරගත යුතු රු.4,013,094 ක මුදල අයකරගෙන නොමැත. |
| (ඈ) | එප්පාවල උප කාර්යාලයේ සේවය කර මියගිය ආදායම් පරීක්ෂකවරයෙක් විසින් 2021 වර්ෂයේ ක්ෂේත්‍රයේදී එකතු කරන ලද රු.667,075 ක් ප්‍රාදේශීය සභාවට ලබාදී නොතිබීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි. | 2022 | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. | අයකරගෙන නොමැත. |

## 3.194 තිරප්පනේ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 813,582,834 | 113,345,380 | 700,237,454 | (13,771,043) | තත්ත්වාගණනය කළ |
| **2022** | 703,425,545 | 38,646,244 | 664,779,301 | (5,198,874) | තත්ත්වාගණනය කළ |
| **2023** | 677,619,720 | 6,388,106 | 671,231,614 | 2,871,785 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2020 වර්ෂයේදී රු.1,431,543 ක් වියදම් කර ඇතුන්ගම කඩ කාමර 04 ක් සහ රු.1,472,920 ක් වියදම් කර දයාගම ඉදිකළ කඩ කාමර 05 ක වහලය නොමැති වීම නිසා නිෂ්කාර්යව පැවැතීම. | 2023 | මෙම කඩ කාමරවල අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකර ගිවිසුම්ගත වී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම කඩ කාමර අලුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති බව. | එසේම පවතී. |

**3.195 නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 471,319,964 | 23,196,911 | 448,123,053 | (477,499) | තත්ත්වාගණනය කළ |
| **2022** | 453,467,694 | 13,817,950 | 439,649,744 | (7,357,404) | තත්ත්වාගණනය කළ |
| **2023** | 485,688,086 | 9,443,754 | 476,244,332 | 3,624,575 | ව්‍යාවනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් නොච්චියාගම, කුකුල්කටුව, හොරුවිල, ඉහළවැටියාව ජල ව්‍යාපෘතිවලින් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ජල ගාස්තු රු.6,823,873 ක් අයකරගෙන නොතිබුණි. | 2023 | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැති බව. | හිඟ ජල ගාස්තු අයකරගත යුතුව ඇත. |
| (ආ) | කළාඹය පෙර පාසල සඳහා වසර 02 කට පෙර ඉදිකළ නව ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවති අතර කළාඹය පන්සල් භූමිය මධ්‍යයේ වූ අනාරක්ෂිත ස්ථාන 02 ක පෙර පාසල් පවත්වාගෙන යමින් පැවතුණි. | 2023 | නව ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීම සඳහා කඩිනමින් ක්‍රියාකළ යුතුය. | අදහස් දක්වා නොමැත. | පෙර පාසල නව ගොඩනැගිල්ලට ගෙන ගොස් නොමැත. |

## 3.196 පදවිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 402,740,916 | 34,880,233 | 367,860,683 | (1,596,089) | තත්ත්වාගණනය කළ |
| **2022** | 405,077,360 | 13,665,182 | 391,412,178 | (5,023,369) | තත්ත්වාගණනය කළ |
| **2023** | 419,398,537 | 13,472,653 | 405,925,884 | (6,023,366) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනා ගෙන ගැසට් නිවේදනය පළකර වරිපනම් බදු පැනවීමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | 2022 | ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. | දේපල සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | දේපල සමීක්ෂණ කටයුතු සිදුකර නොමැත. |
| (ආ) | ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් 2023 වර්ෂයේදී රු.5,834,450 ක් වියදම් කර ධීවර ඔරු 34 ක් මිලදීගෙන තිබුණු නමුත් එම ධීවර ඔරුවලින් 30 ක්ම ආදායම් උත්පාදනය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව සභා පරිශ්‍රයේ තිබුණි. | 2023 | ශිවිසුම්ගතව ලබාදී ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඔරු සඳහා ඇප තැන්පත් මුදලක් ලබාදීමට ධීවරයින් එකඟ නොවීම නිසා ඔරු ලබාදීම ප්‍රමාද වූ අතර ඉදිරියේදී පරිපාලන කමිටු තීරණයක් ලබාගෙන සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන බව. | එසේම පවතී. |

## 3.197 මැදවච්චිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 655,517,113 | 32,272,057 | 623,245,056 | 3,868,526 | තත්ත්වාගණනය කළ |
| **2022** | 662,657,601 | 36,859,303 | 625,798,298 | (11,835,280) | තත්ත්වාගණනය කළ |
| **2023** | 690,172,013 | 27,694,197 | 662,477,816 | 2,653,158 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2019 වර්ෂයේදී ජල සම්පාදන මණ්ඩලයට රු.2,343,240 ක් ගෙවා ඉදිකරන ලද පිළිසරු ඒකකයේ පිහිටි ප්‍රති ආශ්‍රිත (RO) ජල පිරිපහදු යන්ත්‍රය අක්‍රීයවීම නිසා ඒ තුළින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | 2023 | ජල පිරිපහදු යන්ත්‍රය ක්‍රියාකරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | මෙම අක්‍රීය ජල පිරිපහදු යන්ත්‍රය වෙනත් ස්ථානයක සවිකිරීමට නියමිත බව. | එසේම පවතී. |

## 3.198 මිහින්තලය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 355,085,212 | 20,871,183 | 334,214,029 | 8,740,711 | තත්ත්වාගණනය කළ |
| **2022** | 336,318,941 | 8,257,805 | 328,061,136 | (3,760,906) | අහිතකර |
| **2023** | 392,521,488 | 7,061,998 | 385,459,490 | (1,613,198) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(II) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් පැනවීමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | 2022 | අවශ්‍ය කටයුතු කඩිනම් කළ යුතුය. | මේ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | තක්සේරු කර නොමැත. |

**3.199 රඹෑව ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 248,714,693 | 47,838,428 | 200,876,265 | (25,728,099) | තත්ත්වාගණනය කළ |
| **2022** | 241,421,802 | 35,911,760 | 205,510,042 | (15,326,002) | තත්ත්වාගණනය කළ |
| **2023** | 192,356,022 | 10,037,095 | 182,318,927 | (10,685,007) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට පැවත එන වාහන තුනක් කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.2,060,525 ක් 2023 වර්ෂයේදී ද අය කර ගෙන නොතිබුණි. | 2023 | විමර්ශන වාර්තා ලබාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම කුලී අයකරගත යුතු පුද්ගලයින් හඳුනා ගැනීමට නොහැකි වී ඇති බව හා ඒ පිළිබඳව විමර්ශනයක් සිදුකර ඇතත් මෙතෙක් වාර්තාවක් ලැබී නොමැති බව. | මෙම කුලී අයකරගත යුතු පුද්ගලයින් හඳුනා ගැනීමට නොහැකි වී ඇත. ඒ පිළිබඳව විමර්ශනයක් සිදුකර ඇතත් මෙතෙක් වාර්තාවක් ලැබී නොමැත. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් පැරණි පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමට අදාළව 2017 දෙසැම්බර් 25 දිනට නිමකරන ලද වැඩ කොටස් සඳහා රු.2,917,338 ක් ගෙවීම්කර තිබුණු නමුත් එම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට හැකි තත්ත්වයට නිමකර නොතිබීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | 2022 | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | ඉංජිනේරු උපදෙස් ලැබී ඇති බැවින් ප්‍රතිපාදන ලැබුණු පසු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතින බව. | නිෂ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2023 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස 02 තුළ සරප් වෙත දෛනිකව ලැබී තිබුණු රු.349,515 ක් සහා අරමුදල වෙත බැර නොකර වංචා කිරීම සම්බන්ධයෙන් සරප් තනතුරේ රාජකාරි කළ නිලධාරිණියකගේ වැඩ තහනම් කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පාර්ශවය වෙතින් අලාභය අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා රීති 13, 14, 15 අනුව කටයුතු කර නොතිබුණි. | 2023 3.2 | පරීක්ෂණ වාර්තාවල නිර්දේශ අනුව ක්‍රියාකළ යුතුය. | මේ සම්බන්ධ පරීක්ෂණ මේ වනවිට පැවැත්වෙන බව හා වාර්තා ලද පසු මූලා රීති 13, 14 සහ 15 පරිදි කටයුතු කරන බව. | විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා අයකරගෙන නොතිබුණි. |

### 3.200 රාජාංගනය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 498,617,735 | 71,538,582 | 427,079,153 | (12,036,604) | තත්ත්වාගණනය කළ |
| **2022** | 475,376,639 | 35,630,295 | 439,746,344 | (8,712,211) | තත්ත්වාගණනය කළ |
| **2023** | 478,080,500 | 4,173,773 | 473,906,727 | (8,332,419) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | කඩ කාමර 60 ක් වෙනුවෙන් 2023 වර්ෂයට අයවිය යුතු රු.3,083,200 කින් සියයට 58 ක් වූ රු.1,778,410 ක් අයකරගෙන නොතිබුණු අතර එම කඩ කාමර වෙනුවෙන් 2023 ජනවාරි 01 දිනට වූ රු.4,780,213 ක හිඟ කුලී වලින් රු.3,330,400 ක් වූ සියයට 69 ක් ද අයකරගෙන නොතිබුණි. | 2023 | නීතිමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ කඩ කුලී අයවෙමින් පවතින බව හා අයනොවන කඩ කුලී සම්බන්ධයෙන් සමථ මණ්ඩලයේ නඩු පවරා ඇති බව. | තවදුරටත් රු.4,026,960 ක් අයකරගත යුතුව ඇත. |
| (ආ) | සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු බවට මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2011 නොවැම්බර් 08 දින නිර්දේශ කර තිබුණු නමුත් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | 2023 | පරිසර බලපත්‍රයක් ලබාගත යුතුය. | පරිසර බලපත්‍රය කඩිනමින් ලබාදෙන බවට මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනුම් දී ඇති බව. | එසේම පවතී. |

## 3.201 හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 601,825,384 | 38,572,283 | 563,253,101 | 24,094,849 | තත්ත්වාගණනය කළ |
| **2022** | 462,561,707 | 11,581,880 | 450,979,827 | (7,216,319) | මතය ව්‍යාවනය |
| **2023** | 503,841,511 | 9,455,121 | 494,386,390 | (17,772,413) | අහිතකර |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වසර 01 ත් 08 ත් ඉක්ම වූ කාලයක සිට පැවත එන වත්කම් බදුදීම් වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.5,152,943 ක් අයකර ගැනීමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | 2023 | වගකිවයුතු පාර්ශව වෙතින් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | නිරීක්ෂණවලට අදාළව ක්‍රියාමාර්ග දක්වා නොමැත. | අයකරගෙන නොමැත. |
| (ආ) | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ තිබුණු බේල් කිරීමේ යන්ත්‍රය 2023වර්ෂයේදී ගිනි ගැනීමෙන් විනාශ වී තිබුණු නමුත් ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකර එය යථාවත් කිරීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි. | 2023 | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශව වෙතින් අලාභය අයකර ගැනීමටත්, බේල් කිරීමේ යන්ත්‍රය යථාවත් කිරීමටත් කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් සහකාර පළාත් පාලන කොමසාරිස්වරිය දැනුවත් කර ඇති බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා නොමැත. |

### 3.202 පලාගල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 316,946,003 | 27,246,608 | 289,699,395 | (10,159,871) | තත්ත්වාගණනය කළ |
| **2022** | 325,362,186 | 14,580,287 | 310,781,899 | (6,674,235) | තත්ත්වාගණනය කළ |
| **2023** | 291,587,905 | 4,769,100 | 286,818,805 | 2,825,621 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | LDSP ව්‍යාපෘතිය යටතේ වූ අරමුදල් වලින් රු.9,236,000 ක් වියදම් කර මිලදීගත් වත්කම් 2023 වර්ෂයේදී නිෂ්කාර්යව පැවතුණි. (අන්තර් බද්ධිත කුට්ටිගල් යන්ත්‍රය සහ උපාංග) | 2023 | ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අදහස් දක්වා නොමැති බව. | නිෂ්කාර්යව පවතී. |
| (ආ) | 2022 වර්ෂයේදී හිඟුරුවැව ප්‍රදේශයේ රු.19,741,026 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ල සහ ළිඳ නිෂ්කාර්යව පැවතුණි. | 2023 | ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අදහස් දක්වා නොමැති බව. | නිෂ්කාර්යව පවතී. |
| (ඇ) | ජල බෝතල් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට 2022 ජූලි මාසයේදී මිලදීගත් ජල ටැංකි, ජල ටැංකි රඳවන කුළුණු, ඉදිකළ නල ළිඳ, සහ වටිනාකම | 2023 | ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අදහස් දක්වා නොමැති බව. | නිෂ්කාර්යව පවතී. |

රු.2,676,082 ක් වූ ජල බෝතල් හා වටිනාකම රු.88,233 ක් වූ ලේබල් තොගයක් නිෂ්කාර්යව පැවතුණි.

**3.203 ලංකාපුර ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 691,828,230 | 79,409,278 | 612,418,952 | (7,524,216) | තත්ත්වාගණනය කළ |
| **2022** | 609,164,634 | 43,186,703 | 931,565,977 | (6,614,736) | තත්ත්වාගණනය කළ |
| **2023** | 600,519,903 | 28,674,147 | 571,845,756 | (11,789,264) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පිරිවැය රු.2,390,568 ක් වැයකර ඉදිකරන ලද තල්පොත නව බස් නැවතුම්පොළ වෙත බස් ඇතුල් නොකිරීම හේතුවෙන් වර්ෂ 06 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පවතී. | 2022 | පවත්නා වත්කම් මහජන සුභසිද්ධිය සඳහා යොදවාගත යුතුය. | ඉදිරියේදී වත්කම සුදුසු කාර්යක් සඳහා යොදවා ගැනීමට කටයුතු කරන බව. | 2025 වර්ෂයේදී අළුත්වැඩියා කොට ගබඩාවක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත. |
| (ආ) | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශයේ ඝන අපද්‍රව්‍ය ඒකකය මගින් 2019 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණු කොම්පෝස්ට් යන්ත්‍රය මගින් දිනකට නිෂ්පාදනය කළ හැකි කොම්පෝස්ට් ධාරිතාවය ටොන් 50 ක් පමණ වුවද, බල ප්‍රදේශයේ එවැනි ධාරිතාවක් රැස් නොවීම හා අනෙකුත් සභාවල දිරන කසල රැගෙන එමේ අධික | 2022 | ශක්‍යතා අධ්‍යනයකින් පසු සුදුසු ව්‍යාපෘති පමණක් ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය. | කෘෂිමා ව්‍යාපෘතිය සඳහා කරනු ලැබූ ආයෝජනය ප්‍රතිඵල රහිත එකක් බැවින් උපදෙස් ඉල්ලා ලිපි මගින් දැනුවත් කර ඇති බව. | නඩත්තු පිරිවැය ඉතා ඉහළ මට්ටමක්වන බැවින් හා කෘෂිමා යන්ත්‍රය මේවන විට අබලන් වී ඇති බැවින් කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදු නොවේ. |

පිරිවැය හේතුවෙන් ජනනය වන කසළ ප්‍රමාණය අඩුවීම මත ධාරිතාවයෙන් සියයට 2 ක් පමණක් ප්‍රයෝජනයට ගත හැකි වී තිබීම නිසාත් නඩත්තු පිරිවැය හේතුවෙන් යන්ත්‍රය සඳහා වැය කර ඇති රු.මි. 145 ක ආයෝජනය ප්‍රතිඵල රහිත බවට පත්වී තිබුණි.

## 3.204 ඇලහැර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 793,264,040 | 690,631,115 | 677,573,409 | (14,043,160) | තත්ත්වාගණනය කළ |
| **2022** | 692,000,422 | 29,638,860 | 662,361,562 | (5,172,484) | තත්ත්වාගණනය කළ |
| **2023** | 724,082,094 | 17,879,491 | 706,202,603 | 9,519,834 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2015 සිට 2017 දක්වා කාල සීමාව තුළ දුරගමන් සේවා බස් නැවතුම්පලක් හා වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතියකින් හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව කලු ගලක් කඩා ඉවත් කිරීම වෙනුවෙන් විධිමත් මුල්‍ය පටිපාටි අනුගමනය නොකර ගෙවූ රු.15,675,708 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණු අතර, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි. | 2023 | සභා අනුමැතියකින් තොරව කටයුතු කිරීම නිසා සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව මූලික විමර්ශනයක් පවතින බව දන්වා ඇත. | මූලික විමර්ශනය අවසන්වී ඇති අතර සිදු වූ පාඩුව අයකර ගැනීමට හෝ වෙනත් නිර්දේශයන් මේ වන තෙක් සභාව වෙත ලැබී නොතිබුණි. |

## 3.205 මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 676,596,537 | 111,876,918 | 564,719,619 | 7,815,748 | තත්ත්වාගණනය කළ |
| **2022** | 597,730,145 | 45,298,321 | 552,431,824 | 11,579,674 | තත්ත්වාගණනය කළ |
| **2023** | 662,542,036 | 17,965,001 | 644,577,035 | 32,211,798 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| 2022 මැයි මාසයේ සිට එන්ජිම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයක පවතින මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අළුත්වැඩියා ව සඳහා රු.4,674,654 ක ඇස්තමේන්තුගත පිරිවැයක් දැරීමට 2023 ජුනි 30 දින උතුරු මැද ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලැබී වසරක කාලයක් ගත වී තිබුණ ද, එම අලුත්වැඩියාව සිදුකර නොතිබුණි. | 2023 | අලුත්වැඩියා කර වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. | යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වා ඇත. | 2024 ජුනි 03 වන දින යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය වන්නේ පිළිගත් ආයතනයක් වෙතින් මිල ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙසයි. |

**3.206 දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 1,375,697,338 | 322,842,238 | 1,052,855,100 | 81,844,803 | තත්ත්වාගණනය කළ |
| **2022** | 909,723,212 | 75,728,806 | 833,994,406 | 11,965,451 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,085,378,470 | 31,012,887 | 1,054,365,583 | (17,722,076) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභා අරමුදලින් රු.754,930 ක් වැයකර 2015 වර්ෂයේ සභිකයින් වෙත ලබාදී තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 ක් හා iPad යන්ත්‍ර 02 ක් ලබාගෙන වසර 06 කට අධික කාලයක් ගතව ඇතත් ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණු අතර, ලැප්ටොප් යන්ත්‍ර 05 ක් හා iPad යන්ත්‍රයක් ආපසු භාරදීමට නොහැකි මන්ත්‍රීවරුන් 06 දෙනෙකු විසින් ඊට අදාළ වටිනාකම 2019 ජුනි 26 දින සිට වාරික 30 කින් ගෙවීමට එකඟතාව පළකර තිබූ නමුත් එම ගෙවීමද පැහැර හැර තිබුණි. | 2022 | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. | අදාළ වටිනාකම සභාව වෙත පියවන ලෙස ලිඛිතව දැනුවත් කරන ලද බව. | මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2011 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක විසින් සිදුකරන ලද මූල්‍යමය අලාභය රු. 1,367,681 ක් ලෙස හඳුනාගෙන 2021 දෙසැම්බර් 27 දින විනය නියෝග පනවා තිබූ නමුත් ඒ පිළිබඳව වූ ක්‍රියාමාර්ග 2023 අප්‍රේල් වන විටත් ගෙන නොතිබුණි. | 2022 | විනය නියෝගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය කටයුතු කරන බව. | නඩු පැවරීමට නීතිඥතුමිය වෙත ලිපිගොනුව භාර දී ඇත. |
| (ඇ) | දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2019, 2020, 2021 වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 76 කට අදාළව රු.1,626,116 ක අත්තිකාරම් මුදලක් ලබාදී ඇතත්, ව්‍යාපෘති කටයුතු ඉටුකර නොමැති අතර, අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | 2023 | අත්තිකාරම් අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. | අයකරගත හැකි අත්තිකාරම් වටිනාකම රු.728,844 වන අතර, ඉතිරි හිඟ සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව. | අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | 2011 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක විසින් සිදුකරන ලද මූල්‍යමය අලාභය රු.1,367,681 ක් ලෙස හඳුනාගෙන 2021 දෙසැම්බර් 27 දින විනය නියෝග පනවා තිබූ නමුත් 2024 මැයි වන විටත් ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 3.207 හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 973,780,455 | 77,289,830 | 896,490,625 | 8,106,562 | තත්ත්වාගණනය කළ |
| **2022** | 937,856,921 | 97,959,936 | 839,896,985 | 42,743,575 | තත්ත්වාගණනය කළ |
| **2023** | 963,486,622 | 81,958,401 | 881,528,221 | 2,159,038 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය, 2021 වර්ෂයේදී නිම කර ඇති නමුත් එම ව්‍යාපෘති කටයුතු සඳහා යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් සභාවට අයවිය යුතු මුදල රු.2,041,448 ක් විය. | 2022 | පසුවිපරම් කටයුතු සිදුකළ යුතුය. | හිඟ මුදල් අයකරගැනීමට විස්තර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී ඇති බව. | දිගින් දිගටම ඉල්ලීම් කළ ද මුදල් ලැබීම සිදු නොවේ.ඉදිරි DCC ඉදිරිපත් කරන බව |
| (ආ) | 2015 අප්‍රේල් 14 වන දින ප්‍රාදේශීය සභාවේ සභාපති ගමන් කරමින් සිටියදී කැබ් රථය අනතුරට පත්ව පූර්ණ හානියට ලක්වී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ඉල්ලා ඇති බව | මේ රථය හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා වාහන අංගනයේ ස්වාභාවික ආපදාවනට ලක්වෙමින් පවතී. නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.208 ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 644,674,920 | 115,705,542 | 528,969,378 | (37,232,056) | තත්ත්වාගණනය කළ |
| **2022** | 811,694,584 | 112,209,441 | 699,485,142 | 33,796,100 | තත්ත්වාගණනය කළ |
| **2023** | 974,346,911 | 50,146,660 | 924,200,251 | 57,238,181 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ ඉබ්බාගමුව නගරයේ ඉදිකර වැඩ අවසන් කර තිබුණු සතිපොළ භූමිය 2023 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබූ අතර මෙම ගොඩනැගිල්ල සඳහා 2023 වර්ෂයේදී රු.2,385,176ක් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් වියදම් කර තිබුණි. | 2023 | සති පොළ විවෘත කර පොළ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙළෙන්දන්ගෙන් පැවති දැඩි විරෝධය හමුවේ මෙය අසාර්ථක වූ බවත් විකල්ප පොළක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරමින් සිටින බවත් දන්වා ඇත. | 2025 වර්ෂය සඳහා මෙම සති පොළට ටෙන්ඩර් පටිපාටිය යටතේ බදුකරුවෙක් බදු ලබා ගෙන ඇති බව දන්වා තිබුණි. |

## 3.209 උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 417,407,303 | 80,505,941 | 336,901,362 | (23,634,260) | තත්ත්වාගණනය කළ |
| **2022** | 841,620,473 | 51,908,537 | 789,711,936 | (4,112,119) | තත්ත්වාගණනය කළ |
| **2023** | 844,723,567 | 40,775,283 | 803,948,284 | 11,245,060 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව සතු ගිලන් රථය අළුත් වැඩියා කටයුතු සිදු නොකර වසර 02කට අධික කාලයක සිට උපයෝජනයෙන් තොරව පැවතුණි. | 2023 | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරිමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | වයඹ පළාත් ප්‍රධාන ලේකම් වාහනය වෙනත් සභාවකට පවරාදීමට හෝ අළුත් වැඩියා කිරිම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් පතා ඇති බව දන්වා ඇත. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 02 ක, සුසාන භූමි 31 ක සහ ක්‍රීඩාපිටි 05 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | 2023 | සභාව සතු වත්කම් පවරා ගැනිමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | අයිතිය පවරා ගැනීවට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. |

**3.210 කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,332,150,892 | 433,711,005 | 898,439,887 | 153,025,837 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,531,755,345 | 344,551,040 | 1,187,204,305 | 295,226,983 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,669,232,716 | 361,729,559 | 1,307,503,157 | 244,928,314 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂයක | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ඉඩම් කට්ටි කිරීමේ දී සැලැස්මක් අනුමත කර ගැනීමකින් තොරව කහටපිටිය මානෙල්වත්ත ඉඩමේ කට්ටි 08ක් විකුණා තිබුණි. මෙම ඉඩම් කට්ටි කිරීමෙන් සියයට 1ක ආදායම ලෙස රු.2,066,568ක පමණ මුදලක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 | අනුමැතිය ලබාගෙන ඉඩම් කට්ටි කිරීම කළ යුතු වේ. සියයට 01ක විකුණුම් බදු ආදායම නිවැරදිව අයකර ගත යුතු වේ. | අදාළ ආයතනය වෙත අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය අයදුම්පත්‍ර මෙම සභාව වෙත භාරදෙන ලෙස එම ආයතනය මේ වන විට දැනුවත් කර ඇත. | ඉදිරියේ දී පැවැත්වීමට නියමිත සැලසුම් කමිටුවට යොමු කොට සැලසුම් කමිටු තීරණය අනුව මේ සඳහා නීතිමය පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීමත් ඊට අදාළ කටයුතු සිදු කිරීමටත් නියමිත බව. |

## 3.211 කුලියාපිටිය ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 695,203,380 | 233,921,454 | 461,281,926 | 11,662,529 | තත්ත්වාගණනය කළ |
| **2022** | 710,214,392 | 269,168,305 | 441,046,087 | (126,974,087) | තත්ත්වාගණනය කළ |
| **2023** | 642,296,860 | 84,721,089 | 557,575,771 | (67,662,558) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභා රථ ගාලෙහි ගාල්කර ඇති 31 ශ්‍රී 1367 දරන ජීප් රථය සභාවට ලද දිනය හා ලද ආකාරය පිළිබඳව තොරතුරු සභාව සතුව නොතිබූ අතර, රථයට අදාළ ලොග් පොතට අනුව 2013 වර්ෂයේ සිට රථය භාවිත කර තිබුණු බව අනාවරණය විය. මේ වන විට ජීප් රථය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර ඒ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා තිබුණි. | සභා පරිශ්‍රයේ ගාල් කර ඇති 31 ශ්‍රී 1367 අංක දරණ ජීප් රථය පිළිබද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා පිළිතුරු අපේක්ෂාවෙන් සිටින බව දන්වා තිබුණි. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරනු ලබන කැබ් රථයක සහ යතුරුපැදියක අයිතිය ද සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 97ක අයිතිය ද කිතලව සතිපොල හා පුස්තකාලය පිහිටි | 2023 | වත්කම්වල අයිතිය විධිමත් ලෙස සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා තිබුණි. | මේ වන විට එක් කැබ් රථයක අයිතිය සභාව වෙත පවරාගෙන ඇති බවත් ඉතිරි වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු කරනු ලබන බවත් ඉඩම් අයිතිය සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉඩම්වල අයිතිය ද සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | වෙත පවරාගෙන නැති සුසාන භූමි සතිපොළ හා පුස්තකාල පිහිටි ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි. |
| (ඇ) | මෝටර් ග්‍රේඩර් රථය සහ ට්‍රැක්ටර් රථ දෙකකට අමුණා ඇති සුදු යකඩ බවුසර් දෙක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | 2023 | අදාළ නෛතික ආයතනවල ලියාපදිංචි කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | මෙම වාහන වසර ගණනාවකට පෙර මිලදීගෙන ඇති අතර අදාල ලිපි ලේඛන සුදානම් කර අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන බව දන්වා ඇත. |

**3.212 කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 274,341,282 | 54,557,061 | 219,784,221 | 219,784,221. | තත්ත්වාගණනය කළ |
| **2022** | 306,727,707 | 32,062,737 | 274,664,970 | 44,568,444.39 | තත්ත්වාගණනය කළ |
| **2023** | 326,600,529 | 16,594,761 | 310,005,768 | (10,029,554.98) | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව සතු ඉඩම් 04 ක සහ සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 33 ක අයිතිය සභාව විසින් පවරාගෙන නොතිබුණි. | 2023 | මෙම වත්කම්වල අයිතිය පවරා ගත යුතු ය. | පැවරීම් කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |

## 3.213 ගල්ගමුව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 417,892,258 | 199,692,127 | 218,200,131 | 11,968,960 | තත්ත්වාගණනය කළ |
| **2022** | 365,903,827 | 124,106,681 | 241,797,146 | 2,495,179 | තත්ත්වාගණනය කළ |
| **2023** | 564,812,492 | 58,959,775 | 505,852,717 | 12,516,717 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ගල්ගමුව නගරයේ අරසන් වැව, වාන් ඇළ, රක්ෂිතය තුළ සභාවේ හිටපු උප සභාපතිවරයෙකු ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව අනවසරයෙන් විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකර බද්දට දී තිබුණි. | 2021 | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අනවසර ඉදිකිරීමක් හේතුවෙන් එම ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නීතිමය පියවර ගෙන ඇති බව. | කුරුණෑගල මහ අධිකරණයේ එම ඉදිකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා ඇත. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමි 151ක් අතුරින් සුසාන භූමි 117ක අයිතිය සභාව සතුව නොතිබුණි. | 2023 | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | සුසාන භූමි පවරාගැනීම හා මැනුම් කටයුතු කිරීමට අදාල ආයතනවලින් ඉල්ලීම් කර ඇති බවත් එහිදී අනුමැතිය ලැබීම ප්‍රමාද වීමට හේතු වී ඇති බව දන්වා ඇත. |

## 3.214 ගිරිබාව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 344,563,397 | 118,045,364 | 226,518,033 | (1,754,799) | තත්ත්වාගණනය කළ |
| **2022** | 294,712,922 | 61,129,986 | 233,582,936 | 1,749,008 | තත්ත්වාගණනය කළ |
| **2023** | 240,758,201 | 4,973,056 | 235,785,145 | (1,671,141) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව විසින් 2019 වර්ෂයේදී රු.6,857,633ක් වැය දරා ඉදිකළ නිරාවිය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් පොහොර ඒකකය ආරම්භ කළ වර්ෂයේ සිට කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිශ්කාර්යව පැවතුණි. | 2023 | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර එහි අවශ්‍යතාවයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා දිරන කසල ප්‍රදේශය තුළින් ජනනය නොවන බැවින් කසල කළමනාකරණය සඳහා ඉදිකළ නිෂ්කාර්යව පවතින එම ගොඩනැගිල්ල විකල්ප ආදායම් රැස් කිරීමේ මාර්ගයකට යොමු කිරීම සඳහා සෑම උත්සාහයක් ම දරණ බව දක්වා ඇත. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරන ජීප් රථයක සහ කැබ් රථයක අයිතිය ද ඉඩම් 11 ක අයිතිය ද , සුසාන භූමි 30 ක අයිතිය ද සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | 2023 | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දක්වා ඇත. | වාහනය පවරා ගැනීමට මෙතෙක් නොහැකි වී ඇති අතර ඉඩම් හා සුසාන භූමි පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත. |

## 3.215 නාරම්මල ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 548,904,663 | 65,142,513 | 483,762,150 | 38,836,406 | තත්ත්වාගණනය කළ |
| **2022** | 560,075,779 | 37,346,434 | 522,729,345 | 7,901,244 | තත්ත්වාගණනය කළ |
| **2023** | 731,172,801 | 29,555,956 | 701,616,845 | 35,366,731 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් හයක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | 2023 | ඉඩම්වල අයිතිය විධිමත් ලෙස සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා තිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වා තිබුණි. |

**3.216 නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 1,007,331,446 | 105,631,702 | 901,699,744 | 14,841,427 | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,032,546,425 | 72,790,405 | 959,756,020 | 38,776,137 | තත්ත්වාගණනය කළ |
| **2023** | 1,061,535,707 | 81,349,180 | 980,186,527 | 2,859,601 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වසර 05 කට වඩා පැරණි එකතු වටිනාකම රු.2,460,955 ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කර නොතිබුණි. | 2023 | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කළ යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 161 ක් අතුරින් 159 ක, ඉඩම් 15 ක සහ මෝටර් ග්‍රේඩර් රථයක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | 2023 | මෙම වත්කම්වල අයිතිය පවරා ගත යුතු ය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | පැවරීම් කටයුතු සිදුකර මින් පැවතිනි. |

## 3.217 පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 629,756,785 | 53,578,940 | 576,177,845 | 24,177,680 | තත්ත්වාගණනය කළ |
| **2022** | 737,930,239 | 32,292,007 | 705,638,232 | 45284101 | තත්ත්වාගණනය කළ |
| **2023** | 976,481,459 | 90,182,369 | 886,299,090 | 21,770,587 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන්තිය ප්‍රකාරව සභාව විසින් සේවා සපයන සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කර වරිපනම් අයකර නොතිබුණි. | 2023 | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | දියුණු ගම් ප්‍රදේශ වශයෙන් මාර්ග 14ක් හඳුනාගෙන තිබුණ ද නිර්දේශ සම්පූර්ණ කර නොතිබුණි. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 15 ක අයිතිය සහ සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 131 ක අයිතිය සභාව සතුව නොතිබුණි. | 2023 | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | මෙම ඉඩම් පවරා ගැනීම සඳහා දීර්ඝ කාලයක සිට කටයුතු කරමින් පවතින බවත් අදාල ආයතන වල පවතින ප්‍රමාදයන් හේතුවෙන් එම කටයුතු අතර මඟ නතර වී ඇත. |

## 3.218 පන්නල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 987,435,734 | 520,969,156 | 466,466,578 | (55,387,814) | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,040,195,365 | 346,012,351 | 694,183,014 | 83,477,470 | තත්ත්වාගණනය කළ |
| **2023** | 905,263,974 | 265,725,299 | 639,538,675 | 63,658,963 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව රු.20,032,475 ක ඉකුත් වූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරන බව | මෙම තැන්පතු අතරින් රු.12,216,243 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොමැත. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 50ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර සභාව විසින් පරිහරණය කරනු ලබන JCB යන්ත්‍රය, ඩබල් කැබ් රථය සහ ජීප් රථයේ අයිතිය ප්‍රාදේශීය සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | 2023 | පවරා ගැනීමට හා ලියාපදිංචිය ලබාගත යුතුවේ. | විගණනයෙන් පෙන්වා ඇති අඩුපාඩු නිවරදි කිරීමට කටයුතු කරන බව | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.219 පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 576,230,256 | 174,297,373 | 401,932,883 | 4,180,502 | තත්ත්වාගණනය කළ |
| **2022** | 566,546,284 | 131,414,813 | 435,131,471 | 11,143,743 | තත්ත්වාගණනය කළ |
| **2023** | 487,412,639 | 38,104,449 | 449,308,190 | 13,317,548 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර 04 ක් සඳහා රු.1,283,910ක මුදලක් අයකර ගැනීමට තිබුණු නමුත් අධිභාරකරුවන් 17 ක් පළාත් පාලන අමාත්‍යාංශය වෙත අභියාචනා කර තිබුණි. | 2021 | ඉකුත් වර්ෂවලට අදාල අධිභාර සහතික සඳහා මුදල් අයකරගත යුතු වේ. | මෙම මුදල ගෙවා නොමැති බවත්, අධිභාරකරුවන් අභියාචනා කර ඇති බවත් දන්වා තිබුණි. | අංක ව/පපාදෙ/02/09/ අධිභාර - පොල්පි ප්‍රාස හා 2024 ඔක්තෝබර් 03 දිනැති අධිභාර අභියාචනා තීරණ දැනුම් දීමට අදාලව ප.පා.දෙ. එවන ලද ලිපියට අනුව අදාල අධිභාරකරුවන්ගේ අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | පොල්පිතිගම නගරයේ ඉදිකර සභාව වෙත 2021 ජුලි 26 දිනපවරා දී තිබූ රු.21,140,000 ක වටිනාකමින් යුතු බස් නැවතුම්පල තුළ කිසිදු බස් රථයක් නවතා තැබීමට භාවිතාකර නොතිබුණි. | 2021 | බස්නැවතුම්පල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ ආයතන සමඟ සාකච්ඡා කර බස් නැවතුම්පල සම්බන්ධ කටයුතු කරන බව. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන වෙනත් ආදායම් මාර්ගයක් ලෙස විවෘත ටෙන්ඩර් කැඳවීමක් සිදු කර බදු දීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.29,962,280 ක් වැයකර ලීටර් 5,000 ජල ටැංකි 60 ක් හා ලීටර් 2,000 ජල ටැංකි 60 ක් සහා බල ප්‍රදේශයේ ස්ථාපිත කර 2017 ජුනි 30 වන දින ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි. නමුත් දැදුරු ඔය පානීය ජල ව්‍යාපෘතිය සහ වෙනත් ජල ව්‍යාපෘති මඟින් ප්‍රදේශයේ ජනතාව වෙත පානීය ජල පහසුකම් ලබාදීම හේතුවෙන් උක්ත ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිපල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | 2022 | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර සක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර ස්ථාපිත ටැංකි ඵලදායී ලෙස යොදාගැනීමට ඉදිරි විකල්ප වැඩපිළිවෙලක් පිළිබඳ අවධානය යොමුකළ යුතුය. | 2017, 2018 වර්ෂවල තිබූ පානීය ජල ගැටළුව හා වකුගඩු රෝග පැතිරීම හේතු කොටගෙන මෙම ජල ටැංකි සභාවට ලබා දුන්නද පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මෙම ටැංකි සඳහා ජලය ගෙනයාමට ජල බවුසර් 02 ක් ඉල්ලුම් කළ ද, ඒ වන විට එම ජල බවුසර් නොලැබුණු බැවින් ව්‍යාපෘතිය අසාර්ථක වූ බවත් ඉන්පසුව 2021 වර්ෂයේදී ජල බවුසර් ලැබෙන විට දැදුරු ඔය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී තිබුණු බවත් දන්වා ඇත. | ඉල්ලීම් ලිපිවලට අදාලව සුදුසුකම්ලත් පොදු ස්ථාන සඳහා පරිහරණයට ගිවිසුම් සහිතව ලබා දීම සිදු කරන බවට දන්වා ඇත. |

## 3.220 බිංගිරිය ප්‍රාදේශිය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 987,435,734 | 520,969,156 | 466,466,578 | (55,387,814) | තත්ත්වාගණනය කළ |
| **2022** | 1,040,195,365 | 346,012,351 | 694,183,014 | 83,477,470 | තත්ත්වාගණනය කළ |
| **2023** | 905,263,974 | 265,725,299 | 639,538,675 | 63,658,963 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වටිනාකම රු.7,175,000 ක් වූ ගිණුම්වල පෙන්වා තිබූ වාහන 04 ක් මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | 2022 | අදාළ වාහන නිසි පරිදි ලියාපදිංචි කළ යුතුය. | අඩුපාඩු පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මෙම වාහන ලියාපදිංචියට අදාල ලිපි ලේඛන සපයා ගැනීමට නොහැකි වී ඇතිබව දන්වා ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව සභාව විසින් 2018 ට පෙර ලබා දුන් රු.358,252 ක් වූ අත්තිකාරම් 16 ක් හා රු.822,418 ක් වූ හඳුනා නොගත් අත්තිකාරම් ශේෂයක් පියවා නොතිබුණි. | 2023 | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | වසර ගණනාවක සිට පැවත එන රු.249,853ක හඳුනා නොගත් සේවක ණය | 2023 | සේවක ණය නිසි පරිදි අයකර ගත යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ශේෂ පැවති අතර එය හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඇ) | සභාව සතුව භාවිතයේ පවතින රථ 2ක්, ක්‍රීඩා පිටි 18ක් හා සුසාන භූමි 40ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | 2023 | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.221 මහව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 444,245,149 | 35,893,820 | 408,351,329 | 22,589,293 | තත්ත්වාගණනය කළ |
| **2022** | 444,516,790 | 28,248,062 | 416,268,728 | 5,573,527 | තත්ත්වාගණනය කළ |
| **2023** | 459,133,362 | 23,665,851 | 435,467,511 | 1,686,935 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයන්හිදි සභාවේ සන අපද්‍රව්‍ය සම්බන්ධව ලබාදුන් එකතුව රු.2,914,548ක අත්තිකාරම් ගෙවීම් 41ක් හඳුනාගෙන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව නිරවුල් කිරිමට වර්ෂ 05කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඊළඟ වර්ෂයේ ඒවා හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | අත්තිකාරම් පියවා නොමැත. |
| (ආ) | 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා රු. 120,940ක පොලී ආදායමක් ලබාදුන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමේ පැවැති රු.500,000ක් වර්ෂ 19ක සිට ස්ථාවර | 2023 | දීර්ඝ කාලයක සිට ඉතිරි කිරීමේ ගිණුමේ තිබූ මුදල් ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට පියවර ගතයුතුය. | 2024 මූල්‍ය වර්ෂයේ මෙම මුදල ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට පියවර ගනු ලබන බව. | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තැන්පතු ගිණුම්වල තැන්පතු කිරීමට පියවර ගැනීමට සභාව විසින් අපොහොසත් වීමෙන් ආසන්න වශයෙන් රු.1,375,000ක පොලී ආදායමක් අහිමි වී තිබුණි. | | | | |
| (ඇ) | 2022 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ආණ්ඩුකාර අරමුදලින් මිලදී ගත් රු.289,250ක මල්ටි චොපර් යන්ත්‍රය (Multi Chopper Machine) භාවිතා කිරීමට වර්ෂ 02කට අධික කාලයක් පියවර ගෙන නොතිබුණි. | 2023 | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මිලදීගත් මල්ටි චොපර් යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගතයුතුය. | මෙම වර්ෂයේ එම යන්ත්‍රය උපයෝජනය කර පොහොර නිෂ්පාදන කටයුතු සිදුකරන බව. | අදාළ යන්ත්‍රය අරමුණු සඳහා භාවිතා කර නොමැත. |

### 3.257 කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 355,105,000 | 16,282,000 | 338,823,000 | 22,693,671 | තත්ත්වාගණනය කළ |
| **2022** | 432,374,879 | 24,597,688 | 407,777,192 | 60,660,398 | තත්ත්වාගණනය කළ |
| **2023** | 445,512,212 | 22,660,407 | 422,851,805 | 45,931,332 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ඝන අපද්‍රව්‍ය සම්බන්ධව ලබාදුන් එකතුව රු.3,344,907ක අත්තිකාරම් ගෙවීම් 41ක් හඳුනාගෙන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව නිරවුල් කිරීමට වර්ෂ 19කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | 2023 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනාවරණය කර තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගෙන ඇති බව. | අත්තිකාරම් අයකරගෙන නොමැත. |
| (ආ) | සභාව විසින් වාර්ෂිකව රැස්කරනු ලබන ප්ලාස්ටික් අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 398ක්, පොලිතීන් අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 133ක් ප්‍රතිචක්‍රීකරණයට ලක්කිරීමටත් නැතහොත් විකල්ප ක්‍රියාමාර්ගවල යෙදවීමටත් සහ | 2023 | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට ලක්කර ආදායම් ඉපැයීමට පියවර ගත යුතුය. | කාබනික පොහොර මධ්‍යස්ථානය විස්තීර්ණය කිරීමට පසුගිය වර්ෂයේ ඇස්ත මේන්තු කර තිබූ නමුත් ප්‍රමාණවත් ආදායම් නොමැති වීමෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේම, මෙම | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දිරාපත්වන කසල මෙට්‍රික් ටොන් 423ක් කාබනික පොහොර සැකසීමටත් යොදවා ආදායම් ඉපැයීමට පියවර ගෙන නොතිබුණි. | | | වර්ෂයේ නිසි පියවර ගනු ලබන බව. | |
| (ඇ) | පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය යටතේ රු.16,253,511ක් වැයකර ඉදිකළ බහාළුම් කඩකාමර 04ක් යෝජිත පරිදි නියමිත ප්‍රතිලාභීන් 16කට ලබාදී ආදායම් ඉපැයීමට විගණන දිනටත් සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | 2023 | සභාවේ ආදායම් මූලාශ්‍ර උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. | ඉතාමත් කඩිනමින් ප්‍රතිලාභීන්ට මෙම කඩකාමර සංකීර්ණය ලබාදෙනු ලබන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමින් වූ වාහන 16ක්, ට්‍රේලර් 13 සහ ජල බවුසර්වල අයිතිය සභාවට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2023 | සභාව සතු වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. | ඔබගේ අදහස් පරිදි වාහනවල අයිතිය සභාවට පවරා ගැනීමට පියවර ගනු ලබන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | 1988 අංක 56 දරන පනතෙන් සහ 2000 අංක 53 දරන පනතෙන් සහ 2008 අංක 01 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක වන රෙගුලාසිවලට අනුකූලව ලී මෝල් 31ක්, හාල් මෝල් | 2023 | පරිසර ආරක්ෂක බලපත්‍ර ලබාගැනීමට සහ අළුත්කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

04ක් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් ආයතන 01ක් විසින් කල් ඉකුත් වූ පාරිසරික බලපත්‍ර අළුත්කිරීමට පසුගිය වර්ෂ 02 සිට 07ක් දක්වා පියවර ගෙන නොතිබුණි. එසේම, ඉහත පන තේ රෙගුලාසි සහ 2022 ජනවාරි 27 දිනැති සහ 2264/18 අංක දරන විශේෂ ගැසට් පත්‍රයේ “ආ” වගන්තිය ප්‍රකාරව, බේකරි 05ක් සහ ඇඹරුම්හල් 05ක් සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

## 3.258 කුච්චවේලි ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 273,140,023 | 44,120,753 | 229,019,270 | 50,869,883 | තත්ත්වාගණනය කළ |
| **2022** | 293,656,393 | 62,049,334 | 231,605,539 | 34,206,395 | තත්ත්වාගණනය කළ |
| **2023** | 301,423,305 | 63,839,970 | 259,034,513 | 27,318,991 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. මේ හේතුවෙන් අනෙකුත් අතුරු ව්‍යවස්ථා 25 ක් මඟින් ලැබිය යුතු ආදායම් සභාවට අහිමි වී තිබුණි. | 2021 | අතුරු ව්‍යවස්ථා පනවා අවශ්‍ය නියාමන කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේ ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රයන් හඳුනාගෙන ඒ සඳහා අතුරු ව්‍යවස්ථා අනුමත කරගනු ලැබේ. | ගැසට් කර ආදායම් අයකර ගැනීමට කටයුතු කරන අතර අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණ ද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | 1980 අංක 46 දරන සේවක අර්ථසාධක අරමුදල් (EPF) පනතේ 16 වගන්තිය අනුව නියමිත මාසයට අදාල දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට ප්‍රථම හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත්, මෙයට පටහැනිව 2010 සිට | 2022 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල අයගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | පිළිගත නොහැක. අයකරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2014 දක්වා කාලපරිච්ඡේදයට සහ සමාලෝචිත වර්ෂයට අදාල දායක මුදල් කල් ඉකුත් වී ගෙවීම හේතුවෙන් දඩගාස්තු ලෙස රු. 2,005,306ක් ගෙවීමට සිදුවී තිබුණි. | | | | |
| (ඈ) | කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් පාලන සහායක ව්‍යාපෘතිය යටතේ රු.2,000,000කට මිලදී ගත් යන්ත්‍ර 03ක් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2022 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කරමින් පවතින බව. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින දක්වා ලංසු කැඳවීම මත බදු දීමෙන් ලැබිය යුතු මුළු මුදල රු. 14,014,830 ක් විය. ඉන් රු. 12,179,493ක් වසර 10කට වඩා පැරණි හිඟ ශේෂයක් පැවතුණි. | 2023 | පැරණි හිඟ ශේෂයන් අයකිරීමට පියවර ගත යුතුයි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පැරණි හිඟ ශේෂයන් සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුව තුළ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව තිබුණ ද පැරණි හිඟ ශේෂ අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | 2022 වසරේ සහ ඊට පෙර වර්ෂයේ විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු.5,497,455ක් වීදි ලාම්පු හිඟ විදුලි බිල්පත් ගෙවා නිරවුල් | 2023 | හිඟ මුදල් ගෙවීම කඩිනම් කළ යුතුයි. | මේ වන විට වීදි ලාම්පු හිඟ විදුලි බිල්පත් අදියර වශයෙන් ගෙවනු ලැබේ. | හිඟ මුදල් ගෙවා නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කිරිමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඊ) | මහජන පුස්තකාලවල විද්‍යුත් පද්ධතිය හරහා සේවා සැපයීම සඳහා මිල දී ගත් රු. 1,992,850 වටිනා විද්‍යුත් උපකරණ අදාළ අරමුණුවලට භාවිතා කර නොතිබුණි. | 2023 | නිශ්චිත අරමුණට සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. | ඉදිරියේදී පුහුණු නිළධාරියෙක් පත් කර කටයුතු කරනු ලැබේ. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (උ) | පරිවාස කාලය අවසන් කළ නිලධාරීන් 03 දෙනෙකුගේ තනතුරු ස්ථිර කිරීමට අවශ්‍ය ලිපි ලේඛන විභාග දෙපාර්තමේන්තුවට යැවීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. | පිළිතුරු සපයා නැත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3.259 මූතූර් ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 260,405,611 | 36,946,990 | 223,458,621 | 24,690,239 | තත්ත්වාගණනය කළ |
| **2022** | 264,363,921 | 28,982,543 | 235,381,378 | 33,728,379 | තත්ත්වාගණනය කළ |
| **2023** | 310,064,122 | 19,873,363 | 290,190,759 | 29,323,360 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | තෝප්පූර්හි 2014 වර්ෂයේදී රු. 4,967,426ක පිරිවැයකින් ඉදිකළ කඩකාමර 12කින් යුත් කඩකාමර සංකීර්ණය වර්ෂ 08ක සිට කුලියට දීමට පියවර ගෙන නොතිබුණි. | 2022 | අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කළ යුතුය. | ඉදිරියේදි අළුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කරනු ලැබේ. | එම කඩ අළුත්වැඩියා තත්ත්වයේ පවතින අතර ඒවා බදුදීම සඳහා අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවන අතර ආර්ථික අපහසුතා තිබෙන බැවින් එම කඩ අළුත්වැඩියා කිරීමට ප්‍රාදේශීය සභාවට නොහැකි අතර ඒවා අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව බදුදීමට තිබුණි. |
| (ආ) | සාම්පූර්හි රු.3,669,340ක පිරිවැයකින් 2017 වර්ෂයේ ඉදිකළ වෙළෙඳපොල ගොඩනැගිල්ල වර්ෂ 05ක සිට භාවිතා කර නොතිබුණි. | 2022 | අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කළ යුතුය. | කුලියට ලබාගැනීමට ව්‍යාපාරිකයින් ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉදිරියේදී විකල්ප ක්‍රියාමාර්ග යොදන බව. | ව්‍යාපාර කටයුතු හිඟවීම හේතුවෙන් එම ගොඩනැගිල්ලෙහි ව්‍යාපාර කිරීම සඳහා ව්‍යාපාරිකයන් මැලිකමක් දක්වන බැවින් ඉදිරියේදී එම ගොඩනැගිල්ල ඵලදායී කටයුත්තක් සඳහා යොදා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | පළාත් නිශ්චිත සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු. 1,115,226ක් වූ ජීව වායු (Bio Gas) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2016 දෙසැම්බර් 07 දින ගොඩනැගිල්ලක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකර සභාවට භාරදී තිබූ නමුත් මේ දක්වා එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | 2022 2023 | අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කළ යුතුය. | ජීව වායු නිෂ්පාදන ගොඩනැගිල්ල ප්‍රමාණවත් තාක්ෂණික උපදෙස් හා යන්ත්‍ර නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක නොවීය. ඒ සඳහා සම්පත් ලැබූ විටෙක ඉදිරි කාලයේදී වායු නිෂ්පාදන කටයුතු සිදු කරන බව. | ජීව වායු නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණික දැනුමක් මෙන්ම ඒ සඳහා අවශ්‍ය පහසුකම්ද නොමැති බව දන්වා ඇත. |
| (ඈ) | පළාත් නිෂ්චිත සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු. 2,589,515 ක් වූ මුතුර් විනෝදාස්වාද උද්‍යානයේ බෝට්ටු නැවැත්වීමේ (Boat landing) ව්‍යාපෘතිය, 2019 දෙසැම්බර් 06 දින අවසන් කර සභාවට භාරදී තිබූ නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | 2022 | අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කළ යුතුය. | විවිධ අවස්ථාවන්හි ප්‍රයත්න දැරූ නමුත් මේ දක්වා බෝට්ටුවේ ගමන් කිරීමට අනුමැතිය ලැබී නොතිබුණි. අනුමැතිය ලැබීමෙන් පසුව කටයුතු කරන බව. | බෝට්ටු සවාරි සඳහා අනුමැතිය ලබාදී නොමැත. අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බෝට්ටු සවාරි සිදු කරන බව දන්වා ඇත. |

## 3.260 කින්නියා ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 66,038,216 | 8,518,456 | 57,519,760 | 4,583,208 | තත්ත්වාගණනය කළ |
| **2022** | 80,743,125 | 9,827,900 | 70,915,225 | (4,257,574) | තත්ත්වාගණනය කළ |
| **2023** | 106,925,719 | 9,720,946 | 97,204,773 | 43,307,565 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.27,272,144 ක් වැයකර 2011 සිට 2017 දක්වා කාලච්ඡේදයේ ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය ඉදිකර තිබුණත් එහි මෙහෙයුම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණු බැවින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගත නොහැකිව තිබුණි. | 2021 | සභාවේ අරමුණු ළඟාකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | කඩිනමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අප විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |
| (ආ) | බදුකුලී හිමියන්ගෙන් 2007 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අයකළ යුතු මුදල රු.7,382,901ක් විය. | 2022 | හිඟහිටි සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | මෙම බදුකුලී වටිනාකමට අදාල විස්තර ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙය නිර්ණය කිරීමේ දුෂ්කරතා මතු වී ඇත. එමනිසා, මෙය විධිමත්ව අධ්‍යනය | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කර කපාහැරීමට සභාව තීරණය කර ඇති බව. | |
| (ඇ) | 2022 මාර්තු 21 දින පළාත් පාලන සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතිය (LDSP) යටතේ මිලදී ගත් එකතුව රු.2,150,000ක් වූ ඝන අපද්‍රව්‍ය පොහොර බවට පත්කිරිමේ යන්ත්‍ර 03ක් මේ දක්වා සවිකර නොතිබූ අතර නිසි පරිදි නඩත්තු කිරීම් සිදුකර නොතිබූ බව ද නිරීක්ෂණය විය. | 2022 | යන්ත්‍ර ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය. | මෙම යන්ත්‍ර වර්තමානයේ International Kinniya mamu Pvt (Ltd) යන ආයතනය සමග ගිවිසුම්වලට එළැඹීමට ක්‍රියාමාර්ග ගෙන සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා යවා ඇත. ඒ සඳහා අනුමැතිය ලැබූ විගස අදාල යන්ත්‍ර සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඈ) | 2022 දෙසැම්බර් 29 දින පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ව්‍යාපෘතියෙන් මිලදී ගත් රු.410,000ක් වූ කොහු නිෂ්පාදන යන්ත්‍රය භාවිතා නොකර නිෂ්කාර්යව පැවැතුණි. | 2022 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | කොහු නිෂ්පාදන යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා යවා ඇත. අනුමැතිය ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | 2016 වර්ෂයේ රු. 897,155 ක වියදමින් උප්පාරු ප්‍රදේශයේ ඉදිකරන ලද විවිධ සේවා ගොඩනැගිල්ල වසර 08 ට අධික කාලයක් භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2023 | ගොඩනැගිල්ල භාවිතා කිරීමට නිසි කටයුතු කළ යුතුය. | සභාව විසින් පවරා ගෙන ඇති අතර මෙම කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

**3.261 තඹලගමුව ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 144,657,016 | 6,848,827 | 137,808,189 | 8,461,631 | තත්ත්වාගණනය කළ |
| **2022** | 197,358,262 | 54,963,048 | 142,395,214 | 2,317,203 | තත්ත්වාගණනය කළ |
| **2023** | 207,529,593 | 12,283,022 | 195,246,571 | 6,998,328 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දින දක්වා මස්කඩ බදුකුලී වශයෙන් ලැබිය යුතු රු.3,552,966 ක් වර්ෂ 01 සිට 04 ක් දක්වා කාලයක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | 2021 | හිඟහිටි අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉහත හිඟහිටි මුදල් අයකිරීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟ අයකර ගැනීමට නීතියානුකූලව කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2017 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා මස්කඩ බදු කුලි වශයෙන් ලැබිය මුදල රු.3,906,962 ක් විය. | 2022 | හිඟහිටි මස්කඩකුලී අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරියේදී එම හිඟහිටි මුදල් ලබාගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් ඇත. |
| (ඇ) | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2021 වර්ෂයේ රු.1,000,000ක ප්‍රතිපාදන නිදහස් කර තිබූ නමුත්, සභාවට අයත් නොවන ඉඩමක ඒ සඳහා වැඩබිමක් සැකසීම සඳහා රු.803,520 ක් වැය කර තිබුණි. මේ | 2022 | වත්කම් භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | භාවිතා කිරීමට සුදුසු පියවර ගන්නා බව. | නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,500,000ක් පිරිවැය වූ කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගෙන ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ කිසිදු ප්‍රයෝජනයකින් තොරව තබා තිබුණි. | | | | |
| (ඈ) | 2012 වසරේ කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබුණු රු. 18,291,467 ක ණය මුදල සහ රු. 4,573,444 ක ගෙවිය යුතු පොලී මුදල එම අරමුදලට පියවීමට විගණිත දිනය දක්වා සභාව කටයුතු කර නොතිබුණි. | 2023 | ණය සහ පොලිය ගෙවීමට නිසි පියවර ගත යුතුයි | සභාවේ ආදායම ඉතා අඩු බැවින් එම ණය පියවීම සිදු නොවන අතර එම ණය මුදල ගෙවීමට නිසි පියවර ගනු ලැබේ. | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ දී මිලදී ගත් රු. 1,500,000 ක් වටිනා යන්ත්‍රය සහ එය ස්ථාපිත කිරීම සඳහා රු. 803,520 ක වියදමින් සාදන ලද ස්ථානය යනාදියට යටිතල පහසුකම් වැඩ නිම නොවූ බැවින් කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය වසර 03 කට වඩා වැඩියෙන් නිෂ්කාර්යව පැවතුණි. | 2023 | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම් වැඩ නිම නොකිරීම නිසා එම යන්ත්‍ර භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතී. | මෙම කොම්පොස්ට් යන්ත්‍රය නිසි ස්ථානයේ සවි කළද වන අලින්ගේ පැමිණීමත් නිසා එයින් සේවාවක් ඉටුකර ගත හැක්කේ අලිවැටක් ඉදිකිරීමෙන් අනතුරුව බව නිරීක්ෂණය විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2013/2014 කාලය තුළ භාවිතා කරන ලදුපත් පොත් 09 ක් සහ ටිකට්පත් මගින් අය කරන ලද මුදල් ප්‍රමාණය සභාවට භාර නොදීම හේතුවෙන් සභාවේ නිලධාරියෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන සිදුවූ හානිය එම නිලධාරියා ගෙන් අයකිරීමට වසර 10 ට වැඩි කාලයක් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2023 | විනය ක්‍රියා මාර්ග නියමිත කාලය තුළ ගත යුතුය. | ලදුපත් පොත භාවිත කළ නිලධාරියාට එරෙහිව මූලික පරීක්ෂණයක් සිදු කර ඇත. | විනය ක්‍රියාමාර්ග අවසන් කර නැත. |

**3.262 කන්තලේ ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 297,830,715 | 14,559,276 | 283,271,439 | 9,765,379 | තත්ත්වාගණනය කළ |
| **2022** | 330,915,842 | 11,811,124 | 39,104,718 | 51,602,610 | තත්ත්වාගණනය කළ |
| **2023** | 389,191,622 | 14,929,183 | 374,262,439 | 10,849,566 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සභාව වෙත ලබා දී තිබුණු JCB යන්ත්‍රයේ අලුත්වැඩියාව සඳහා පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) මඟින් රු.1,903,500ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර එය 2021 දෙසැම්බර් 15 දිනට ප්‍රථම අවසන් බිල්පත් ඉදිරිපත් කිරීමට නියමිතව පැවතුණි. නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රය අළුත්වැඩියා කර නොතිබූ අතර අළුත්වැඩියාකරු විසින් JCB යන්ත්‍රයෙහි එන්ජිම ගලවා ගෙන ගොස් තිබුණි. | 2022 | වාහන පාලනය විධිමත් කළ යුතුය. | RS-1461 දරණ JCB යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධව මූලික විමර්ශනයක් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ආරම්භකර ඇති නිසා පරික්ෂණයේ ප්‍රතිඵල මත ඉදිරි කටයුතු සිදු කරන බව . | පළාත් පාලන කොමසාරිස් පත් කළ කමිටුවක් මඟින් මේ වන විට විමර්ශනයක් සිදු කරනු ලබයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | යන්ත්‍රය අලුත්වැඩියා කර නොතිබියදී කන්තලේ ඩිපෝවේ සහකාර කළමනාකරණ ඉංජිනේරුවරයා විසින් එම අළුත්වැඩියාව නිමකර ඇති බවට ව්‍යාජ ලේඛන සකසා 2021 දෙසැම්බර් 10 දින අත්සන් හා නිලමුද්‍රාව තබා අළුත්වැඩියාව නිමකර ඇති බවට සහතික කර තිබුණි. ඒ මත 2022 අගෝස්තු 15 දින අළුත්වැඩියාකරුවෙකු වෙත රු.648,500 ක් ගෙවා තිබුණි. | 2022 | වාහන පාලනය විධිමත් කළ යුතුය. | RS-1461 දරණ JCB යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධව මූලික විමර්ශනයක් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ආරම්භකර ඇති නිසා පරික්ෂණයේ ප්‍රතිඵල මත ඉදිරි කටයුතු සිදු කරන බව . | LDSP ප්‍රතිපාදන යටතේ අත්වැඩියා කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත. |

## 3.263 මොරවැව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 131,997,365 | 1,164,471 | 130,832,894 | 109,478 | තත්ත්වාගණනය කළ |
| **2022** | 134,832,363 | 1,411,696 | 133,420,667 | (280,387) | තත්ත්වාගණනය කළ |
| **2023** | 155,082,735 | 5,254,087 | 149,828,648 | 176,105 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුමේ රු.7,864,759 ක ශේෂය නිරවුල් කර නොතිබුණි. | 2022 | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | 2011 අවසන් ගිණුමේ මෙම ශේෂය මුලින්ම සටහන් වන අතර එතැන් පටන් මේ දක්වා සෑම අවසන් ගිණුමකම සටහන් වී ඇත. ඊට අදාළ තොරතුරු නොමැති වීම නිසා මෙය නිරවුල් කිරීමට නොහැකි වී ඇත. කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය එලෙසම පවතී. |
| (ආ) | සභාව සතු රු.16,695,000 ක් වටිනා JCB යන්ත්‍රයක් දැනට වසර 05 ක පමණ කාලයක සිට අක්‍රියව පැවතුණි. | 2022 | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය. | මෙම වාහනය අලුත්වැඩියා කිරීමට සුදුසු සැපයුම්කරුවෙකු නොමැති නිසාවෙන් අලුත්වැඩියා කිරීමට නොහැකි වී ඇති අතර අලුත්වැඩියාව සඳහා වැයවිය හැකි අධික මුදල දැරීමට සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමද ගැටළුවක් වී | නිරීක්ෂණය එලෙසම පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඇති බව. | |
| (ඇ) | වසර ගණනාවකට පෙර නිලධාරීන් 4 දෙනෙකුට ලබාදී තිබූ රු.100,146 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාල පුද්ගලයන්ගේ තොරතුරු රැස් කරමින් පවතින අතර එම ණය ශේෂ අයකරගැනීමට කටයුතු කරමින් සිටින බව. | නිරීක්ෂණය එලෙසම පවතී. |
| (ඇ) | 2017 වර්ෂයේදී රු. 1,826,485 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ අතර එම අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | 2023 | අත්තිකාරම් සම්බන්ධයෙන් මනා පාලනයක් පවත්වා ගත යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව | අයකරගෙන නොතිබුණි. |

## 3.264 සේරුවිල ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 251,471,493 | 4,253,567 | 247,217,926 | (4,561,496) | තත්ත්වාගණනය කළ |
| **2022** | 263,506,231 | 8,637,792 | 254,868,439 | 2,803,721 | තත්ත්වාගණනය කළ |
| **2023** | 292,509,964 | 6,408,415 | 286,101,549 | 10,082,224 | තත්ත්වාගණනය නොකළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රු.19,000,000 ක පිරිවැයක් දරා ඉදිකළ ආදාහනාගාරය සමාලෝචිත වර්ෂය තුළ කිසිදු භාවිතයක් නොමැතිව පැවතුණි. | 2022 | කඩිනමින් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙ පිළිබදව අවධානය යොමු කර ඉහළ නිලධාරීන්ගේ උපදෙස් ලබා ගනිමින් අවශ්‍යකටයුතු කරන .බව | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

**3.265 නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 372,426,660 | 47,054,896 | 325,371,764 | 44,237,824 | තත්ත්වාගණනය කළ |
| **2022** | 418,184,441 | 38,679,929 | 379,504,512 | 35,031,797 | තත්ත්වාගණනය කළ |
| **2023** | 524,574,718 | 27,445,559 | 497,102,159 | 66,570,633 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 1990 - 2013 වකවානුවේදී ලබාදුන් රු. 2,356,250 ක අත්තිකාරම් 2019 මුලාා ගිණුම් වලින් කපාහැර තිබුණි. | 2023 | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. | 2024 අවසන් ගිණුමේ අදාළ කරුණු නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | වර්ෂ දෙකකට වැඩි රු. 16,554,082 ක කල් ඉකුත් වූ තැන්පතු 75 ක් සම්බන්ධයෙන් සභාව අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | 2023 | ආදායම් ලෙස මාරුකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලෙය්දී තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නිවැරදි කරනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 27,030,334 ක හිඟ වරිපනම් අයකිරීමට වසර එක සිට වසර අටකට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟය කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුයි. | අයකිරීම සඳහා ජංගම සේවාව සහ K ආකෘතියේ හිඟ මුදල දක්වා ලබා දෙනු ලැබේ. | 2022, 2023, 2024 වර්ෂ සඳහා ජංගම සේවා ක්‍රියාත්මක කරමින් හිඟහිටි මුදල් අයකර ගැනීමට කටයුතු කර තිබුණ ද සම්පූර්ණ හිඟ හිටි අයකර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | වෙල්ලයිමනල් ප්‍රදේශයේ පිහිටි සභාවට අයත් නේවාසිකාගාර 03 ක වසර 40 කට අධික කාලයක් පිටස්තර පුද්ගලයින් පදිංචිව සිටින නමුත් සභාව විසින් ඔවුන්ට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 | කුලී නොගෙවන්නන් ට නීතිමය පියවර ගත යුතුය. | කුලී නොගෙවන්නන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්න බව. | අදාළ දේපළ සභාව සතු කර ගැනීමට TGPS/Pla/HeaHL Lab.Quar.Land/Vellaimanal wxl 13.02.2023 දිනැති ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් හට ලිපියක් යවා ඇත. මේ වන තෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත. |
| (ඉ) | 2011 සිට 2019 දක්වා දල වශයෙන් පුද්ගලික ඉඩම් 24 ක් අනු බෙදීමේදී ප්‍රාදේශීය සභාවේ මහජන භාවිතය සඳහා වෙන් කරන ලද 10% ප්‍රතිශතය වන අක්කර 1යි රූඩ් 7 යි පර්ච් 7.29 ක වපසරියකින් යුතු ඉඩම් ප්‍රාදේශීය සභාව විසින් මේ දක්වා කිසිදු පොදු කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | 2023 | මහජන උපයෝගිතා වැඩිදියුණු කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුයි. | පිළිතුරු සපයා නැත. | නිරීක්ෂණ ක්‍රියාත්මක කර නොමැත. |

**3.266 අඬඬාලව්වේන ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 286,203,576 | 15,194,266 | 271,009,310 | 13,654,109 | තත්ත්වාගණනය කළ |
| **2022** | 305,405,477 | 11,571,201 | 293,834,276 | 8,091,768 | තත්ත්වාගණනය කළ |
| **2023** | 327,621,522 | 10,115,144 | 317,506,378 | 13,776,717 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලබා දුන් රු. 1,400,000 ක අරමුදල් යොදවා පල්ලක්කාඩු ගම්මානයේ ඉදි කරනු ලැබූ සත්ත්ව අස්ථි ඇඹරුම් කම්හල භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 | සත්ව අස්ථි ඇඹරුම් මධ්‍යස්ථානය ඉතා ඉක්මනින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | සභාව විසින් ඉදිකර අදාල ආයතනයට දැනුම් දුන්නද මෙතෙක් විධිමත් එකඟතාවකට පැමිණ නොමැති බව. | කුලියට දී ආදායම් උපයා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වෙනත් ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වාහන 07 ක අයිතිය සභාවේ නමට පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | 2022<br>2023<br>2022 | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහන වලට අදාල සැලැකියයුතු රේගු ගාස්තු නිසා අයිතිය මාරුකිරීමේදී ප්‍රමාද සිදු වී තිබුණ බව. | අයිතිය පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

## 3.267 අක්කරෙපත්තුව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 132,022,310 | 2,648,569 | 129,373,741 | (1,155,854) | තත්ත්වාගණනය කළ |
| **2022** | 136,594,990 | 2,262,206 | 134,332,784 | (2,794,984) | තත්ත්වාගණනය කළ |
| **2023** | 160,237,561 | 2,954,798 | 157,282,763 | 947,304 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොතිබිය දී 2022 වර්ෂයේ දී රු. 969,500 ක වියදමින් ඝන අපද්‍රව්‍ය ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගෙන සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නිෂ්කාර්යව තිබුණි. | 2023 | ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | අක්කරෙයිපත්තුව මහා නගර සභාවේ කාබනික පොහොර මධ්‍යස්ථානයේ භාවිතය සඳහා මිලදී ගෙන ඇත. මෙම මධ්‍යස්ථානය මෑතකදී තාවකාලිකව අත්හිටුවා ඇති බව. | උපකරණය භාවිත කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

## 3.268 ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 263,294,214 | 1,131,498 | 262,162,716 | 5,110,195 | තත්ත්වාගණනය කළ |
| **2022** | 282,778,080 | 3,336,098 | 279,441,982 | 6,836,209 | තත්ත්වාගණනය කළ |
| **2023** | 291,223,026 | 1,983,375 | 289,239,651 | 3,477,088 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාවේ සේවකයින් 04 දෙනෙකුට ලබාදී තිබුණු වැරදි වැටුප් පරිවර්තන හේතුවෙන් ඔවුන්ගෙන් අයවිය යුතු සහ ඔවුන්ට ගෙවිය යුතු පිළිවෙලින් රු.293,955 සහ රු.59,986 මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2023 | අයවිය යුතු හා ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි අවස්ථාවන් පැන නැගීමේදී මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | අයකරගත හැකි හෝ ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් මේ වන තෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සේවකයින් 05 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක් අය නොවී පවතින රු. 290,070 ක ආපදා ණය හිඟය අයකර ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමට සභාව විසින් සිදුකර නොතිබුණි. | 2022<br>2023<br>2022<br>2023 | අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම නිලධාරීන්ට ආදාළ පාරිතෝෂිත ලැබීමේදී ණය ශේෂය අයකරගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සේවකයාගෙන් හෝ ඇපකරුගෙන් හිඟ මුදල් අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | සභාව විසින් උපයෝජනය කරනු ලබන වාහන 08 ක අයිතිය පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2022<br>2023 | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | අයිතිය පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

## 3.269 ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 184,485,108 | 4,684,746 | 179,800,362 | 2,803,059 | තත්ත්වාගණනය කළ |
| **2022** | 207,683,353 | 5,097,435 | 202,585,918 | 453,208 | තත්ත්වාගණනය කළ |
| **2023** | 221,483,048 | 5,395,982 | 216,087,066 | 826,053 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සභාව භාවිතා කරන වාහන 03 ක අයිතිය සභාවේ නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022<br>2023 | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට පියවර ගත යුතුය. | වාහන දෙකක් කිසිදු ලියවිල්ලක් නොමැතිව සම්මන්තුරේ ප්‍රාදේශීය සභාවෙන් ලබාදී ඇති බැවින් නම වෙනස් කළ නොහැකිව පවතී. ඒ වගේම අනෙක් වාහනයේ අයිතිය පවරා ගැනීමට පියවර ගෙන තිබෙන බව. | අයිතිය පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

**3.270 කාරතිවු ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 193,578,585 | 2,702,352 | 190,876,233 | 3,947,941 | තත්ත්වාගණනය කළ |
| **2022** | 195,513,072 | 3,426,973 | 192,086,099 | (4,948,028) | තත්ත්වාගණනය කළ |
| **2023** | 241,674,440 | 3,318,847 | 238,355,593 | 14,573,016 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| උතුරු නැගෙනහිර වෙරළාශ්‍රිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු. 14,347,200 ක වැයකර ඉදිකිරීම් කර 2009 වසරේ සභාවට භාර දුන් කඩ කාමරවලින් කඩ කාමර 14 ක් වසර ගණනාවක සිට කුලියට දීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2021<br>2022<br>2023 | නව ක්‍රමවේද ඇති කර සියලුම කඩකාමර කුලියට දීමට පියවර ගත යුතුය. | පාරිභෝගික පැමිණීම අඩු බැවින් කඩවල් ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවීම නිසා ඇතැම් වෙළෙඳසල් භාවිතයට නොගෙන පැවතුණ බව. | මේ වනතුරු කඩකාමර කුලියට දීමට කටයුතු කර නොතිබුණි. |

**3.271 නින්දවූර් ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 258,091,181 | 12,303,713 | 245,787,468 | 12,716,011 | තත්ත්වාගණනය කළ |
| **2022** | 282,187,312 | 9,487,883 | 272,699,429 | 10,456,948 | තත්ත්වාගණනය කළ |
| **2023** | 381,902,048 | 9,060,122 | 372,841,926 | 86,270,196 | තත්ත්වාගණනය කළ |

| විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ දී දේපළ බදු හිඟය වන රු. 62,854,496ක මුදල අයකිරිමට සභාව කටයුතු කර නොතිබුණි. | 2023 | හිඟය අයකිරිමට කටයුතු කළ යුතුය. | මේ වන විට නියමිත කාලයේ අය කිරීමට කටයුතු කරන බව. | හිඟ මුදල් සම්පූර්ණයෙන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

## 3.272 නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 210,626,307 | 2,767,085 | 207,859,222 | 4,261,432 | තත්ත්වාගණනය කළ |
| **2022** | 218,707,620 | 3,966,606 | 214,741,014 | 1,632,636 | තත්ත්වාගණනය කළ |
| **2023** | 231,651,971 | 5,469,701 | 226,182,270 | 6,940,497 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නමින් ඇති ට්‍රැක්ටරය, ද්විත්ව කාර්ය වාහනය, ටේලරය, මෝටර් රථය ආදී වාහන 08ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමටත් ඒවායේ වටිනාකම් ගණනය කර ගිණුම්ගත කිරීමටත් කටයුතු කර නොතිබුණි. | 2021 2022 2023 | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. | සභාවේ නමට පවරා ගැනිමට කටයුතු කරමින් සිටින බව. | අයිතිය පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රු. 4,543,500 කට වී කොටන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, අදාළ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් මේ වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි. | 2023 | ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර වී කොටන යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | අරමුදල් ලැබුණු පසු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර යන්ත්‍ර භාවිතා කිරීමට තීරණය කර ඇති බව. | ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

**3.273 පොතුවිල් ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 339,363,354 | 10,557,587 | 327,390,348 | 14,696,273 | තත්ත්වාගණනය කළ |
| **2022** | 361,789,279 | 10,857,233 | 347,666,766 | 18,181,148 | තත්ත්වාගණනය කළ |
| **2023** | 407,271,670 | 13,092,660 | 390,913,680 | 10,495,411 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපොළ කඩකාමර 33 ක් සඳහා ඇති කරගත් ගිවිසුම්වල කුලීහිමියන් කිසිදු අත්සනක් යොදා නොමැති අතර, එම ගිවිසුමේ කොන්දේසිවලට අනුව, කුලීහිමියන් 17 දෙනෙකුගෙන් කිසිදු හිඟයක් සමාලෝචිත වර්ෂයතුල අය කර නොමැති අතර ගිවිසුමේ අඩුපාඩු හේතුවෙන් අයවියයුතු රු.1,608,000ක හිඟ කුලිය නීතිමය ක්‍රියාමාර්ග වලින් අයකර ගැනීමටද සභාවට නොහැකි වී තිබුණි. | 2022 2023 | සුදුසු ක්‍රමවේදයන් සකස් කර හිඟ මුදල් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය. | පසුගිය කාලයේ ගිවිසුම් නොමැති නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැක. කෙසේ වෙතත්, එකඟතාවය මත හිඟ අයකිරීමට කටයුතු කර ඇති බව. | හිඟ ශේෂයන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සභාව විසින් භාවිතා කරන වාහන 11 ක අයිතිය සභාවේ නමට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 2023 | පවරා නොගත් වාහන ලැයිස්තුගත කර කඩිනමින් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | සභාවේ වාහන කිහිපයක් හැර අනෙකුත් සියලුම වාහන පවරාගෙන ඇති බව | අයිතිය පැවරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

### 3.274 සම්මාන්තුරෙයි ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 614,241,970 | 22,808,471 | 591,433,499 | 23,642,420 | තත්ත්වාගණනය කළ |
| **2022** | 617,183,977 | 11,959,582 | 605,224,395 | (14,974,592) | තත්ත්වාගණනය කළ |
| **2023** | 654,763,127 | 22,145,039 | 632,618,088 | 10,472,491 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව භාවිතා කරන වාහන 06 ක සහ ඉඩම් කට්ටි 16 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | වත්කම්වල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට පියවර ගත යුතුය. | දැනටමත් අප වෙත ලබා දී ඇති කාර්යාලවලින් ලේඛන ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | අයිතිය පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මියගිය, විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවීම් වැනි හේතූන් මත නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 144,000 ක ණය ශේෂය අදාල පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුගෙන් අයකරගෙන නොතිබුණි. | 2022 2023 | හිඟ ණය ශේෂය අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අදාළ ණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | සේවකයාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි |
| (ඇ) | 2018 සිට 2022 දක්වා කාල පරිච්ඡේදයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ මුළු නිශ්චල දේපළ ඒකක සංඛ්‍යාව පදනම් කරමින් | 2022 | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ මුළු නිශ්චල දේපළ ඒකක සංඛ්‍යාව පදනම් කරමින් වරිපනම් | මෙම කාරණාව ඉදිරි කාලයේදි විධිමත් අන්දමින් ක්‍රියාත්මක කරන බව. | වත්කම්වල වටිනාකම නැවත තක්සේරු කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| සභාව විසින් වරිපනම් බදු අයකිරීම් සිදුනොකර ඊට අඩු දේපළ ඒකක මත බදු අයකර තිබුණි. මේ හේතුවෙන් පසුගිය වර්ෂ 05 තුළ සභාවට (ආසන්න වශයෙන්) රු.10,582,996 ක ආදායම් අහිමි වී තිබුණි. | බදු අයකිරීම් සිදුකිරීමට පියවර ගත යුතුය. |

**3.275 තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 277,760,158 | 5,618,860 | 272,141,298 | 8,392,084 | තත්ත්වාගණනය කළ |
| **2022** | 289,599,588 | 6,865,568 | 282,734,020 | (3,380,922) | තත්ත්වාගණනය කළ |
| **2023** | 333,685,187 | 7,238,317 | 326,446,870 | 12,533,099 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු. 17,678,131 ක මුදලකට මිලදී ගෙන තිබුණු වී පිරිසිදු කිරීමේ සහ වී වියළන යන්ත්‍ර භාවිතයට අවශ්‍ය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාව විසින් රු. මිලියන 10.6 ක මුදලක් ඇස්තමේන්තු කර වෙන්කිරීම් කර තිබුණද, මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් අදාළ යන්ත්‍ර භාවිතා නොකර නිෂ්කාර්යව පවතින අතර යන්ත්‍රවල වගකීම් කාලයද අවසන් වීමට ආසන්නව පැවතුණි. | 2023 | ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | සුදුසු පිළිතුරක් ලබා දී නැත. | ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්‍රාම ගිය සහ මියගිය සේවකයන් 05 දෙනෙකුගේ රු. | 2023 | අදාළ පුද්ගලයන්ගෙන් හෝ | මරණ පාරිතෝෂිත විශ්‍රාම පාරිතෝෂිකය ලැබෙන විට එයින් | සේවකයාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට මේ |

| | | | |
|---|---|---|---|
| 316,792 ක් අය නොවී දිගින් දිගටම මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඇපකරුගෙන් කඩිනමින් අය කිරීම සඳහා කටයුතු කළ යුතුය. | අදාළ මුදල් අයකරගනු ලබන බව | වන තෙක් කටයුතු කර නොතිබුණි. |

## 3.276 දමන ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 231,166,544 | 33,164,549 | 198,001,995 | 1,365,078 | තත්ත්වාගණනය කළ |
| **2022** | 216,781,680 | 38,904,883 | 222,876,797 | 2,344,297 | තත්ත්වාගණනය කළ |
| **2023** | 247,095,069 | 16,850,965 | 230,244,104 | 4,766,125 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් 2022 මැයි 09 වන දින සභාව සතු කැබ් රථය පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොළඹ පැවති රැස්වීමට සහභාගී වී ආපසු පැමිණීමේ දී කලහකාරී සිද්ධියට මැදි වී කැබ් රථයට පහර දී ගිනි තැබීම හේතුවෙන් කැබ් රථය මුළුමනින්ම හානියට පත් වී තිබූ අතර මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ඉදිරිපත් කළ ප්‍රාරම්භක වාර්තාව අනුව රථයට සිදුව තිබූ අලාභය රු.8,500,000 ක් වුවත් රක්ෂණ වන්දි ලෙස ලද මුදල රු.5,000,000ක් වූයෙන් ප්‍රාදේශීය සභාවට | 2023 2022 | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා අනුමැතිය ලබාගෙන වටිනාකම පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.3,500,000ක අලාභයක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී කැබ් රථයේ වටිනාකම ද පොත්වලින් ඉවත්කර තිබුණි. | | | | |
| (ආ) | සභාවට අයත් සුසාන භූමි 27ක, ක්‍රීඩා පිටි 10ක හා සභාවට අයත් ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023 2022 | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. | තක්සේරුවක් කර නොමැති බැවින් වටිනාකමක් හඳුනාගැනීමට නොහැක. ඉදිරියේ දී ඒ සම්බන්ධව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | වටිනාකම හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) | සභාව භාරයේ පවතින වාහන 09ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 2022 | අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහන අයිතිය පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වාහන අයිතිය පවරාගෙන නොතිබුණි. |

## 3.277 දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 470,298,924 | 107,277,065 | 363,021,859 | 1,918,824 | තත්ත්වාගණනය කළ |
| **2022** | 393,967,336 | 28,841,840 | 365,125,496 | 2,903,118 | තත්ත්වාගණනය කළ |
| **2023** | 439,658,773 | 21,039,500 | 418,619,273 | 13,707,370 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (PT 02) යටතේ පාසල් බෑග් සහ පාසැල් පාවහන් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත ගොඩනැගිල්ල නවීකරණ කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් මිලදීගෙන තිබූ රු.18,328,150 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අයිතම 23 ක් භාවිතා නොකර ගබඩාවේ නිෂ්කාර්යව පවතින අතර භාවිතා නොකර තිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 09 ක් මේ වන විට ඉක්මවා ගොස් තිබුණි. | 2023 | ගොඩනැගිල්ල නවීකරණය කර යන්ත්‍ර හා උපකරණ භාවිතා කළ යුතුය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත ගොඩනැගිල්ල ඉදිකිරීම, දෙවන අදියර යටතේ ක්‍රියාත්මක කරන ලෙස අනුමැතිය ලබා දුන් අතර එම උපකරණ තාවකාලිකව පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල තුළ ස්ථානගත කර ඇත. ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර අවසන් වූ වහාම මෙම උපකරණ එම ස්ථානයේ ස්ථාන ගත කිරීමට නියමිත බව. | ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | සභාව භාරයේ පවතින වාහන 07ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2023 2022 | වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහනවල අයිතිය ඉදිරි වර්ෂයේ දී සභාව නමට පවරා ගන්නා බව. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

**3.278 නාමල්ඔය ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 219,784,805 | 35,772,329 | 184,012,476 | 450,291 | තත්ත්වාගණනය කළ |
| **2022** | 214,815,214 | 11,114,813 | 203,700,401 | (40,005) | තත්ත්වාගණනය කළ |
| **2023** | 243,749,489 | 3,877,197 | 239,872,292 | 3,095,029 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් දේශීය ධාන්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන යොදා ගනිමින් සත්ත්ව ආහාර නිෂ්පාදනය හා බිත්තර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මිලදීගෙන තිබූ රු.3,388,674 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ තොගයක් මාස 08 කට අධික කාලයක් තිස්සේ භාවිතයට නොගෙන ගබඩා කර තබා ඇති බවත් මෙම භාණ්ඩ භාවිතයට නොගෙන තිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 08ක් මේ වන විටත් ඉක්මවා ගොස් තිබුණි. | 2023 | ගොඩනැගිල්ල කඩිනමින් නවීකරණය කර යන්ත්‍ර සූත්‍ර හා උපකරණ භාවිතයට ගත යුතුය. | LDSP PT - 02 ව්‍යාපෘතියේ අදාල මුදල් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වූ නිසා මෙම තත්වයට මුහුණ දීමට සිදු වූ බවත් මේ වන විට ප්‍රතිපාදන ලැබී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. | ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | සභාව සතුව පවතින වාහන 05 ක අයිතිය සභාව නමට පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 2023 2022 | වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉල්ලීම්කර ඇති නමුත් මේ වන තෙක් අප වෙත පවරා දී නොමැති බව. | අයිතිය පවරාගෙන නොතිබුණි. |

## 3.279 පදියතලාව ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය/ (ඌනතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 712,593,722 | 21,877,759 | 690,715,963 | 4,434,941 | තත්ත්වාගණනය කළ |
| **2022** | 745,624,928 | 41,339,561 | 704,285,367 | 1,046,831 | තත්ත්වාගණනය කළ |
| **2023** | 759,814,893 | 31,679,869 | 728,135,024 | 4,913,718 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය (LDSP - PT 2) යටතේ දෙහි සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2023 ජූලි 08 සිට 2023 නොවැම්බර් 13 දක්වා කාලය තුළ රු.6,788,205 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ තොගයක් මිලදීගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට පෙර යන්ත්‍ර උපකරණ මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන ලබාදීම හේතුවෙන් මිලදී ගත් මෙම උපකරණ ගබඩාවේ සහ වාහන අංගනයේ ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර පැවති අතර මේ හේතුවෙන් වගකීම් | 2023 | ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකර යන්ත්‍ර හා උපකරණ භාවිතයට ගත යුතුය. | LDSP - PT 2 යටතේ දෙහි ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමේ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ මිලදීගැනීම සඳහා පමණක් පළමු අදියරේදී මුදල් වෙන්කර ලබා දුන් අතර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදන දෙවන අදියරේදී ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇති බව. | ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සහතික පවතින උපකරණ භාවිතා නොකර තිබිය දී එහි වගකීම් කාලයෙන් මාස 08ක් මේ වන විටත් ඉක්මවා ගොස් තිබුණි. | | | | |
| (ආ) | සභාව භාරයේ පවතින වාහන 10ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | 2023<br>2022 | දැනට සභාව නමින් ලියාපදිංචි කර නොමැති වාහන සභාවේ නමට ලියාපදිංචි කරගත යුතුය. | අදාළ ආයතන වෙත පැවරීම් කටයුතු සඳහා ඉල්ලීම් කර ලිපි යවා ඇති බව. | වාහන අයිතිය පවරාගෙන නොතිබුණි. |
| (ඇ) | පදියතලාව ප්‍රාදේශීය සභාව මඟින් කිරවාන ප්‍රදේශයේ පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි. | 2023 | වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. | පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |

## 3.280 මහඔය ප්‍රාදේශීය සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 145,206,469 | 13,971,675 | 131,234,794 | (4,148,060) | තත්ත්වාගණනය කළ |
| **2022** | 210,502,460 | 56,687,298 | 153,815,162 | (2,479,681) | තත්ත්වාගණනය කළ |
| **2023** | 212,548,834 | 29,690,785 | 182,858,049 | 2,088,618 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.33,083,469ක වියදමක් දරා නිමකළ කැකිරිහේන ප්‍රදේශයේ පිහිටි වෙළෙඳ සංකීර්ණයේ කඩකාමර 24න් පළමු මහලේ කඩකාමර 12ක් 2015 වර්ෂයේ සිටත්, දෙවන මහලේ කඩකාමර 12ක් 2017 වර්ෂයේ සිටත් කඩ හිමියන් වෙත ලබා දී තිබුණ ද 2024 මැයි 08 විගණිත දින වන විට වසර 07කට අධික කාලයක සිට එම කඩකාමර විවෘත නොකර නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම කඩ කාමරවලින් අයවිය යුතු හිඟ කුලිය | 2023 2022 | කුලී පැහැර හරින්නන් හට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා කඩකාමර පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය කෙරෙහි සභාව විසින් අවධානය යොමු කරන අතර ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු නොකර මෙම මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට ලිපි යොමුකර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.4,126,533ක් වූ අතර හිඟ මුදල් පැහැර හරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | | |
| (ආ) | සභාව භාරයේ පවතින වාහන 06ක අයිතිය සභාවේ නමට මාරු කිරීමට විගණන දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 2022 | වාහන අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරන බව. | අයිතිය පවරාගෙන නොතිබුණි. |

**3.281 ලාහුගල ප්‍රාදේශීය සභාව**

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය/ (ඌනතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 268,290,132 | 14,908,355 | 253,381,777 | 56,044 | තත්ත්වාගණනය කළ |
| **2022** | 289,529,320 | 13,410,644 | 276,118,676 | (703,649) | තත්ත්වාගණනය කළ |
| **2023** | 284,550,819 | 2,569,817 | 281,981,002 | (1,325,408) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරනු ලබන රථවාහන 15ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | වාහනවල අයිතිය සභාව නමට පවරා ගත යුතුය. | වාහන පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වාහනවල අයිතිය පවරාගෙන නොතිබුණි. |
| (ආ) | ලාහුගල ප්‍රාදේශීය සභාව විසින් පානම, ලාහුගල හා හුලංනුගේ යන ස්ථාන 03ක පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරියෙන් වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, සභාව විසින් වලංගු | 2023 | වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතුය. | ඉදිරි කාලයේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

පරිසර බලපත්‍රයක් නොමැතිව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පවත්වාගෙන ගොස් තිබුණි.